PR 6765

HARTI

# "අපි වවමු - රට නගමු"
# දේශීය ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම ඇගයීමේ අධ්‍යයනය

ආර්. එල්. එන්. ජයතිස්ස

එම්. ඩී. සුසිලා ලූර්දු

ඉන්දිකා පතිරණ



හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

National Science Foundation
30 JUL 2015
NSLRC
Colombo

# "අපි වවමු - රට නගමු"

## දේශීය ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම ඇගයීමේ අධ්‍යයනය

ආර්.එල්.එන්.ජයතිස්ස
එම්.ඩී.සුසිලා ලූර්දු
ඉන්දිකා පතිරණ

පර්යේෂණ වාර්තා අංක: 60

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
අංක 114, විජේරාම මාවත
කොළඹ 07.

ප්‍රථම මුද්‍රණය :2014

© හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

සියලුම හිමිකම් ඇවිරිණි.

ISBN : 978-955-612-176-6

පරිගණක ගත කිරීම : එන්.ඒ. කාංචනා සඳමාලි

පරිගණක පිටු සැකසුම හා පිට කවරය නිර්මාණය : ඒ.පී. උදේනි කරුණාරත්න

## පෙරවදන

ලංකාවට නිදහස ලැබුණ 1948 වර්ෂය වන විට මුළු ජනගහනය මිලියන අටක් වුව ද ඔවුන්ට අවශ්‍ය ආහාර ද්‍රව්‍යවලින් 60%ක් පමණ පිටරටවලින් ආනයනය කිරීමට සිදු විය. මේ සඳහා වාර්ෂිකව අති විශාල මුදලක් වැය කිරීමට සිදු වූ අතර රටේ සංවර්ධනය සඳහා අවශ්‍ය මුදල් හිඟ විය. මේ නිසාම, ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු ජනතාවට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය රට තුළදී ම නිෂ්පාදනය කරගැනීම සඳහා පාලකයන් දැක්වූයේ බලවත් උනන්දුවකි. ඒ වන විට ශ්‍රී ලංකාවේ පැවති සමාජ, ආර්ථික හා දේශපාලන පසුබිම මත අනුගමනය කළ ක්‍රමෝපායන් එකිනෙකට වෙනස් විය. රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේ සිට 1958 දක්වා අනුගමනය කරන ලද්දේ කෘෂිකාර්මික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත් නව ජනපදකරණය තුළින් වගා බිම් ප්‍රමාණය වැඩි කිරීමත් විය. කෘෂිකර්මාන්තයේ අනාගත සංවර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ හා පුහුණු ආයතන, බීජ හා රෝපණ ද්‍රව්‍ය නිපදවීමේ ආයතන, විවිධ දේශගුණික කලාපවලට යෝග්‍ය ගොවිපළ පද්ධතීන් ද මේ සමඟම ස්ථාපිත කරන ලදී. මෙම ආරම්භක උත්සාහය මඟින් කෘෂිකර්මාන්තයේ යම් කිසි දියුණුවක් උදාකර ගත් නමුත් එය තවදුරටත් අඩු නිෂ්පාදනයක් සහිත සම්ප්‍රදායික කෘෂිකර්මාන්තයක් ලෙස ම පැවතුණි. මෙම තත්ත්වය වෙනස් කිරීමේ අවශ්‍යතාවය හඳුනාගත් පාලකයෝ 1958 වර්ෂයේ දී කෘෂිකර්මයේ ව්‍යුහාත්මක වෙනස්කම් කිහිපයක් තුළින් එහි සංවර්ධනය සඳහා "කෘෂිකාර්මික සැලැස්ම" ඉදිරිපත් කළහ. මෙහි වැදගත්ම අංගය වූයේ කුඹුරු පනතයි. පැවති වැඩවසම් ඉඩම් භුක්ති ක්‍රමය අහෝසි කර අඳ ගොවීන්ගේ ජීවන තත්ත්වය නැංවීමට ඒ මඟින් නීති සම්පාදනය විය. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවක් ද ස්ථාපිත කළ අතර ගොවි ජනතාවගේ සංවර්ධනය වෙනුවෙන් කටයුතු කිරීමට හා කුඹුරු පනත ක්‍රියාත්මක කිරීම එයට පවරන ලදී. 1960 දශකයේ දී ශ්‍රී ලංකාව දැඩි විදේශ විනිමය දුෂ්කරතාවයකට මුහුණ පෑමට සිදුවීමත් ලෝක වෙළඳපොළේ සහල් ඇතුළු අනෙකුත් ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යාමත් නිසා උද්ගත වූ තත්ත්වයට විසඳුමක් ලෙස යළිත් වරක් දේශීය ආහාර නිෂ්පාදනය සඳහා යොමු විය. මේ යටතේ කෘෂිකාර්මික සැලසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික්ක හා ජාතික මට්ටමේ සංවිධාන ජාලයක් ස්ථාපිත කරන ලදී. ඒ යටතේ ඉලක්කගත නිෂ්පාදනයක් සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ වගකීම පරිපාලන සංවිධාන වෙත පවරා දෙනු ලැබීය.

ලෝක වෙළඳපොළේ ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යාම, විදේශ විනිමය ගැටලු අඛණ්ඩව ශ්‍රී ලංකා ආර්ථිකයට අභියෝග කිරීම නිසාත් රැකී රක්ෂා සම්පාදනය හා ග්‍රාමීය සංවර්ධනය සඳහාත් දේශීය ආහාර නිෂ්පාදනය අතිශය පුළුල් අන්දමින් සිදු කිරීමට 1970 බලයට පත් වූ රජය දේශීය ආහාර නිෂ්පාදනය වැඩිකිරීම හා ආහාර ආරක්ෂණය උදෙසා පස් අවුරුදු සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කරන ලදී. මේ වැඩපිළිවෙළ සාර්ථක කරගැනීම සඳහා අවශ්‍ය නීතිමය පසුබිම් සැකසීම සඳහා අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත, 1972 අංක 02 දරන කෘෂිකාර්මික ඵලදාවර්ධන පනත, අංක 43 දරන කෘෂිකාර්මික ඉඩම් පනත යනාදී පනත් ඉදිරිපත් කරන ලදී. ඵලදා වර්ධන කමිටු, ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල හා දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ඒකක යනා දී පරිපාලන ඒකක හඳුන්වා දෙමින් විධිමත් වැඩපිළිවෙළක් ඔස්සේ

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා පියවර ගන්නා ලදී. 1978 දී එවකට පැවති රජය වෙනස් වී පත් වූ රජය මඟින් ශ්‍රී ලංකාව විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වාදුන් අතර දේශීය කෘෂිකාර්මික සංවර්ධන කටයුතුවලින් ක්‍රම ක්‍රමයෙන් රජය ඉවත් වෙමින් පෞද්ගලික අංශයට එම කාර්ය පැවරීමක් දක්නට ලැබුණි. ඒ සමඟම කෘෂිකර්මය වාණිජකරණය කිරීමටත් පියවර ගන්නා ලදී. 1994 වර්ෂයෙන් පසු කෘෂිකර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන් රජයේ පුළුල් අවධානය යොමු වූ අතර ඒ සඳහා ජාතික කෘෂිකාර්මික සැලසුම් රාමුව ඉදිරිපත් කරනු ලැබිය. ඒකාබද්ධ ප්‍රවේශය යටතේ කෘෂිකර්මාන්තයේ සමස්ත සංවර්ධනයක් ඇතිකරලීම සඳහා *"අමා"* වැඩසටහන හඳුන්වාදුන් අතර කෘෂි ඉබ්ර්ග වගාව නැංවීම සඳහා *"සාගත සාගිනි නිවමු - හැම බිම් අඟලකම වවමු, වගා ලංකා ,වගා සංග්‍රාමය"* යන වැඩසටහන හඳුන්වාදෙන ලදී. එහෙත්, 2000-2006 කාල වකවානුවේ ආහාර නිෂ්පාදනයට වඩා ආහාර ආනයනය ලාභදායී බවට එදා රජය විශ්වාස කළ නිසා නැවත කෘෂිකර්මාන්තයේ පසුබැසීමක් දක්නට ලැබුණි. මේ නිසා යළිත් දේශීය කෘෂිකර්මාන්තය අඩපණ වූ අතර අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය විශාල වශයෙන් ආනයනය කිරීමට සිදු විය.

ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් ලෝක වෙළඳපොළ මත යැපීම අවම කර දේශීය ආහාර නිෂ්පාදනවලින් රට ස්වයං පෝෂණය කිරීමේ නව දැක්මක් සහිත කෘෂි ප්‍රතිපත්තියක් 2005 සිට "*මහින්ද චින්තන ප්‍රතිපත්ති රාමුව*" යටතේ ක්‍රියාත්මක කරන ලදී. "අපි වවමු රට නගමු දේශීය ආහාර දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම හඳුන්වා දෙමින් දේශීය කෘෂිකර්මාන්තයේ නවෝදයක් ඇති කරන ලදී. 2010 වර්ෂය වන විට රට සහලින් ස්වයං පෝෂිත වීම එහි කුඨප්‍රාප්තිය විය. ශ්‍රී ලංකාවේ සමස්ත කෘෂිකාර්මික ක්ෂේත්‍රය ආවරණය වන පරිදි ක්‍රියාවට නංවන ලද මෙම ජාතික වැඩසටහන පිළිබඳ ඇගයීමක් කිරීම මෙවැනි වැඩසටහනක් අනාගතයේ ක්‍රියාත්මක කිරීමේ දී එම අත්දැකීම් අනාගත සැලසුම් සඳහා ප්‍රයෝජනවත් විය හැකි බැවින් මෙම අධ්‍යයනය සිදු කරන ලද අතර එය අප ආයතනයේ වගකීමක් ද වේ. මෙම අධ්‍යයනය සඳහා සහභාගී වූ පර්යේෂකයින් මෙන්ම, ඒ සඳහා සහාය වූ සියලු දෙනාටම අපගේ කෘතවේදීත්වය හිමිවේ.

**ආර්.එම්.අභයරත්න**
**අධ්‍යක්ෂ**

# ස්තුතිය

මෙම අධ්‍යයනය සාර්ථක කරගැනීම සඳහා විවිධ ආකාරයෙන් සහයෝගය ලබාදුන් බොහෝ දෙනෙකු සිටින අතර ඔවුන් වෙත අපගේ හෘදයාංගම ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කොට ගනිමු. මෙම අධ්‍යයනය සිදු කිරීම සඳහා මූල්‍යමය ප්‍රතිපාදන හා ආයතනික වශයෙන් පූර්ණ සහයෝගය ලබා දුන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ හිටපු අධ්‍යක්ෂ නීතීඥ ලලිත් කාන්ත ජයසේකර මහතාටත්, අධ්‍යයනය අවසන් කිරීම සඳහා ආයතනික වශයෙන් පූර්ණ සහයෝගය ලබාදෙමින් අපව දිරිමත් කළ ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ඊ.එම්.අභයරත්න මහතාටත් අපගේ හෘදයාංගම ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමු. මෙම අධ්‍යයනය සිදු කිරීම සඳහා අපව යොමු කරමින් පර්යේෂණ යෝජනාව සැකසීමේ අවස්ථාවේ සිට ක්ෂේත්‍ර දත්ත රැස් කිරීමේ දී පවා අප හා සමඟ රැඳෙමින් අපව මෙහෙය වූ සහ මෙහි පළමුවන කෙටුම්පත් වාර්තාව කියවා බලා ඒ පිළිබඳ සිය සංශෝධන නොපමාව ලබා දුන් කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශයේ හිටපු අංශ ප්‍රධාන සහ වර්තමාන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජේ.කේ.එම්.ඩී.චන්ද්‍රසිරි මහතාටත් අපගේ කෘතවේදීත්වය පළ කර සිටිමු. මෙම වාර්තාව සැකසීමේ දී එය කියවා බලා එහි ගුණදොස් පෙන්වා දෙමින් වාර්තාවේ ගුණාත්මකභාවය වැඩිකරලීම සඳහා වෙහෙස වූ කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශයේ අංශ ප්‍රධාන ආචාර්ය ටී.ජේ.ධර්මරත්න මහතා වෙත අපගේ නොමසුරු ස්තුතිය පුද කරමු.

කොතෙකුත් රාජකාරී පැවතිය ද මෙම වාර්තාව භාරගෙන එය කියවා බලා සංශෝධන ගණනාවක් ඉදිරිපත් කර වාර්තාවේ අභිමතාර්ථය මැනවින් නිරූපණය කිරීමට වෙහෙසී ක්‍රියා කළ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ මහාචාර්ය පාලිත වීරක්කොඩි මහතාට අපගේ ගෞරව පූර්වක ස්තුතිය පුද කරමු. මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය හා දත්ත හා තොරතුරු සපයා දුන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, සුළු අපනයන බෝග සංවර්ධන දෙපාර්තමේන්තුව, උතුරුමැද හා නැගෙනහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු, පසු අස්වනු තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකා හදබිම සංවර්ධන අධිකාරිය, උද්‍යාන බෝග සංවර්ධන හා පර්යේෂණ ආයතනය, කනංවිල පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය යන දෙපාර්තමේන්තු හා ආයතනවලට ද අපගේ කෘතවේදීත්වය පළකර සිටින්නෙමු.

මෙම වාර්තාව පරිගණක ගත කළ කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශයේ එන්.ජේ. කාංචනා සඳමාලි මෙනවියටත්, පිටු සැකසුම් කටයුතු හා පිටකවර නිර්මාණය කර දුන් උදේනි කරුණාරත්න මහත්මියටත් වාර්තාව සංස්කරණය කර දුන් ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී ආර්.ඩී. ඩබ්. සී. රාජපක්ෂ මහත්මියටත්, වාර්තාව මුද්‍රණය කර දුන් මුද්‍රණ අංශයේ කාර්ය මණ්ඩලයටත් අපගේ හද පිරි ස්තුතිය පුද කරන්නෙමු.

**ආර්.එල්.එන්.ජයතිස්ස**
**එම්.ඩී.සුසිලා ලූර්දු**
**ඉන්දිකා පතිරණ**

# සාරාංශය

රටේ ජනගහනයෙන් 70%ක් සෘජුව හා වක්‍රව කෘෂිකර්මය ආශ්‍රිත ජීවනෝපායයන්ගෙන් යැපීම, වෙනත් කන්න බෝගයක් වගා කර නැති තරම් අති විශාල භූමි භාගයක වී වගාව සිදු කිරීම සහ දළ ජාතික නිෂ්පාදනයට 16.5%කින් දායකවීම යන කරුණු මත සුළු ගොවි කෘෂිකර්ම ක්ෂේත්‍රය ශ්‍රී ලංකා ආර්ථිකයේ වැදගත් ස්ථානයක් හෙබවූව ද කෘෂි කර්මාන්තයට සෘජුවම සම්බන්ධ ගැටලු ගණනාවක් ආර්ථිකය තුළ පවතී. වී වගාවෙන් විභව අස්වැන්නක් ලබාගැනීමට අසමත් වීම, දේශීය පරිභෝජනයට අවශ්‍ය දේශීය වශයෙන් වගා කළ හැකි ධාන්‍ය, රනිල බෝග, එළවළු හා පළතුරු සැලකිය යුතු ප්‍රමාණයක් ආනයනය කිරීම සඳහා වසරකට රුපියල් මිලියන 50ක් පමණ වැය කිරීම, ළදරු මන්දපෝෂණය 16%ක් තරම් ඉහළ මට්ටමක පැවතීම, ග්‍රාමීය දිළිඳුභාවය, දෛනිකව වැඩිවන ජනගහනය සඳහා බෝග වගාකිරීමට සුදුසු භූමිය සීමිත වීම, බෝග වගාව සඳහා යොදවන බීජවලින් බහුතරය ආනයනය මත රඳා පැවතීම, රසායනික පොහොර යෙදීම අත්‍යවශ්‍ය බැවින් පොහොර ආනයනය සඳහා විශාල වියදමක් දැරීමට සිදු වීම, බිම් සැකසීම, ජලය සැපයීම වැනි කාර්යයන් සඳහා අවශ්‍ය ඉන්ධන ඉහළ යන මිල ගණන් යටතේ ඒවා ආනයනය කිරීමට සිදු වීම, දේශීය හා ජාත්‍යන්තර ප්‍රවණතාවයන් හේතුවෙන් කෘෂි ද්‍රව්‍ය මිල ගණන් ඉහළ යාමේ ප්‍රවණතාවය ඒ අතර කැපී පෙනේ. මෙම ගෝලීය ප්‍රවණතාවයන්ට මුහුණ දීමටත් රටේ ආහාර සුරක්ෂිතතාවය නැංවීම සඳහාත් සාර්ව ආර්ථිකයේ කෘෂිකර්මාන්තයේ දායකත්වය ඉහළ නැංවීම සඳහාත් "අපි වවමු රට නඟමු දේශීය ආහාර නිෂ්පාදනය දිරිගැන්වීමේ ජාතික තුන් අවුරුදු වැඩසටහන" 2007/08 මාස් කන්නයේ සිට ආරම්භ කරන ලදී.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් අරමුණු 10ක් සපුරා ගැනීමට බලාපොරොත්තු විය. ඒවා නම් අත්‍යවශ්‍ය ආහාර බෝගයන් හි දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම, ශ්‍රී ලාංකික ජනතාවගේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය තහවුරු කිරීම, ජාතික නිෂ්පාදනය සඳහා කෘෂිකර්මාන්තයෙන් සිදු කරන දායකත්වය වැඩි කිරීම, රටේ ජනතාවගේ ආහාර පරිභෝජන රටාව සංවර්ධනය කිරීම, ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා වැය කරමින් පවතින විදේශීය විනිමය අඩු කිරීම, ගොවීන්ගේ ආදායම් වැඩි දියුණු කිරීම, ඉදිරි වසර තුන තුළ දී ආහාර බෝග වගාව සඳහා රසායනික පොහොර භාවිතය 25%කින් අඩු කිරීම, නව තාක්ෂණ භාවිතය ගොවි ජනතාව තුළ ව්‍යාප්ත කිරීම, තරුණ දායකත්වය කෘෂිකර්මාන්තය වෙත වැඩි වැඩියෙන් යොමු කිරීම සහ කෘෂිකර්මාන්තයේ දී පරිසර හිතකාමී දේශීය ක්‍රමවේදයන් භාවිතය ප්‍රචලිත කිරීම වේ.

මෙම වැඩසටහන ඇගයීමේ අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ එහි එක් එක් අංග රටට හා ජනතාවට බලපෑ ආකාරය පිළිබඳව ලබාගත් අත්දැකීම් මත මෙවැනි වැඩසටහනක්

අනාගතයේ සැලසුම් කිරීමට උපදෙස් ලබාදීම විය. මෙහි විශේෂිත අරමුණු වූයේ වැඩසටහන් කාර්යයන් විමර්ශනය කිරීම, යෝග්‍ය බව, බලපෑම සහ තිරසාර බව තක්සේරු කිරීම, වැඩසටහනෙන් බලාපොරොත්තු වූ ප්‍රතිඵල සහ බලපෑම තක්සේරු කිරීම, ව්‍යාපෘති අරමුණු ළඟාකරගැනීමේ තත්ත්වය අධ්‍යයනය කිරීම, ව්‍යාපෘති අරමුණු ඉටුකරගැනීමේ දී බාධා ඇතිවුණ ප්‍රධාන ගැටලු හඳුනාගැනීම හා මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් ලබාගත් අත්දැකීම් හඳුනාගැනීම, විවිධ ශ්‍රේණිවල නිලධාරීන් සහ ගොවීන් එම වැඩසටහනේ සාර්ථකභාවය පිළිබඳ දකින ආකාරය විමර්ශනය කිරීම සහ අනාගත සැලසුම් අරමුණු සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම යන ඒවාය.

තෝරාගත් ප්‍රදේශයන් හි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉහළ මධ්‍යම හා පහළ නිලධාරීන්, සිවිල් පරිපාලන නිලධාරීන් ගොවීන් හා ගොවි නායකයන් සමඟ සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලී භාවිතයෙන් දත්ත රැස් කිරීමත් අදාළ දෙපාර්තමේන්තුවල ද්විතියික දත්ත ද භාවිතා කරන ලදී. සාමාන්‍ය සංඛ්‍යානමය ක්‍රමවේදයක් මඟින් දත්ත විශ්ලේෂණය කිරීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය විය. අම්පාර, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, පොළොන්නරුව, කළුතර, කුරුණෑගල යන දිස්ත්‍රික්ක ආශ්‍රයෙන් දත්ත රැස් කරගන්නා ලදී.

මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ උප වැඩසටහන් අතර පුරන් කුඹුරු අස්වැද්දීම, ගෙවතු වගාව ප්‍රචලිත කිරීම, තෝරාගන්නා ලද බෝග කිහිපයක නිෂ්පාදන තත්ත්වය ඉහළ නැංවීම, පසු අස්වනු තාක්ෂණය යටතේ බෝග ගබඩා කිරීම, සැකසීම, කෘෂි පාදක කර්මාන්ත ඇරඹීම, බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය වැඩි දියුණු කිරීම, නව දියුණු තාක්ෂණ ක්‍රම ප්‍රචාරණය, කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය වැඩි දියුණු කිරීම, පලතුරු හා එළවළු නිෂ්පාදනය වැඩි කිරීම හා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතනයන් එහි විෂය පථය අනුව සිය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් ය.

පුරන් කඹුරු අස්වැද්දීමේ වැඩසටහන යටතේ එහි ඉලක්කයෙන් 38%ක් පුරන් කුඹුරු (හෙක් 21, 500) වගා කිරීමට හැකි විය. වී වගා බිම් ප්‍රමාණයේ වැඩිවීම හා නිෂ්පාදනය වැඩිවීම සහල්වලට උපරිම සිල්ලර මිලක් නියම කිරීම, තිරිඟු පිටි මිල ඉහළ නැංවීම යන ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස බත් පරිභෝජනය වැඩි වී වාර්ෂික ඒක පුද්ගල සහල් පරිභෝජනය කි. ග්‍රෑ. 114 දක්වා ඉහළ ගොස් ඇත. තිරිඟු පිටි ආනයනය ද සුළු වශයෙන් අඩු වී ඇත. කුඹුරුවල ඵලදායීතාවය හෙක්ටයාර් එකකට මෙට්‍රික් ටොන් 5.2 හා ඉන් ඔබ්බට ගොස් ඇත්තේ උඩවලව විශේෂ බල ප්‍රදේශයේ හා මහවැලි එච් කලාපයේ පමණි.

පෝෂ්‍යදායී ආහාර ද්‍රව්‍ය ගෙවත්තෙන් සපයාගැනීමට හැකියාව ඇති කිරීම, පරිසර හිතකාමී බව වැඩිකිරීම, කාබනික පොහොර භාවිතය ඉහළ නැංවීම යන අරමුණු සහිතව ග්‍රාමීය, නාගරික ප්‍රදේශ, පාසැල් කාර්යාල පරිශ්‍ර, නිල නිවාස රෝහල් පරිශ්‍රයන් හි වගා කළ හැකි ඉඩකඩ භාවිතයට ගෙන ආහාර බෝග වගා කිරීමට ජනතාව පෙළඹවීම ගෙවතු වගා වැඩසටහනේ අරමුණු විය. 2008 වර්ෂයේ දී වැඩ ආරම්භ කළ ගෙවතු සංඛ්‍යාව 207,951ක් ද, 2009 දී 287,217ක් ද, 2010 දී 178,597ක් ද වී තිබුණි. ගෙවතු වගාවේ වැදගත්කම පිළිබඳ පණිවිඩය සමාජයට දීමට හැකි වුව ද හඳුනාගත් දුර්වලතාවයන් කිහිපයක් ද විය. එනම් ගුණාත්මයෙන් ඉහළ රෝපණ ද්‍රව්‍ය ගොවීන්ට ලබා නොදීම ප්‍රතිපාදන නියමිත කාලයට නොලැබීම යන ඒවා සහ නාගරික, කාර්යාල, පාසැල්, රෝහල් නිල නිවාස යනාදියේ ගෙවතු වැඩටහන් පළමු වසරෙන් පසු ක්‍රියාත්මක නොවීමත් ය.

දෛනික පලතුරු පරිභෝජනය ග්‍රෑම් 40කට සීමා වී ඇති අතර වෛද්‍ය නිර්දේශිත ප්‍රමාණය පරිභෝජනය නොකරන බව හෙළි වී ඇත. මේ නිසා පෝෂණ මට්මෙන් සපිරි සමාජයක් ගොඩනැංවීම සඳහා පලතුරු නිෂ්පාදනය ඉහළ නැංවීමේ අවශ්‍යතාව මත පලතුරු වගා ක්ෂේත්‍රය දියුණු කිරීමට පියවර කිහිපයක් ගෙන තිබුණි. පලතුරු වගාව පිළිබඳ ජනතාව දැනුවත් කිරීම, පැවති දුර්වල කළමනාකරණය වෙනුවට යහපත් කළමනාකරණයක් සහිතව පලතුරු වගාවට ජනතාව යොමු කිරීමේ පසුබිමක් සැකසීමට පියවර ගැනීම, මාදං, හිඹුටු, වෙරළු වැනි දේශීය ඌන භාවිත පලතුරු වගා යළි නැංවීමට ජාන තාක්ෂණ උද්‍යානයක් ඇරඹීම හා අඹ, අන්නාසි, කෙසෙල්, පැපොල්, අලිපේර හා පැඟිරි වගා ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පසුබිම සැකසීම, වගා ව්‍යාප්තිය වැඩිකිරීම සඳහා උසස් බීජ හා රෝපණ ද්‍රව්‍ය නිපදවීම සහ පසු අස්වනු තාක්ෂණය දියුණු කිරීම සඳහා මේ යටතේ වැඩි අවධානය යොමු කර තිබුණි. වගා කළ සියලුම පලතුරු පැළවලින් කොටසක් අස්වනු ලබාගන්නා අවධිය දක්වා වර්ධනය නොවී විනාශවීම අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමේ බාධකයක් ලෙස හෙළි විය.

විදේශ විනිමය වැඩි වැඩියෙන් ඉපැයීම සඳහා අපනයනය බෝග ව්‍යාප්තිය වැඩිකිරීමට අපනයනය බෝග දෙපාර්තමේන්තුව ක්‍රියාමාර්ග ගෙන තිබුණි. 2008-2010 කාලය තුළ ගම්මිරිස් හෙක්ටයාර් 6,824ක් සහ කුරුඳු හෙක්ටයාර් 3,104ක් වැඩියෙන් වගා කිරීමට හැකි වී ඇත. ගොවීන් විසින් අපනයන බෝග වගා ආරම්භයේ සිට වගාවන් නිසි පරිදි නඩත්තු නොකිරීම, පොහොර යෙදීමේ දුර්වලතා හා දුර්වල වගා කළමනාකරණය අපනයන බෝග නිෂ්පාදනය වැඩිකිරීමේ බාධකයක් ලෙස හඳුනාගෙන තිබුණි.

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතන 'අපි වවමු රට නගමු වැඩසටහන'ට දායක කරගත් අතර ශ්‍රී ලංකා හදබිම සංවර්ධන අධිකාරිය පාංශු සංරක්ෂණ වැඩසටහන සමඟ බදුල්ල මොණරාගල දිස්ත්‍රික්ක දෙකේ ගොවීන් සම්බන්ධ කරගෙන කෘෂිකර්ම

දෙපාර්තමේන්තුවේ සහයෝගය ද ඇතිව මුං ඇට, කව්පි, කුරක්කන්, රට කජු, තල යන බෝග තෝරාගත් ගොවීන් ලවා වගා කරවීමේ ප්‍රජා මූලික බීජ නිෂ්පාදන වැඩසටහන ක්‍රියාවට නංවන ලදී. දේශීය බීජ හා කොම්පෝස්ට් භාවිතය මෙහිදී කෘෂි උපදෙස් පිට සිදු කර ඇති අතර සාර්ථක අස්වනු ලබාගැනීමටත් දේශීය බීජ හිඟකමින් පීඩා විඳි ගොවීන්ට විසඳුමකුත් ලබාගැනීමට හැකි වී ඇත. වැඩසටහන සඳහා උපරිම ගොවි දායකත්වයක් ලැබීම කැපී පෙනුණි. වගා කරගෙනයෑමේ දී තාක්ෂණ නිලධාරීන්ගේ සහයෝගය ලබාගැනීමේ ගැටලුවලට මුහුණු පෑමට සිදු විය.

පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් තාක්ෂණය ලබාදීම, උපාංග පහසුම්ලට සැපයීම, උපදෙස් සහ පුහුණු පංති ආශ්‍රයෙන් වී මෝල් හිමියන්ගේ දැනුම වැඩි දියුණු කිරීමෙන් සහල්වල තත්ත්වය උසස් කිරීම, සහල් මෝල්වල පරිමාණය දියුණු කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබුණි. ධාන්‍ය හා කුළු බඩු ආශ්‍රිත සැකසුම් කර්මාන්තය, සහල් පිටි කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා නව තාක්ෂණය ලබා දීමට ද පියවර ගෙන තිබුණි. ඊට අමතරව ගෘහස්ථ වී ගබඩා පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කිරීමෙන් ගොවීන්ට තමන්ගේ වී කල්තබා ගැනීමෙන් ගොවීන්ගේ ආදායම් තත්ත්වය වර්ධනය කර ගැනීමේ හැකියාව වර්ධනය කර ඇත. පලතුරු සහ එළවළුවල පසු අස්වනු හානිය අඩු කිරීම සඳහා ප්ලාස්ටික් කූඩා හඳුන්වාදුන්න ද එහි භාවිතය පිළිබඳ ගැටලු පැන නැඟී තිබුණි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගොවිජනතාවගේ කෘෂිකාර්මික දැනුම වැඩි කිරීම හා නව තාක්ෂණය ගොවීන් වෙත සම්ප්‍රේෂණය කිරීම සඳහා ක්ෂේත්‍ර මට්ටමේ කෘෂි පුහුණු වැඩසටහන් ව්‍යාප්ත කර ඇත. බෝග නායක නමින් තනතුරක් ඇති කර බෝංචි, තක්කාලි, අර්තාපල් වැනි බෝග සඳහා ඉහළ ගුණාත්මයෙන් යුත් මූලික බීජ නිපදවීම, රෝගවලින් තොර පැළ නිපදවීමෙන් දේශීය බීජ හා රෝපණ ද්‍රව්‍ය අවශ්‍යතාවය සැපිරීමට පසුබිම සකසා තිබුණි. මේ නිසා දේශීය බීජ නිෂ්පාදනය දිරිගැන්වීම සිදු වූ අතර බීජ ආනයනය අඩුවීම, නිෂ්පාදන වියදම් අඩුවීම, බීජ සුලබවීම යන ප්‍රතිලාභ දේශීය කෘෂිකර්මාන්තයට ලැබී ඇත. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු විසින් ද බීජ නිපදවීම, නව තාක්ෂණික ක්‍රම හා වගා කළමනාකරණය වැනි ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ගොවීන්ගේ දැනුම පුළුල් කිරීමට පියවර ගෙන තිබුණි.

කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය වැඩි කිරීමටත් රසායනික පොහොර භාවිතය 25%කින් අඩු කිරීමත් අරමුණු කොට කාබනික පොහොර මෙහෙයුම් කාර්යාලයක් ද අමාත්‍යාංශය තුළ අරඹා තිබුණි. කාබනික පොහොර නිෂ්පාදන ගම්මාන ඇති කිරීම, ගොවිජන සේවා මධ්‍යස්ථාන ආශ්‍රිතව ආදර්ශන පිහිටුවීම, මුහුන් පැකට් ලබාදී කාබනික පොහොර නිෂ්පාදනයට ගොවීන් පෙළඹවීම, නිෂ්පාදකයින් ලියාපදිංචි කිරීම, පර්යේෂණ සිදු කිරීම,

ගවගාල් වැඩි දියුණු කිරීම, අත්පත්‍රිකා බෙදා දීම තුළින් සමාජය දැනුවත් කිරීම වැනි ක්‍රියාමාර්ග රැසක් කාබනික පොහොර නිෂ්පාදනය හා ව්‍යාප්තිය සම්බන්ධයෙන් ගෙන තිබුණි. එහෙත් ගොවිතැන ද්විතියික රැකියාවක් වශයෙන් කරගෙන යන ජනතාවට අමුද්‍රව්‍ය සහ කාලය හිඟකම, විශාල ගොවිපළ සඳහා ප්‍රමාණවත් පරිදි කාබනික පොහොර නිපදවා ගැනීම සඳහා අමුද්‍රව්‍ය හිඟකම, ගොවීන් මේ සම්බන්ධයෙන් පරිශ්‍රමයක් දැරීමට සිදුවීම, රසායනික පොහොරවලින් ලැබෙන ප්‍රමිතියට සමාන ගුණාත්මයක් කාබනික පොහොරවලින් ලැබේද යන අවබෝධයේ අඩුකම වැනි කරුණු නිසා මෙම වැඩසටහන ශීඝ්‍ර දියුණුවක් ලබා නොතිබුණි.

මෙම වැඩසටහන පිළිබඳව කෘෂිකර්ම හා ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ අදහස් විමසීමක් සිදු කළ අතර මෙම වැඩසටහන සාර්ථක වැඩසටහනක් ලෙස කරුණු ඉදිරිපත් කළ පිරිස විසින් ඒ සඳහා හේතු වශයෙන් ගොවීන් තාක්ෂණය හා බද්ධව කෘෂිකර්මයේ යෙදීම, ව්‍යාප්ති සේවයට පහසු කටයුත්තක්වීම, ගොවීන්ගේ නිෂ්පාදනය මෙන්ම ආදායම ද වැඩිවීම, ගොවීන්ගේ මෙන්ම නිලධාරීන්ගේ ද දැනුම වැඩිවීම යන අදහස් දක්වා තිබුණි. මෙය අසාර්ථක වැඩසටහනක් ලෙස අදහස් දැක් වූ පිරිස ගුණාත්මක බීජ කලට වේලාවට නොලැබීම, පසු විපරමක් සිදු නොවීම, වැඩසටහන නිසි කලට ක්‍රියාක්මක නොකිරීම, මේ සඳහා මූලික සැලැස්මක් නොතිබීම, සැලසුම් අවදියේ දී ඉහළ, මධ්‍යම හා පහළ නිලධාරීන්ගේ අදහස් ලබා නොගැනීම යන කරුණු ඒ සඳහා ඉදිරිපත් කරන ලදී.

'අපි වවමු රට නගමු' වැඩසටහන කෘෂිකර්මාන්තයේ සංවර්ධනය සඳහා හේතු වූ ජාතික වැඩසටහනක් වශයෙන් අගය කළ හැකි අතර මෙම වැඩසටහනේ පැවති අඩුපාඩු සපුරාගනිමින් මීට සමාන වැඩසටහනක් යළිත් ක්‍රියාවට නැංවීම මෙම වැඩසටහන ඉදිරිපත් කිරීමේ දී සපුරාගැනීමට බලාපොරොත්තු වූ අරමුණු ඉටුකරගැනීමට හැකි වන බව මෙම අධ්‍යයනයේ අවසාන නිගමනය වශයෙන් දැක්විය හැකිය. ඒ සඳහා නිර්දේශයන් කිහිපයක් ද ඉදිරිපත් කර ඇති අතර වැඩසටහන සැලසුම් අවදියේ දී කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ, කෘෂිකර්ම නිලධාරී, ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්,ගොවිජන සංවර්ධන නිලධාරී වැනි නිලධාරීන් සමඟ ඍජුව අදහස් හුවමාරු කරගැනීමෙන් පරිපූර්ණ මූලික සැලැස්මක් සකස් කරගැනීම, විවිධ ආයතන මඟින් සපුරා ගැනීමට බලාපොරොත්තු වූ ඉලක්ක ඉටුකරගත්තේදැයි පසුවිපරම් ක්‍රමයක් ස්ථාපිත කිරීම, විවිධ ආයතනවලට අවශ්‍ය මුදල් නියමිත කාලයට නියමිත ප්‍රමාණයෙන් ලබාදීම, ගුණාත්මයෙන් යුතු බීජ හා රෝපණ ද්‍රව්‍ය ගොවීන්ට සැපයීම අන්තර් ආයතන සම්බන්ධීකරණ ක්‍රමෝපායයක් යටතේ වැඩසටහන ක්‍රියාවට නැංවීම යන ඒවා විය.

# පටුන


| | පිටු අංකය |
|---|---|
| පෙරවදන | ii |
| ස්තුතිය | iv |
| සාරාංශය | v |
| පටුන | x |
| ඇමුණුම | xvii |
| වගු සටහන් | xviii |
| ප්‍රස්තාර සටහන් | xxii |
| සාකච්ඡා | xxiii |
| සිද්ධි අධ්‍යයන | xxiv |
| **පළමු පරිච්ඡේදය** | |
| **1."අපි වවමු -රට නගමු" දේශීය ආහාර නිෂ්පාදනය දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම** | 01 |
| 1.1 හැඳින්වීම | 01 |
| 1.2 'අපි වවමු - රට නගමු' වැඩසටහනේ ප්‍රධාන අරමුණු | 03 |
| 1.3 එක් එක් වර්ෂයන්හි දී කිරීමට යෝජිත වැඩසටහන් | 03 |
| 1.3.1 2008 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ වැඩසටහන් | 03 |
| 1.3.2 2009 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ වැඩසටහන් | 08 |
| 13.3 2010 ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ වැඩසටහන් | 08 |
| 1.3.4 2011 ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ වැඩසටහන් | 09 |
| 1.4 අපි වවමු රට නගමු වැඩසටහන දියත් කිරීමේ පසුබිම් වූ කරුණු | 11 |
| 1.4.1 ලෝක ජනගහනය වැඩිවීම | 11 |
| 1.4.2 ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම්වල ඒක පුද්ගල අයිතිය | 12 |
| 1.4.3 පොහොර මිල ඉහළයාම | 13 |
| 1.4.4 ඉන්ධන මිල ඉහළයාම | 13 |
| 1.4.5 ශ්‍රමය සඳහා ගෙවීම් ඉහළ යාම | 14 |

1.4.6 කෘෂිකාර්මික ද්‍රව්‍ය ආයතනික මිල ගණන් ඉහළයාම 15

1.4.7 ජාත්‍යන්තර සහල් මිල 16

1.4.8 මෙරට වී නිෂ්පාදනය වැඩිකිරීමට එරෙහිව ඇති ගැටලු 17

1.4.9 ආහාර ආනයනය 17

1.4.10 දේශගුණික තත්ත්වයේ වෙනස්වීම් 18

1.4.11 'අපි වවමු රට නගමු' වැඩසටහන දියත් කිරීමේ අවශ්‍යතාවය 19

1.5 අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ 19

1.5.1 අධ්‍යයන ක්‍රමවේදය 20

1.5.2 අධ්‍යයනයේ සීමා 20

1.5.3 අධ්‍යයනයේ පරිච්ඡේද සංවිධානය 21

**දෙවන පරිච්ඡේදය**

**පුරන් කුඹුරු අස්වැද්දීම 23**

2.0 පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන 23

2.1 හැඳින්වීම 23

2.1.1 ශ්‍රී ලංකාවේ මුළු කුඹුරු ප්‍රමාණය 24

2.1.2 අස්වද්දන ලද කුඹුරු 24

2.1.3 පුරන් කුඹුරු 24

2.1.4 පුරන් කුඹුරු හඳුනාගැනීම 25

2.2 'අපි වවමු- රට නගමු' වැඩසටහන යටතේ පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන 28

2.2.1 පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහනේ අරමුණු 28

2.2.2 පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන සඳහා භාවිතා කරන ලද ක්‍රමෝපායන් 28

2.2.3 'අපි වවමු - රට නගමු' වැඩසටහන යටතේ පුරන් කුඹුරු වගාකිරීමේ ඉලක්ක 29

2.2.4 නැගෙනහිර පළාතේ විශේෂ සංවර්ධන වැඩසටහන මඟින් වගා නොවී පවතින ඉඩම් වගා කිරීම 30

2.2.5 වියළි හා අන්තර් මාධ්‍ය කලාපවල ඇති රජයේ ඉඩම් වගා කිරීම 30

2.2.6 'අපි වවමු- රට නගමු' වැඩසටහන යටතේ නැවත වගා කිරීමට අපේක්ෂිත කුඹුරු ප්‍රමාණය 31

2.2.7 'අපි වවමු- රට නගමු' වැඩසටහන යටතේ වී නිෂ්පාදනය වැඩි කිරීමේ ඉලක්ක සපුරාගැනීමේ ප්‍රගතිය 31

2.2.8 ජාතික දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් 25 වී වගාවේ ප්‍රගතිය 36

2.2.8.1 කොළඹ දිස්ත්‍රික්කය - බස්නාහිර පළාත 36

2.2.8.2 ගාල්ල දිස්ත්‍රික්කය - දකුණු පළාත 38

2.2.8.3 පුත්තලම දිස්ත්‍රික්කය - වයඹ පළාත 39

2.2.8.4 කෑගල්ල දිස්ත්‍රික්කය - සබරගමුව පළාත 41

2.2.8.5 මහනුවර දිස්ත්‍රික්කය - මධ්‍යම පළාත 43

2.2.9.6 බදුල්ල දිස්ත්‍රික්කය - ඌව පළාත 45

2.2.8.7 යාපනය දිස්ත්‍රික්කය - උතුරු පළාත 47

2.2.8.8 අනුරාධපුර දිස්ත්‍රික්කය - උතුරු මැද පළාත 51

2.2.8.9 ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය - නැගෙනහිර පළාත 53

2.2.8.10 උඩවලව විශේෂ බල ප්‍රදේශය 56

2.2.8.11 මහවැලි එච් කලාපය 57

2.2.9 පුරන්කුඹුරු වගාකිරීමේ ඉලක්ක 59

2.2.9.2 ඒක පුද්ගල සහල් පරිභෝජනය 60

2.2.9.3 ඒක පුද්ගල තිරිඟු පිටි පරිභෝජනය 61

2.2.9.4 තිරිඟු පිටි සහ ඇට ආනයනය 61

2.2.9.5 පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා වැය කර ඇති මුදල 62

2.2.9.6 පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ පෑමට සිදු වූ ගැටලු 64

2.2.9.7 පුරන් කුඹුරු අස්වැද්දීමේ දී මුහුණ පෑමට සිදුවන ගැටලු සඳහා විසඳුම් 66

**තුන්වැනි පරිච්ඡේදය** 69

**ගෙවතු වගාව** 69

3.0 ගෙවතු වගාව 69

3.1 හැඳින්වීම 69

3.1.1 ගෙවතු වගා ප්‍රචලිත කිරීමේ මූලික අරමුණු 70

3.1.2 ගෙවතු වගා දිරිගැන්වීම සඳහා වූ ඉලක්ක හා ක්‍රමෝපායන් 71

3.1.2.1 ග්‍රාමීය හා නාගරික ගෙවතු 71

3.1.2.2 පාසැල් භූමි 71

3.1.2.3 පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ගෙවතු 71

3.1.2.4 කාර්යාල පරිශ්‍ර හා නිල නිවසාවල ගෙවතු හා ආදර්ශන වගා 72
3.1.2.5 හමුදා කඳවුරු තුළ වගාකටයුතු 73
3.1.2.6 රාජ්‍ය නිලධාරීන්ගේ පුද්ගලික ගෙවතු 73
3.1.2.7 ජනතා නියෝජිතයින්ගේ ගෙවතු 75
3.2 මෙම වැඩසටහනේ 2010 වර්ෂයට වෙන් කළ ප්‍රතිපාදන අනුව ප්‍රගතිය 77
3.2.1 නැගෙනහිර පළාත 77
**හතරවැනි පරිච්ඡේදය** **87**
**ශ්‍රී ලංකාවේ පලතුරු වගාව ප්‍රවර්ධනය** **87**
4.0 ශ්‍රී ලංකාවේ පලතුරු වගාව සංවර්ධනය 87
4.1 හැඳින්වීම 87
4.2 පලතුරු අපනයනය 89
4.3 පලතුරු ආනයනය 89
4.4 දේශීය නිෂ්පාදනය ඉහළන නැංවීමට පවතින ප්‍රධාන ගැටලු 90
4.5 පලතුරු නිෂ්පාදන වැඩසටහන (2008-2010) 91
4.6 නිෂ්පාදනය ඉහළ නැංවීමේ ක්‍රමවේදයන් 91
4.7 තෝරාගත් පලතුරු බෝග ප්‍රවර්ධනය සඳහා අපේක්ෂිත උපාය මාර්ග 91
4.8 2008-2012 දක්වා වූ පලතුරු බෝග ප්‍රවර්ධනය සඳහා සිදු කෙරී ඇති වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය 92
4.9 2008 වර්ෂයේ පලතුරු බෝග ප්‍රවර්ධනය සඳහා සිදු කෙරී ඇති වැඩසටහන් 92
4.10 2009 වර්ෂයේ පලතුරු බෝග ප්‍රවර්ධනය - ප්‍රාදේශීය මට්ටමේ ප්‍රවර්ධනය 93
4.11 2010 වර්ෂයේ පලතුරු බෝග ප්‍රවර්ධනය- ප්‍රජා බීජ වැඩසටහන 94
4.12 2011-2012 යන වර්ෂයන් හි පලතුරු බෝග ප්‍රවර්ධනය-ජෛව විවිධත්ව පලතුරු උද්‍යාන ව්‍යාපෘතිය 96
4.13 පලතුරු වගා වපසරිය සහ නිෂ්පාදනයන් හි විචලනය 99
4.14 ආනයන අපනයනයන් හි විචලනය 101
**පස්වැනි පරිච්ඡේදය** **107**
**සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව** **107**
5.1 හැඳින්වීම 107
5.1.1 ගම්මිරිස් බෝග සංවර්ධන වැඩසටහන 107

5.1.2 කුරුඳු වගාව 109

5.2 පාංශු සංරක්ෂණය සහ ඉඩම්වල ඵලදායිතාවය නැංවීම 109

5.2.1 හැඳින්වීම 109

5.2.2 ශ්‍රී ලංකා හදබිම අධිකාරිය විසින් සිදු කරන ලද සංවර්ධන වැඩසටහන් 110

5.2.3 'අපි වවමු රට නගමු' වැඩසටහන සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන 110

5.3 පසු අස්වනු තාක්ෂණය ප්‍රචලිත කිරීම 117

5.3.1 හැඳින්වීම 117

5.3.2 පසු අස්වනු හානි අවම කිරීමේ ක්‍රමවේද හඳුන්වාදීම 120

5.3.2.1 ගෘහස්ථ වී ගබඩා ඉදිකිරීම 120

5.3.2.2 ප්ලාස්ටික් ඇසුරුම් හඳුන්වාදීම 120

5.3.2.3 ප්ලාස්ටික් ඇසුරුම් ලබාදීම 2006-2011 කාලය 121

5.4 ගොවීන්ගේ කෘෂිකාර්මික දැනුම වැඩිකිරීම 127

5.4.1 බෝග නායක වැඩසටහන් 127

5.4.2 පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව- උතුරු මැද පළාත 128

5.5 පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - නැගෙනහිර පළාත 137

5.5.1 ක්ෂේත්‍ර මට්ටමේ ගොවි පුහුණු වැඩසටහන් 137

5.5.2 දිස්ත්‍රික් කෘෂිකාර්මික පුහුණු මධ්‍යස්ථාන 138

5.5.3 කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය 138

5.5.4 පුහුණු පංති පැවැත්වීම 138

5.5.5 බිත්තර වී නිෂ්පාදන වැඩසටහන 138

5.5.6 මුං බීජ නිෂ්පාදන වැඩසටහන 138

5.6 බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය 139

5.6.1 බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය 'අපි වවමු රට නගමු' වැඩසටහන යටතේ 2009 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන් 139

5.6.2 බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය 'අපි වවමු රට නගමු' වැඩසටහන යටතේ 2010 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන් 140

5.7 උද්‍යාන බෝග පර්යේෂණය හා සංවර්ධනය 142

5.7.1 උද්‍යාන බෝග පර්යේෂණය හා සංවර්ධන ආයතනය විසින් සිදු කළ කාර්යයන් හි ප්‍රගතිය 142

**හයවැනි පරිච්ඡේදය** **143**

**කාබනික පොහොර භාවිතය හා නිෂ්පාදනය** **143**

6.0 කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන 143

6.1 හැඳින්වීම 143

6.1.1 ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු 144

6.1.2 ක්‍රියාකාරකම් 144

6.1.3 ප්‍රතිලාභ 145

6.1.4 ක්‍රියාත්මක කරන ලද ආයතනය 145

6.1.5 කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන (2008-2011) 146

6.2 කාබනික පොහොර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී මුහුණදීමට සිදු වී ඇති ගැටලු 148

6.3 සාර්ථක ලෙස කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා යෝජනා 149

**හත්වැනි පරිච්ඡේදය** **151**

**'අපි වවමු- රට නගමු' කෘෂිකාර්මික දැනුම සම්ප්‍රේෂණය සඳහා මාධ්‍ය භාවිතය** **151**

7.0 ගොවිජන සංවර්ධන, කෘෂිකාර්මික, සිවිල් පරිපාලන නිලධාරීන් මෙම වැඩසටහන සම්බන්ධයෙන් දැක් වූ අදහස් 151

7.1 හැඳින්වීම 151

7.2 විවිධ ආයතන නියෝජනය කරන ඉහළ නිලධාරීන් වැඩසටහනට සම්බන්ධ වූ වර්ෂ 151

7.2.1 එක් එක් නිලධාරී කාණ්ඩ අනුව ඔවුන්ට වැඩසටහන පිළිබඳව ඇති අවබෝධය 152

7.2.2 වැඩසටහනෙහි අරමුණු පිළිබඳව එක් එක් නිලධාරී කාණ්ඩය දැක් වූ අදහස් 152

7.2.3 වැඩසටහනෙහි සැලසුම පිළිබඳව එක් එක් නිලධාරී කාණ්ඩයේ අදහස් 152

7.2.4 'අපි වවමු- රට නගමු' වැඩසටහනෙහි ක්‍රියාත්මකභාවය පිළිබඳව එක් එක් නිලධාරී කාණ්ඩයේ අදහස් 153

7.2.5 වැඩසටහනෙ හි සාර්ථකභාවය පිළිබඳව නිලධාරීන්ගේ අදහස් දැක්වීම 153

7.2.6 වැඩසටහනෙ හි සාර්ථක අසාර්ථකභාවයට හේතු වශයෙන් විවිධ මට්ටම් හි නිලධාරීන් දක්වන ලද හේතු 153

7.2.7 සැලසුම් කිරීමේ දී ආයතනවල අදහස් විමසීම 154

7.2.8 මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් නිලධාරීන්ට ලබාගත හැකි වූ අත්දැකීම් 155

7.2.9 වැඩසටහනෙ හි දුර්වලතා 156

7.2.10 වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා 158

**අටවැනි පරිච්ඡේදය** **161**

**අධ්‍යයනයේ සොයාගැනීම්, නිගමන හා නිර්දේශ** **161**

8.0 හැඳින්වීම 161

8.1 අධ්‍යයනයේ සොයාගැනීම් 161

8.2 නිගමන 166

8.3 නිර්දේශ 168

**ආශ්‍රිත ග්‍රන්ථ** **170**

# ඇමුණුම් අංක


| | පිටු අංකය |
|---|---|
| ඇමුණුම 01 | 171 |
| ඇමුණුම 02 | 174 |
| ඇමුණුම 03 | 177 |
| ඇමුණුම 04 | 179 |
| ඇමුණුම 05 | 182 |
| ඇමුණුම 06 | 186 |
| ඇමුණුම 07 | 192 |

# වගු සටහන්

පිටු අංකය

පළමු පරිච්ඡේදය


| | | |
|---|---|---|
| 1.1 | ලෝක ජනසංඛ්‍යාන දත්ත | 12 |
| 1.2 | ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම්වල ඒක පුද්ගල අයිතිය | 12 |
| 1.3 | මිශ්‍ර පොහොරවල අලෙවි මිල | 13 |
| 1.4 | භූමිතෙල් සිල්ලර මිලෙහි සාමාන්‍ය | 14 |
| 1.5 | වී වගා අංශයේ නිෂ්පාදන කාර්යයන් කිහිපයක් සඳහා දෙන කුලියේ සාමාන්‍ය (2002-2007) | 14 |
| 1.6.1 | තෝරාගත් කෘෂි බෝග කිහිපයක ආනයන ප්‍රමාණ සහ මිල ගණන් | 15 |
| 1.6.2 | තිරිඟු පිටි ආනයනය | 15 |
| 1.7 | ශ්‍රී ලංකාවේ වී වගාවේ සාමාන්‍ය අස්වැන්න | 16 |
| 1.8 | ශ්‍රී ලංකාවේ වාර්ෂික ඒක පුද්ගල සහල් පරිභෝජනය | 17 |
| 1.9 | බඩඉරිඟු ආනයනික මිල ගණන් | 18 |
| 1.10 | ශ්‍රී ලංකාවේ වර්ෂාපතන රටාව | 18 |


දෙවන පරිච්ඡේදය


| | | |
|---|---|---|
| 2.1 | ශ්‍රී ලංකාවේ 2002 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා කුඹුරු පුරන් වී ඇති ප්‍රමාණය | 26 |
| 2.2 | 1997/98 පාදක වර්ෂය ලෙස සලකා ශ්‍රී ලංකාවේ පුරන් කුඹුරු ප්‍රමාණය දැක්වීම | 27 |
| 2.3 | වගා නොකර අත්හරින ලද ඉඩම් ප්‍රමාණය | 29 |
| 2.4 | වගා වපසරිය වැඩිකිරීම සඳහා විභව ඉඩම් ප්‍රමාණය | 30 |
| 2.5 | පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහනේ ඉලක්ක සහ ප්‍රගතිය | 31 |
| 2.6 | 2007-2011 කාල පරිච්ඡේදය තුළ වගා කරන ලද පුරන් කුඹුරු අක්කර ප්‍රමාණය (ප්‍රතිපාදන යටතේ) | 34 |
| 2.7 | 2007-2010 වගා කරන ලද පුරන් කුඹුරු අක්කර ප්‍රමාණය (ප්‍රතිපාදන රහිතව) | 35 |
| 2.8 | කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල වී වගා බිම් ප්‍රමාණය | 36 |
| 2.9 | කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල සාමාන්‍ය අස්වැන්න | 37 |
| 2.10 | ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල වී වගා බිම් ප්‍රමාණය | 38 |
| 2.11 | ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල සාමාන්‍ය අස්වැන්න | 39 |

2.12 පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල වී වගා බිම් ප්‍රමාණය 40
2.13 පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල සාමාන්‍ය අස්වැන්න 40
2.14 කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්කවල වී වගා බිම් ප්‍රමාණය 41
2.15 කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්කවල සාමාන්‍ය අස්වැන්න 42
2.16 මහනුවර, මාතලේ සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කවල වී වගා බිම් ප්‍රමාණය 43
2.17 මහනුවර, මාතලේ සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කවල සාමාන්‍ය අස්වැන්න 45
2.18 බදුල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්කවල වී වගා බිම් ප්‍රමාණය 46
2.19 බදුල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්කවල සාමාන්‍ය අස්වැන්න 47
2.20 යාපනය, වුවනියාව, මුලතිව්, මන්නාරම සහ කිලිනොච්චි යන දිස්ත්‍රික්කවල වී වගා බිම් ප්‍රමාණය 48
2.21 යාපනය, වුවනියාව, මුලතිව්, මන්නාරම සහ කිලිනොච්චි යන දිස්ත්‍රික්කවල වී වගා බිම් ප්‍රමාණය 50
2.22 අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල වී වගා බිම් ප්‍රමාණය 51
2.23 අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල සාමාන්‍ය අස්වැන්න 52
2.24 ත්‍රිකුණාමල, මඩකලපුව සහ අම්පාර යන දිස්ත්‍රික්කවල වී වගා බිම් ප්‍රමාණය 53
2.25 ත්‍රිකුණාමල, මඩකලපුව සහ අම්පාර යන දිස්ත්‍රික්කවල සාමාන්‍ය අස්වැන්න 55
2.26 උඩවලව විශේෂ බල ප්‍රදේශයේ වී වගා බිම් ප්‍රමාණය 56
2.27 උඩවලව විශේෂ බල ප්‍රදේශයේ සාමාන්‍ය අස්වැන්න 57
2.28 වී වගා බිම් ප්‍රමාණය- මහවැලි එච් කලාපය, 2006-2011 58
2.29 මහවැලි එච් කලාපයේ සාමාන්‍ය අස්වැන්න, 2005-2011 58
2.30 පුරන් කුඹුරු වගාකිරීමේ ඉලක්ක සපුරාගැනීම 59
2.31 ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල සහල් පරිභෝජනය (වර්ෂයකට කි.ග්‍රෑම්) 60
2.32 ඒක පුද්ගල තිරිඟු පිටි පරිභෝජනය 61
2.33 තිරිඟු පිටි සහ ඇට ආනයනය 62
2.34 පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා වැය කර ඇති මුදල 63

තුන්වැනි පරිච්ඡේදය

3.1 නිලධාරීන්ගේ ගෙවතු 2008-2010 74
3.2 2010 වර්ෂයේ ගෙවතු වගා වැඩසටහනේ හි ප්‍රගතිය 77
3.3 2010 වර්ෂයේ ගෙවතු වගාව සඳහා වෙන් කළ මුදල් ප්‍රතිපාදන 78

3.4 ගෙවතු වගා වැඩසටහන ගෙවතු හිමියන් සඳහා- නාගරික ගෙවතු ද ඇතුළුව 79

3.5 ගෙවතු සංවර්ධන වැඩසටහන 2009.01.01 – 2009.12.31 දක්වා ප්‍රගතිය 80

3.6 ගොවිජන සේවා මධ්‍යස්ථානය- භූමි සංවර්ධන ප්‍රගතිය 2009.01.01 – 2009.12.3174 81

3.7 ගෙවතු සංවර්ධන වැඩසටහන ප්‍රගතිය 2009.01.01- 2009.12.31 දක්වා 82

3.8 කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් සඳහා ගෙවතු වගා තරඟය- ප්‍රගති වාර්තාව 83

හතරවැනි පරිච්ඡේදය

4.1 පලතුරු වගාකළ බිම් ප්‍රමාණය හා නිෂ්පාදනය (2004-2006) 88

4.2 ක්ෂේත්‍ර මට්ටමේ ඒකක ඵලදාව හා විභව ඒකක ඵලදාව 88

4.3 පලතුරු අපනයන ප්‍රමාණය හා වටිනාකම (2004-2006) 89

4.4 ශ්‍රී ලංකාවේ පලතුරු ආනයන ප්‍රමාණ හා වටිනාකම් 90

4.5 2009 වර්ෂයේ දී එක් එක් පලතුරු බෝගයන් සඳහා වූ ප්‍රතිපාදන, ප්‍රගතිය හා වැය 94

4.6 2010 වර්ෂයේ පලතුරු ප්‍රජා බීජ වැඩසටහන සඳහා වෙන් කළ මූල්‍ය ප්‍රතිපාදන සහ එහි ප්‍රගතිය 96

4.7 අන්නාසි බෝගයේ නිෂ්පාදනය සහ එහි වගා වපසරිය 2008 වර්ෂයට සාපේක්ෂව වැඩිවීමේ ප්‍රතිශය 100

4.8 දොඩම් බෝගයේ නිෂ්පාදනය සහ වගා වපසරිය 2008 වර්ෂයට සාපේක්ෂව වැඩිවීමේ ප්‍රතිශතය 101

4.9 පලතුරු ආනයනය (2007-2010) 102

පස්වැනි පරිච්ඡේදය

5.1.1 ගම්මිරිස් නිෂ්පාදනය හා අපනයන පරිමාව 108

5.1.2 ගම්මිරිස් වගාවේ ව්‍යාප්තිය සහ නිෂ්පාදන පරිමාව 108

5.1.3 කුරුඳු නිෂ්පාදනය හා අපනයනය 109

5.2.1 2007-2011 දක්වා කාලය තුළ හදබිම අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ විශේෂ ව්‍යාපෘති 111

5.2.2 2007-2011 විශේෂ ව්‍යපෘති සම්බන්ධ මූල්‍ය ප්‍රගතිය (රු.මි.) 112

5.2.3 අලෙවිකරණ වැඩසටහන 2007-2011 දක්වා මූල්‍ය ප්‍රගතිය 113

5.2.4 කෘෂි අලෙවි වැඩසටහන 2007-2011 මූල්‍ය ප්‍රගතිය 113

5.2.5 මොණරාගල සහ බදුල්ල දිස්ත්‍රික්ක දෙකේ 2007-2011 කාලපරිච්ඡේදය තුළ කුරක්කන්, කව්පි සහ මුං ඇටවල වගා බිම් ප්‍රමාණය සහ අස්වැන්න 117

5.3.1 2009 සහ 2010 වර්ෂවල දී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් 117

5.3.2 පසු අස්වනු තාක්ෂණය සම්බන්ධයෙන් 2011 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් 118

5.3.3 සංවර්ධන ව්‍යාපෘති සඳහා දරන ලද වියදම - 2011 119

5.3.4 ප්ලාස්ටික් ඇසුරුම් 122

5.3.5 ප්ලාස්ටික් ඇසුරුම් ලබාදීමේ දී දරන ලද වියදම් 122

5.4.1 ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා එහි ප්‍රගතිය 129

5.6.1 බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය 'අපි වවමු රට නගමු' වැඩසටහන යටතේ 2008 වර්ෂයේ දී සිදු කළ කාර්යයන් 139

5.6.2 අතිරේක ආහාර බෝග ආනයනය (මෙ.ටො) 140

5.6.3 එක් එක් බෝග සම්බන්ධයෙන් ආනයනය අඩු කිරීමට අපේක්ෂා කරන ලද ප්‍රතිශතය 141

5.6.4 දේශීය නිෂ්පාදනය වැඩි කිරීම 141

හයවැනි පරිච්ඡේදය

6.1 කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන (2008-2011) 146

6.2 භෞතික ප්‍රගතිය 2008 - 2011 147

# ප්‍රස්තාර සටහන්

පිටු අංකය

ප්‍රස්තාර සටහන් අංක 2.1 පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහනේ ඉලක්ක සහ ප්‍රගතිය 35

ප්‍රස්තාර සටහන් අංක 3.1 පුද්ගලික ගෙවතු සංවර්ධන වැඩසටහන 2008-2010 75

ප්‍රස්තාර සටහන් අංක 3.2 පුද්ගලික ගෙවතු වගා වැඩසටහන 2009 76

ප්‍රස්තාර සටහන් අංක 3.3 පුද්ගලික ගෙවතු වගා වැඩසටහන 2010 76

## සාකච්ඡා


| | | | පිටු අංකය |
|---|---|---|---|
| සාකච්ඡා අංක | 5.2.1 | අතිරේක ආහාර බෝග වගා කිරීමේ වැඩසටහන- ශ්‍රී ලංකා හදබිම සංවර්ධන අධිකාරිය, ඌව පළාත | 116 |
| සාකච්ඡා අංක | 5.3.4 | රන් කෙත් සහල් පිටි - අනුරාධපුරය | 125 |
| සාකච්ඡා අංක | 5.3.5 | හිරිපිටියාගම ගෘහස්ථ වී ගබඩා - ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා | 126 |
| සාකච්ඡා අංක | 5.3.6 | වී තැම්බීම- හිඟුරක්ගොඩ, ගන්නෝරුව- සහල් සැකසුම් ගම්මාන වැඩසටහන | 127 |
| සාකච්ඡා අංක | 5.4.2 | උඳු බීජ නිෂ්පාදන වැඩසටහන - ආඬියාගල ගොවිජන සේවා මධ්‍යස්ථානය - කහල්ල | 131 |
| සාකච්ඡා අංක | 5.4.4 | ලොකු ළූණු බීජ නිෂ්පාදනය - ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාව | 132 |
| සාකච්ඡා අංක | 5.4.6 | මුං හා කව්පි වගාව - ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාව | 134 |
| සාකච්ඡා අංක | 5.4.7 | ඒ.අයි. කැකුලන්දර මෙනවිය - පුද්ගල සාකච්ඡා, පලාගල ගොවිජන සේවා මධ්‍යස්ථානය | 135 |
| සාකච්ඡා අංක | 5.4.8 | සරුකෙතයාය වැඩසටහන, අනුරාධපුර දිස්ත්‍රික්කය | 136 |
| සාකච්ඡා අංක | 5.4.9 | ඩී. එඩ්මන්ඩ් මහතා - කෝන්වැව, බිත්තර වී නිෂ්පාදනය | 137 |

## සිද්ධි අධ්‍යයන


| | | | පිටු අංකය |
|---|---|---|---|
| සිද්ධි අධ්‍යයන අංක | 2.1 | පුරන් කුඹුරු අස්වැද්දීම | 68 |
| සිද්ධි අධ්‍යයන අංක | 3.1 | පාසැල් ගෙවතු | 72 |
| සිද්ධි අධ්‍යයන අංක | 4.2 | අන්නාසි වගාව | 104 |
| සිද්ධි අධ්‍යයන අංක | 4.3 | කෙසෙල් වගාව | 105 |
| සිද්ධි අධ්‍යයන අංක | 5.3.2 | චාන්දනී සහල් සැකසුම් මධ්‍යස්ථානය, අනුරාධපුර | 123 |
| සිද්ධි අධ්‍යයන අංක | 5.3.3 | සෙවන පැළ තවාන- අම්පාර | 124 |
| සිද්ධි අධ්‍යයන අංක | 5.4.1 | බීජ වී නිෂ්පාදන වැඩසටහන- මී වැව | 130 |
| සිද්ධි අධ්‍යයන අංක | 5.4.3 | ලොකු ළූණු බීජ නිෂ්පාදනය- ඩී.එම්.ජේ.සී. දිසානායක ආඩියාගල ගොවිජන සේවා මධ්‍යස්ථානය | 131 |
| සිද්ධි අධ්‍යයන අංක | 5.4.5 | ලොකු ළූණු ගබඩා ඉදිකිරීම- ආර්.එම්. ජයතිස්ස කුඩාහල්මිල්ලෑව | 133 |

## පළමුවැනි පරිච්ඡේදය

## "අපි වවමු - රට නගමු" දේශීය ආහාර නිෂ්පාදනය දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම

*"අපි වවමු - රට නගමු" දේශීය ආහාර නිෂ්පාදනය දිරිගැන්වීමේ ජාතික මෙහෙයුමට අදාළ උප වැඩසටහන් පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීමක් ද මෙවැනි ජාතික වැඩසටහනක් 2007/08 මාස් කන්නයේ සිට ශ්‍රී ලංකාවට හඳුන්වාදීමට හේතු වූ පසුබිම හා අපි වවමු - රට නගමු ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන පිළිබඳ කාර්යය සාධනය ඇගයීමේ අධ්‍යයනය පිළිබඳව හැඳින්වීමක් ද මෙම පරිච්ඡේදයේ ඇතුළත් වේ.*

### 1. "අපි වවමු - රට නගමු" දේශීය ආහාර නිෂ්පාදනය දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම

### 1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ආර්ථිකයේ සංයුතිය පිළිබඳව සලකා බලනවිට කෘෂිකර්මාන්ත අංශයට හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි. 2006 වර්ෂයේ ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්ම අංශයේ දායකත්වය 16.5%ක් විය. එයින් 30%ක් ම දායකත්වය ලැබුණේ වී වගා අංශයෙනි. මිලියන 20කට (2006 ජනගහනය මිලියන 20කි.) ආසන්න ජනගහනයෙන් 32%ක් සෘජුව ම කෘෂිකර්මාන්තයේ නියැළෙති. ග්‍රාමීය ජනතාවගෙන් 70%ක් වක්‍රව කෘෂිකර්මාන්තය ආශ්‍රිත රැකියාවලින් යැපේ. දළ වශයෙන් ගත්කළ මේ රටේ ගොවි පවුල් 879,000ක් වී වගාව මත යැපෙන අතර එය රටේ මුළු ජනගහනයෙන් 20% ද ජාතික රැකියා නියුක්තියෙන් 32%ක් ද වේ. ඒ නිසා කෘෂිකර්මාන්තය යනු අප රටෙහි ආර්ථික, සාමාජික, සංස්කෘතික යන සෑම අංශයකම පදනම වේ.

ශ්‍රී ලංකාවේ වී වගාව සඳහා අස්වද්දන ලද හෙක්ටයාර් 807,763ක් ඉඩම් ප්‍රමාණයක් පවතින අතර මෙයින් හෙක්ටයාර් 524,803ක් එනම් 64%ක බිම් ප්‍රමාණයක් මාස් කන්නයේදීත්, හෙක්ටයාර් 282960ක් එනම් 35%ක බිම් ප්‍රමාණයක් යල කන්නයේදීත් වී වගාකරයි (අපි වවමු - රට නගමු 2007).

මහා වාරිමාර්ග, සුළු වාරිමාර්ග හා වර්ෂාපෝෂිත යන ජල සම්පාදන ක්‍රම තුන යටතේ වී වගාව සිදු කරයි. 2005/06 මාස් කන්නයේ දී හෙක්ටයාර් 285,000ක් මහා වාරිමාර්ග යටතේ ද, හෙක්ටයාර් 138,000ක් සුළු වාරිමාර්ග යටතේ ද, හෙක්ටයාර් 162,000ක් වර්ෂාපෝෂිත යටතේ ද වී වගාව සිදු කර තිබුණි. යල කන්නයේ දී මහා වාරිමාර්ග යටතේ හෙක්ටයාර් 220,000ක් ද, සුළු වාරිමාර්ග යටතේ හෙක්ටයාර් 55,000ක් ද, වර්ෂාපෝෂිත යටතේ හෙක්ටයාර් 38,000ක් පමණ ද වගාකර තිබුණි (අපි වවමු- රට නගමු 2007). 1980, 1990

දශකවල දී ස්ථාවර මට්ටමක පැවති ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය හා අස්වැන්න පසුගිය දශකය තුළ යළිත් වැඩිවීමේ ප්‍රවණතාවයක් පෙන්වා ඇත. 1995 වර්ෂයේ දී හෙක්ටයාර් එකකට මෙට්‍රික් ටොන් 3.5ක් වූ ජාතික සාමාන්‍ය අස්වැන්න 2007 වර්ෂය වන විට හෙක්ටයාර් එකකට මෙට්‍රික් ටොන් 4.3ක් දක්වා වැඩි වී ඇත.

"ආහාර ද්‍රව්‍ය සැලකිය යුතු ලෙස ආනයනය කරන ශ්‍රී ලංකාව වැනි රටකට ඇති හොඳම විකල්පය වනුයේ, දේශීය වශයෙන් වගා කළ හැකි ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම ය. මෙරට ජනතාවට අවශ්‍ය සහල් අනෙකුත් ධාන්‍ය, රනිල බෝග, පලතුරු, එළවළු හා අර්තාපල් දේශීය වශයෙන් හැකිතාක් දුරට නිෂ්පාදනය කරගැනීමෙන් මෙරට ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කළ හැකිය. මේ සඳහා සියලු ජනයාගේ කැපවීම, දායකත්වය හැකි සෑම අයුරකින්ම ලබාගැනීම සඳහාත් අප රට තුළ වගාකළ හැකි සෑම බිම් අඟලක්ම ඵලදායී ලෙස ආහාර නිෂ්පාදන ක්‍රියාදාමය උදෙසා යොදාගැනීම සඳහාත් "අපි වවමු - රට නගමු 2007- 2010 දේශීය ආහාර නිෂ්පාදන දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම" ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහනෙහි මූලික අරමුණ වනුයේ සහල්, අනෙකුත් ක්ෂේත්‍ර බෝග පලතුරු සහ එළවළුවලින් මෙරට ස්වයං පෝෂිත කිරිමයි (අපි වවමු- රට නගමු 2007-2010).

එසේ වුව ද, ග්‍රාමීය දිළිඳුභාවය 12%-15% ත් පමණ වන අතර ග්‍රාමීය ප්‍රදේශයන් හි වයස අවුරුදු 5ට අඩු දරුවන්ගෙන් 30%ක් පමණ මන්දපෝෂණයට ලක්ව ඇත. කෘෂිකර්මාන්තය ආර්ථිකයේ ප්‍රධාන අංශයක් වුව ද රටේ ආහාර අවශ්‍යතාවයෙන් 32%ක් පමණ වසරකට ආනයනය කෙරේ. අතිරේක ආහාර බෝග පලතුරු ඇතුළු ආහාර වර්ග ආනයනයට 2006 වසරේ දී රුපියල් බිලියන 49කට ආසන්න මුදලක් වැය කර ඇත.

ශ්‍රී ලංකාවේ ආහාර ආරක්ෂණය සම්බන්ධයෙන් දේශීය හා ජාත්‍යන්තරව පැන නැගෙන අර්බුදකාරී වාතාවරණයන්ගෙන් ආරක්ෂාවීමට ඇති හොඳම විසඳුම වනුයේ රටට අවශ්‍ය ආහාර රට තුළ ම වගාකර ගැනීමයි. වර්තමාන තත්ත්වය වනුයේ දේශීය ආහාර අවශ්‍යතාවයට සරිලන තරම් දේශීය ව ආහාර නිෂ්පාදනය නොකිරීමය.

එමෙන්ම 2007 වසරේ දී ගෝලීය වශයෙන් කෘෂිකර්මාන්තයේ පසුබෑමක් සිදු වූ අතර ඉදිරියේ දී ඇතිවිය හැකි ආර්ථික අවපාතවල බලපෑම අවම කිරීමත් රටේ ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීමටත් දේශීය ආහාර නිෂ්පාදනය වැඩි කිරීමටත් එමඟින් සාර්ව ආර්ථිකයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය වැඩි කිරීමටත් ඉලක්ක කර "අපි වවමු - රට නගමු" තේමාව යටතේ දේශීය ආහාර දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම ආරම්භ කෙරිණි. මෙම වැඩසටහන 2007 වසරේ මහ කන්නයේ සිට 2013 වසර දක්වා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මේ අනුව

2007.09.03 දින ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් "අපි වවමු - රට නගමු වැඩසටහන" ප්‍රකාශයට පත් කරන ලදී.

## 1.2 'අපි වවමු - රට නගමු' වැඩසටහනේ ප්‍රධාන අරමුණු

2007 - 2008 මහ කන්නයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද "අපි වවමු- රට නගමු" ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනේ මූලික අරමුණු, පහත සඳහන් පරිදි ප්‍රකාශයට පත් කර ඇත.

- අත්‍යවශ්‍ය ආහාර බෝගයන් හි දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම.
- ශ්‍රී ලාංකික ජනතාවගේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය තහවුරු කිරීම.
- ජාතික නිෂ්පාදනය සඳහා කෘෂිකර්මාන්තයෙන් සිදු කරන දායකත්වය වැඩි කිරීම.
- රටේ ජනතාවගේ ආහාර පරිභෝජන රටාව සංවර්ධනය කිරීම.
- ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා වැය කරමින් පවතින විදේශීය විනිමය අඩු කිරීම.
- ගොවීන්ගේ ආදායම් වැඩි දියුණු කිරීම.
- ඉදිරි වසර තුන තුළ දී ආහාර බෝග වගාව සඳහා රසායනික පොහොර භාවිතය 25%කින් අඩු කිරීම.
- නව තාක්ෂණ භාවිතය ගොවි ජනතාව තුළ ව්‍යාප්ත කිරීම.
- තරුණ දායකත්වය කෘෂිකර්මාන්තය වෙත වැඩි වැඩියෙන් යොමු කිරීම.
- පරිසර හිතකාමී දේශීය ක්‍රමවේදයන් කෘෂිකර්මාන්තයේ දී භාවිතය ප්‍රචලිත කිරීම.

"අපි වවමු - රට නගමු වැඩසටහන" යටතේ එක් එක් වර්ෂවල ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් පහත සඳහන් ආකාරයට දැක්විය හැකිය.

## 1.3 එක් එක් වර්ෂවල ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන්

### 1.3.1 2008 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන්

මෙම වැඩසටහන යටතේ උක්ත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා 2008 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ වැඩසටහන් පහත සඳහන් පරිදි වේ.

- ගෙවතු වගාව ග්‍රාමීය හා නාගරික ජනතාව අතර ප්‍රචලිත කිරීම.
- පුරන් කුඹුරු අස්වැද්දීම.
- වර්තමානයෙහි අත්‍යවශ්‍ය වූ තෝරාගන්නා ලද බෝග කිහිපයක නිෂ්පාදන තත්ත්වය ඉහළ නැංවීම.
- පසු අස්වනු හානි අවම කිරීම.

- බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.
- කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීම.
- ගොවි ප්‍රජාව ශක්තිමත් කිරීම, දැනුවත් කිරීම, තාක්ෂණ දැනුම නංවාලීම හා උපදෙස් ලබාදීම.

**ග්‍රාමීය හා නාගරික ජනතාව අතර ගෙවතු වගාව ප්‍රචලිත කිරීම**

වසර තුනක් තුළ දී ගෙවතු වගා වැඩසටහනට පවුල් ලක්ෂ 10ක් පමණ යොමු කිරීම ඉලක්ක කර ගෙවතු වගා වැඩසටහන ආරම්භ කර ඇත. මේ යටතේ නාගරික හා ග්‍රාමීය ප්‍රජාව අතර ගෙවතු වගාව ප්‍රචලිත කිරීම හා ගෙවතු වගාව සම්බන්ධව ජනයාගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා මාධ්‍ය හරහා ප්‍රචාරක වැඩසටහන් 'ආරම්භ කර ඇත. ඊට අමතරව අමාත්‍යාංශය යටතේ ඇති සියලු ම ආයතනවල ප්‍රධානීන් සහ සෙසු සේවක කණ්ඩායම් සහභාගීකරවා ගනිමින් "ගමින් ගමට- ගෙයින් ගෙට" නමින් හඳුන්වන ලද වැඩසටහනක් මගින් ග්‍රාමීය මට්ටමේ නිලධාරීන් ද සම්බන්ධ කරගනිමින් ගෙවතු වගාවේ වැදගත්කම පිළිබඳ අවබෝධය වැඩි කිරීමට අපේක්ෂා කර ඇත.

**"අපි වවමු - රට නගමු" වැඩසටහන යටතේ ක්‍රියාත්මක උපවැඩසටහන්**

**පුරන් කුඹුරු අස්වැද්දීම**

ශ්‍රී ලංකාවේ වියළි, අතරමැදි හා තෙත් කලාපයේ අස්වද්දා තිබූ කුඹුරු විශාල ප්‍රමාණයක් විවිධ හේතූන් නිසා වගානොකර පුරන්වීමට ඉඩහැර තිබුණි. මෙම පුරන් කුඹුරු 2007-2010 කාලයේ අක්කර ලක්ෂයක් යළිත් අස්වැද්දීමට ඉලක්ක කර ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීම ද අපේක්ෂාවකි. පසුගිය වසර පහක් තුළ නොකඩවා වගා නොවූ කුඹුරු නැවත වගාවට යොමු කිරීම පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන යටතේ සිදු කෙරේ. 2008 යල කන්නයේ දී හෙක්ටයාර් 2,300ක් සහ 2008/09 මහ කන්නයේ දී හෙක්ටයාර් 4,350ක් වගා කිරීමට අපේක්ෂිතය.

**නැගෙනහිර පළාතේ විශේෂ සංවර්ධන වැඩසටහන මගින් වගානොවී ඇති කුඹුරු ඉඩම් වගාකිරීම**

නැගෙනහිර ප්‍රදේශයේ සාමය ස්ථාපිත වීමත් සමග දැනට වගා නොවී ඇති කුඹුරු ඉඩම් නැවත වගාකිරීම සඳහා ආරක්ෂක අංශ සමග සම්බන්ධීකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමෙන් හෙක්ටයාර් 25,000ක් බිම් ප්‍රමාණයක් වගාකිරීමට අපේක්ෂා කෙරේ.

**දැනට වගාකරන ලද ඉඩම්වල ඵලදායිතාවය නැංවීම**

වියළි හා අන්තර් මධ්‍ය කලාපවල මහා වාරිමාර්ග ඉඩම් ඇතුළුව අනෙක් ඉඩම් හා තෙත් කලාපයේ දැනට වගාවෙන ඉඩම්වල ඵලදායීතාවය නැංවීමට ක්‍රියා කෙරේ. මේ යටතේ ප්‍රධාන වැඩසටහන් දෙකක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

01. වියළි හා අන්තර් මධ්‍ය කලාපවල ඵලදායීතාවය නැංවීමේ වැඩසටහන
02. තෙත් කලාපයේ වී වගාවේ ඵලදායීතාවය නැංවීමේ වැඩසටහන

**තෙත් කලාපයේ වී වගාවේ ඵලදායීතාවය නැංවීමේ වැඩසටහන**

මෙම වැඩසටහන් තුළින් වසර තුනක දී 22.5%ක ඵලදායීතාවයක් නැංවීමට බලාපොරොත්තුවන අතර වර්තමානයේ හෙක්ටයාර් එකක අස්වැන්න වන මෙට්‍රික් ටොන් 4.3ක අස්වැන්න මෙට්‍රික් ටොන් 5.2 දක්වා ඉහළ නැංවීමට බලාපොරොත්තු වේ.

**වියළි හා අන්තර් මධ්‍ය කලාපවල අත්හැරදමා ඇති ඉඩම් වගාකිරීම**

මේ යටතේ වියළි හා අන්තර් මධ්‍ය කලාපවල සුළු වාරිමාර්ග පහසුකම්වල ගැටලු, ආරක්ෂක තත්ත්වය හෝ වන සතුන්ගෙන් වන හානිය වැනි හේතු නිසා අත්හැරදමා ඇති කුඹුරු ඉඩම් වගාකිරීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව මෙම ප්‍රදේශවල ඇති රජයේ ඉඩම් හා ආරක්ෂක අංශවල භාරයේ ඇති ඉඩම් වගාකිරීමට අපේක්ෂා කෙරේ. වසරකට හෙක්ටයාර් 5000ක් පමණ මේ යටතේ වගාකිරීමට අපේක්ෂිත ය.

**තෝරාගන්නා ලද ආහාර බෝග කිහිපයක නිෂ්පාදන තත්ත්වය ඉහළ නැංවීම**

මේ යටතේ වර්තමාන ශ්‍රී ලාංකිකයින්ගේ ආහාර සඳහා අත්‍යවශ්‍ය වූ වෙනත් ආහාර ද්‍රව්‍ය කිහිපයක් තෝරා එම බෝගවල නිෂ්පාදනය වැඩිකිරීමට 2008 වර්ෂය තුළ දී අපේක්ෂා කරන ලදී.

- එම ආහාර බෝග වනුයේ, වී, අතිරේක ආහාර බෝග වශයෙන් සලකනු ලබන බඩඉරිඟු, කුරක්කන්, රතුළූණු, මුං, කව්පි, සෝයා බෝංචි, රටකජු සහ උඳු
- පලතුරු- කෙසෙල්, පැපොල්, අන්නාසි, මිදි, අඹ, දෙළුම්, අලිගැටපේර, මැංගුස් සහ රඹුටන්
- එළවළු- බෝංචි, බටු, බණ්ඩක්කා,දඹල, තක්කාලි, මෑ සහ පලාවර්ග
- අල බෝග- අර්තාපල්, බතල, කිරිඅල
- කුළුබඩු- ඉඟුරු, කහ, කුරුඳු, ගම්මිරිස්, එනසාල් ආදී ආහාර බෝග වේ.

**පසු අස්වනු හානි අවම කිරීම**

වී නිෂ්පාදනයේ දී පසු අස්වනු හානි අවමකර ගුණාත්මක සහල් හා සහල් ආශ්‍රිත ආහාර වර්ග නිෂ්පාදනය මෙම වැඩසටහනේ අරමුණුය. මෙම වැඩසටහන යටතේ පසු අස්වනු හානිය දැනට පවතින 6% සිට 5% දක්වා අඩු කිරීම සහ වී සහල් අනුපාතය 2%කින් වැඩිකිරීමට බලාපොරොත්තු වේ. එයට අමතරව ගොවිපල මට්ටමේ දී වී වියළීම, පිරිසිදු කිරීම හා ගබඩා පහසුකම් දියුණු කිරීම සඳහා මැදිහත්වීම බැංකු ණය සම්බන්ධ කිරීමෙන් සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් 600ක් හා මධ්‍ය පරිමාණ සහල් මෝල් 10ක් නවීකරණය කිරීමට බලාපොරොත්තු විය. ගොවීන් විසින් නිපදවනු ලබන එළවළු පලතුරු වැනි බෝගවල අස්වනු නෙළීමේ සිට පාරිභෝජකයා දක්වා වූ ක්‍රියාවලියේ දී පසු අස්වනු හානිය 30%ක් පමණ වන බව වාර්තා වී ඇත. මෙම හානිය අවම කරගැනීම තුළින් නිපදවනු ලබන මුළු නිෂ්පාදිතය ම පාරිභෝජනය කිරීමට අවස්ථාව සැලසේ. ඒ සඳහා සුදුසු ඇසුරුම් හඳුන්වාදීමට කටයුතු කිරීම අපේක්ෂාව වේ. පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් අස්වනු නාස්තිය අවම කරමින් බෝග ප්‍රවාහනය කිරීම සඳහා ප්ලාස්ටික් ඇසුරුම් හඳුන්වා දී ඇති අතර එය ප්‍රචලිත කිරීම මෙම වැඩසටහන යටතේ සිදු කිරීමට අපේක්ෂා කරන ලදී.

**බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය වැඩි දියුණු කිරීම**

ගොවීන් අතර ගුණාත්මක බිත්තර වී නිෂ්පාදනය ප්‍රචලිත කිරීම සඳහා යොමු වූ වැඩසටහනක් ලෙස මෙය හැඳින්විය හැකිය. බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථාන, පුද්ගලික අංශය, ගොවි ගම්මාන සමුපකාර සමිති යන අදාළ අංශ සහභාගීත්වයෙන් වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන අතර මුළු වගා බිම් ප්‍රමාණයෙන් 20%ක වපසරියක ගුණාත්මක බිත්තර වී භාවිතයක් මෙම වැඩසටහන මගින් බලාපොරොත්තු විය.

ගොවීන් සඳහා අවශ්‍ය පලතුරු, එළවළු හා ක්ෂේත්‍ර බෝගයන් හි බීජ හා වෙනත් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කඩිනම් කර අවශ්‍ය තරම් නිෂ්පාදනය කර ඒවායේ ප්‍රමිතිය ආරක්ෂා කොට අවශ්‍ය අවස්ථාවන්හි දී ගොවිජනතාව වෙත ලබාදීමට මෙම වැඩසටහනින් අපේක්ෂා කර තිබුණි. මෙහි දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පලතුරු බෝග සංවර්ධන ආයතනය හා පෞද්ගලික අංශ එකතු වී මෙම කාර්යයන් ඉටුකිරීමට ද අපේක්ෂා කරන ලදී.

**කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීම**

ශ්‍රී ලාංකික ගොවි ජනතාව පශ්චාත් හරිත විප්ලව සමයේ පටන් රසායනික පොහොර යොදා බෝග වගාකිරීමට පෙළඹ වූ අතර වර්තමානයේ දී එය පරිසර විරෝධී මහජන සෞඛ්‍යයට අහිතකර රටේ විදේශ විනිමය විශාල වශයෙන් වැය කෙරෙන විනාශකාරී කෘෂිකාර්මික

පුරුද්දක් බවට පත් වී ඇත. වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ රසායනික පොහොර ආනයනය සඳහා වසරකට රුපියල් මිලියන 50,000ක් වැය කිරීමට සිදු වී ඇත. තවත් අතකින් වසර ගණනාවක් රසායනික පොහොර භාවිතා කිරීම නිසා ගොවිබිම්වල පෝෂණ තත්ත්ව පිරිහී ඇත. ඒ අනුව මෙම තත්ත්වයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය සඳහා යෝග්‍ය වූ භූමිය සුරක්ෂිත කිරීම හා විදේශීය විනිමය වැයවීම් අඩු කිරීමටත්, පසේ පෝෂණ තත්ත්වය ප්‍රශස්ත මට්ටමකින් පවත්වාගැනීමටත් කාබනික පොහොර භාවිතය ගොවි ජනතාව තුළ ප්‍රචලිත කිරීමටත් මෙම වැඩසටහන තුළින් බලාපොරොත්තු වේ.

**නව දියුණු තාක්ෂණ ක්‍රම ප්‍රචාරණය කිරීම**

පර්යේෂණ මගින් සොයාගෙන ඇති කෙටි කාලීනව ඵලදායීතාවය නැංවීම සඳහා භාවිත කළ හැකි තාක්ෂණයන් ප්‍රචලිත කිරීම මෙම වැඩසටහන මගින් බලාපොරොත්තු වේ. නව වී ප්‍රභේද කුඩා කට්ටල, දෙමුහුන් වී ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් හා අදාළ වගා තාක්ෂණයන් ගොවීන් වෙත ප්‍රචලිත කර එමගින් ඵලදායීතාවය නැංවීමට වැඩසටහන් දියත් කිරීමට බලාපොරොත්තු වේ.

ඉහත විස්තර කළ සියලුම වී වගා සංවර්ධන වැඩසටහන් 2008-2010 තුළ ක්‍රියාත්මක කිරීමෙන් පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කෙරේ.

01. වී ගොවීන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම.
02. සහලින් රට ස්වයං පෝෂිත වීම.
03. තිරිඟු පිටි ආනයනය හා පරිභෝජනය 50%කින් අඩු කිරීම.
04. පාරිභෝගිකයින්ට දැරිය හැකි මිලකට සහල් ලබාදීම.
05. සහල් ඉහළ ගුණාත්මක තත්ත්වයක් කරා ළඟා කරවීම.

**ගොවි ප්‍රජාව ශක්තිමත් කිරීම හා දැනුවත් කිරීම**

දේශීය ආහාර නිෂ්පාදනය දිරිගැන්වීමේ වැඩසටහන පිළිබඳව කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සියලු නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි. ඊට අමතරව රූපවාහිනී සහ ගුවන්විදුලිය යන ජනමාධ්‍ය මඟින් ද ජනතාව කෘෂිකර්මාන්තයට නැඹුරු කිරීමට හා ඔවුන්ගේ කෘෂි දැනුම නංවාලීමට මෙම වැඩසටහන තුළින් බලාපොරොත්තු වේ.

### 1.3.2 2009 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ වැඩසටහන්

"අපි වවමු -රට නගමු" දේශීය ආහාර නිෂ්පාදනය දිරිගැන්වීමේ ජාතික වැඩසටහන" යටතේ 2009 වසර තුළ දී පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරිණි.

- ඒ යටතේ කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම තුළින් රසායනික පොහොර භාවිතය 25%කින් අඩු කිරීමට මෙම වසරේ දී ද අවධානය යොමු කිරීම.
- ගෙවතු වගා පිහිටුවීම සහ ව්‍යාප්ත කිරීම.
- පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන තවදුරටත් මේ වසරේ දී ද ක්‍රියාත්මක කිරීම.
- රැකියා නොමැති උගත් තරුණ පිරිසෙන් කැමති පුද්ගලයන් තෝරා ඔවුන්ට කෘෂිකර්මාන්තය ආශ්‍රිත ස්වයං රැකියා හඳුන්වාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- කෘෂි නිෂ්පාදන අලෙවිය සම්බන්ධයෙන් ගොවි ප්‍රජාවගේ මෙන් ම සිසුන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා වූ කෘෂි නිෂ්පාදන අලෙවිසැලක් හා කෘෂි විද්‍යාපීඨයක් පේරාදෙණියේ පිහිටුවීම.
- රැකියා අපේක්ෂිත උගත් එහෙත් රැකියාවක් නොකරන තරුණ තරුණියන්ගේ අදහස් හා ආකල්ප කෘෂිකර්මාන්තය වෙත නැඹුරු කරවා ඔවුන් පූර්ණ කාලීන කෘෂිකර්මාන්තයෙහි නියුක්ත කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක කිහිපයක ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලදී. ඔවුන්ට අවශ්‍ය ඉඩම් ලබාදීමට ද ඒවා වගාවට සුදුසු ඉඩම් බවට පත් කිරීමට ද මෙම වැඩසටහන තුළින් අපේක්ෂා කෙරිණි.
- එළවළු, පලතුරු හා අතිරේක බෝග සංවර්ධන වැඩසටහන අඛණ්ඩව සිදු කිරීමට අපේක්ෂා කිරීම.
- ගොවීන්, ප්‍රවාහනකරුවන්, තොග වෙළඳුන් හා සිල්ලර වෙළඳුන් අතර ප්ලාස්ටික් ඇසුරුම් ප්‍රචලිත කිරීම ද අඛණ්ඩව සිදු කිරීමට අපේක්ෂා කරන ලදී.

### 1.3.3 2010 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ වැඩසටහන්

2010 වර්ෂය තුළ දී පහත සඳහන් වැඩසටහන් කෙරෙහි වැඩි අවධානය යොමු කිරීමට අපේක්ෂිත විය.

- බෝග විශේෂීකරණ වැඩසටහන
- පසු අස්වනු හානි අවම කිරීම සඳහා ප්ලාස්ටික් ඇසුරුම් ප්‍රචලිත කිරීම.
- පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන
- ගෙවතු වගා ප්‍රවර්ධනය හා කළමනාකරණ වැඩසටහන
- ප්‍රජා මූලික බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන වැඩසටහන

- කෘෂි ක්ෂේත්‍රයේ පූර්ණ කාලීන ගොවීන් වශයෙන් තරුණයන්ගේ දායකත්වය වැඩි දියුණු කිරීම.
- පාසැල් පාදක කෘෂි ඵලදායිතා සංවර්ධන වැඩසටහන
- කෘෂි නවෝදය ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහන
- පළාත් සභා තුළින් කෘෂිකර්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම
- ලොකුළුණු බීජ නිෂ්පාදන වැඩසටහන

### 1.3.4 2011 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ වැඩසටහන්

**පලතුරු බෝග සංවර්ධන වැඩසටහන**

මෙම වැඩසටහන යටතේ දූරියන්, පැපොල්, අන්නාසි, කෙසෙල්, මිදි, අඹ, රඹුටන්, පේර, ස්ට්‍රෝබෙරි සහ පැණි දොඩම් යන පලතුරු බෝග රට පුරා හෙක්ටයාර් 790ක වපසරියක ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරන ලදී. ඊට අමතරව හොරණ ජෛව විවිධත්ව පලතුරු උයනක් පිහිටුවීමේ ව්‍යාපෘතිය යටතේ පවතින භූමියට අමතරව හෙක්ටයාර් 20ක නව ඉඩමක් සංවර්ධනය කිරීම, මව් ශාක නිපදවීම, පවතින පැළ තවාන වැඩි දියුණු කිරීම, නව තවානක් පිහිටුවීම, වැඩි අස්වනු ලබාදෙන දෙමුහුන් පැපොල්, පැෂන්ෆෘට්, අඹ, දූරියන් හා දෙහි ප්‍රභේද නිපදවීමට අපේක්ෂා කර තිබුණි.

**රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන ව්‍යාපෘතිය**

රඹුටන්, දූරියන්, දොඩම්, අඹ, කොස්, ජමනාරං, පෙයාර්ස්, බෙලි, දෙළුම්, කෙසෙල්, අන්නාසි, මිදි, ඩ්‍රැගන් ෆෘට් සහ දෙහි පැළ නිපදවීම හා සෞඛ්‍යාරක්ෂිත ලෙස ඒවා පවත්වාගැනීමට අපේක්ෂා කිරීම හා ඊට අමතරව සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ ආයතනයේ අර්තාපල් බීජ නිෂ්පාදන වැඩසටහන ශක්තිමත් කිරීමට ද අපේක්ෂා කෙරිණි.

**ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය ඉහළ නැංවීම**

රටේ සියලුම පළාත්සභා සහ අන්තර් පළාත් බල ප්‍රදේශයන් හි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලදී. මෙහි දී 50% ගොවි දායකත්වය යටතේ වගා වපසරිය වැඩි කිරීමට අපේක්ෂා කර තිබිණි.

**තුන්වන කන්නයේ බෝගවගා ව්‍යාපෘතිය**

මෙතෙක් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වගා කන්න දෙක වූයේ, යල සහ මහ කන්න දෙකයි. එහෙත් කෘෂි බෝග නිෂ්පාදනයේ ඉහළ පරිමාවක් බලාපොරොත්තු වූ එම කන්න දෙකට අතරමැදිව භූමියේ ඵලදායිතාවය උපරිම ලෙස යොදාගැනීම අරමුණු කරගෙන අතරමැදි කන්නයේ වගා

කිරීම නැමති නව වගා වැඩසටහන් හඳුන්වාදීමට බලාපොරොත්තු විය. මේ යටතේ විශේෂයෙන් ම මුං වගා කිරීමට බලාපොරොත්තු වූ අතර ඊට අමතරව මෙනේරි, කුරක්කන්, එළවළු, කව්පි, රටකජු, උඳු සහ සෝයා බෝංචි එම එක් එක් බෝග වගාව සඳහා සුදුසු වූ පළාත් සහ අන්තර් පළාත් බල ප්‍රදේශවල වගාකිරීමට අපේක්ෂා කෙරිණි.

**රණවිරු සහභාගීත්ව ආහාර බෝග සංවර්ධන ව්‍යාපෘතිය**

මේ යටතේ තෝරාගත් හමුදා කඳවුරුවල හා කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලය හා අනුබද්ධිත ආයතනවල බන්ධනාගාර භූමිවල වගානොකළ ඉඩම් සංවර්ධනය කිරීමටත් ඒවායේ එළවළු පලතුරු හා අතිරේක ආහාර බෝග වගා කිරීමටත් අපේක්ෂා කෙරිණි.

**රජයේ ඉඩම්වල ඵලදායීතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය**

රජයේ ආයතනවලට අයත් විහාල භූමි ප්‍රමාණයක් පවතින අතර එම ඉඩම් ඵලදායී සහ දර්ශනීය ආකාරයකින් පවත්වාගෙන යෑමේ අරමුණින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය සතු භූමිවල බෝග වගාකිරීමේ වැඩසටහනක් ඇරඹීමට අපේක්ෂිත විය.

**ආදර්ශ කෘෂි පාසැල් වැඩසටහන**

පාසැල් සිසුන් අතර නවීන කෘෂි තාක්ෂණික දැනුම ප්‍රචලිත කිරීම හා කෘෂිකර්මය කෙරෙහි තරුණ දායකත්වය වර්ධනය කරගැනීමේ අරමුණින් දිවයිනේ අධ්‍යාපන කලාප 96න් එක පාසලක් බැගින් තෝරාගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරිණි. තෝරාගත් පාසැල් හි තාක්ෂණික පුහුණුව ලබාදීම සඳහා ආරක්ෂිත ගෘහ ස්ථාපනය කිරීම පාංශු සංරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම, නවීන ජල සම්පාදන තාක්ෂණය හඳුන්වාදීම, නාගරික කෘෂිකර්මාන්ත විධික්‍රම හඳුන්වාදීම, භූමි අලංකරණය, මී මැසි පාලනය, කාබනික පොහොර නිෂ්පාදනය ආදී විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ක්‍රියාකාරකම් සැලසුම් කර තිබුණි.

**කෘෂිකර්මාන්තයෙ හි දැනුම හා ආකල්ප වර්ධනය**

කෘෂිකර්මාන්තයෙහි නියැළී සිටින සහ නියැළී නොමැති ප්‍රජාව තුළ කෘෂිකර්මය කෙරෙහි පවතින ආකල්පය ධනාත්මක ආකාරයෙන් වර්ධනය කිරීම සඳහා කෘෂිකාර්මික දැනුම ඉහළ නැංවීමට හේතුවන වැඩසටහන් ගුවන් විදුලිය සහ රූපවාහිනිය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලදී. මේ යටතේ මිහිකත දිනුවෝ, රන් අටුව, ගොවිබිමට අරුණළු යන රූපවාහිනී වැඩසටහන් ද මහගෙදරින් ගොවි ගෙදරට යන ගුවන් විදුලි වැඩසටහන් ද විකාශය කිරීමට නියමිත විය.

**අගය එකතු කළ නිෂ්පාදන සකස් කිරීමේ හා දේශීය ආහාර ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය**

මෙම වැඩසටහන ආහාර ප්‍රවර්ධන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද වැඩසටහනකි. මේ යටතේ අතිරේක ආහාර පැකට් නිපදවීම හා පලතුරු බීම නිපදවීමේ ව්‍යාපෘති ආරම්භ කිරීමට නියමිත විය.

**එළවළු හා අල බෝග සංවර්ධන වැඩසටහන**

දේශීය පාරිභෝජන අවශ්‍යතා සපුරාගැනීම සඳහා එළවළු නිෂ්පාදනය ඉහළ නැංවීම සහ ජනතාවට පහසු මිලට එළවළු ලබාදීම අරමුණු කරගනිමින් පාරම්පරික දේශීය අලවර්ග සහ එළවළු වර්ග වගා කිරීමට මෙම වැඩසටහන යටතේ බලාපොරොත්තු විය.

**තිරසාර පාංශු සංරක්ෂණ හා ඉඩම් සංවර්ධන වැඩසටහන**

පාංශු සංරක්ෂණය සහිත තිරසාර ආකාරයට බෝග වගා කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ මානව සම්පත් සංවර්ධන වැඩසටහනක් වශයෙන් මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කෙරිණි. මේ යටතේ ප්‍රජා නායකත්ව සංවර්ධනය, පාංශු සංරක්ෂණය, කෙටි හා මධ්‍යකාලීන බෝග වගාව හා මානව සම්පත් කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරිණි.

**බීජ නිෂ්පාදන ගම්මාන වැඩසටහන**

බිත්තර වී, අර්තාපල් සහ අතිරේක ආහාර බෝග බීජ හා පලතුරු පැළ නිෂ්පාදනය කිරීමේ ගම්මාන පිහිටුවීමට මෙම වැඩසටහන යටතේ බලාපොරොත්තු විය.

## 1.4 "අපි වවමු රට නගමු වැඩසටහන" ක්‍රියාත්මක කිරීමට පසුබිම් වූ කරුණු

### 1.4.1 ලෝක ජනගහනය වැඩිවීම

දිනෙන් දින ඉහළ යන ලෝක ජනගහනයට සමගාමීව ආහාර අවශ්‍යතාවය ද ඉහළ යයි. ආහාර නිෂ්පාදනය ස්ථාවර තත්ත්වයක පැවතීම හෝ පවතින තත්ත්වයෙනුත් අඩුවීම සිදු වුවහොත් ආහාර හිඟයක් මතු වේ. වසර 2006 වන විට ලෝක ජනගහනය 6,583,961,000ක් වූ අතර මෑත කාලීනව ලෝක ජනගහන සංඛ්‍යා ලේඛන පිරික්සීමේ දී ජනගහනය අඛණ්ඩව වර්ධනය වෙමින් පවතින බව පෙනී යන අතර ශ්‍රී ලංකාව තුළ ද ජනගහන වර්ධනය ශීඝ්‍රයෙන් සිදු වන බව පහත සංඛ්‍යා දත්ත පැහැදිලි කරයි.

වගු අංක 1.1: ලෝක ජනසංඛ්‍යා දත්ත

| වර්ෂය | ලෝකයේ වෙනත් රටවල ජනගහනය (000) | ශ්‍රී ලංකාවේ ජනගහනය (000) |
|---|---|---|
| 2002 | 6276717 | 19134 |
| 2003 | 6553190 | 19370 |
| 2004 | 6429754 | 19611 |
| 2005 | 6506645 | 19843 |
| 2006 | 6583961 | 20062 |

මූලාශ්‍රය: ආහාර හා කෘෂිකර්ම සංවිධානය, 2008

ජනගහන වර්ධනයට සමගාමීව ආහාර නිෂ්පාදනය වැඩි කිරීමට නම් ඒ සඳහා සුදුසු භූමියක් අවශ්‍ය වෙයි. එනම් කෘෂිකාර්මික ඉඩම් අවශ්‍ය වෙයි. ඉඩම් යනු සීමිත සම්පතක් වන අතර වගාවට සුදුසු ඉඩම් යනු තවදුරටත් සීමිතය. එම නිසා පවතින ඉඩම් උපරිම කාර්යක්ෂමතාවයකින් වගාකිරීම හා වගාවට සුදුසු පරිදි සූදානම් කර වගානොකර පුරන් වී ඇති ඉඩම් ද වගාවට යොදා ගත යුතු වෙයි. ජනගහනය වැඩිවීමත් සමග ම සීමිත සම්පත් වන ඉඩම්වල ඒක පුද්ගල පරිභෝජනය සීමා වෙයි. ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල කෘෂිකාර්මික ඉඩම් අයිතිය සීමා වෙමින් පවතින බව පහත සඳහන් දත්ත අනුව පැහැදිලි වේ.

### 1.4.2 ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම්වල ඒක පුද්ගල අයිතිය

ඒක පුද්ගල කෘෂි ඉඩම් අයිතිය සීමාවෙමින් පැවතීම නිසා කෘෂි බෝග නිෂ්පාදනයට යොදාගත හැකි ඉඩම් සීමිතවීම කෘෂි බෝග නිෂ්පාදනය ද සීමා කරයි.

වගු අංක 1.2: ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම්වල ඒක පුද්ගල අයිතිය

| වර්ෂය | ඒකපුද්ගල ඉඩම් අයිතිය (හෙක්) |
|---|---|
| 2000 | 0.12 |
| 2009 | 0.13 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව- 2010

### 1.4.3 පොහොර මිල ඉහළ යාම

කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා යෙදවුම් රාශියක් අවශ්‍ය වේ. පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍ය, බීජ හා යන්ත්‍ර සූත්‍ර ඒවායින් කැපී පෙනේ. අඛණ්ඩව මිල ඉහළ යාම මේවායේ ස්වභාවයයි. පොහොර ආනයනික ද්‍රව්‍යයන් වන අතර පොහොර මිල ජාත්‍යන්තර මට්ටමින් තීරණය වෙයි. පොහොර මිල ද වැඩිවීමේ ප්‍රවණතාවයක් පෙන්වයි.

වගු අංක 1.3: මිශ්‍ර පොහොරවල අලෙවි මිල (මෙට්‍රික් ටොන් එකක් සඳහා)

| වර්ෂය | වී සඳහා පොහොර මිල රුපියල් | | | අතිරේක ආහාර බෝග සඳහා පොහොර මිල රුපියල් | |
|---|---|---|---|---|---|
| | වී මිශ්‍රණය | TDM | TA1130 | අර්තාපල් | මිරිස් |
| 2000 | 17030 | 10570 | 11250 | 15760 | 13880 |
| 2001 | 16800 | 11290 | 13880 | 17380 | 16040 |
| 2002 | 19360 | 15040 | 14780 | 18500 | 17040 |
| 2003 | 20700 | 17840 | 14860 | 19120 | 17420 |
| 2004 | 23520 | 17400 | 19860 | 24320 | 22760 |
| 2005 | 30560 | 20160 | 21580 | 29180 | 25000 |
| 2006 | 29450 | 36060 | 21700 | 27420 | 24100 |
| 2007 | 32800 | 40560 | 23120 | 29580 | 26860 |
| 2008 | 32800 | 40560 | 51600 | 100000 | 70000 |

මූලාශ්‍රය: ජාතික පොහොර ලේකම් කාර්යාලය, 2008

මෙම සියලුම වර්ගවල පොහොරවල ආනයනික මිල ගණන් 2007, 2008 වර්ෂවල කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇත. ඉන්ධන මිල ගණන් ද ඉහළ යාමේ ප්‍රවණතාවයක් දක්නට ඇත. පසුගිය වසර කිහිපය තුළ භූමිතෙල් මිල ගණන් ඉහළ යාම පහත දැක්වෙන සංඛ්‍යා සටහනින් පෙන්වයි.

### 1.4.4 ඉන්ධන මිල ඉහළයාම

ඉන්ධන මිලෙහි දක්නට ඇති ස්වභාවය අඛණ්ඩ වැඩිවීම යි. බිම් සැකසීම, ජලය සැපයීම, අස්වනු නෙළීම සහ සැකසීම, ප්‍රවාහනය සඳහා ඉන්ධන අත්‍යවශ්‍ය සාධකයකි.

වගු අංක 1.4: භූමිතෙල් සිල්ලර මිලෙහි සාමාන්‍ය (ලීටර් එකක මිල රුපියල්)

| වර්ෂය | ලීටර් එකක සිල්ලර මිලෙහි සාමාන්‍ය |
|---|---|
| 2002 | 21.02 |
| 2003 | 25.04 |
| 2004 | 26.52 |
| 2005 | 29.85 |
| 2006 | 42.50 |
| 2007 | 59.85 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, 2008

### 1.4.5 ශ්‍රමය සඳහා ගෙවීම් ඉහළ යාම

කෘෂිකාර්මික බෝග වගා අංශයෙහි විවිධ කාර්යයන් සඳහා වූ ගෙවීම් මිල ඉහළ යාමක් වසරින් වසර දක්නට හැකි වේ. මෙය නිෂ්පාදන මිලට සෘජුව බලපෑම නිසා කෘෂි නිෂ්පාදනවලට අහිතකර ලෙස බලපෑ හැකිය.

වගු අංක 1.5: වී වගා අංශයේ නිෂ්පාදන කාර්යයන් කිහිපයක් සඳහා දෛනික කුලියේ සාමාන්‍ය (2002- 2007)

| කාර්යය | ශ්‍රමික වර්ගය | වර්ෂය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | **2002** | **2003** | **2004** | **2005** | **2006** | **2007** | **2008** |
| සී සෑම | පිරිමි | 291.58 | 313.40 | 348.20 | 384.06 | 429.29 | 509.44 | 628.68 |
| වැපිරීම | පිරිමි | 272.16 | 294.66 | 327.95 | 334.00 | - | - | 529.38 |
| පැළ සිටුවීම | පිරිමි | 264.75 | 285.77 | 304.31 | 324.63 | 354.41 | 405.42 | 508.16 |
| අස්වනු නෙළීම | පිරිමි | 263.96 | 278.82 | 305.84 | 300.00 | 300.00 | - | - |
| | ගැහැණු | 223.96 | 236.27 | 275.71 | 250.00 | - | - | - |
| ගොයම් කැපීම | | 270.65 | 293.73 | 352.16 | 358.00 | 379.41 | 444.36 | 577.20 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, 2008

### 1.4. 6 කෘෂිකාර්මික ද්‍රව්‍ය ආනයනික මිල ගණන් ඉහළයාම

මේ සියලුම හේතු නිසා කෘෂිකාර්මික බෝගයන් හි මිල ගණන් දේශීය මෙන් ම ජාත්‍යන්තර වශයෙන් ද ඉහළ යමින් පවතී. ශ්‍රී ලංකාවේ ඉල්ලුම සපුරාලීමට තරම් කෘෂි බෝග නිෂ්පාදනයක් රට තුළ නොමැති හෙයින් ජාත්‍යන්තරව ආනයනය කිරීමට සිදුව ඇති අතර ඒවායේ මිල උච්චාවචනවලට මුහුණ පෑමට ද සිදු වී ඇත.

**වගු අංක 1.6.1: තෝරාගත් කෘෂි බෝග කිහිපයක ආනයන ප්‍රමාණ සහ මිල ගණන්**

| වර්ෂය | කුරක්කන් | | බඩ ඉරිඟු | | මුං ඇට | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය මෙ.ටො. | වටිනාකම රු.(000) | ප්‍රමාණය මෙ.ටො. | වටිනාකම රු.(000) | ප්‍රමාණය මෙ.ටො. | වටිනාකම රු.(000) |
| 2000 | 552 | 8,932 | 123,112 | 1,163,356 | 6,767 | 172,548 |
| 2001 | 816 | 12,740 | 157,402 | 1,796,104 | 8,717 | 271,434 |
| 2002 | 1134 | 17,368 | 94,595 | 1,206,132 | 7,121 | 223,083 |
| 2003 | 610 | 9,555 | 136,698 | 1,927,730 | 8,181 | 241,893 |
| 2004 | 1829 | 25,587 | 148,866 | 2,518,785 | 12,673 | 402,413 |
| 2005 | 1379 | 18,927 | 146,929 | 2,523,884 | 9,321 | 298,059 |
| 2006 | 1933 | 22,934 | 84,044 | 1,694,952 | 11,495 | 390,423 |

මූලාශ්‍රය: රේගු දෙපාර්තමේන්තුව, 2007

**වගු අංක 1.6.2: කිරිඟු පිටි ආනයනය**

| වර්ෂය | තිරිඟු ඇට | | |
|---|---|---|---|
| | ප්‍රමාණය (මෙ.ටො.) | වටිනාකම ( රුපියල් මිලියන ) | CIF කි. ග්‍රෑ. එකක් (රුපියල්) |
| 2002 | 998124 | 112 | 12.5 |
| 2003 | 999446 | 14 | 14.5 |
| 2004 | 945994 | 18 | 15.8 |
| 2005 | 934624 | 15 | 16.5 |
| 2006 | 1174604 | 20 | 17.4 |

මූලාශ්‍රය: රේගු දෙපාර්තමේන්තුව,2007

දේශීයව නිෂ්පාදනය නොකරන එහෙත් දේශීයව විශාල වශයෙන් පරිභෝජනය කරනු ලබන තිරිඟු පිටි වැනි ආහාර ද්‍රව්‍ය ආනයනය කළ යුතු අතර ඉහළ යන මිල ගණන් යටතේ ඒවා ආනයනය කිරීමට සිදු ව ඇත. එය අවාසි සහගත තත්ත්වය කි.

### 1.4.7 ජාත්‍යන්තර සහල් මිල

පිලිපීනය, තායිලන්තය, ඉන්දියාව යන රටවලත් සහල් ආනයනය කිරීමේ දී එම රටවල් සහල් අපනයන සීමා පැනවීමේ ගැටලුව මෙන්ම මිල ගණන් ඉහළ යාමේ ගැටලුවට ද මුහුණ පෑමට සිදු වී ඇත.

2006/07 වර්ෂය වනවිට ශ්‍රී ලංකාවේ දරිද්‍රතා ප්‍රතිශතය 12.6%ක් විය. 2006 වර්ෂයේ ජනගහනයෙන් 2,287,268ක් (ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම) කෘෂිකර්මය ජීවනෝපාය කරගෙන ජීවත් වූහ. 2002 වර්ෂයේ කෘෂිකර්ම සංගණනයට අනුව වී වගාවේ නිරතව සිටි පුද්ගලයින් සංඛ්‍යාව 897,005ක් රටේ ජනගහනයෙන් 32%ක් විය. තිරිඟුපිටි මිල වැඩිවීමත් තිරිඟු පිටි ආනයනය සීමා වීමත්, පාන් සහ තිරිඟු පිටි ආශ්‍රිත මිල අසීමිත ලෙස වැඩිවීමත් නිසා දේශීය සහල් පරිභෝජනය වැඩි වූ අතර දේශීය නිෂ්පාදනය පරිභෝජන අවශ්‍යතාවයට ප්‍රමාණවත් නොවන තත්ත්වයකට පත්ව ඇත. රටේ පැවති යුද තත්ත්වය නිමාවීම නිසා උතුරු නැගෙනහිර මෙතෙක් වගා නොකරමින් පැවති කුඹුරු ඉඩම් වගාවට යොදා ගැනීමට අවකාශය සැලසීමත් තාක්ෂණයේ දියුණුව කෘෂිකර්ම අංශය වෙතට යොදාගැනීම පුළුල් වෙමින් පැවතීමත් නිසා වී හෙක්ටයාර් එකකින් ලබාගතහැකි අස්වැන්න ඉහළ යමින් පැවතීමත් නිසා වී වගාව ආර්ථිකමය වශයෙන් වාසි සහගත වගාවක් බවට පත්වෙමින් පැවතුණි.

**වගු අංක 1.7: ශ්‍රී ලංකාවේ වී වගාවේ සාමාන්‍ය අස්වැන්න (හෙක්ටයාර් එකක් සඳහා වී කිලෝ ග්‍රෑම්)**

| වර්ෂය | සාමාන්‍ය අස්වැන්න (හෙක්ටයාර් එකක් සඳහා වී කිලෝ ග්‍රෑම්) |
|---|---|
| 2005 | 3963 |
| 2006 | 4137 |
| 2007 | 4386 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2008

තිරිඟු පිටි මිල ඉහළ යාම හා වෙනත් සෞඛ්‍යමය හේතූන් නිසා මෙරට ජනතාව සහල් පරිභෝජනය වැඩි කරමින් සිටී. වසර කිහිපයක සංඛ්‍යා ලේඛන පරීක්ෂා කරන විට ශ්‍රී ලංකාවේ වාර්ෂික ඒකපුද්ගල සහල් පරිභෝජනය ඉහළ යමින් පවතින බව සනාථ වේ.

**වගු අංක 1.8: ශ්‍රී ලංකාවේ වාර්ෂික ඒක පුද්ගල සහල් පරිභෝජනය**

| වර්ෂය | ප්‍රමාණය කි. ග්‍රෑ. |
|---|---|
| 1982 | 101.20 |
| 1987 | 103.60 |
| 1997 | 106.14 |
| 2004 | 106.21 |
| 2007 | 108.00 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, 2008

1997 සිට 2006 දක්වා ඒක පුද්ගල සහල් පරිභෝජනය කිලෝ ග්‍රෑම්106ක් ව පැවති අතර 2007 වර්ෂය වන විට මෙම ප්‍රමාණය කි, ග්‍රෑ.108 දක්වා ඉහළ ගොස් තිබේ. තිරිඟු මිල ඉහළ යාමත් සමග තව දුරටත් සහල් පරිභෝජනය ඉහළ යාමක් සිදුවිය හැක.

### 1.4.8 මෙරට වී නිෂ්පාදනය වැඩිකිරීමට එරෙහිව ඇති ගැටලු

මෙරට වී අස්වැන්න හා නිෂ්පාදනය වැඩි කිරීමට බාධක වශයෙන් ගැටලු කිහිපයක් හඳුනාගෙන ඇත. එම ගැටලු අතර සමාජ ආර්ථිකමය, ප්‍රතිපත්තිමය ගැටලු, කම්කරු හා යන්ත්‍ර සූත්‍ර හිඟය, නව තාක්ෂණයන්ට අනුවර්තනය නොවීම, වී වගානොකර අත්හැරීම, යටිතල පහසුකම් දුර්වලවීම, තාක්ෂණික කරුණු, ආනයනික ගැටලු, ස්වාභාවික සම්පත් සම්බන්ධ ගැටලු, වන සතුන්ගෙන් වන හානිය, යුධමය වාතාවරණය යන කරුණු ප්‍රධාන ය. (දේශීය ආහාර නිෂ්පාදන දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම, 2008)

### 1.4.9 ආහාර ආනයනය

ආහාර ආනයනය සම්බන්ධයෙන් අර්බුද දෙකකට මුහුණ පෑමට මෙරටට සිදු වූ බව පසුගිය අත්දැකීම්වලින් පැහැදිලි වෙයි. ඉන් එකක් වනුයේ ලෝකයේ ආහාර අපනයනය සම්බන්ධව ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ නිසා ආහාර ආනයනය සීමාවීමයි. මේ නිසා ශ්‍රී ලංකාව තුළ ආහාර හිඟයක් ඇතිවීමට පුළුවන. සහල් නිෂ්පාදනය කරන රටවල් අතරින් ඉන්දියාව සහ වියට්නාමය සහල් අපනයනයට සීමාවන් පනවා තිබූ බව පසුගිය කාලය තුළ වාර්තා විය. පිලිපීනය, ඉන්දුනීසියාව වැනි රටවල නිෂ්පාදනය අඩුවීමෙන් සහල් මිල ගණන් ඉහළ ගොස් ඇති බව ද වාර්තා විය. මේ නිසා ලෝක වෙළඳපොලේ සහල් මිල ඉහළ මට්ටමක රැඳී පවතී.

බලශක්ති අර්බුදය නිසා ලෝකයේ දියුණු රටවල් ජෛව ඉන්ධන නිෂ්පාදනය සඳහා පෙළඹී සිටී. මෙම තත්ත්වය සෘජුව ම එවැනි ධාන්‍යවල පමණක් නොව අනෙකුත් ධාන්‍යවල සැපයුම හා මිල ඉහළ යාම කෙරෙහි ද හේතු වේ. ලෝක වෙළඳපළේ බඩ ඉරිඟු මිල ද ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බව පෙනේ.

වගු අංක 1.9: බඩ ඉරිඟු ආනයනික මිල ගණන්

| ඒකකය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|---|
| ප්‍රමාණය (මෙ.ටො.) | 146,929 | 84,044 | 78,758 | 83,195 | 28,034 | 10,506 |
| වටිනාකම (රුපියල් දහස්) | 2,523,884 | 1,694,952 | 2,155,247 | 2,634,178 | 984,528 | 581,557 |

මූලාශ්‍රය: පාරිභෝගික දෙපාර්තමේන්තුව, 2010

### 1.4.10 දේශගුණික තත්ත්වයේ වෙනස්වීම්

රටේ දේශගුණික තත්ත්වයේ වෙනස්වීම් ද බෝග වගාව කෙරෙහි සෘජුව ම බලපායි. වසර ගණනාවක වර්ෂාපතන දත්ත විමසන විට පෙනීයන්නේ වර්ෂාපතනය ක්‍රමයෙන් අඩුවෙමින් පවතින බවයි. වර්ෂාපතනය අඩුවීම කෘෂිකාර්මික නිෂ්පාදනයට අහිතකර ලෙස බලපාන අතර එය කෘෂිකර්මයට සිදුවන අහිතකර බලපෑමක් ලෙස දැක්විය හැකිය.

වගු අංක 1.10 : ශ්‍රී ලංකාවේ වර්ෂාපතන රටාව (මිලි මීටර්)

| වර්ෂා වර්ගය | 1901-1930 | 1931-1960 | 1961-1990 | 1991-2010 |
|---|---|---|---|---|
| නිරිත දිග මෝසම් වර්ෂාව | 529 | 582 | 459 | 459 |
| ඊසාන දිග මෝසම් වර්ෂාව | 548 | 541 | 534 | 470 |
| පළමුවන අන්තර් මෝසම් වර්ෂාව | 268 | 301 | 263 | 243 |
| දෙවන අන්තර් මෝසම් වර්ෂාව | 595 | 571 | 554 | 559 |
| වාර්ෂික වර්ෂාපතනය | 1,936 | 1,993 | 1,813 | 1,714 |

මූලාශ්‍රය: කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,2010

වර්ෂා රටාවේ අඩුවීම, උෂ්ණත්වය ඉහළයාම රටේ ආහාර ආරක්ෂණය සම්බන්ධයෙන් අයහපත් ලෙස බලපායි.

ආහාර ආනයනය මත රඳාපැවතීම රටක ආහාර සම්බන්ධයෙන් අර්බුද ඇති කරයි. ආහාර අර්බුද ඇතිවීම රටේ නොසන්සුන්තාවයන් ඇතිවීමට හේතු වේ. එම නිසා අර්බුදවලින් ආරක්ෂාවීමට ශ්‍රී ලංකාව වැනි කෘෂිකාර්මික රටකට ඇති හොඳම විසඳුම දේශීය වශයෙන් රටට අවශ්‍ය ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමයි.

### 1.4.11 "අපි වවමු රට නගමු වැඩසටහන" දියත් කිරීමේ අවශ්‍යතාවය

මේ අර්බුදයට මුහුණදීමට හැකි ප්‍රශස්තම විසඳුම මේ රටට අවශ්‍ය ආහාර රට තුළ නිෂ්පාදනය කිරීමත් ඒ සඳහා ජනතාවගේ සහභාගීත්වය සහතික කිරීමත් බැවින් ඒ සඳහා වූ වැඩපිළිවෙළක් අවශ්‍ය වන්නේ ය. "අපි වවමු - රට නගමු වැඩසටහන" හඳුන්වාදීමේ දී ඒ බව පිළිබඳව සඳහන් කර ඇත.

"මෙවැනි අර්බුදකාරී තත්ත්වයකින් ආරක්ෂාවීමට ආහාර ද්‍රව්‍ය සැලකිය යුතු ලෙස ආනයනය කරන ශ්‍රී ලංකාව වැනි රටකට ඇති හොඳම විකල්පය වනුයේ, දේශීය වශයෙන් එවැනි ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම යි. විශේෂයෙන් ම මෙරට ජනතාවට අවශ්‍ය සහල්, අනෙකුත් ධාන්‍ය, රනිල බෝග, පලතුරු, එළවළු හා අර්තාපල් දේශීය වශයෙන් හැකිතාක් දුරට නිෂ්පාදනය කර ගැනීමෙන් මෙරට ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කළ හැකිය. මේ සඳහා මෙරට සියලු ජනයාගේ කැපවීම හා දායකත්වය හැකි සෑම අයුරකින් ම ලබාගැනීම සඳහාත් රට තුළ වගා කළ හැකි සෑම බිම් අගලක් ම ඵලදායී ලෙස ආහාර නිෂ්පාදන ක්‍රියාදාමය උදෙසා යොදාගැනීම සඳහාත් "අපි වවමු රට නගමු" 2007 – 2010 දේශීය ආහාර නිෂ්පාදනය දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම ක්‍රියාත්මක කරන ලදි.

මෙම වැඩසටහනේ මූලික අරමුණ වනුයේ සහල්, අනෙකුත් ක්ෂේත්‍ර බෝග, පලතුරු සහ එළවළුවලින් මෙරට ස්වයංපෝෂිත කිරීමයි.

## 1.5 අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ

"අපි වවමු - රට නගමු" වැඩටසහන ඇගයීමේ අධ්‍යයනයේ ප්‍රධානතම අරමුණ වූයේ, මෙම වැඩසටහනේ එක් එක් අංග රටට හා ජනතාවට බලපාන ආකාරය පිළිබඳව උගත් පාඩම් මත මෙවැනි වැඩසටහනක් අනාගතයේ සැලසුම් කිරීමට උපදෙස් ලබාදීම විය.

**අධ්‍යයනයේ විශේෂිත අරමුණු,**

1. වැඩසටහන් කාර්යයන් විමර්ශනය කිරීම, ක්‍රියාකාරිත්වයේ සම්බන්ධිත බව, බලපෑම සහ තිරසාර බව තක්සේරු කිරීම.
2. වැඩසටහනෙන් බලාපොරොත්තු වූ ප්‍රතිඵල සහ බලපෑම හා වැඩසටහනේ ප්‍රතිඵලවලින් සිදුවුණු බලපෑම තක්සේරු කිරීම.
3. ව්‍යාපෘති අරමුණු ළඟාකරගැනීමේ තත්ත්වය අධ්‍යයනය කිරීම.
4. ව්‍යාපෘති අරමුණු ඉටුකරගැනීමේ දී බාධා ඇතිවුණ ප්‍රධාන ගැටලු හඳුනාගැනීම හා මෙම ව්‍යාපෘතියෙන් ලබාගත් අත්දැකීම් හඳුනාගැනීම.
5. විවිධ ශ්‍රේණිවල නිලධාරීන් සහ ගොවීන් එම වැඩසටහනේ සාර්ථකභාවය පිළිබඳ දකින ආකාරය විමර්ශනය කිරීම.
6. අනාගත සැලසුම් අරමුණු සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

### 1.5.1 අධ්‍යයන ක්‍රමවේදය

ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන්, පරිපාලන නිලධාරීන්, සාමාන්‍ය ගොවීන් සහ ගොවි නායකයින් සමඟ සම්මුඛ සාකච්ඡා ආශ්‍රයෙන් තොරතුරු ලබාගන්නා ලදී. මීට අමතරව ද්විතියික දත්ත භාවිතා කරන ලදී. නිලධාරීන්ගෙන් තොරතුරු ලබා ගැනීමේ දී ප්‍රශ්නාවලී ක්‍රමයක් භාවිතා කළ අතර එම තොරතුරු සාමාන්‍ය සංඛ්‍යානමය ක්‍රමවේදයන් මඟින් විශ්ලේෂණය කරන ලදී. දත්ත එක් රැස් කිරීම ත්‍රිකුණාමලය, අනුරාධපුරය, පොළොන්නරුව සහ අම්පාර යන දිස්ත්‍රික්ක ආශ්‍රයෙන් සිදු කරන ලදී.

### 1.5.2 අධ්‍යයනයේ සීමා

අපි වවමු රට නගමු වැඩසටහන යටතේ වැඩසටහන් ගණනාවක් එක් එක් වර්ෂවල දී ක්‍රියාත්මක කර ඇත. එම වැඩසටහන් සියල්ලම මෙම ඇගයුමට ලක් කර නොමැති අතර පහත වැඩසටහන් කිහිපයට පමණක් සීමා කරන ලදී. එනම් පුරන් කුඹුරු අස්වැද්දීම, ගෙවතු වගාව, පලතුරු වගාව, අපනයන බෝග වගාව, පසු අස්වනු තාක්ෂණය හා සම්බන්ධ වැඩසටහන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා පර්යේෂණ ආයතනය විසින් බීජ හා රෝපණ ද්‍රව්‍ය නිපදවීම හා ගොවීන්ට නව තාක්ෂණය ලබාදීම හා සම්බන්ධයෙන් සිදු කරන ලද කාර්යයන් ඇගයුමට ලක් කළ අතර ඊට අමතරව මෙම වැඩසටහන සම්බන්ධයෙන් කෘෂිකර්ම හා පරිපාලන ක්ෂේත්‍රයේ නිලධාරීන් ඉදිරිපත් කළ අදහස්වල සම්පිණ්ඩනයක් ඇතුළත් කරන ලදී.

### 1.5.3 අධ්‍යයනයේ පරිච්ඡේද සංවිධානය

මෙම අධ්‍යයනය පරිච්ඡේද අටකින් සමන්විත වේ. "අපි වවමු- රට නගමු දේශීය ආහාර නිෂ්පාදනය දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම" 2007/2008 මහ කන්නයේ දී ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණු පිළිබඳ විස්තර කිරීම, 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා එක් එක් වර්ෂවල සිදු කිරිමට සැලසුම් කර තිබූ වැඩසටහන් විස්තර කිරිම, මෙම වැඩසටහන් ශ්‍රී ලංකාවේ මෙම වකවානුව තුළ දියත් කිරීමට හේතුකාරක වූ පසුබිම විස්තර කිරීම සහ "අපි වවමු - රට නගමු" වැඩසටහනේ කාර්යසාධනය ඇගයීමේ අධ්‍යයන යෝජනාව හා එහි පරමාර්ථ විස්තර කිරීම සඳහා පළමු වන පරිච්ඡේදය වෙන් කොට තිබේ.

මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද උප වැඩසටහන් වන පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන හා එමඟින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදු වූ බලපෑම් දෙවන පරිච්ඡේදයෙන් ඉදිරිපත් කර ඇත.

ජාතික ගෙවතු වගා වැඩසටහන හා එමඟින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදු වූ බලපෑම හා ලද අත්දැකීම් තුන්වන පරිච්ඡේදය යටතේ දක්වා ඇත.

පලතුරු සංවර්ධන වැඩසටහන හා එහි ක්‍රියාත්මක ක්‍රමවේදය හා ඉන් රටේ ආර්ථිකයට වන බලපෑම හතරවන පරිච්ඡේදයෙන් විස්තර කර ඇත.

අපනයන බෝග සංවර්ධන වැඩසටහන යටතේ ගම්මිරිස් හා කුරුඳු ව්‍යාප්තිය හා ඒවායේ නිෂ්පාදන වර්ධන ක්‍රියාවලිය විස්තර කිරීම, ශ්‍රී ලංකා හදබිම අධිකාරිය විසින් ක්‍රියාවට නැංවූ වැඩසටහන් හා ඒවායින් ගොවි ප්‍රජාවට අත් වූ ප්‍රතිලාභ දැක්වීම, පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් ගොවි ප්‍රජාවගේ ආදායම් වර්ධනය කිරීම හා රැකියා සැපයීම සඳහා ඉටුකරන ලද කාර්යභාරය ඉදිරිපත් කිරීම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු විසින් මෙම වැඩසටහන යටතේ ක්‍රියාවට නඟන ලද බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන හා තාක්ෂණය ගොවීන් වෙත ලබාදීමේ වාහක වැඩසටහන් විස්තර කිරීමට පස්වන පරිච්ඡේදය වෙන් කර ඇත.

කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය, එම වැඩසටහනේ ක්‍රියාත්මක ක්‍රමවේදය එහි අඩු පාඩු, එම අඩු පාඩු අවම කරගැනීමේ ක්‍රමෝපායන් හයවන පරිච්ඡේදය යටතේ සාකච්ඡා කොට ඇත.

"අපි වවමු - රට නගමු වැඩසටහන" සම්බන්ධයෙන් කෘෂිකර්ම හා ගොවිජන ක්ෂේත්‍රයේ සහ පරිපාලන ක්ෂේත්‍රයේ උසස්, මධ්‍යම හා පහළ යන ශ්‍රේණිවලට අයත් නිලධාරීන් සිය අත්දැකීම් ආශ්‍රයෙන් ඉදිරිපත්කරන ලද අදහස් හත්වන පරිච්ඡේදය යටතේ දක්වා ඇත.

මෙම අධ්‍යයනයේ සොයාගැනීම්, අධ්‍යයනයේ නිගමන මෙවැනි ජාතික වැඩසටහනක් අනාගතයේ දී සැලසුම්කර ක්‍රියාවට නැංවීමේ දී සැලකිල්ලට ගත යුතු අංශ පිළිබඳ ඉදිරිපත් කරන නිර්දේශයන් කිහිපයක් අටවන පරිච්ඡේදයෙන් ඉදිරිපත් කර ඇත.

# දෙවන පරිච්ඡේදය

# පුරන් කුඹුරු අස්වැද්දීම

"අපි වවමු - රට නගමු" වැඩසටහනේ එක් උප වැඩසටහනක් වූ පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ සියලුම පළාත්වල පුරන් කුඹුරු අස්වැද්දීමේ ප්‍රමාණයත් මේ සඳහා අනුගමනය කරන ලද ක්‍රියාපිළිවෙත්, මෙම වැඩසටහනේ දී මුහුණ පෑමට සිදු වූ ගැටලු, එය ක්‍රියාත්මක වූ කාලය තුළ රටේ දිස්ත්‍රික්ක 26 හි ක්‍රියාත්මක කිරීමෙන් වී වගා බිම් ප්‍රමාණය වැඩිවීම, සාමාන්‍ය අස්වැන්න ඉහළ යාම හා ලබා ඇති ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු මෙම පරිච්ඡේදයෙහි ඇතුළත් කර ඇත.

## 2.0 පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන

## 2.1 හැඳින්වීම

වී වගාව සඳහා සකස් කරන ලද ඉඩම් වසර පහක් තුළ වගා නොකර අත්හැරදමා තිබේ නම් ඒවා පුරන් කුඹුරු ලෙස හැඳින්වේ. "අපි වවමු - රට නගමු" වැඩසටහනෙහි එක් කාර්යයක් වූයේ පුරන් කුඹුරු යළි වගාවට යොමු කිරීමයි. පුරන් කුඹුරු යළි වගාවට යොමු කිරීම ක්‍රම කිහිපයක් යටතේ සිදු කරන ලදී. ඒවා නම්,

01. පුරන් කුඹුරු යළි වගාකිරීමේ වැදගත්කම ගොවීන්ට අවබෝධ කිරීම මගින් පුරන් කුඹුරු යළි අස්වැද්දීමට ගොවීන් පෙළඹවීම. ගොවිජන සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර මගින් ගොවි ජනතාව දැනුවත් කිරීමෙන් පුරන් කුඹුරු යළිත් වගාවට යොමු කිරීම මෙම ක්‍රමය යටතේ සිදු විය. මෙහි දී ගොවීන්ට අවශ්‍ය බිත්තර වී ලබාදීම, පොහොර සහනාධාර ලබාදීම යන සහන ද ලබාදෙයි.

02. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලවලට ප්‍රතිපාදන ලබා දී ඒ මත විවිධ සානුබලයක් ගොවීන්ට ලබාදෙමින් පුරන් කුඹුරු වගාවට ගොවීන් පෙළඹවීම. මෙම ක්‍රමය යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එක් එක් දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් වෙත ප්‍රතිපාදන ලබාදෙන අතර එම ප්‍රතිපාදන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛවලින් නිකුත් කරනු ලබන උපදෙස් අනුගමනය කරමින් පුරන් කුඹුරු යළි අස්වැද්දීමට පියවර ගෙන තිබුණි (චක්‍රලේඛ අංක 3/2011(1) ඇමුණුමේ දක්වා ඇත).

03. උතුරු නැගෙනහිර යුධමය වාතාවරණය පැවති පෙදෙස්වල විශේෂිත වැඩසටහනක් ලෙස පුරන් කුඹුරු අස්වැද්දීම. උතුරු නැගෙනහිර ප්‍රදේශයේ යුද්ධයෙන් පසුව සාමය ස්ථාපිත වීමත් සමඟ ම දැනට වගා නොකර අත්හැරදමා ඇති කුඹුරු ඉඩම් නැවත වගාකිරීම සඳහා ආරක්ෂක අංශ සමග සම්බන්ධීකරණ වැඩසටහනක් යටතේ ගොවීන්ට අවශ්‍ය ආරක්ෂාව සැපයීම, සහනාධාර පොහොර සැපයීම, බිත්තර වී සැපයීම, ට්‍රැක්ටර් යන්ත්‍ර සූත්‍ර සුලබ කිරීම අපේක්ෂා කරන ලදී. යුධමය වාතාවරණය හේතුවෙන් අවතැන් වූ ගොවීන්ට සහන සැලසීම සඳහා උතුරු නැගෙනහිර ප්‍රදේශවල පැවති පුරන් කුඹුරු වගාකිරීම සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක දේ. ආනි. 2010/1/2 අනුව ක්‍රියාමාර්ග ගැනීම මෙහිදී සිදු වීය.

### 2.1.1 ශ්‍රී ලංකාවේ මුළු කුඹුරු ප්‍රමාණය

ශ්‍රී ලංකාවේ මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය යනුවෙන් දැක්වෙනුයේ අස්වද්දන ලද කුඹුරු ප්‍රමාණයේ සහ පුරන් වී ඇති කුඹුරු ප්‍රමාණයේ එකතුවයි.

### 2.1.2 අස්වද්දන ලද කුඹුරු

ජලය පාලනය කර ගැනීම සඳහා අවශ්‍ය නියරවල් ගොඩනගා වී වගාව සඳහා සකස් කරනු ලැබූ භූමියක් කුඹුරු ඉඩමක් ලෙස හැඳින්වේ (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 1997/1998).

ජල පාලනය සඳහා අවශ්‍ය වැටි සකස්කර වී වගාව වෙනුවෙන් භූමිය සකස්කිරීම කුඹුරු අස්වැද්දීම යනුවෙන් හැඳින්වේ. මෙලෙස සකස්කරන ලද කුඹුරු අස්වැද්දූ කුඹුරු ලෙසින් හඳුන්වනු ලබන අතර එම බිම් අඛණ්ඩව වී වගාකිරීම හෝ අඛණ්ඩව වී වගා නොකිරීම හෝ දීර්ඝ කාලයකින් පසු යළිත් වී වගා කිරීමට හෝ යොදාගත හැකිය. එලෙස අඛණ්ඩව ඍතුමය භේදය අනුව වගාව කරන්නේ නම් ඒවා වගාකරන කුඹුරු ලෙස හැඳින්වේ. නමුත් මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය ලෙස හඳුන්වනුයේ මෙම ආකාර දෙකට ම අයත් කුඹුරු ඉඩම් ය. මෙම අස්වද්දන ලද භූමිය තුළ වී පමණක් ම නොව වෙනත් කන්න බෝගයක් වගා කළ ද එය අස්වැද්දූම් කුඹුරු යන කාණ්ඩයෙන් ඉවත් නොවේ.

### 2.1.3 පුරන් කුඹුරු

හේනක් ලෙසට සකස් කරන ලද බිමක වී වගා කිරීම ගොඩට වී වගාකිරීම කි. එහෙත් කුඹුරෙහි වී වගාකිරීම යනු ඒ වෙනුවෙන්ම සකස් කරන ලද භූමියක වී වගා කිරීම යි. ඒ නිසා කුඹුරක් යනු විශේෂ පරිශ්‍රමයක් දරා වී වගාව වෙනුවෙන් ම සකසන ලද විශේෂිත භූමියකි. මෙම

කුඹුරේ වී වගා කිරීම ශ්‍රී ලංකාවේ කන්න භේදය අනුව සෘතුමය වශයෙන් අඛණ්ඩව සිදුවන්නේනම් මෙම ඒකකය කුඹුර නමින් අඛණ්ඩව ව්‍යවහාර කළ හැකිය. එහෙත් මෙම බිමෙහි වී වගා නොකර අත්හැර තිබෙන තත්ත්වයක් යටතේ මෙය හැඳින්විය හැක්කේ පුරන් කුඹුර එනම්, වගානොකරන කුඹුරු බිම වශයෙනි. එලෙස වී වගාව සඳහා විශේෂයෙන් සකස් කරන ලද කුඹුරු ඉඩම් වගා නොකර දීර්ඝ කාලයක් පවතින විට පුරන් වූ කුඹුර ලෙස ව්‍යවහාර කරනු ලබයි.

යම් කිසි අස්වද්දන ලද කුඹුරු ඉඩමක් වසර 05ක් තිස්සේ ක්‍රමානුකූලව වගා නොකළේ නම් එවැනි කුඹුරක් පුරන් කුඹුරක් ලෙස අර්ථකථනය කරනු ලබයි (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 1997/1998).

### 2.1.4 පුරන් කුඹුරු හඳුනා ගැනීම

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් කුඹුරු සංගණන සිදුකරනු ලබයි. මෙම කුඹුරු සංගණනය සඳහා P1 නැමති පෝරමය තුළින් කුඹුරු පිළිබඳ විස්තර රැස් කරයි. P1 ලේඛනය යනු පසුගිය වර්ෂ 05 තුළ අඛණ්ඩව වගා නොකරන ලද එහෙත් වී වගාව සඳහා අස්වද්දා ඇති බිම් ප්‍රමාණය වාර්තා කිරීමේ ආකෘති පත්‍රය යි. ශ්‍රී ලංකාවේ සියලු ම ග්‍රාම නිලධාරී වසම් ආවරණය වන පරිදි මෙම සංගණනය සිදු කෙරෙනු ඇත. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව අදාළ අස්වැද්දුම් කුඹුරු ප්‍රමාණය පිළිබඳව දත්ත ඉදිරිපත් කිරීමේ දී පසුගිය වසර 05 තුළ වගා නොකරන ලද කුඹුරු ඉඩම් පුරන් කුඹුරු ලෙස සලකා අදාළ අස්වැද්දුම් දත්තවලින් ඉවත් කෙරෙනු ඇත. නමුත් කිසියම් අවස්ථාවක මෙවැනි පුරන් ලෙස නම් කළ කුඹුරු ඉඩමක් නැවත වගාකිරීම ආරම්භ කළහොත් අවුරුදු 05ක කාල සීමාව සැලකීමේ දී නැවත එම ඉඩම් අස්වැද්දූ කුඹුරු ඉඩමක් ලෙස නම් කරනු ලැබේ (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 1997/1998).

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛනවලට අනුව 1960 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ අස්වද්දා තිබූ කුඹුරු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 46,9475කි. මෙම කුඹුරු ප්‍රමාණය මහා වාරිමාර්ග, සුළු වාරිමාර්ග හා වර්ෂා පෝෂිත ඉඩම්වලට අයත් ය. එම ප්‍රමාණය මුළු අස්වද්දන ලද බිම් ප්‍රමාණයෙන් පිළිවෙළින් ප්‍රතිශත ලෙස ගත් විට 28%ක් මහා වාරිමාර්ග, 29%ක් සුළු වාරිමාර්ග හා 43% වර්ෂා පෝෂිත වේ. මෙම අස්වද්දන ලද කුඹුරු බිම් ප්‍රමාණය 1990 වර්ෂය වන විට හෙක්ටයාර් 733,395 දක්වා ඉහළ ගොස් ඇති අතර එය 1960 වර්ෂයට සාපේක්ෂව 56%ක වර්ධනයකි. මෙම ප්‍රමාණය 2002 වර්ෂය වන විට 741,716 දක්වා වැඩි වී ඇති අතර වාර්තා වී ඇති අස්වද්දන ලද කුඹුරු ප්‍රමාණය වේ. නමුත් මෙම වර්ධනයේ විශාල අඩු වීමක් 2003 වර්ෂය වන විට දැකගත හැකි විය. එය හෙක්ටයාර් 691,414කි. එනම්

7%ක අඩු වීමකි. අස්වද්දන ලද කුඹුරු ප්‍රමාණයේ අඩු වීමක් යනු ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අර්ථ දැක්වීමට අනුව වසර 05ක් තිස්සේ එම ඉඩම් ක්‍රමානුකූල ලෙස වගා නොකර තිබීමයි. එනම් එම කුඹුරු පුරන්ව තිබීමයි. ඒ අනුව 2002 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ පුරන් කුඹුරු සමීක්ෂණය P1 ලේඛනය අනුව හෙක්ටයාර් 50,302ක අස්වැද්දුම් කුඹුරු ප්‍රමාණයක් පුරන් කුඹුරු ලෙස අඩු කර ඇත. ශ්‍රී ලංකාවේ අස්වද්දනු ලැබූ කුඹුරුවල විචලතාවය පිළිබඳව සලකා බැලීමේ දී විවිධ හේතු මත කුඹුරු පුරන් වීම නිසා සංඛ්‍යාත්මකව කුඹුරු ඉඩම් ප්‍රමාණය අඩු වීම හා අස්වද්දන ලද ප්‍රමාණය වැඩි වීම යන සිදු වීම් දෙක් ම වී ඇති බව පෙනේ. වගු අංක 2.1 මඟින් පෙන්වන්නේ විවිධ දිස්ත්‍රික්කවල පුරන් වී ඇති කුඹුරු ප්‍රමාණය යි.

**වගු අංක 2.1: ශ්‍රී ලංකාවේ 2002 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා කුඹුරු පුරන් වී ඇති ප්‍රමාණය උතුරු නැගෙනහිර හා අනෙකුත් දිස්ත්‍රික්ක**

| දිස්ත්‍රික්කය<br>උතුරු නැගෙනහිර | ප්‍රමාණය හෙක්ටයාර් | ප්‍රතිශතය |
|---|---|---|
| කිලිනොච්චිය | 14,291 | |
| මන්නාරම | 10,975 | |
| ත්‍රිකුණාමලය | 12,941 | |
| වව්නියාව | 3,690 | |
| **මුළු ප්‍රමාණය** | **41,897** | **83.3** |
| **අනෙකුත් දිස්ත්‍රික්ක** | | |
| අනුරාධපුරය | 2,506 | |
| ගම්පහ | 2,663 | |
| කළුතර | 2,581 | |
| ගාල්ල | 2,260 | |
| මාතර | 2,035 | |
| රත්නපුර | 1,533 | |
| මහනුවර | 1,526 | |
| | **15,104** | **16.7** |

මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, 2010

ඉහත වගුව අනුව උතුරු නැගෙනහිර ප්‍රදේශයේ දිස්ත්‍රික්ක 4ක කුඹුරු පුරන් වී ඇති ප්‍රමාණය හෙක්ටයාර් 41,897කි. මෙය ප්‍රතිශතයක් ලෙස 83%කි. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පෙන්වා දෙන්නේ එම ප්‍රදේශවල පැවති අයහපත් වාතාවරණය මීට හේතුව බවයි. ශ්‍රී ලංකාවේ වෙනත් දිස්ත්‍රික්කවල පුරන් වී ඇති කුඹුරු ප්‍රමාණයට (17%) හේතුන් ලෙස එම දෙපාර්තමේන්තුව දක්වා ඇත්තේ වෙනත් අරමුණු වෙනුවෙන් ඉඩම් යොදා ගැනීම, කරදිය ගැලීම නිසා වගාකළ නොහැකි වීම වැනි හේතුන් ය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන කුඹුරු සංගණයේ දී භාවිතා කරන නිර්ණායකය වන වසර 05ක් එක දිගට වගා නොකර සිටී නම් එවැනි කුඹුරු අස්වද්දන ලද කුඹුරු ප්‍රමාණයෙන් අඩුවන අතර එම පුරන් කුඹුරු යළිත් වගාකළ හොත් අස්වැද්දුම් ගණයට අයත් වේ. එම නිසා වසරින් වසර මෙම අස්වැද්දුම් හා පුරන් කුඹුරු ප්‍රමාණය වෙනස් වේ. මෙම තත්ත්වය මත ශ්‍රී ලංකාවේ පවතින මුළු කුඹුරු ප්‍රමාණය නිශ්චිතව ප්‍රකාශ කිරීම ගැටලු සහගත ය. කුඹුරු ප්‍රමාණය හඳුනා ගැනීම ක්‍රම දෙකක් යටතේ සිදු කළ හැකිය.

I. ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ පුරන් කුඹුරු සමීක්ෂණ දත්ත අනුව

II. ශ්‍රී ලංකාවේ අස්වද්දන ලද වැඩිම කුඹුරු පිළිබඳ සංඛ්‍යා ලේඛන

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 1997/1998 පුරන් කුඹුරු සමීක්ෂණ වාර්තාව අනුව එම වර්ෂයේ අස්වද්දන ලද කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් 732475ක් වන අතර පුරන් කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් 32187කි. එනම් එක දිගට වසර 05ක් වගා නොකළ P1 ලේඛනය අනුව ඉවත් කරන ලද ප්‍රමාණය වේ. 1997/98 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ පැවති මුළු කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් 764662කි. (එනම් 732475 + 32187 = 764662) ශ්‍රී ලංකාවේ මුළු කුඹුරු ප්‍රමාණය හා පුරන් කුඹුරු ප්‍රමාණය 1997/98 වර්ෂ පාදක වර්ෂ ලෙස සලකා ගණනය කරගත හැකි අතර එම තත්ත්වය වගු අංක 2.2 මගින් දක්වා ඇත.

**වගු අංක 2.2: 1997/98 පාදක වර්ෂය ලෙස සලකා ශ්‍රී ලංකාවේ පුරන් කුඹුරු ප්‍රමාණය දැක්වීම**

| වර්ෂය | අස්වද්දන ලද කුඹුරු ප්‍රමාණය හෙක්: | | පුරන් කුඹුරු ප්‍රමාණය හෙක්: | | මුළු කුඹුරු ප්‍රමාණය හෙක්: | |
|---|---|---|---|---|---|---|
| 1997/1998 | 732,475 | 95.7% | 32,187 | 4.3% | 764,662 | 100% |
| 2002 | 741,716 | 96.9% | 22,946 | 3.1% | 764,662 | 100% |
| 2003 | 691,414 | 90.4% | 73,248 | 9.6% | 764,662 | 100% |
| 2006 | 708,738 | 92.7% | 55,924 | 7.3% | 764,662 | 100% |
| 2007 | 711,446 | 93.17% | 52,916 | 6.9% | 764,662 | 100% |
| 2008 | 716,803 | 93.7% | 47,859 | 6.3% | 764,662 | 100% |

මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, 2010

1997/98 පාදක වර්ෂය ලෙස සැලකූ විට රට තුළ පුරන් වී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 55,924කි. මෙම ප්‍රමාණය 2008 වර්ෂය වන විට අඩුවීමක් පෙන්වන අතර එය හෙක්ටයාර් 47,859කි. 2006 වර්ෂය සමඟ සසඳන කළ 2008 වර්ෂයේ පුරන් කුඹුරු ප්‍රමාණය 44% කින් අඩු වී අස්වැද්දූම් ගණයට අයත්ව ඇත. 2008 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ මුළු කුඹුරු ප්‍රමාණයෙන් 93.7%ක් අස්වැද්දූම් හා 6.3%ක් පුරන් කුඹුරු ලෙස පැවතී ඇත.

## 2.2 "අපි වවමු රට නගමු" වැඩසටහන යටතේ පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන

දේශීය ආහාර දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම (2007-2008) යටතේ ක්‍රියාත්මක වූ කැපී පෙනෙන වැඩසටහනක් වූයේ පුරන් කුඹුරු නැවත වගා කිරීමයි. මෙම කාර්යය සාර්ථක කරගැනීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විශාල කාර්යභාරයක් ඉටුකර ඇත. ගොවිජනතාව සමඟ සම්බන්ධතාවය පුළුල් කර ගනිමින් තම නිලධාරී ජාලය මඟින් මෙම වැඩසටහන සාර්ථක කරගැනීමට උත්සාහ දරා ඇත. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පහත සඳහන් අරමුණු සඵල කරගැනීම තුළින් වැඩසටහනෙහි මූලික ඉලක්කය වූ පුරන් කුඹුරු වැඩි ප්‍රමාණයක් අස්වැද්දූ කුඹුරු බවට පත්කර ගැනීමට යත්න දරා ඇත.

### 2.2.1 පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහනෙහි අරමුණු

- තම බල ප්‍රදේශයේ සියලු ම කුඹුරු ඉඩම් ඉදිරි කන්නවලදී වගා කිරීමට ගොවීන් පෙළඹවීම හා පවතින පුරන් කුඹුරු වලින් 30%ක් වගා කිරීමට කටයුතු කිරීම.
- වී වගාවේ දී වර්තමානයේ දී ලබා ගන්නා සාමාන්‍ය අස්වැන්න පෙර කන්නවලට වඩා 10%කින් වැඩි කිරීමට සැලසුම් කර ක්‍රියාවට නැංවීම.
- ජලය අඩු ගොඩ කුඹුරුවල අතිරේක බෝග වගා කිරීමට කටයුතු කිරීම.
- මෙතෙක්වගා නොකළ පුරන් වී ඇති කුඹුරු පරීක්ෂාකර එම ගොවීන් හමුවී නැවත වගා කිරීමට ඔවුන් පෙළඹවීම.

### 2.2.2 පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන සඳහා භාවිතා කරන ලද ක්‍රමෝපායයන්

පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා ගොවීන් ඒ කෙරෙහි පොළඹවා ගැනීම සඳහා ක්‍රමෝපායයන් කිහිපයක් ම භාවිතා කර ඇති බව හෙළිවිය.

කුඹුරේ ස්වභාවය අනුව අයිතිකරු වගා නොකරන්නේ නම්, වගා කිරීමට කැමති ගොවියෙකුට තාවකාලිකව බලපත්‍රයක් මඟින් වගා කිරීමට පැවරීම වැනි ක්‍රියාමාර්ග තුළින් පුරන් කුඹුරු නැවත වගා කරවීමට උත්සහ දරා ඇත. පුරන් කුඹුරු වගාකරන්නන් සඳහා ගොවි බැංකු විශේෂ ණය ක්‍රම හඳුන්වා දී ඇත. පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන යටතේ සෑම පුරන්

කුඹුරක ම වී වගා කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු බව නිර්දේශ කර ඇත. යම් කිසි හේතුවක් නිසා වී වගා කිරීමට හැකියාවක් නොමැතිනම් අනෙකුත් බෝග වගා කිරීමට අවසර ලබා දී ඇත. එපමණක් ද නොව කුඹුරු ගොඩ කිරීමට ලබා දී ඇති අවසරය අහෝසිකර ඇති අතර ජල පහසුකම් සහිතව වගාකිරීමට හැකියාව ඇති සියලු කුඹුරු වගා කිරීමට කටයුතු කරවීම අදාළ බල ප්‍රදේශවල ගොවිජන සංවර්ධන නිලධාරීන්ගේ හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ගේ වගකීම ලෙස දක්වා ඇත.

මෙම ව්‍යාපෘතියේ දී එක් ගොවියෙකු වෙනුවෙන් ලබාදෙන ප්‍රතිලාභ රුපියල් 10,000 නොඉක්මවීමත්, වැඩිම ගොවීන් සංඛ්‍යාවකට ප්‍රතිලාභ ලැබෙන ආකාරයට කුඹුරු යායක් තෝරාගැනීමත්, වෙනත් ව්‍යාපෘති යටතේ ප්‍රතිලාභ ලබන හෝ පෙර දී ලැබූ හෝ ගොවීන්ට අයත් කුඹුරු යායන් තෝරා නොගැනීමත් යන කරුණු සැලකිල්ලට භාජනය කළ යුතු විය.

එක් එක් ගොවීන්ට මුදල් ප්‍රතිපාදන ලබාදීම කිසිදු විටක සිදු නොකළ යුතු බව දන්වා ඇති අතර පුරන් කුඹුරු වගා කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා වල් නාශක, බීජ, උදලුතල වැනි දේ මිලදී ගැනීම්වල දී රජයේ ප්‍රසම්පාදන උපදෙස් අනුගමනය කළ යුතු වීය.

පුරන් කුඹුරු වගා කිරීමේ වැඩසටහන තවදුරටත් ප්‍රචලිත කිරීමේ හා ව්‍යාපෘතියේ විනිවිදභාවය ආරක්ෂා කිරීමේ පියවරක් වශයෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කුඹුරු යායක් තුළ කුඹුරුයායේ නැවත වගාකරන කුඹුරු අක්කර ප්‍රමාණය, වෙන්කර ඇති මුදල, ප්‍රතිලාභී ගොවි පවුල් සංඛ්‍යාව වැනි විස්තර ඇතුළත් පුවරුවක් ද සවි කළ යුතුය.

### 2.2.3 "අපි වවමු - රට නගමු" වැඩසටහන යටතේ පුරන් කුඹුරු වගා කිරීමේ ඉලක්ක

විවිධ හේතු නිසා තෙත් කලාපයේ, වියළි කලාපයේ සහ අන්තර් කලාපයේ කුඹුරු ඉඩම් වගා නොකර අත්හරී. එම ප්‍රමාණ පහත සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

**වගු අංක 2.3: වගා නොකර අත්හරින ඉඩම් ප්‍රමාණය**

| කෘෂි පාරිසරික කලාපය | කන්නය | |
|---|---|---|
| | යල (හෙක්ටයාර්) | මහ (හෙක්ටයාර්) |
| තෙත් කලාපය | 90,000 | 40,000 |
| වියළි හා අන්තර් මාධ්‍ය කලාපය | 340,000 | 168,000 |

මූලාශ්‍රය: අපි වවමු-රට නගමු යෝජිත සැලැස්ම

මෙම වගානොකර අත්හරින ඉඩම්වලින් යම් ඉඩම් ප්‍රමාණයක් වගාකළොත් සාමාන්‍ය වගා කන්නයක දී වගාකරන බිම් ප්‍රමාණයෙන් 75%ක් (හෙක්ටයාර් 2750) පමණ බිම් ප්‍රමාණයක් පහසුවෙන් වගා කිරීමට පුළුවන.

**වගු අංක 2.4: වගා වපසරිය වැඩි කිරීම සඳහා විභව ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර්)**

| වගා වපසරිය | යල කන්නය දැනට වගාකරන ඉඩම් ප්‍රමාණය | වැඩිකළ හැකි ඉඩම් ප්‍රමාණය | මහ කන්නය දැනට වගාකරන ඉඩම් ප්‍රමාණය | වැඩි කළ හැකි අමතර ඉඩම් ප්‍රමාණය | මුළු වැඩිකළහැකි ඉඩම් ප්‍රමාණය | මුළු වැඩි ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| මහාවාරි | 216,156 | 10,807 | 246,602 | 12,330 | 23,137 | 5% |
| සුළු වාරි | 54,277 | 5,427 | 128,604 | 12,860 | 18,227 | 10% |
| වර්ෂාපෝෂිත | 58,315 | 5,831 | 155,040 | 15,504 | 21,335 | 10% |
| මුළු ප්‍රමාණය | 32,749 | 27,049 | 530,246 | 37,520 | 62,750 | 7.5% |

මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

මේ වැඩසටහන යටතේ පසුගිය කන්න 5ක් තුළ නොකඩවා වගානොවූ කුඹුරු නැවත වගාවට යොමු කිරීමට අපේක්ෂා කරයි. මේ වැඩසටහන යටතේ හෙක්ටයාර් 2,300ක් 2008 යල කන්නයේදී ත්, හෙක්ටයාර් 4,350ක් 2008/09 මහ කන්නයේ දීත් වගා කිරීමට අපේක්ෂා කරන ලදී.

### 2.2.4 නැගෙනහිර පළාතේ විශේෂ සංවර්ධන වැඩසටහන මගින් වගා නොවී පවතින ඉඩම් වගා කිරීම.

නැගෙනහිර පළාතේ සාමකාමී වාතාවරණය ස්ථාපිතවීම නිසා දැනට වගානොවී පවතින කුඹුරු ඉඩම් නැවත වගා කිරීම සඳහා ආරක්ෂක අංශ සමග සම්බන්ධීකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් හෙක්ටයාර් 25,000ක් වගා කිරීමට අපේක්ෂා කර තිබුණි.

### 2.2.5 වියළි හා අන්තර් මාධ්‍ය කලාපවල ඇති රජයේ ඉඩම් වගා කිරීම.

වියළි හා අන්තර් මාධ්‍ය කලාපවල සුළු වාර්මාර්ග ගැටලු හා වන සත්ත්ව උවදුරු නිසා වගා නොකර අත්හැර ඇති ඉඩම් වසරකට හෙක්ටයාර් 5000ක් පමණ වගා කිරීමට අපේක්ෂා කරයි.

### 2.2.6 "අපි වවමු- රට නගමු" වැඩසටහන යටතේ නැවත වගාකිරීමට අපේක්ෂිත කුඹුරු ප්‍රමාණය

01. පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන - හෙක්ටයාර් 6650.00
02. නැගෙනහිර පළාත් විශේෂ සංවර්ධන වැඩසටහන - හෙක්ටයාර් 25,000.00
03. වියළි හා අන්තර් මාධ්‍ය කලාපයේ විවිධ ගැටලු නිසා අත්හැරදමා ඇති ඉඩම් (වසරකට හෙක්ටයාර් 5000 බැගින්) 25,000

### 2.2.7 "අපි වවමු - රට නගමු" වැඩසටහන යටතේ වී නිෂ්පාදනය වැඩි කිරීමේ ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය


2006/07 මාස් කන්නයේ සිට 2011 යල කන්නය දක්වා මෙම වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ එක් එක් දිස්ත්‍රික්කවල වගා කිරීමට ඉලක්ක කොට තිබූ පුරන් කුඹුරු ප්‍රමාණයන් සහ ඉලක්ක සපුරා ගැනීමට හැකි වූ ප්‍රමාණයන් වගු අංක 2.5 යටතේ දක්වා ඇත.

අදාළ කාලය තුළ පුරන් කුඹුරු අස්වැද්දීමේ ඉලක්කය වූයේ හෙක්ටයාර් 36,427කි. එහෙත් පුරන් කුඹුරු වගාකිරීමේ වැඩසටහන යටතේ වගා කිරීමට හැකි වී ඇත්තේ හෙක්ටයාර් 25,586කි. ඒ අනුව ජාතික ඉලක්කය සපුරාගැනීම 70%ක් පමණි. වගු අංක 2.5 සහ ප්‍රස්තාර අංක2.1 මගින් පුරන් කුඹුරු අස්වැද්දීමේ ඉලක්ක සහ ප්‍රගතිය දක්වා ඇත.

**වගු අංක 2.5 : පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහනේ ඉලක්ක සහ ප්‍රගතිය**

| වගා කන්නය | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්) | % |
|---|---|---|---|
| 2008/2009 මහ | 13292 | 12498 | 94 |
| 2009 යල | 6624 | 3416 | 52 |
| 2009/2010 මහ | 11583 | 8357 | 72 |
| 2010 යල | 4927 | 1317 | 27 |
| එකතුව | 36,427 | 25,586 | 70 |

මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව




ප්‍රස්තාර අංක 2.1 : පුරන්කුඹුරු අස්වැද්දීමේ වැඩසටහනේ ඉලක්ක සහ ප්‍රගතිය

උතුරු පළාතේ මන්නාරම, වවුනියාව, කිලිනොච්චිය සහ මුලතිව් යන දිස්ත්‍රික්කවල පුරන් කුඹුරු වගා කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වුව ද එය ක්‍රියාත්මක වී ඇත්තේ අපි වවමු - රට නඟමු ප්‍රතිපාදන යටතේ නොව "උතුරු වසන්තය" වැඩසටහන යටතේ ය. අම්පාර දිස්ත්‍රික්කයේ දී ද පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන අසාර්ථක වී ඇති බවට තොරතුරු හෙළි වී ඇත. පුරන් කුඹුරු වගා කරන ලද සියලු දිස්ත්‍රික්කවල 2008/2009 මාස් කන්නයේ දී පුරන් කුඹුරු වගා කිරීමේ ඉලක්කය 94%ක් සපුරාගෙන තිබූ අතර 2009 යල කන්නයේ එම වගා ඉලක්කය සපුරාගෙන තිබුණේ 52%ක් පමණි. එයට හේතුව යල කන්නයේ පැවති ජල හිඟතාවයයි. 2009/2010 මාස් කන්නයේ දී ද මෙම වැඩසටහන අත්කරගෙන තිබූ ප්‍රගතිය 72%ක් වූ අතර 2010 යල කන්නයේ ප්‍රගතිය වූයේ 27%ක් වැනි අඩු ප්‍රමාණයකි. එයටද හේතු වී තිබුණේ ජල හිගයයි.

පුරන් කුඹුරු වගා කිරීමෙ ඉලක්ක සපුරාගැනීමේ ප්‍රගතිය දිස්ත්‍රික්ක වශයෙන් සලකා බලන විට යෝජිත ඉලක්කයෙන් වැඩිම ප්‍රතිශතයක් සපුරාගෙන තිබූ දිස්ත්‍රික්කය වූයේ ත්‍රිකුණාමලය, යාපනය සහ ගම්පහ යන ඒවාය. එම ප්‍රමාණය ත්‍රිකුණාමලය හෙක්ටයාර් 8,128, යාපනය හෙක්ටයාර් 2,787 සහ ගම්පහ 2,517ක් වශයෙනි. ඉලක්කයෙන් 89%ක් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙන් ද, 93% යාපනය දිස්ත්‍රිකකයෙන් ද, 100% ගම්පහ දිස්ත්‍රිකකයෙන් ද සපුරා ගැනීමට හැකි වී ඇති බව ඉහත වගු ආශ්‍රයෙන් හෙළි වේ. පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන යටතේ 2010 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 තුළ පුරන් කුඹුරු අක්කර

9,963 (හෙක්ටයාර් 4,034) නැවත අස්වද්දා ඇත. එයින් ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව 10,822කි. මෙම වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල රුපියල් මිලියන 108.17ක් වන අතර දිස්ත්‍රික්ක 25 සඳහා නිදහස් කරන ලද මුළු මුදල රුපියල් 112.65ක් විය. මෙම කාර්යය සඳහා වූ සත්‍ය වියදම රුපියල් මිලියන 99.9ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 89%කි. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 අතුරින් වැඩි ම පුරන් කුඹුරු ප්‍රමාණයක් අස්වද්දා තිබුණේ ගම්පහ සහ මඩකලපුව දිස්ත්‍රික්කවල ය. එය පිළිවෙළින් අක්කර 1,213 (හෙක්ටයාර් 491) සහ අක්කර 1,438 (හෙක්ටයාර් 582)ක් විය. ගම්පහ දිස්ත්‍රික්කයේ පවුල් 1,737ක් සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ පවුල් 889ක ට ප්‍රතිලාභ ලැබිණි. "අපි වවමු - රට නගමු" ජාතික ආහාර නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන යටතේ පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන යටතේ 2011 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 තුළ පුරන් කුඹුරු නැවත වගා කිරීමේ ව්‍යාපෘති 335ක් ක්‍රියාත්මක කර ඇති අතර එමගින් මෙතෙක් පුරන් වී තිබූ කුඹුරු අක්කර 13,087.75ක් නැවත වගාවට යෙදීමට හැකි වී ඇත. මේ මගින් ප්‍රතිලාභී ගොවීන් සංඛ්‍යාව 12,789කි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික්ක 25 වෙත ලබා දී තිබූ මුදල් ප්‍රමාණය රුපියල් 209.57කි. පොදුවේ ගත්කල, මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය 87%ක් වන අතර වැයකර ඇති මුදල් රුපියල් 181.57කි.

වගු අංක 2.6: 2007 – 2011 කාලපරිච්ඡේදය තුළ වගාකරන ලද පුරන් කුඹුරු අක්කර ප්‍රමාණය (ප්‍රතිපාදන යටතේ)

| දිස්ත්‍රික්කය | 2006 - 2007 මහ කන්නය | 2007 යල කන්නය | 2009/2010 මහ. කන්නය | 2010 යල කන්නය | 2011 මහ කන්නය | එකතුව අක්කර |
|---|---|---|---|---|---|---|
| | අස්වද්දන ලද.අක්කර ප්‍රමාණය | අස්වද්දන ලද අක්කර ප්‍රමාණය | අස්වද්දන ලද අක්කර ප්‍රමාණය | අස්වද්දන ලද අක්කර ප්‍රමාණය | අස්වද්දන ලද අක්කර ප්‍රමාණය | |
| යාපනය | 4848. 24 | - | 1946.00 | 690.00 | 813.00 | 8297.24 |
| මන්නාරම | - | - | 5935.00 | 1350.00 | 1016.00 | 8301.00 |
| වවුනියාව | - | - | 1424.00 | 561.00 | 389.00 | 2374.00 |
| මුලතිව් | - | - | 750.00 | 4415.00 | 441.00 | 5606.00 |
| කිලිනොච්චි | - | - | 750.00 | 5348.00 | 156.00 | 6254.00 |
| මඩකලපුව | - | - | - | 1438.00 | - | 1438.00 |
| අම්පාර | - | - | - | - | 77.00 | 77.00 |
| ත්‍රිකුණාමලය | 1520 | 1950 | - | 361.00 | 795.00 | 4626.00 |
| කුරුණෑගල | 570.35 | 412.50 | - | 277.00 | 637.00 | 1896.00 |
| පුත්තලම | 269.77 | 171.53 | - | 583.00 | 1379.00 | 2403.00 |
| අනුරාධපුර | 243.00 | 48.00 | - | 488.00 | 1157.00 | 1936.00 |
| පොළොන්නරුව | - | - | - | 335.00 | 330.00 | 665.00 |
| බදුල්ල | 81.00 | 41.00 | - | 180.00 | 318.00 | 620.00 |
| මොණරාගල | 77.00 | - | - | 162.00 | 220.00 | 459.00 |
| මාතලේ | 210.95 | 13.75 | - | 107.00 | 100.00 | 431.00 |
| කොළඹ | 3025.00 | 2090.00 | 100.00 | 658.00 | 488.00 | 6361.00 |
| ගම්පහ | 772.25 | 346.00 | 239.00 | 1213.00 | 690.00 | 3260.75 |
| කළුතර | - | 438.00 | 175.00 | 498.00 | 783.00 | 1894.75 |
| මහනුවර | 396.00 | 389.00 | - | 192.00 | 178.00 | 1155.00 |
| නුවරඑළිය | - | - | - | 123.00 | 170.00 | 293.05 |
| ගාල්ල | - | - | 1208.00 | 806.00 | 563.00 | 2577.00 |
| මාතර | 243.00 | 202.30 | 257.00 | 618.00 | 999.25 | 2319.00 |
| රත්නපුර | 264.05 | 598.00 | 150.00 | 180.00 | 796.00 | 1933.55 |
| කෑගල්ල | 213.40 | 172.00 | - | 162.00 | 73 | 536.60 |
| **එකතුව අක්කර** | **12817.01** | **7089.03** | **12934.00** | **20757.00** | **13087.75** | **66684.79** |
| **එකතුව හෙක්ටයාර්** | **5189.0** | **2870.0** | **5236.0** | **8403.6** | **5299.0** | **26997** |

මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, 2011

වගු අංක 2.7: 2007-2010 වගාකරන ලද පුරන් කුඹුරු අක්කර ප්‍රමාණය(ප්‍රතිපාදන රහිතව)

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

| දිස්ත්‍රික්කය | 2008 | | 2009 | | 2010 | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | 2007/08 මහ කන්නය | 2008 යල කන්නය | 2008/09 මහ කන්නය | 2009 යල කන්නය | 2009/10 මහ කන්නය | 2010 යල කන්නය | |
| යාපනය | 1671 | - | 5589 | - | - | - | 7260 |
| මන්නාරම | - | - | - | - | - | - | - |
| වවුනියාව | - | - | 570 | 45 | - | - | 615 |
| මුලතිව් | - | - | - | - | - | - | - |
| කිලිනොච්චි | - | - | - | - | - | - | - |
| මඩකලපුව | - | - | - | - | - | - | - |
| අම්පාර | - | - | - | - | 2566 | - | 2566 |
| ත්‍රිකුණාමලය | 3997 | 827 | 8514 | 1305 | 8165 | 30 | 22838 |
| කුරුණෑගල | 950 | 1140 | 2495 | 793 | 858 | - | 6236 |
| පුත්තලම | 539 | 974 | 1172 | 549 | 1574 | 380 | 5188 |
| අනුරාධපුර | 616 | 132 | 1099 | 90 | 1272 | 90 | 3299 |
| පොළොන්නරුව | - | 21 | - | 200 | 111 | 200 | 532 |
| බදුල්ල | 317 | 54 | 686 | 653 | 47 | - | 1757 |
| මොණරාගල | 49 | - | - | - | - | - | 49 |
| මාතලේ | 379 | 213 | 327 | 47 | 75 | 55 | 1096 |
| කොළඹ | 914 | 395 | 890 | 370 | 533 | - | 3012 |
| ගම්පහ | 1752 | 1163 | 2670 | 2240 | 971 | - | 8796 |
| කළුතර | 2499 | 1552 | 1782 | 538 | 524 | 176 | 7071 |
| මහනුවර | 1164 | 726 | 1367 | 602 | 484 | 217 | 4560 |
| නුවරඑළිය | 671 | 113 | 306 | 28 | 47 | - | 1165 |
| ගාල්ල | - | 3962 | 2303 | 1121 | - | 322 | 7708 |
| මාතර | 536 | 557 | 724 | - | 5 | - | 1822 |
| රත්නපුර | 961 | 1087 | 1197 | 1062 | 1506 | 306 | 6119 |
| කෑගල්ල | 446 | 603 | 514 | 270 | 307 | - | 2140 |
| **එකතුව අක්කර** | **18178** | **13602** | **33060** | **9959** | **19045** | **1776** | **76961** |
| **එකතුව හෙක්ටයාර්** | **7359.5** | **5506.9** | **13384.6** | **4032** | **7710.5** | **719** | **38713** |

මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, 2011

මෙම වැඩසටහන යටතේ 2011 වර්ෂය, තුළ දී කුඹුර අක්කර දහසකට වඩා යළි අස්වද්දා ඇත්තේ පුත්තලම දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 558 (අක්කර 1379), අනුරාධපුර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 468 (අක්කර 1157) ක් වශයෙනි. පුත්තලම දිස්ත්‍රික්යේ අස්වද්දන ලද කුඹුරු හෙක්ටයාර් 558 න් ගොවීන් 1,065ක් සඳහා ප්‍රතිලාභ සැලසුන අතර අනුරාධපුර දිස්ත්‍රික්යේ පවුල් 973ක් ප්‍රතිලාභ ලබන බව හෙළි වී ඇත.

### 2.2.8 ජාතික දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 හි වී වගාවේ ප්‍රගතිය

#### 2.2.8.1 කොළඹ දිස්ත්‍රික්කය - බස්නාහිර පළාත

කොළඹ දිස්ත්‍රික්කයේ වැඩිම කුඹුරු ප්‍රමාණයක් අස්වද්දා ඇති වසර වශයෙන් වාර්තා වී ඇත්තේ 1979 වසර යි. වී වගා අස්වැද්දූම් බිම් ප්‍රමාණය හෙක්ටයාර් 8473කි. වැඩිම කුඹුරු ප්‍රමාණයක් වගාකර ඇති මහ කන්නය හා යල කන්නය ලෙස වාර්තා වී ඇත්තේ පිළිවෙළින් 1979 හෙක්ටයාර් 7270, හා 1981 හෙක්ටයාර් 6247 ලෙසයි. මෙම වැඩසටහන් ඇරඹීමට පෙර 2005/06 මහ කන්නයේ සහ 2006 යල කන්නයේ වී වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර් 4593 හා 2263 කි.

වගු අංක **2.8 :** කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කයේ වී වගා බිම් ප්‍රමාණ (හෙක්ටයාර්)

| දිස්ත්‍රික්කය | කන්නය | 2006/07 | 2007/08 | 2008/09 | 2009/10 | 2010/11 |
|---|---|---|---|---|---|---|
| කොළඹ | මහ | 4422 | 3354 | 3767 | 4506 | 4764 |
| | යල | 480 | 8402 | 3832 | 3615 | 2656 |
| ගම්පහ | මහ | 10173 | 9835 | 8402 | 9360 | 10826 |
| | යල | 3487 | 1158 | 2407 | 7501 | 8106 |
| කළුතර | මහ | 13197 | 12511 | 13476 | 14684 | 15369 |
| | යල | 9759 | 7135 | 12368 | 12872 | 12025 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව,2011

මෙම දත්ත අනුව 2007/2008 යල කන්නයෙන් පසුව කොළඹ දිස්ත්‍රික්කයේ වී වගා බිම් ප්‍රමාණය 2011 සැලකිය යුතු අඩුවීමක් පෙන්වයි.

ගම්පහ දිස්ත්‍රික්කයේ වැඩි ම කුඹුරු ප්‍රමාණයක් අස්වද්දා ඇති වසර ලෙස 1983 වසර වාර්තා වී ඇත. එම ප්‍රමාණය හෙක්ටයාර් 19072 කි. වැඩිම කුඹුරු ප්‍රමාණයක් වගා කළ වසර ලෙස මහ සහ යල කන්නයේ බිම් ප්‍රමාණ පිළිවෙළින් 1983 හෙක්ටයාර් 17,107 හා 1984 යල 12,556

කි. මෙම වැඩසටහන් ඇරඹීමට පෙර වර්ෂ වන 2005/06 මහ කන්නයේ සහ 2006 යල කන්නයේ වී වගා කළ බිම් ප්‍රමාණය පිළිවෙළින් හෙක්ටයාර් 4,593 හා 2,263 ක් විය.

කළුතර දිස්ත්‍රික්කයේ වාර්තා වී ඇති වැඩි ම අස්වැද්දූම් ප්‍රමාණය 1975 වර්ෂයේ වන අතර එය හෙක්ටයාර් 23,043 කි. මාස් කන්නයක දී වැඩි ම වගා බිම් ප්‍රමාණය 1975 වර්ෂයේ දී වාර්තා වන අතර එය හෙක්ටයාර් 21,177 ක් සහ යල කන්නයේ හෙක්ටයාර් 20,463කි.

2005 මාස් කන්නයේ සහ 2006 යල ක්න්නයේ වගා බිම් ප්‍රමාණය පිළිවෙළින් හෙක්ටයාර් 13,642ක් සහ 11479 කි.

**වගු අංක 2.9: කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල සාමාන්‍ය අස්වැන්න (හෙක්ටයාර් 1ට මෙට්‍රික් ටොන්)**

| දිස්ත්‍රික්කය | කන්නය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|---|
| කොළඹ | මහ | 3.2 | 3.2 | 3.0 | 3.5 | 3.5 | 3.5 | 2.7 |
| | යල | 2.4 | 2.5 | 3.3 | 3.1 | 3.0 | 3.2 | 3.1 |
| | සාමාන්‍ය අස්වැන්න | 2.9 | 3.2 | 3.0 | 3.3 | 3.3 | 3.3 | 2.8 |
| ගම්පහ | මහ | 3.4 | 3.8 | 3.1 | 3.4 | 3.3 | 3.4 | 3.0 |
| | යල | 2.7 | 2.6 | 3.6 | 3.2 | 3.3 | 3.6 | 3.5 |
| | සාමාන්‍ය අස්වැන්න | 3.2 | 3.5 | 3.2 | 3.3 | 3.3 | 3.5 | 3.2 |
| කළුතර | මහ | 2.8 | 2.8 | 3.1 | 2.8 | 3.1 | 3.2 | 2.9 |
| | යල | 2.3 | 2.6 | 3.0 | 2.7 | 2.8 | 2.6 | 2.6 |
| | සාමාන්‍ය අස්වැන්න | 2.6 | 2.7 | 3.1 | 2.8 | 3.0 | 2.9 | 2.7 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2011

කොළඹ දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අස්වැන්න 2008 වර්ෂයේ දී සුළු වශයෙන් වර්ධනය වී ඉන් පසුව ස්ථාවර වී ඇත. ගම්පහ දිස්ත්‍රික්කයේ සාමාන්‍ය වී අස්වැන්න 2007 න් පසු කැපී පෙනෙන ඉහළ යාමක් දක්නට නැති අතර කළුතර දිස්ත්‍රික්කයේ අඩු අස්වැන්නක් ලැබෙන බව පැහැදිලි වන අතර එම සාමාන්‍ය අස්වැන්න ද වර්ෂයක් පාසා විචලනය වී ඇති බව පෙනේ.

### 2.2.8.2 ගාල්ල දිස්ත්‍රික්කය - දකුණු පළාත

ගාල්ල දිස්ත්‍රික්කයේ වැඩි ම කුඹුරු ප්‍රමාණයක් අස්වද්දන ලද වර්ෂය හා ප්‍රමාණය පිළිවෙළින් 1985 වර්ෂය වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 24070කි. මාස් කන්නයක දී වැඩි ම වී වගා කළ වර්ෂය 1977 වන අතර බිම් ප්‍රමාණය හෙක්ටයාර් 23639කි. යල කන්නයක දී වැඩියෙන් ම වී වගා කළ වර්ෂය 1975 වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 23,720කි. "අපි වවමු-රට නගමු" වැඩසටහන ඇරඹීමට පෙර වසර වන 2005/06 මාස් කන්නයේ වී වගා කළ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 13642ක් හා යල කන්නයේ එය 11,479කි.

**වගු අංක 2.10: ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්කවල වී වගා බිම් ප්‍රමාණ (හෙක්ටයාර්)**

| දිස්ත්‍රික්කය | කන්නය | 2006/07 | 2007/08 | 2008/09 | 2009/10 | 2010/11 |
|---|---|---|---|---|---|---|
| ගාල්ල | මහ | 14,104 | 12,395 | 14,679 | 15,930 | 17,156 |
| | යල | 4,912 | 5,871 | 14,130 | 13,120 | 11,732 |
| මාතර | මහ | 13,176 | 14,865 | 16,171 | 15,908 | 15,803 |
| | යල | 13,345 | 15,975 | 15,722 | 15,574 | - |
| හම්බන්තොට | මහ | 19,881 | 13,176 | 13,345 | 14,865 | 15,975 |
| | යල | 16,448 | 22,320 | 20,925 | 24,234 | 24,500 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව,2011

මාතර දිස්ත්‍රික්කයේ වැඩි ම කුඹුරු අස්වැද්දූම් බිම් ප්‍රමාණය වාර්තා වී ඇත්තේ 1985 වර්ෂයේ වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 21,352කි. මාස් කන්නයක දී වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා කර ඇත්තේ 1977 වර්ෂයේ වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 29,156කි. යල කන්නයක දී වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා කර ඇත්තේ 1977 වර්ෂයේ වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 19,730කි. 2005/06 මාස් කන්නයේ වගා කළ කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් 14,782කි. 2006 යල කන්නයේ වගා කළ ප්‍රමාණය හෙක්ටයාර් 11,443කි.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ වැඩි ම අස්වැද්දූම් කුඹුරු ප්‍රමාණයක් පැවති වසර 1991 වන අතර වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් 26,817කි. වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා කළ මහ කන්නය ලෙස හඳුනාගත හැක්කේ 1998 වසර වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 24,648කි. වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා කළ යල කන්නය 2000 වසර වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 21,286කි. 2005/06 මාස් කන්නයේ වී වගා ප්‍රමාණය හෙක්ටයාර් 19066ක් වන අතර 2006 යල කන්නයේ වී වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් 16,633කි.

වගු අංක 2.11: ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්කවල සාමාන්‍ය අස්වැන්න (හෙක්ටයාර් 1ට මෙට්‍රික් ටොන්)

| දිස්ත්‍රික්කය | කන්නය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|---|
| ගාල්ල | මහ | 3.7 | 3.4 | 3.4 | 3.1 | 3.0 | 3.2 | 2.9 |
| | යල | 2.7 | 2.7 | 3.2 | 3.6 | 2.9 | 2.9 | 2.9 |
| | සාමාන්‍ය අස්වැන්න | 3.3 | 3.2 | 3.3 | 3.1 | 3.0 | 3.0 | 2.9 |
| මාතර | මහ | 3.7 | 4.0 | 3.6 | 3.8 | 3.6 | 3.6 | 3.4 |
| | යල | 3.2 | 3.5 | 3.7 | 3.7 | 3.6 | 3.4 | 3.4 |
| | සාමාන්‍ය අස්වැන්න | 3.5 | 3.8 | 3.7 | 3.8 | 3.6 | 3.5 | 3.4 |
| හම්බන්තොට | මහ | 4.4 | 5.0 | 5.2 | 4.7 | 5.2 | 5.1 | 5.7 |
| | යල | 4.1 | 4.4 | 4.9 | 4.7 | 5.0 | 5.1 | 5.1 |
| | සාමාන්‍ය අස්වැන්න | 4.3 | 4.7 | 5.0 | 4.7 | 5.1 | 5.1 | 5.5 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2011

ගාල්ල දිස්ත්‍රික්කයෙහි සාමාන්‍ය අස්වැන්නෙහි වර්ධනයක් සිදු වී නොමැති බව ද සාමාන්‍ය අස්වැන්න පරීක්ෂා කරන විට යන අතර මාතර දිස්ත්‍රික්කයේ "අපි වවමු- රට නගමු" වැඩසටහන ක්‍රියාත්මක වූ අවදියේ දී වී වගාවේ සාමාන්‍ය අස්වැන්න පිළිබඳව විමසීමේ දී පෙනීයන්නේ එය සුළු උච්චාවචනයකට ලක් වී තිබුණත් යම් කිසි ප්‍රගතියක් පෙන්වන බවයි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අස්වැන්න උසස් මට්ටමක පවත්වාගෙන ගොස් ඇති බව පෙනේ.

### 2.2.8.3 පුත්තලම දිස්ත්‍රික්කය - වයඹ පළාත

මෙම දිස්ත්‍රික්කයේ වැඩි ම කුඹුරු ප්‍රමාණයක් අස්වද්දා ඇති වර්ෂය ලෙස 1989 වර්ෂය යි. බිම් ප්‍රමාණය හෙක්ටයාර් 20044කි. මහ කන්නයක දී වැඩිම කුඹුරු ප්‍රමාණයක් වගා කර ඇති වර්ෂය ලෙස 2003 වර්ෂය වාර්තා වන අතර බිම් ප්‍රමාණය හෙක්ටයාර් 15,943කි. යල කන්නයක දී වැඩිම කුඹුරු ප්‍රමාණයක් අස්වද්දා ඇති වර්ෂය ලෙස 2003 වර්ෂය වාර්තා වන අතර වගා කළ කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් 11,693කි. 2005/06 මහ කන්නයේ වගා කළ කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් 10,561කි. 2006 යල කන්නයේ වගා කළ කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් 5,927කි.

වගු අංක 2.12: පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල වී වගා බිම් ප්‍රමාණ (හෙක්ටයාර්)

| දිස්ත්‍රික්කය | කන්නය | 2006/07 | 2007/08 | 2008/09 | 2009/10 | 2010/11 |
|---|---|---|---|---|---|---|
| පුත්තලම | මහ | 11,360 | 12,579 | 12,284 | 19,680 | 14,415 |
| | යල | 6,781 | 5,320 | 14,484 | 15,298 | 10,576 |
| කුරුණෑගල | මහ | 73,331 | 71,731 | 75,351 | 77,291 | 68.758 |
| | යල | 35,093 | 28,729 | 68,912 | 48,916 | 56,682 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2011

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩි ම වී වගා අස්වැද්දූම් ප්‍රමාණයක් වාර්තා වී ඇති වසර වනුයේ 1991 වර්ෂය වන අතර අස්වැද්දූම් ප්‍රමාණය හෙක්ටයාර් 77,962කි. මාස් කන්නයක වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ 2003 මාස් කන්නයේ වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 75,721කි. යල කන්නයේ වැඩි ම කුඹුරු හෙක්ටයාර් ප්‍රමාණයක් වගා කළ වර්ෂය ලෙස වාර්තා වී ඇත්තේ 1984 වර්ෂය වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 61,234කි. වැඩසටහන ඇරඹීමට පෙර මාස් කන්නය වූ 2005/06 මාස් කන්නයේ වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් 61,421කි.

වගු අංක 2.13: පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල සාමාන්‍ය අස්වැන්න (හෙක්ටයාර් 1ට මෙට්‍රික් ටොන්)

| දිස්ත්‍රික්කය | කන්නය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|---|
| පුත්තලම | මහ | 3.7 | 3.4 | 3.9 | 3.8 | 3.9 | 3.9 | 3.6 |
| | යල | 3.4 | 3.6 | 4.1 | 3.7 | 3.6 | 3.5 | 3.4 |
| | සාමාන්‍ය අස්වැන්න | 3.5 | 3.5 | 4.0 | 3.7 | 3.8 | 3.8 | 3.7 |
| කුරුණෑගල | මහ | 3.4 | 3.6 | 4.0 | 3.8 | 3.9 | 4.0 | 3.3 |
| | යල | 2.9 | 3.6 | 3.7 | 3.1 | 3.5 | 3.9 | 3.9 |
| | සාමාන්‍ය අස්වැන්න | 3.2 | 3.6 | 3.9 | 3.5 | 3.7 | 4.0 | 3.5 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2011

පුත්තලම දිස්ත්‍රික්කයේ මහ සහ යල කන්න දෙකේ ම සාමාන්‍ය අස්වැන්න සුළු ප්‍රමාණයක ඉහළ යාමක් දක්නට හැකි වේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් එකකට මෙට්‍රික් ටොන් 4.3ක අපේක්ෂිත ආකාරයේ සාමාන්‍ය අස්වැන්නක් තවමත් ලැබී නොමැති බව පෙනෙන නමුත් අස්වැන්නෙහි සුළු වැඩිවීමක් පමණක් දක්නට ලැබුණි.

### 2.2.8.4 කැගල්ල දිස්ත්‍රික්කය - සබරගමුව පළාත

කැගල්ල දිස්ත්‍රික්කයේ වැඩි ම කුඹුරු ප්‍රමාණයක් අස්වැද්දූ වර්ෂය ලෙස වාර්තා වී ඇත්තේ 1990 වර්ෂයයි. මෙම වර්ෂයේ දී කුඹුරු හෙක්ටයාර් 11,272ක් අස්වද්දා ඇත. වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා කළ මාස් කන්නය ලෙස වාර්තා වී ඇත්තේ 1982 වර්ෂය වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 11189කි. වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා කළ යල කන්නය ලෙස වාර්තා වී ඇත්තේ 1985 වර්ෂය වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 11,004කි. "අපි වවමු- රට නගමු" වැඩසටහන ඇරඹීමට පෙර මාස් කන්නය වූ 2005/06 මාස් කන්නයේ වගාකළ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 8922ක් වූ අතර යලට වගා කළ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 7,774කි. එම ප්‍රමාණය වැඩි ම බිම් ප්‍රමාණයක් වගා කළ වර්ෂයට සාපේක්ෂව හෙක්ටයාර් 2,267ක අඩුවීමකි. වැඩි ම කුඹුරු වගා කළ යලට සාපේක්ෂව හෙක්ටයාර් 3,230ක අඩුවීමකි.

**වගු අංක 2.14: කැගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්කවල වී වගා බිම් ප්‍රමාණ (හෙක්ටයාර්)**

| දිස්ත්‍රික්කය | කන්නය | 2006/07 | 2007/08 | 2008/09 | 2009/10 | 2010/11 |
|---|---|---|---|---|---|---|
| කැගල්ල | මහ | 8,777 | 8,233 | 7,486 | 8,179 | 8,337 |
| | යල | 5,471 | 5,159 | 7,431 | 7,617 | 7,216 |
| රත්නපුර | මහ | 12,219 | 11,136 | 12,025 | 12,995 | 13,485 |
| | යල | 9,520 | 7,437 | 11,331 | 11,978 | 11,463 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව,2011

රත්නපුර දිස්ත්‍රික්කයේ මෙතෙක් වගා කර ඇති ඉහළ ම අස්වැද්දූම් ප්‍රමාණය ලෙස වාර්තා වී ඇත්තේ 1983 වර්ෂයේ හෙක්ටයාර් 18,722ක් ලෙසිණි. මෙම දිස්ත්‍රික්කයේ මාස් කන්නයක දී වැඩි ම වී වගා බිම් ප්‍රමාණයක් වාර්තා වී ඇති මාස් කන්නය 1990 මහ කන්නය වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 18,785කි. මෙතෙක් වාර්තා වී ඇති වැඩි ම වී වගා ප්‍රමාණයක් සහිත යල කන්නය 1991 වසරේ යල කන්නය වන අතර එම ප්‍රමාණය හෙක්ටයාර් 13,791කි. "අපි වවමු - රට නගමු" වැඩසටහන ඇරඹීමට පෙර මහ කන්නය වූ 2005/06 මහ කන්නයේ වී වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් 12,418කි. යල කන්නයේ බිම් ප්‍රමාණය හෙක්ටායාර් 10,375කි. වැඩි ම වී වගා බිම් ප්‍රමාණයක් පැවති මහ කන්නය වූ 1990 මහ කන්නය සමග සසඳන විට මෙම බිම් ප්‍රමාණය හෙක්ටයාර් 6,367කින් පහළ බැස ඇති අතර වැඩි ම වී වගා බිම් ප්‍රමාණය පැවති යල කන්නය වූ 1991 යල කන්නය සමඟ සසඳන විට හෙක්ටයාර් 3,416කින් අඩුවීමක් පෙන්වයි. මෙය කැපී පෙනෙන අඩුවීමකි. ඉන් පසුව 2006/07 වර්ෂයේ "අපි වවමු- රට නගමු" වැඩසටහන ක්‍රියාත්මක වූ අතර 2006/07 මාස් කන්නයේ සිට 2011 යල කන්නය දක්වා වී

වගා බිම් ප්‍රමාණය පිළිබඳව පරීක්ෂා කිරීමෙන් මෙම විශේෂ වැඩසටහන පිළිබඳව අවබෝධයක් ලබාගත හැකිය.

ඉහත සංඛ්‍යා සටහන පරීක්ෂා කරන විට පෙනී යන්නේ 2005/06 මාස් කන්නයේ වගා කළ බිම් ප්‍රමාණයවත් වගාකර ගැනීමට 2010/11 මහ කන්නයට නොහැකි වී ඇති බවයි. එසේ නමුත් 2006/07 යල කන්නයට සාපේක්ෂව 2010/11 යල කන්නයේ වගා බිම් ප්‍රමාණයේ වර්ධනයක් පෙන්නුම් කරන අතර රත්නපුර දිස්ත්‍රික්කයේ 2005/06 මාස් කන්නයේ හා යල කන්නයේ වී වගාව පැවති තත්ත්වයට වඩා ඉදිරියට පැමිණීමට 2011 මහ සහ යල කන්නයේ දී හැකියාව ලැබී ඇත. සුළු ප්‍රගතියක් පෙන්වා ඇති බව ද පෙනේ.

**වගු අංක 2.15: කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්කවල සාමාන්‍ය අස්වැන්න (හෙක්ටයාර් එකට මෙ.ටො.)**

| දිස්ත්‍රික්කය | කන්නය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|---|
| කෑගල්ල | මහ | 3.403 | 4.032 | 3.143 | 3.749 | 3.721 | 3.791 | 2.993 |
| | යල | 3.078 | 3.130 | 3.291 | 3.323 | 3.374 | 2.846 | 2.833 |
| | සාමාන්‍ය අස්වැන්න | 3.252 | 3.686 | 3.199 | 3.532 | 3.552 | 3.353 | 3.5 |
| රත්නපුර | මහ | 3.0 | 3.0 | 3.3 | 3.3 | 3.4 | 3.3 | 3.5 |
| | යල | 3.0 | 3.3 | 3.9 | 3.5 | 3.2 | 3.2 | 3.3 |
| | සාමාන්‍ය අස්වැන්න | 3.0 | 3.1 | 3.3 | 3.4 | 3.3 | 3.3 | 3.4 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව,2011

කෑගල්ල දිස්ත්‍රික්කයේ අස්වැන්නද සතුටුදායක මට්ටමකට ළඟා වී නොමැති බව පෙනෙන අතර රත්නපුර දිස්ත්‍රික්කයේ අස්වැන්න ද ප්‍රශස්ත නොවූවත් සුළු වැඩිවීමක් පමණක් අත්කරගෙන ඇති අතර එය ස්ථාවර ලෙස තබාගැනීමට සමත් වී ඇති බව පෙනේ.

**2.2.8.5 මහනුවර දිස්ත්‍රික්කය - මධ්‍යම පළාත**

මහනුවර දිස්ත්‍රික්කයේ වැඩි ම කුඹුරු ප්‍රමාණයක් අස්වද්දන ලද වර්ෂය ලෙස වාර්තා වී ඇත්තේ 1981 වන අතර අස්වැද්දූ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 22,718කි. මෙම දිස්ත්‍රික්කයේ වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා කළ මහ කන්නය ලෙස වාර්තා වී ඇත්තේ 1980 මහ කන්නය වන අතර වගා කළ ප්‍රමාණය හෙක්ටයාර් 22,423කි. වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා කරන ලද යල කන්නය ලෙස වාර්තා වී ඇත්තේ 1974 යල කන්නය වන අතර වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් 17,949කි. "අපි වවමු - රට නගමු" වැඩසටහන ක්‍රියාත්මක කිරීමට පෙර කන්නය වූ 2005/06 මාස් කන්නයේ මෙහි වගා කළ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 13,562ක් වූ අතර 2006 යල කන්නයේ වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් 8,852කි. වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා කළ මාස් කන්නය වූ 1980 මහ සමඟ සසඳන විට හෙක්ටයාර් 8,861ක් අඩුවී ඇති බව පෙනෙන අතර වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා කළ යල වූ 1974 යල කන්නය සමඟ සසඳන විට හෙක්ටයාර් 9,097ක ශීඝ්‍ර අඩුවීමකි.

**වගු අංක 2.16: මහනුවර, මාතලේ සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කවල වී වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)**

| දිස්ත්‍රික්කය | කන්නය | 2006/07 | 2007/08 | 2008/09 | 2009/10 | 2010/11 |
|---|---|---|---|---|---|---|
| මහනුවර | මහ | 12,784 | 12,042 | 13,476 | 14,071 | 13,837 |
| | යල | 8,067 | 8,157 | 11,629 | 9,262 | 10,121 |
| මාතලේ | මහ | 15,906 | 15,281 | 19,119 | 19,374 | 20,248 |
| | යල | 7,268 | 5,585 | 11,960 | 6,406 | 10,719 |
| නුවරඑළිය | මහ | 5,935 | 5,335 | 5,627 | 5,576 | 5,586 |
| | යල | 1,932 | 2,072 | 2,087 | 2,883 | 3,030 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව,2011

මෙම සංඛ්‍යා සටහන අනුව පෙනී යන්නේ මහනුවර දිස්ත්‍රික්කයේ 2005/06 මාස් කන්නයේ පැවති ප්‍රමාණයට වඩා මහ සහ යල කන්නයේ වී වගා බිම් ප්‍රමාණය වැඩි වී ඇති බවයි.

මාතලේ දිස්ත්‍රික්කයේ වැඩි ම කුඹුරු ප්‍රමාණයක් අස්වද්දා ඇති වර්ෂය ලෙස වාර්තා වන්නේ 2004 වර්ෂය වන අතර එම ප්‍රමාණය හෙක්ටයාර් 17,191කි. වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා කළ මාස් කන්නය ලෙස වාර්තා වී ඇත්තේ 2003 වර්ෂය වන අතර ප්‍රමාණය හෙක්ටයාර්

16,372කි. වැඩි ම වගා බිම් ප්‍රමාණයක් වාර්තා වූ යල කන්නය වූයේ 2003 වර්ෂය වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 6,999කි. "අපි වවමු - රට නගමු" වැඩසටහන ඇරඹීමට පෙර මාස් කන්නය වූ 2005/06 මාස් කන්නයේ වී වගා බිම් ප්‍රමාණය 15,913ක් වූ අතර යල කන්නයේ වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් 5,368කි. මෙහි දී වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා කළ මාස් කන්නය වූ 2003 මාස් කන්නය සමඟ සසඳන විට 2005/06 වර්ෂයේ දී හෙක්ටයාර් 453ක අඩු වීමක් පෙන්නුම් කරයි. යල කන්නය සමග සසඳන වීට හෙක්ටයාර් 1,631ක අඩු වීමකි. 2005/06 මහ කන්නයේ හා යල කන්නයේ වගා බිම් ප්‍රමාණය අඩු වීම සුළු ප්‍රමාණයක් බව ද පෙනේ.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ වැඩි ම කුඹුරු ප්‍රමාණයක් අස්වද්දන ලද වර්ෂය ලෙස වාර්තා වී ඇත්තේ 1983 වර්ෂය වන අතර වැඩිම කුඹුරු බිම් ප්‍රමාණයක් වගා කළ මාස් කන්නය ලෙස වාර්තා වී ඇත්තේ 1978 වර්ෂයේ වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 7,573කි. වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා කළ යල කන්නය ලෙස වාර්තා වී ඇත්තේ 1975 වර්ෂය වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 5,189 කි. "අපි වවමු - රට නගමු" වැඩසටහන ඇරඹීමට පෙර වසර වන 2005/06 මහ කන්නයේ වී වගා කළ හෙක්ටයාර් ප්‍රමාණය 5760ක් වන අතර 2006 යල කන්නයේ හෙක්ටයාර් 1,932කි. 'අපි වවමු රට නගමු වැඩසටහන' ඇරඹීමට පෙර වර්ෂය වනවිට වී වගා බිම් ප්‍රමාණයේ වෙනස ගණන් බැලීමේ දී වැඩිම කුඹුරු ප්‍රමාණයක් වගා කළ, 1978 වර්ෂය සමඟ සැසඳූ කළ හෙක්ටයාර් 1,813ක අඩුවීමක් පෙන්වන අතර වැඩිම හෙක්ටයාර් ගණනක් වී වගා කළ යල කන්නය වූ 1975 යල සමග සඳන වීට එය හෙක්ටයාර් 3,257ක අඩුවීමකි. මාස් කන්නය සමග සසඳන විට සුළු අඩුවීමක් පෙන්වන අතර යල කන්නය සමග සසඳන වීට සැලකිය යුතු අඩුවිමකි. "අපි වවමු - රට නගමු" වැඩසටහන ක්‍රියාත්මක වූ වර්ෂය වන 2006/07 මාස් කන්නයේ සිට 2007 යල කන්නය දක්වා නුවරඑළිය දිස්ත්‍රික්කයේ වී වගා බිම් ප්‍රමාණය වැඩිවීමක් අපේක්ෂා කළ හැකිය.

වගු අංක 2.17: මහනුවර, මාතලේ සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කවල සාමාන්‍ය අස්වැන්න (හෙක්ටයාර් 1ට මෙට්‍රික් ටොන්)

| දිස්ත්‍රික්කය | කන්නය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|---|
| මහනුවර | යල | 3.4 | 3.6 | 3.7 | 3.7 | 3.7 | 3.4 | 3.1 |
| | මහ | 3.4 | 3.8 | 3.9 | 3.8 | 3.5 | 3.5 | 3.5 |
| | සාමාන්‍ය අස්වැන්න | 3.4 | 3.7 | 3.7 | 3.8 | 3.6 | 3.5 | 3.4 |
| මාතලේ | යල | 3.9 | 3.4 | 3.8 | 3.5 | 3.7 | 4.4 | 3.5 |
| | මහ | 3.2 | 3.5 | 4.0 | 3.7 | 3.6 | 4.2 | 4.2 |
| | සාමාන්‍ය අස්වැන්න | 3.7 | 3.5 | 3.5 | 3.6 | 3.7 | 4.4 | 3.8 |
| නුවරඑළිය | යල | 4.3 | 3.8 | 3.4 | 3.9 | 4.1 | 4.1 | 3.8 |
| | මහ | 2.9 | 3.1 | 3.7 | 3.6 | 2.9 | 4.4 | 3.8 |
| | සාමාන්‍ය අස්වැන්න | 4.0 | 3.7 | 3.5 | 3.8 | 3.7 | 4.2 | 4.0 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

මහනුවර දිස්ත්‍රික්කයේ වී වගා අස්වැන්න අපේක්ෂිත මට්ටම වූ හෙක්ටයාර් එකට මෙට්‍රික් ටොන් 4.3 ප්‍රමාණයේ නොපැවති අතර අඩු ප්‍රමාණයක අස්වැන්නක් ලැබී ඇති අතර එම අස්වැන්න එකම මට්ටමක පවත්වාගෙන ගොස් ඇත. මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල ද 2010 වර්ෂය වන විට හෙක්ටයාර් එකකින් ලබාගන්නා සාමාන්‍ය අස්වැන්න 4.4 වැනි ඉහළ මට්ටමකට වැඩි වී නොමැති බව පෙනේ.

### 2.2.8.6 බදුල්ල දිස්ත්‍රික්කය - ඌව පළාත

බදුල්ල දිස්ත්‍රික්කයේ වැඩි ම කුඹුරු ප්‍රමාණයක් අස්වද්දා ඇති වර්ෂය ලෙස මෙතෙක් වාර්තා වී ඇත්තේ 2005 වර්ෂය වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 23,790කි. මහ කන්නයක දී මෙතෙක් වාර්තා වී ඇති වැඩි ම කුඹුරු වගා ප්‍රමාණය වාර්තා වී ඇත්තේ 2005 වර්ෂයේ හෙක්ටයාර් 22,112 ක් ලෙස ය. වැඩි ම වී වගා බිම් ප්‍රමාණයක් වාර්තා වී ඇති යල කන්නය වනුයේ 2003 වසරේ වන අතර එය හෙක්ටයාර් 11,979කි. "අපි වවමු- රට නගමු" වැඩසටහන ඇරඹීමට පෙර වසර වන 2005/06 මාස් කන්නයේ වී වගා කර තිබූ ප්‍රමාණය හෙක්ටයාර් 22,112කි. 2006 යල කන්නයේ වී වගා ප්‍රමාණය හෙක්ටයාර් 11,394කි. මෙම සංඛ්‍යා මෙතෙක් මෙම දිස්ත්‍රික්කයේ වාර්තා වී ඇති වැඩිම වී වගා බිම් ප්‍රමාණය වේ.

වගු අංක **2.18:** බදුල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්කවල වී වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)

| දිස්ත්‍රික්කය | කන්නය | **2006/07** | **2007/08** | **2008/09** | **2009/10** | **2010/11** |
|---|---|---|---|---|---|---|
| බදුල්ල | මහ | 22,162 | 22,266 | 25,331 | 27,225 | 27,023 |
| | යල | 11,337 | 10,705 | 12,746 | 8,168 | 12,665 |
| මොණරාගල | මහ | 16,746 | 23,544 | 25,827 | 26,529 | 27,360 |
| | යල | 6,579 | 8,926 | 13,716 | 8,341 | 14,016 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2011

මොණරාගල දිස්ත්‍රික්කයේ මෙතෙක් වාර්තා වී ඇති වැඩි ම කුඹුරු අස්වැද්දුම් ප්‍රමාණය 2006 වර්ෂයේ හෙක්ටයාර් 18,788කි. මෙතෙක් වාර්තා වී ඇති මාස් කන්නයේ වැඩි ම කුඹුරු හෙක්ටයාර් ප්‍රමාණය 2005 වර්ෂයේ හෙක්ටයාර් 15,914කි. යල කන්නයක දී මෙතෙක් වාර්තා වී ඇති වී වගා හෙක්ටයාර් ප්‍රමාණය 2003 වර්ෂයේ හෙක්ටයාර් 6,758කි. "අපි වවමු - රට නගමු වැඩසටහන" ඇරඹීමට පෙර වර්ෂය වූ 2005/06 මාස් කන්නයේ සහ යල කන්නයේ වී වගා හෙක්ටයාර් ප්‍රමාණය පිළිවෙළින් 15,914 සහ 6,114ක් විය. මෙය මෙතෙක් වාර්තා වී ඇති වැඩිම කුඹුරු හෙක්ටයාර් ප්‍රමාණයක් වගා කළ මහ සහ යල කන්නය යි. ඉන් පසුව 2006/07 වර්ෂයේ දී "අපි වවමු -රට නගමු" වැඩසටහන ඇරඹී අතර මෙම කාලය තුළ දී වී වගා කළ බිම් ප්‍රමාණය තවදුරටත් ඉහළ නැග ඇති බව පෙනේ. යල සහ මහ කන්න දෙකේ වගා බිම් ප්‍රමාණය මෙම කාල පරිච්ඡේදය තුළ අඛණ්ඩව ඉහළ ගොස් ඇති බව පෙනේ. මෙම තත්ත්වය දිස්ත්රික්කයේ මෙතෙක් මහ සහ යල කන්නයක දී වාර්තා වී ඇති වැඩි ම කුඹුරු හෙක්ටයාර් ප්‍රමාණය ඉක්මවන තත්ත්වයකි. 2010 මහ කන්නය වන විට 2006/07 මහ කන්නයට වඩා හෙක්ටයාර් 5,063ක් වී වගා කර තිබුණි.

වගු අංක 2.19: බදුල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්කවල සාමාන්‍ය අස්වැන්න (හෙක්ටයාර් 1ට මෙට්‍රික් ටොන්)

| දිස්ත්‍රික්කය | කන්නය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|---|
| බදුල්ල | මහ | 4.2 | 4.2 | 4.4 | 4.0 | 4.4 | 4.3 | 3.3 |
| | යල | 4.2 | 4.3 | 4.6 | 4.6 | 4.6 | 4.4 | 4.4 |
| | සාමාන්‍ය අස්වැන්න | 4.2 | 4.3 | 4.5 | 4.2 | 4.5 | 4.3 | 3.7 |
| මොණරාගල | මහ | 3.9 | 3.9 | 4.0 | 3.9 | 4.4 | 4.4 | 4.0 |
| | යල | 3.7 | 4.0 | 4.3 | 4.2 | 3.6 | 4.2 | 4.1 |
| | සාමාන්‍ය අස්වැන්න | 3.8 | 3.9 | 4.1 | 4.0 | 4.1 | 4.3 | 4.1 |

බදුල්ල දිස්ත්‍රික්කයේ වී වගාවේ ඵලදායිතාවය ඉහළ මට්ටමක එනම් හෙක්ටයාර් එකකින් මෙ.ටො. 4.2 සිට 4.5 දක්වා ඉහළ අස්වැන්නක් ලබාගෙන ඇති බව වාර්තා වන අතර මෙම තත්ත්වය සතුටුදායක තත්ත්වයකි. සාමාන්‍ය අස්වනු ලැබීම පිළිබඳව සලකා බලන විට මොණරාගල දිස්ත්‍රික්කයේ ඉහළ අස්වැන්නක් ලැබී ඇති බව ද පේනේ.

### 2.2.8.7 යාපනය දිස්ත්‍රික්කය - උතුරු පළාත

යාපනය දිස්ත්‍රික්කයේ වාර්තා වී ඇති වැඩි ම කුඹුරු අස්වැද්දුම් ප්‍රමාණය 1975 වර්ෂයේ හෙක්ටයාර් 38,134කි. මෙතෙක් මාස් කන්නයක දී වගා කරන ලද වැඩි ම කුඹුරු ප්‍රමාණය වාර්තා වී ඇත්තේ 1974 වර්ෂයේ වන අතර එය හෙක්ටයාර් 35,100කි. මෙතෙක් වාර්තා වී ඇති වැඩිම කුඹුරු ප්‍රමාණයක් වගා කළ යල කන්නය 1982 වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 7,132කි. මෙයින් පසුව මෙම දිස්ත්‍රික්කයේ මාස් කන්නය පමණක් වගා වී ඇති අතර යල කන්නයේ වගා වී නැත. "අපි වවමු - රට නගමු" වැඩසටහන ඇරඹීමට පෙර මහ කන්නය වූ 2005/06 මහ කන්නයේ වී වගා ප්‍රමාණය හෙක්ටයාර් 7,636ක් වී ඇත. "අපි වවමු - රට නගමු" වැඩසටහන ඇරඹි 2006/07 මහ කන්නයේ සිට 2010/11 මහ කන්නය දක්වා වී වගා බිම් ප්‍රමාණය යම් තරමකින් වැඩි වී ඇති බව පෙනේ.

වගු අංක 2.20: යාපනය, වවුනියාව, මුලතිව්, මන්නාරම, කිලිනොච්චි යන දිස්ත්‍රික්කවල වී වගා බිම් ප්‍රමාණ (හෙක්ටයාර්)

| දිස්ත්‍රික්කය | කන්නය | 2006/07 | 2007/08 | 2008/09 | 2009/10 | 2010/11 |
|---|---|---|---|---|---|---|
| යාපනය | මහ | 7568 | 6918 | 7566 | 8171 | 8948 |
| | යල | - | - | - | - | - |
| වවුනියාව | මහ | 9330 | 4064 | 6422 | 6709 | 4830 |
| | යල | 721 | 586 | 4969 | 253 | 834 |
| මුලතිව් | මහ | 9581 | 9568 | 6596 | - | 2180 |
| | යල | 2755 | 1862 | 3143 | - | 1183 |
| මන්නාරම | මහ | 9715 | 5668 | 4894 | 5352 | 8093 |
| | යල | 48 | 843 | 984 | - | 600 |
| කිලිනොච්චි | මහ | 9581 | 9568 | 6596 | - | 2180 |
| | යල | 2755 | 1862 | 3143 | - | 1183 |

වවුනියාව දිස්ත්‍රික්කයේ මෙතෙක් අස්වද්දා ඇති කුඹුරු අස්වැද්දුම් ප්‍රමාණය ලෙස 1978 හෙක්ටයාර් 30,083 වාර්තා වී ඇත. මෙම දිස්ත්‍රික්කයේ මාස් කන්නයක මෙතෙක් වාර්තා වී ඇති වැඩිම වී වගා ප්‍රමාණය 1979 වර්ෂයේ හෙක්ටයාර් 15,711ක් වන අතර මෙතෙක් වාර්තා වී ඇති වැඩිම වී වගා ප්‍රමාණය වාර්තා වී ඇති යල කන්නය 1984 හෙක්ටයාර් 4,513කි. "අපි වවමු- රට නගමු" වැඩසටහන ඇරඹීමට පෙර වර්ෂය වූ 2005/06 මාස් කන්නයේ වී වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් 8439ක් විය. 2006 යල කන්නයේ වී වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් 1,332ක් වී තිබුණි. 1979 වර්ෂයේ මහට වගා කළ වැඩි ම කුඹුරු ප්‍රමාණය සමඟ සසඳන විට හෙක්ටයාර් 7,272ක අඩුවීමකි. වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා කළ යල කන්නය සමග සැසඳීමේ දී හෙක්ටයාර් 3,181ක අඩුවීමක් මෙයින් පෙන්වයි.

මෙම සංඛ්‍යා සටහන පරීක්ෂා කිරීමෙන් පෙනී යන්නේ කන්නයෙන් කන්නය වගා බිම් ප්‍රමාණයේ අඛණ්ඩ වර්ධනයක් සිදු වී නොමැති බවයි. වාරිමාර්ග ගැටලු හා නැවත පදිංචි කිරීම් හා සම්බන්ධ ගැටලු නිසා මෙම ප්‍රදේශවල වී වගාව ක්ෂණිකව ඉහළ නැංවීම අසීරු වී ඇත.

මුලතිව් දිස්ත්‍රික්කයේ වැඩි ම කුඹුරු ප්‍රමාණයක් අස්වද්දන ලද වර්ෂය 2002 වර්ෂය වන අතර කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් 17,590කි. වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා කළ මාස් කන්නය ලෙස වාර්තා වී ඇත්තේ 1982 වර්ෂය වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 13,923කි. වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා කළ යල කන්නය ලෙස වාර්තා වී ඇත්තේ 1984 වර්ෂය වන අතර

ප්‍රමාණය හෙක්ටයාර් 3,522කි. "අපි වවමු - රට නගමු" වැඩසටහන ඇරඹීමට පෙර වර්ෂය වූ 2005/06 මාස් කන්නයේ වී වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් 11,818ක් හා යල කන්නයේ හෙක්ටයාර් 2,519කි. වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා වූ මහ කන්නය වූ 19,852 මහ කන්නය සමඟ සසඳන කළ 2005/06 කන්න වන විට හෙක්ටයාර් 2,105 වැනි සුළු ප්‍රමාණයක අඩු වීමක් පෙන්වන අතර යල කන්නය සමග සසඳන විට හෙක්ටයාර් 1,003ක අඩු වීමක් පෙන්නුම් කරයි. මෙම සංඛ්‍යා දත්ත අනුව වී වගාවේ කැපී පෙනෙන ව්‍යාප්තියක් දක්නට නැත. 2008/09 මහ කන්න සහ 2009 යල කන්නයෙන් පසු වී වගා ව්‍යාප්තිය අඩු වීමක් පෙන්වයි. මෙයට ප්‍රධානත ම හේතුව මුලතිව් ප්‍රදේශය දශක ගණනාවක් යුද්ධය නිසා ජන ජීවිතය මෙන්ම යටිතල පහසුකම් ද පිරිහී තිබීම බව කිව හැකිය.

මන්නාරම දිස්ත්‍රික්කයේ මෙතෙක් අස්වද්දන ලද වැඩි ම කුඹුරු ප්‍රමාණය වාර්තා වන්නේ 1978 වර්ෂයේ වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 22,719කි. වැඩි ම බිම් ප්‍රමාණයක් වී වගා කළ මාස් කන්නය ලෙස වාර්තා වන්නේ 1974 වර්ෂයේ හෙක්ටයාර් 19,110ක් වශයෙනි. වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා කළ යල කන්නය ලෙස වාර්තා වී ඇත්තේ 1971 වර්ෂයේ හෙක්ටයාර් 2,317ක් ලෙසිනි. "අපි වවමු -රට නගමු" වැඩසටහන ඇරඹීමට පෙර වර්ෂය වූ 2005/06 මාස් කන්නයේ වී වගා කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් 9,529ක් වූ අතර යල කන්නයේ හෙක්ටයාර් 1,093කි. 1974 මාස් කන්නය සමඟ සසඳන විට 2005/06 මහ කන්නයේ හෙක්ටයාර් 9,581කින් අඩු වී තිබේ. 1971 වසරේ යල සමඟ සසඳන විට හෙක්ටයාර් 1,224ක් අඩු වී ඇත. මාස් කන්නය හා සැසඳූ විට වී වගාවේ විශාල අඩුවීමක් පෙන්වයි. මෙම සංඛ්‍යා සටහන පිළිබඳව විමසන වීට පෙනී යන්නේ වී වගා ව්‍යාප්තියේ යම්කිසි වර්ධනයක් දක්නට ලැබෙන බවයි. එයට හේතුව උතුරු ප්‍රදේශයේ පැවති යුධමය වාතාවරණය නිසා ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වෙමින් පවතින බවයි.

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ මෙතෙක් වාර්තා වී ඇති වැඩි ම කුඹුරු අස්වැද්දූම් ප්‍රමාණය 2002 වර්ෂයේ වාර්තා වී ඇති අතර එය හෙක්ටයාර් 22,488කි. වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගාකරන ලද මහ කන්නය වනුයේ 2005 වර්ෂයේ වන අතර එම ප්‍රමාණය හෙක්ටයාර් 19,470කි. වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගාකරන ලද යල කන්නය ලෙස වාර්තා වී ඇත්තේ 1991 වර්ෂයේ වන අතර එම ප්‍රමාණය හෙක්ටයාර් 5,912කි. "අපි වවමු - රට නගමු" වැඩසටහන ඇරඹීමට පෙර වර්ෂය වූ 2005/06 මාස් කන්නයේ වී වගා කළ කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් 19,470කි. එම යල කන්නයේ වී වගාකළ හෙක්ටයාර් ප්‍රමාණය 53,89කි. 2006/07 මාස් කන්නයේ සිට "අපි වවමු - රට නගමු" වැඩසටහන ඇරඹී අතර එහි දී වගා බිම් ප්‍රමාණය වර්ධනයක් වී ඇත්ද යන්න පරීක්ෂා කළ හැකිය. වසර 30ක කාලයක් තිස්සේ යුධ ගැටුම් පැවති දිස්ත්‍රික්කයක් ලෙසින් මෙම දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට යුද්ධයේ බලපෑමක් සිදු වී ඇති බව

පෙනේ. එම නිසා වී වගා බිම් ප්‍රමාණයේ අඩුවීමක් වී ඇති බව පැහැදිලි වේ. ජීවනෝපායන් යළි නගා සිටුවීම, වාරි පහසුකම්, පොහොර යන සානුබල සැපයීම මඟින් මාස් කන්නවල වී වගා ප්‍රමාණය වැඩි වී තිබෙන බව පෙනේ.

**වගු අංක 2.21: යාපනය, වවුනියාව, මුලතිව්, මන්නාරම, කිලිනොච්චි යන දිස්ත්‍රික්කවල සාමාන්‍ය අස්වැන්න (හෙක්ටයාර් 1ට මෙට්රික් ටොන්)**

| දිස්ත්‍රික්කය | කන්නය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|---|
| යාපනය | මහ | 2.2 | 1.9 | 2.1 | 2.8 | 2.5 | 2.6 | 2.6 |
| | සාමාන්‍ය අස්වැන්න | 2.2 | 1.9 | 2.1 | 2.8 | 2.5 | 2.6 | 2.6 |
| වවුනියාව | මහ | 3.6 | 3.8 | 4.3 | 3.5 | 4.6 | 5.3 | 4.1 |
| | යල | 3.9 | 4.4 | 4.4 | 4.3 | 3.9 | 4.7 | 4.5 |
| | සාමාන්‍ය අස්වැන්න | 3.7 | 3.9 | 4.3 | 3.9 | 4.6 | 5.2 | 4.1 |
| මුලතිව් | මහ | 3.4 | 3.6 | 3.6 | 3.4 | - | 5.3 | 2.4 |
| | යල | 3.7 | 3.6 | 3.7 | 2.9 | - | 3.8 | 3.7 |
| | සාමාන්‍ය අස්වැන්න | 3.5 | 3.6 | 3.6 | 3.2 | - | 4.8 | 2.9 |
| මන්නාරම | මහ | 4.2 | 4.1 | 3.8 | 3.6 | 3.6 | 4.8 | - |
| | යල | 4.1 | 4.0 | 4.2 | 4.2 | - | 5.4 | 4.0 |
| | සාමාන්‍ය අස්වැන්න | 4.1 | 4.1 | 3.9 | 3.8 | - | 3.9 | 3.9 |
| කිලිනොච්චි | මහ | 3.4 | 3.3 | 3.3 | 2.8 | - | - | 2.8 |
| | යල | 3.5 | 3.5 | 3.5 | 3.0 | - | 2.5 | 2.6 |
| | සාමාන්‍ය අස්වැන්න | 3.4 | 3.3 | 3.3 | 2.8 | - | 2.5 | 2.8 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2011

වෙනත් දිස්ත්‍රික්කයන් හා සසඳන විට, යාපනය දිස්ත්‍රික්කයේ වී අස්වැන්නෙ හි සාමාන්‍ය ඉතා අඩු මට්ටමක පවතී. අස්වැන්න ඉතා සුළු ඉහළ යාමක් පමණක් මෙම කාලය තුළ දක්නට ලැබේ. 2008 වර්ෂයෙන් පසු සාමාන්‍ය අස්වැන්නේ සුළු වැඩිවීමක් සිදු වී ඇති බව පෙනේ.

වවුනියාව දිස්ත්‍රික්කයේ 2007 වර්ෂයෙන් පසු මහ සහ යල කන්න දෙකේ ම අස්වැන්න ඉහළ ගොස් ඇති බව පෙනේ. පොහොර භාවිතයේ ප්‍රශස්තබව, වාරිමාර්ග පහසුකම්, දේශගුණික යෝග්‍යතාවය, ආරක්ෂාව වැනි කරුණු ගණනාවක් මෙසේ වී අස්වැන්න ඉහළ යාමට හේතු පාදක වී ඇත. මුලතිව් දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අස්වැන්න ද අඩු මට්ටමක පවතින අතර 2010 වර්ෂයේ දී පමණක් අස්වනු ඉහළ ගොස් ඇති බව පෙනේ.

මන්නාරම දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අස්වැන්න පිළිබඳව විමසීමේ දී පෙනී යන්නේ මහ කන්නයේ අස්වැන්නට වඩා යල කන්නයේ වැඩි අස්වැන්නක් ලැබ ඇති බවයි. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අස්වැන්න ඉතා පහත් මට්ටමක පවතින බව පෙනෙන අතර ජීවනෝපායන් යළි නගා සිටුවීම, ප්‍රාග්ධන හිඟය, වාරිජල පහසුකම් හා යටිතල පහසුකම් දුර්වල මට්ටමක පැවතීම එයට හේතු වී ඇත.

### 2.2.8.8 අනුරාධපුර දිස්ත්‍රික්කය - උතුරු මැද පළාත

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මෙතෙක් වාර්තා වී ඇති වැඩි ම අස්වැද්දූම් වර්ෂය හා ප්‍රමාණය වනුයේ 1980 වර්ෂයේ හෙක්ටයාර් 86,634කි. මෙතෙක් වාර්තා වී ඇති මාස් කන්නයක වැඩිම වී වගා ප්‍රමාණය 1980 වර්ෂයේ හෙක්ටයාර් 76,299 කි. මෙතෙක් වාර්තා වී ඇති යල කන්නය 1994 වන අතර වී වගා ප්‍රමාණය හෙක්ටයාර් 25,222කි. "අපි වවමු- රට නගමු" වැඩසටහන ඇරඹීමට පෙර වසර වන 2005/06 මාස් කන්නයේ වගා ප්‍රමාණය හෙක්ටයාර් 61,153කි. 2006 යලෙ හි වී වගා ප්‍රමාණය හෙක්ටයාර් 24,294කි. වැඩි ම වී වගා ප්‍රමාණයක් පැවති 1980 මාස් කන්නය සමග සසඳන කළ හෙක්ටයාර් 15,146කින් වගා බිම් ප්‍රමාණය අඩු වී තිබේ. යල කන්නයේ වගාව අඩු වී ඇත්තේ හෙක්ටයාර් 928කිනි. මාස් කන්නයේ ඉතා පැහැදිලි අඩුවීමක් පෙන්වයි.

**වගු අංක 2.22: අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල වී වගා බිම් ප්‍රමාණ**

| දිස්ත්‍රික්කය | කන්නය | 2006/07 | 2007/08 | 2008/09 | 2009/10 | 2010/11 |
|---|---|---|---|---|---|---|
| අනුරාධපුර | මහ | 61782 | 57562 | 72717 | 80724 | 81463 |
| | යල | 21201 | 14635 | 49133 | 18164 | 22887 |
| පොළොන්නරුව | මහ | 53176 | 50565 | 55529 | 57298 | 60312 |
| | යල | 48501 | 49558 | 54481 | 36862 | 58301 |

මාස් කන්යේ වී වගා ව්‍යාප්තිය සැලකූවිට පැහැදිලි වැඩිවීමක් දක්නට පුළුවන. 2006/07 මාස් කන්නයේ හෙක්ටයාර් 61782 සිට 2010/11 මහ කන්නය වන විට හෙක්ටයාර් 81463 දක්වා

වගාව වැඩි වී ඇත. යල කන්නයේ වී වගා ව්‍යාප්තිය 2007 යල කන්නයේ සිට 2011 යල කන්නය වනවිට හෙක්ටයාර් 22887 දක්වා වැඩි වී ඇත.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වාර්තා වී ඇති ඉහළ ම අස්වැද්දූම් ප්‍රමාණය 2005 වර්ෂයේ වාර්තා වී ඇති අතර ප්‍රමාණය හෙක්ටයාර් 56,962කි. මාස් කන්නයක වැඩි ම වී වගා කළ වර්ෂය 2005 වර්ෂය වන අතර එහි ප්‍රමාණය හෙක්ටයාර් 53,180කි. යල කන්නයක දී වැඩියෙන් ම වී වගා කළ වර්ෂය 2003 වන අතර වගා ප්‍රමාණය හෙක්ටයාර් 50,627කි. "අපි වවමු- රට නගමු" වැඩසටහන ඇරඹීමට පෙර වර්ෂයේ මාස් කන්නයේ වී වගා ප්‍රමාණය හෙක්ටයාර් 53,180කි. යල කන්නයේ වගා ප්‍රමාණය හෙක්ටයාර් 49,865කි.

2005/06 මාස් කන්නයේ වී වගා ප්‍රමාණය සමඟ සසඳන විට 2010/11 මහ කන්නය වන විට හෙක්ටයාර් 7,132 වගා බිම් ප්‍රමාණයක් වැඩි වී ඇත. 2006 යල කන්නය සසඳන විට හෙක්ටයාර් 8,436ක වගා බිම් ප්‍රමාණයක් වැඩි වී ඇත. පොහොර සහනාධාරය ලබාදීම, වාරිමාර්ග නවීකරණය නිසා ජල සැපයුම වැඩිවීම, ජනතාව දැනුවත් කිරීම හා පෙළඹවීම මගින් මෙන් ම ප්‍රතිපාදන වැය කිරීම මගින් පුරන් කුඹුරු වගා කිරීම යන කරුණු මත මෙම ඉඩම් ප්‍රමාණය වැඩි වී තිබේ.

සාමාන්‍ය අස්වැන්න

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අස්වැන්න පිළිබඳව සැලකූවිට මෙම වැඩසටහන ක්‍රියාත්මක වූ කාලයේ සාමාන්‍ය අස්වැන්න ද වැඩිවීමක් දක්නට ලැබේ.

**වගු අංක 2.23: අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල සාමාන්‍ය අස්වැන්න (හෙක්ටයාර් 1ට මෙට්‍රික් ටොන්)**

| දිස්ත්‍රික්කය | කන්නය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|---|
| අනුරාධපුරය | මහ | 4.5 | 4.5 | 4.7 | 4.3 | 4.6 | 4.9 | 4.4 |
| | යල | 4.2 | 4.5 | 4.8 | 4.3 | 4.4 | 4.8 | 4.7 |
| | සාමාන්‍ය අස්වැන්න | 4.4 | 4.5 | 4.7 | 4.3 | 4.6 | 4.9 | 4.6 |
| පොළොන්නරුව | මහ | 4.9 | 4.9 | 5.1 | 4.9 | 5.2 | 5.3 | 3.8 |
| | යල | 4.7 | 4.8 | 5.0 | 4.9 | 4.7 | 5.0 | 5.0 |
| | සාමාන්‍ය අස්වැන්න | 4.8 | 4.9 | 5.0 | 4.9 | 5.0 | 5.2 | 4.4 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2011

ඉහත සංඛ්‍යා සටහන අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී හෙක්ටයාර් එකක සාමාන්‍ය අස්වැන්න මාස් කන්නයේ මෙට්‍රික්ටොන් 4.5 සිට 4.9 දක්වා පරාසයක පැවතී ඇති බව පෙනේ. යල කන්නයේ ද මෙට්‍රික්ටොන් 4.2 සිට 4.7 දක්වා පරාසයක පැවතී ඇති බව පෙනේ. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අස්වැන්න සුළු වශයෙන් වැඩිවීමක් "අපි වවමු - රටනගමු" වැඩසටහන පැවති කාලපරිච්ඡේදය තුළ පෙන්නුම් කරන අතර එය අක්කර එකකට බුසල් 99ක් වැනි ප්‍රමාණයකි. අස්වැන්න උසස් තත්ත්වයකට පත්වීම අපේක්ෂිත තත්ත්වයකට ළඟා වී ඇති බව පෙනේ.

### 2.2.8.9 ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය - නැගෙනහිර පළාත

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වැඩි ම අස්වැද්දුම් ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ 2000 වර්ෂයේ වන අතර එය හෙක්ටයාර් 4,2678කි. මාස් කන්නයක දී වැඩි ම කුඹුරු ප්‍රමාණයක් වගා කර ඇත්තේ 2003 වර්ෂයේ වන අතර එය හෙක්ටයාර් 26912කි. මෙතෙක් වාර්තා වී ඇති යල කන්නයක වැඩිම කුඹුරු වගා හෙක්ටයාර් ප්‍රමාණය 2006 වර්ෂයේ 16321කි. "අපි වවමු - රට නගමු" වැඩසටහන ඇරඹීමට පෙර වර්ෂය වූ 2005/06 මාස් කන්නයේ වී වගා කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් 25022කි. මාස් කන්නයක මෙතෙක් වාර්තා වී ඇති වැඩි ම කුඹුරු හෙක්ටයාර් ප්‍රමාණය 2005/06 මාස් කන්නයේ වී වගා ප්‍රමාණය සමග සසඳන විට කුඹුරු හෙක්ටයාර් 1,890ක අඩුවීමක් පෙන්වයි. යල කන්නයක මෙතෙක් වාර්තා වී ඇති වැඩිම කුඹුරු හෙක්ටයාර් ප්‍රමාණය 2006 යල කන්නයයි. 'අපි වවමු රට නගමු' වැඩසටහන 2006/07 මාස් කන්නයේ සිට ක්‍රියාත්මක වී ඇත.

**වගු අංක 2.24: ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර යන දිස්ත්‍රික්කවල වී වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)**

| දිස්ත්‍රික්කය | කන්නය | 2006/07 | 2007/08 | 2008/09 | 2009/10 | 2010/11 |
|---|---|---|---|---|---|---|
| ත්‍රිකුණාමලය | මහ | 23743 | 16287 | 18987 | 23014 | 26535 |
| | යල | 11027 | 10368 | 15296 | 13950 | 13116 |
| මඩකලපුව | මහ | 46772 | 18469 | 19134 | 45905 | 54855 |
| | යල | 15498 | 2705 | 17728 | 17073 | 20901 |
| අම්පාර | මහ | 62715 | 51803 | 64490 | 69979 | 69861 |
| | යල | 55036 | 53787 | 60168 | 46227 | 59255 |

2005/06 මාස් කන්නයේ වී වගා කළ බිම් ප්‍රමාණය වන හෙක්ටයාර් 25022 සමඟ 2010/11 මහ කන්නයේ වගා බිම් ප්‍රමාණය සැසඳූ විට හෙක්ටයාර් 1,535කින් වැඩි වී ඇත.

මඩකලපුව දිස්ත්‍රික්කයේ මෙතෙක් වාර්තා වී ඇති වැඩි ම අස්වැද්දූම් ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ 2002 වර්ෂයේ වන අතර එය හෙක්ටයාර් 58,422කි. මෙතෙක් වාර්තා වී ඇති වැඩි ම වී වගා ප්‍රමාණය වනුයේ 2005 වර්ෂයේ වන අතර එය හෙක්ටයාර් 46,182කි. මෙතෙක් වාර්තා වී ඇති වැඩි ම වී වගා ප්‍රමාණය 2003 යල කන්නය වන අතර ප්‍රමාණය හෙක්ටයාර් 20,477කි. "අපි වවමු- රට නගමු" වැඩසටහන ඇරඹීමට පෙර වී වගා බිම් ප්‍රමාණය අඩුවීමක් සිදු වී ඇත්දැයි විමසීම සඳහා සැසඳිය යුත්තේ 2003 යල කන්නය පමණි. ඒ අනුව 2006 යල කන්නය හෙක්ටයාර් 3758 කින් අඩු වී ඇත.

මෙම සංඛ්‍යා සටහන පරීක්ෂා කරන විට පෙනී යන්නේ 2006/07 මහ කන්නය සමග සසඳන විට 2009/10 මහ කන්නයේ දී කුඹුරු හෙක්ටයාර් 8,083ක් වැඩි වී තිබෙන බවයි. 2007 යල කන්නය සමඟ සැසඳීමේ දී හෙක්ටයාර් 5,403ක වගා බිම් ප්‍රමාණයක් වැඩි වී තිබේ. යුධමය වාතාවරණය අවසන්වීම සමඟ වාරිමාර්ග පිළිසකර කිරීම හා යටිතල පහසුකම් දියුණු කිරීම, ජනතාව යළි ගම්වල පදිංචිවීම හා 'අපි වවමු - රට නගමු' වැඩසටහන යටතේ පුරන් කුඹුරු අස්වැද්දීම යන සියලු ම කරුණු මෙයට හේතු වී ඇත.

අම්පාර දිස්ත්‍රික්කයේ මෙතෙක් වාර්තා වී ඇති වැඩි ම අස්වැද්දූම් ප්‍රමාණය 2005 වර්ෂයේ වන අතර එය හෙක්ටයාර් 75,070කි. වාර්තා වී ඇති වැඩි ම වී වගා ප්‍රමාණයක් සහිත මාස් කන්නය 2003 වර්ෂය වන අතර එම ප්‍රමාණය හෙක්ටයාර් 60,993කි. වාර්තා වී ඇති වැඩි ම වී වගා බිම් ප්‍රමාණයක් සහිත යල කන්නය 2006 වර්ෂය වන අතර එම ප්‍රමාණය හෙක්ටයාර් 56324කි. "අපි වවමු - රට නගමු" වැඩසටහන ඇරඹීමට පෙර මහ කන්නය වූ 2005/06 මහ කන්නයේ වී වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් 60,737කි. ඒ අනුව ඉහළ ම වගා බිම් ප්‍රමාණයක් පැවති වසර වන 2003 වර්ෂය සමග සසඳන විට හෙක්ටයාර් 256ක් පමණ අඩු වි තිබේ. යල කන්නයේ වෙනසක් නැත. 2010/11 මහ කන්නයේ වගා බිම් ප්‍රමාණය 2005/06 මාස් කන්නයේ වගා බිම් ප්‍රමාණය හා සසඳන විට හෙක්ටයාර් 8861කින් ඉහළ ගොස් ඇත. 2006 වර්ෂයේ වී වගා බිම් ප්‍රමාණය හා සසඳන කළ 2011යල කන්නයේ දී වී වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් 2,931කින් ඉහළ ගොස් ඇත.

සාමාන්‍ය අස්වැන්න

වගු අංක 2.25: ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර යන දිස්ත්‍රික්කවල සාමාන්‍ය අස්වැන්න (හෙක්ටයාර් 1ට මෙට්‍රික් ටොන්)

| දිස්ත්‍රික්කය | කන්නය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|---|
| ත්‍රිකුණාමලය | මහ | 3.9 | 3.9 | 4.2 | 4.3 | 4.4 | 4.3 | 2.3 |
| | යල | 4.4 | 4.4 | 4.3 | 4.5 | 4.8 | 4.8 | 4.7 |
| | සාමාන්‍ය අස්වැන්න | 4.1 | 4.1 | 4.3 | 4.4 | 4.6 | 4.5 | 3.7 |
| මඩකලපුව | මහ | 2.3 | 3.2 | 2.8 | 3.6 | 3.6 | 4.0 | 2.3 |
| | යල | 3.4 | 3.6 | 3.6 | 3.9 | 4.1 | 4.0 | 4.1 |
| | සාමාන්‍ය අස්වැන්න | 2.6 | 3.3 | 2.9 | 3.8 | 3.7 | 5.3 | 3.4 |
| අම්පාර | මහ | 4.2 | 4.5 | 4.9 | 4.8 | 5.1 | 5.3 | 3.3 |
| | යල | 4.7 | 4.8 | 4.9 | 4.9 | 4.9 | 4.8 | 4.9 |
| | සාමාන්‍ය අස්වැන්න | 4.5 | 4.7 | 4.9 | 4.8 | 5.0 | 5.1 | 4.3 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ගත් විට 2010 මාස් කන්නයේ අක්කරයකට බුසල් 86ක සාමාන්‍ය අස්වැන්නක් ලැබී ඇති බවයි. මෙය උසස් අස්වැන්නක් නොවේ. එම නිසා වී වගාවේ ඵලදායීතාවය ඉහළ නැංවී නොමැති බව පෙනේ.

මඩකලපුව දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අස්වැන්න පිළිබඳව සලකන විට පෙනී යන්නේ එහි සාමාන්‍ය අස්වැන්නේ වැඩි දියුණුවක් සිදු වී නොමැති අතර මධ්‍යස්ථ මට්ටමක පැවති බවයි. මාස් කන්නයේ අස්වැන්නට වඩා යල කන්නයේ අස්වැන්න තරමක් දුරට වැඩි බව ද පෙනේ. 2009 වර්ෂයේ සිට යල කන්නයේ අස්වැන්න සුළු වශයෙන් ඉහළ ගොස් තිබේ. 2010 වර්ෂයේ සාමාන්‍ය අස්වැන්න යල සහ මහ කන්නයේ අක්කරයකට බුසල් 80 මට්ටමේ පැවතිණි. එහෙත් මෙය ඉහළ අස්වැන්නක් නොවන බව කිව හැකිය.

අම්පාර දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අස්වැන්න යම් කිසි ඉහළ මට්ටමකට ළඟා වී ඇති බව පැහැදිලි වන අතර මෙය ප්‍රශස්ත මට්ටමක් නොවන නමුත් වෙනත් දිස්ත්‍රික්ක සමඟ සසඳන

කළ ඉහළ මට්ටමක් බව සඳහන් කළ හැකිය. සාමාන්‍ය අස්වැන්න මහ කන්නය සඳහා හෙක්ටයාර් එකට මෙට්‍රික් ටොන් 4.5-5.3 ද යල කන්නය සඳහා හෙක්ටයාර් එකට මෙට්‍රික් ටොන් 4.8-4.9 වශයෙන් පැවතිණි. 2010 මාස් කන්නයේ අස්වැන්න සැලකූ විට එය අක්කර එකට බුසල් 106 මට්ටමක පවතී. මෙය බලාපොරොත්තුවන ප්‍රශස්ත අස්වැන්න නොවූන ද සතුටුදායක මට්ටමක් බව සඳහන් කළ හැකිය.

### 2.2.8.10 උඩවලවේ විශේෂ බල ප්‍රදේශය (උඩවලව විශේෂ බල ප්‍රදේශයට රත්නපුර හා මොණරාගල යන දිස්ත්‍රික්කවලින් කොටසක් අයත් වේ)

උඩවලව විශේෂ බල ප්‍රදේශයේ වැඩි ම වී වගා අස්වැද්දූම් බිම් ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ 1986 වර්ෂයේ ය . එය හෙක්ටයාර් 19,237කි. මෙම ප්‍රදේශයේ මාස් කන්නයක මෙතෙක් වාර්තා වී ඇති වැඩි ම වී වගා ප්‍රමාණය 1990 වර්ෂයේ වන අතර එය හෙක්ටයාර් 10,854කි. වැඩිම යල වී වගාවක් වාර්තා වන්නේ 1990 වර්ෂයේ වන අතර එය හෙක්ටයාර් 10,488කි. "අපි වවමු - රට නගමු" වැඩසටහන ආරම්භ වීමට පෙර වර්ෂයේ වී වගාවේ තත්ත්වය 2005/06 හා 2006 යල කන්නයේ වී වගා ප්‍රමාණය පරීක්ෂා කරන විට පෙනේ. ඒ අනුව 2005/06 මාස් කන්නයේ වී හෙක්ටයාර් 8,884ක් වන අතර 2006 යල කන්නයේ හෙක්ටයාර් 9,190කි. වැඩි ම කුඹුරු ප්‍රමාණය වගා කළ 2005/06 මහ කන්නය සමග සසඳන විට එය හෙක්ටයාර් 1,970කින් අඩු වී ඇති අතර යල කන්නය සමග සැසඳූ කළ එය හෙක්ටයාර් 1,928 කින් පහත බැස තිබේ. "අපි වවමු - රට නගමු" වැඩසටහන 2006/07 මාස් කන්නයේ සිට ආරම්භ වූ අතර වගු සටහන් අංක 2.26 මගින් වී වගා බිම් ප්‍රමාණය දක්වා ඇත. ඒ අනුව වී වගා බිම් ප්‍රමාණය යම් කිසි වැඩිවීමක් සිදු වී ඇත්දැයි පරීක්ෂා කළ හැකිය.

**වගු අංක 2.26 : වී වගා බිම් ප්‍රමාණය - උඩවලව ප්‍රදේශය 2006 - 2011 (හෙක්ටයාර්)**

| 2006/07 මහ | 2007 යල | 2007/08 මහ | 2008 යල | 2008/09 මහ | 2009 යල | 2009/10 මහ | 2010 යල | 2010/11 මහ | 2011 යල |
|---|---|---|---|---|---|---|---|---|---|
| 9904 | 9484 | 9460 | 9381 | 9527 | 10718 | 11517 | 12118 | 13068 | 14317 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව,2011

මහ සහ යල කන්න දෙකේදී ම වී වගා බිම් ප්‍රමාණය 2006/07 සිට 2011 යල කන්නය දක්වා වූ වගා කන්න 10 තුළ වැඩි වී ඇති බව මෙම සංඛ්‍යා සටහන අනුව පෙනේ. "අපි වවමු - රට නගමු" වැඩසටහන ඇරඹීමට පෙර වර්ෂය වූ 2005/06 මාස් කන්නය සමහ සසඳන විට හෙක්ටයාර් 4184 ක වැඩිවීමක් සිදු වී තිබේ. 2006 යල කන්නය සමග 2011 යල කන්නය සසඳන විට හෙක්ටයාර් 5127ක වැඩිවීමක් සිදු වී ඇත. මෙය "අපි වවමු - රට නගමු"

වැඩසටහන යටතේ දියත් කළ විශේෂ වැඩසටහන් හා උඩවලව ප්‍රදේශයේ වැඩි ප්‍රමුඛත්වය ලැබූ කෙසෙල් වගාවෙන් ඉවත් වී නැවත වී වගාව වෙත නැඹුරුවක් දැක්වීමේ ප්‍රතිඵලයක් ලෙසින් දැක්විය හැකිය.

මෙම ප්‍රදේශයේ සාමාන්‍ය අස්වැන්න, මෙතෙක් සාකච්ඡා කළ සියලු ම දිස්ත්‍රික්කවල සාමාන්‍ය අස්වැන්නට වඩා ඉහළ මට්ටමක බවතින බව පෙනේ. වගු සටහන් අංක 2.27 යටතේ මෙම ප්‍රදේශයේ වී වගාවේ සාමාන්‍ය අස්වැන්න පිළිබඳව විස්තර ඉදිරිපත් කරයි.

**වගු අංක 2.27: උඩවලව විශේෂ බල ප්‍රදේශය 2005-2011 කාලය තුළ සාමාන්‍ය අස්වැන්න (හෙක්ටයාර් 1ට මෙට්‍රික් ටොන්)**

| කන්නය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|
| මහ | 5.3 | 5.6 | 5.6 | 5.6 | 6.5 | 6.2 | 6.5 |
| යල | 5.1 | 5.4 | 5.6 | 6.1 | 6.1 | 6.5 | 6.5 |
| සාමාන්‍ය අස්වැන්න | 5.2 | 5.5 | 5.6 | 5.9 | 6.3 | 6.4 | 6.5 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2011

සාමාන්‍ය අස්වැන්න ඉහළ මට්ටමක පවතින බව ඉහත සටහනට අනුව පෙනී යයි. මහ කන්නයේ හෙක්ටයාර් එකට මෙට්‍රික් ටොන් 5.3 සිට 6.5 දක්වාත් යලට 5.1 සිට 6.5 දක්වාත් පරාසයක පිහිටා ඇත. 2010 වර්ෂයේ අස්වැන්න සලකා බැලූ විට අක්කරයකට බුසල් 124ක වැනි ඉහළ අස්වැන්නක් ලැබී තිබෙන බව පෙනේ.

### 2.2.8.11 මහවැලි එච්.කලාපය

මහවැලි එච් කලාපයේ (මාතලේ සහ අනුරාධපුර යන දිස්ත්‍රික්ක) වැඩි ම අස්වැද්දූම් ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ 2005 වර්ෂයේ වන අතර එය හෙක්ටයාර් 26,734කි. මෙතෙක් වාර්තා වී ඇති වැඩි ම මහ කන්නයේ වී වගා ප්‍රමාණය ද 2003 වර්ෂයේ වන අතර එම ප්‍රමාණය හෙක්ටයාර් 25339කි. වාර්තා වී ඇති පරිදි යල කන්නයක වැඩිම වී වගා බිම් ප්‍රමාණය 2001 වර්ෂයේ හෙක්ටයාර් 9586කි. "අපි වවමු - රට නගමු" වැඩසටහන ඇරඹීමට පෙර වර්ෂය වූ 2005/06 මහ කන්නයේ වී වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් 25,094ක් වන අතර 2006 යල වී වගා ප්‍රමාණය හෙක්ටයාර් 13479කි. මෙතෙක් වාර්තා වූ වැඩි ම වී වගා හෙක්ටයාර් ප්‍රමාණය වූ 25,339 සමග සසඳන කල 2005/06 මහ කන්නයේ හෙක්ටයාර් 245ක අඩුවීමක්

පෙන්වයි. මෙය සුළු අඩුවීමකි. යල කන්නය ගත්විට මීට පෙර උපරිම වී වගා බිම් ප්‍රමාණය සමග සසඳන විට 2006 යල කන්නයේ වී වගාව වැඩි වී තිබේ. 2006/ 07 මාස් කන්නයේ සිට "අපි වවමු - රට නගමු" වැඩසටහන ආරම්භ වන අතර මහවැලි එච් කලාපයේ වී වගා බිම් ප්‍රමාණයේ වැඩිවීමක් සිදු වී ඇත්දැයි සොයාගැනීමට පුළුවන.

**වගු අංක 2.28: වී වගා බිම් ප්‍රමාණය - මහවැලි එච්.කලාපය 2006 - 2011 (හෙක්ටයාර්)**

| 2006/07 මහ | 2007 යල | 2007/08 මහ | 2008 යල | 2008/09 මහ | 2009 යල | 2009/10 මහ | 2010 යල | 2010/11 මහ | 2011 යල |
|---|---|---|---|---|---|---|---|---|---|
| 25106 | 13451 | 24183 | 11440 | 24178 | 17758 | 24849 | 6481 | 25012 | 15824 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව,2011

ඉහත සංඛ්‍යා සටහනට අනුව මාස් කන්නයේ වී වගා බිම් ප්‍රමාණයේ කැපී පෙනෙන වැඩිවීමක් දක්නට නොලැබේ. එහෙත් 2006 යල කන්නය සමග සසඳන විට හෙක්ටයාර් 2345ක සැලකිය යුතු වැඩිවීමක් මෙම කාලපරිච්ඡේදය තුළ සිදු වී ඇති බව පෙනේ.

මහවැලි එච්.කලාපයේ සාමාන්‍ය අස්වැන්න 2005 වසරේ සිට ම ඉහළ මට්ටමක පැවති අතර ව්‍යාපෘති කාලය තුළ කැපී පෙනෙන වැඩිවීමක් සිදු වී නොමැති බව පෙනේ. වගු සටහන් අංක 2.29 යටතේ වී වගාවේ සාමාන්‍ය අස්වැන්න පිළිබඳ දත්ත ඉදිරිපත් කරයි.

**වගු අංක 2.29: මහවැලි එච්.කලාපය 2005-2011 කාලය තුළ සාමාන්‍ය අස්වැන්න (හෙක්ටයාර් 1ට මෙට්‍රික් ටොන්)**

| කන්නය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|
| මහ | 5.7 | 5.3 | 5.5 | 5.5 | 6.0 | 6.4 | - |
| යල | 4.8 | 4.7 | 5.1 | 5.4 | 4.8 | 5.5 | 5.5 |
| සාමාන්‍ය අස්වැන්න | 5.4 | 5.0 | 5.4 | 5.4 | 5.7 | 6.1 | 5.3 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2011

2.29 සංඛ්‍යා සටහන පරීක්ෂා කරන විට මහවැලි එච් කලාපයේ සාමාන්‍ය අස්වැන්න 2005 වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂය වන විට මහ සහ යල කන්න දෙකේදී ම වැඩි වී ඇති බව පෙනේ. 2010 වර්ෂයේ දී කන්න දෙකේ ම සාමාන්‍ය අගයන් අනුව ගණන් බැලීමේ දී අක්කර එකට බුසල් 120ක් වැනි අස්වැන්නක් ලබා ඇති බව පෙනේ. වී වගාවේ අස්වැන්න වසරින් වසර උච්චාවචනය වන ස්වභාවයක් ගෙන ඇති බව පෙනේ.

### 2.2.9.1 පුරන් කුඹුරු වගා කිරීමේ ඉලක්ක

පුරන් කුඹුර වගා කිරීමේ වැඩසටහනේ සාර්ථකත්වය මැනීම සඳහා පහත සඳහන් නිර්නායක හතර භාවිතා කරන ලදී. එනම්,

- පුරන් කුඹුරු වගාකිරීමේ ඉලක්ක සපුරා ගැනීම
- ඒක පුද්ගල සහල් පරිභෝජනය
- තිරිඟු පිටි ආනයනය
- කුඹුරුවල ඵලදායීතාවය ඉහළ නැංවීම

**වගු අංක 2.30 : පුරන් කුඹුරු වගාකිරීමේ ඉලක්ක සපුරා ගැනීම**

| වගා කිරීමට යෝජිත පුරන් කුඹුරු වැඩසටහන් | ප්‍රමාණය (හෙක්) | වගා කරන ලද ප්‍රමාණය (හෙක්) | ප්‍රතිශතය % |
|---|---|---|---|
| පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන | 6,650 | | |
| නැගෙනහිර පළාතේ විශේෂ සංවර්ධන වැඩසටහන | 25,000 | | |
| වියළි හා අන්තර් මාධ්‍ය කලාපයේ අත්හැර දමා ඇති කුඹුරු | 30,000 | | |
| **එකතුව** | **56,650** | **21,500** | **38** |

පුරන් කුඹුරු වගා කිරීමේ වැඩසටහන යටතේ හෙක්ටයාර් 56,650ක් නැවත වගා කිරීම ඉලක්කය වූ අතර 2006/2007 මාස් කන්නයේ සිට 2010/2011 මාස් කන්නය දක්වා පුරන් කුඹුරු යළි වගා කිරීමේ වැඩසටහන් යටතේ හේකටයාර් 21,500ක් වගා කිරීමට හැකි වී ඇත. මෙය ඉලකක්යෙන් 38%ක් පමණක් සපුරා ගැනීමකි.

## 2.2.9.2 ඒක පුද්ගල සහල් පරිභෝජනය

1978/79 වර්ෂවල වාර්ෂික ඒක පුද්ගල සහල් පරිභෝජනය නාගරික, ග්‍රාමීය වතු යන සියලු අංශයන්හි පැවතියේ කිලෝග්‍රෑම් 90.90ක් ලෙස ය. එයට ප්‍රධාන ම හේතුව තිරිඟු පිටි මිල අඩු මට්ටමක පැවතීම ය. අනතුරුව 1996/97 වර්ෂවල ඒක පුද්ගල සහල් පරිභෝජනය ක්‍රමයෙන් වැඩිවීමක් දක්නට ඇත. 1996/97 වර්ෂයේ ඒක පුද්ගල සහල් පරිභෝජනය වර්ෂයකට කිලෝග්‍රෑම් 106.14ක් දක්වා වැඩි වී ඇත. ජනගහනය වැඩිවීමක් සිදු වුවත් තිරිඟු පිටි මිල ඉහළයාම, සෞඛ්‍යමය දැනුවත්වීම් හා රටේ වී නිෂ්පාදනය වැඩිවීම නිසා සාමාන්‍ය පාරිභෝගිකයන්ට දැරිය හැකි මිලකට සහල් මිලදී ගැනීමට හැකිවන අයුරින් වෙළෙඳපොළේ සහල් සුලබව පැවතීම නිසා ඒක පුද්ගල සහල් පරිභෝජනය ක්‍රමයෙන් වැඩි වී ඇත.

ආදායම් වියදම් සමීක්ෂණය 2009-2010ට අනුව ඒක පුද්ගල සහල් පරිභෝජනය වර්ෂයකට කිලෝග්‍රෑම් 108.7 දක්වා තවදුරටත් වැඩි වී තිබුණි. එහෙත් සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනය ද සමඟ එකතුව ගත් විට ඒක පුද්ගල සහල් සහ සහල් පිටි පරිභෝජනය වර්ෂයකට කිලෝ ග්‍රෑම් 113ක් වී ඇත. මෙයින් පෙනී යන්නේ සහල් පරිභෝජනයේ වර්ධනයක් දක්නට ලැබෙන බවයි. වගු සටහන් අංක 2.31 යටතේ ශ්‍රී ලංකාවේ සියලු අංශවල ඒක පුද්ගල සහල් පරිභෝජනය පිළිබඳ දත්ත ඉදිරිපත් කෙරේ.

**වගු අංක 2.31 : ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල සහල් පරිභෝජනය (වර්ෂයකට කිලෝ ග්‍රෑම්)**

| වර්ෂය | නාගරික | ග්‍රාමීය | වතු | සියලුම අංශ |
|---|---|---|---|---|
| 1978/79 | 77.20 | 95.90 | 88.40 | 90.90 |
| 1996/97 | 77.59 | 110.34 | 110.39 | 106.14 |
| 2003/04 | 29.17 | 110.28 | 109.72 | 106.21 |
| 2006/04 | 77.43 | 113.21 | 116.27 | 108.01 |
| 2009/10 | 77.43 | 113.21 | 116.27 | 108.70 |

මූලාශ්‍රය: ආදායම් වියදම් සමීක්ෂණය, 2006/07, 2009/10

වාර්ෂික ඒක පුද්ගල සහල් පරිභෝජනය අදාළ කාලය තුළ ඉහළ යාමක් සිදු වී ඇතත් අපි වවමු රට නගමු වැඩසටහනෙහි ඉලක්කය කි. ග්‍රෑ. 116 මට්ටමට ළඟාවීමට නොහැකි වී ඇති බව පෙනේ.

### 2.2.9.3 ඒක පුද්ගල තිරිඟු පිටි පරිභෝජනය

තිරිඟු පිටි ආනයනික ආහාර ද්‍රව්‍යයක් වන අතර මෑත කාලීන ප්‍රවණතාවය වූයේ ලෝක වෙළඳපළේ තිරිඟු පිටි මිල ඉහළයාම යි. මෙම තත්ත්වය නිසාත් දේශීය සහල් නිෂ්පාදනය දිරිගැන්වීම නිසාත් සෞඛ්‍යමය හේතුන්ගේ බලපෑම නිසා ජනතාව තිරිඟු පිටි පරිභෝජනය ක්‍රම ක්‍රමයෙන් අඩු කිරීමේ ප්‍රවණතාවයක් දැකිය හැකිය. දේශීය ආහාර නිෂ්පාදනය දිරිගැන්වීමත් සමග ම දේශීය ආහාර පරිභෝජනය කෙරෙහි ද ශ්‍රී ලාංකිකයන් වැඩි වශයෙන් පෙළඹීම හේතුවෙන් තිරිඟු පිටි ආශ්‍රිත ආහාර පරිභෝජනය අඩු කිරීම මෙම වැඩසටහනෙ හි අපේක්ෂාවයි. වගු සටහන් අංක 2.32 යටතේ ඒක පුද්ගල තිරිඟු පිටි පරිභෝජනය පිළිබඳ දත්ත ඉදිරිපත් කරයි.

**වගු අංක 2.32: ඒක පුද්ගල තිරිඟු පිටි පරිභෝජනය**

| වර්ෂය | ඒක පුද්ගල තිරිඟු පිටි පරිභෝජනය(කිලෝ ග්‍රෑම්) |
|---|---|
| 2003/04 | 9.4 |
| 2005 | 9.1 |
| 2006/07 | 7.0 |
| 2009/10 | 8.2 |

මූලාශ්‍රය: ගෘහස්ථ ආදායම් වියදම් සමීක්ෂණය, ශ්‍රී ලංකා මහ බැංකුව, 2010

### 2.2.9.4 තිරිඟු පිටි සහ ඇට ආනයනය

දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ යාමත් සමග ම ආනයනික තිරිඟු පිටි ප්‍රමාණය අඩු විය යුතුය. වගු සටහන් අංක 2.33 යටතේ තිරිඟු පිටි ආනයනය දක්වා ඇත. තිරිඟු පිටි සහ ඇට ආනයනික ප්‍රමාණය 2010 වර්ෂයේ සිට ඉහළ යාමේ ප්‍රවණතාවයක් දක්නට හැකිය. මේ නිසා තිරිඟු පිටි ආශ්‍රිත ආහාර පරිභෝජනය සීමා වීමේ අපේක්ෂාව ඉටු වී නොමැති අතර විදේශ විනිමය වැයවීම සීමා කිරීමේ අපේක්ෂාව ද ඉටු වී නොමැති බව පෙනේ.

වගු අංක **2.33:** තිරිඟු පිටි සහ ඇට ආනයනය

| වර්ෂය | ආනයනික ප්‍රමාණය පිටි (මෙ.ටො) | ආනයනික ප්‍රමාණය ඇට (මෙ.ටො) | වටිනාකම (රුපියල් දහස්) පිටි | වටිනාකම (රුපියල් දහස්) ඇට |
|---|---|---|---|---|
| 2005 | 150,436 | 934,624 | 3,200,350 | 15,456,786 |
| 2006 | 13,578 | 1,174,604 | 320,452 | 20,472,909 |
| 2007 | 5,797 | 854,858 | 266,690 | 22,755,493 |
| 2008 | 2,083 | 954,211 | 109,976 | 42,396,913 |
| 2009 | 2,997 | 1,035,301 | 192,113 | 30,868,475 |
| 2010 | 1,415 | 944,859 | 59,601 | 26,710,397 |
| 2011 | 29,104 | 1,325,593 | 1,470,980 | 49,640,125 |
| 2012 | 10,588 | 1,114,150 | 515,960 | 46,877,235 |

මූලාශ්‍රය: රේගු දෙපාර්තමේන්තුව, 2011

තිරිඟු පිටි ආනයනික ප්‍රමාණය ගත්විට 2005 වර්ෂයේ සිට 2010 වර්ෂය වනවිට ක්‍රමයෙන් අඩු වීමක් දක්නට ඇත. එහෙත් ආනයනික මිල ගණන්වල ඉහළයාම නිසා ආනයනික ප්‍රමාණය අඩුවීමක් සිදු වුවත් ආනයනික වටිනාකම තවමත් ඉහළ මට්ටමක පවතී. දේශගුණික හේතු නිසා දේශීය කෘෂිකර්මයේ සිදු වූ පසුබෑම නිසා 2011 වර්ෂයේ තිරිඟු පිටි ආනයනික ප්‍රමාණය යළිත් ඉහළ ගොස් ඇත.

### 2.2.9.5 පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා වැය කර ඇති මුදල

පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදීම ඇරඹී ඇත්තේ 2009/10 මාස් කන්නයේ දී ය. ඒ අනුව 2010 යල කන්නයේ සහ 2011 වර්ෂයේදී ත් අස්වද්දන ලද කුඹුරුවලින් කොටසක් මෙම මුදල් ප්‍රතිපාදන යටතේ අස්වද්දා ඇත. පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන සඳහා ලබාදුන් මුදල් ප්‍රතිපාදන පහත සඳහන් ආකාරයට දැක්වීමට පුළුවන.

වගු අංක 2.34 : පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා වැය කර ඇති මුදල

| වර්ෂය | ප්‍රතිපාදන සැපයූ මූලය | ප්‍රතිපාදන ප්‍රමාණය රු. |
|---|---|---|
| 2010/11 මහ | තෙත් කලාපීය ප්‍රදේශවල වී වගාව ඉහළ නැංවීම සඳහා ලබාදුන් ප්‍රතිපාදන යටතේ | 8,143,913.43 |
| 2010 යල | ගොවීන්ගේ භාරකාර අරමුදලින් | 54250,297.22 |
| | USAID යටතේ | 9100,000.00 |
| | පුරන් කුඹුරු අස්වැද්දීමේ විශේෂ වැඩසටහන සඳහා ලබාදුන් ප්‍රතිපාදන යටතේ | 99,956,820.97 |
| | උතුරු වසන්තය සඳහා ලබාදුන් ප්‍රතිපාදන යටතේ ගොවීන්ගේ භාරකාර අරමුදලින් | 20,285,000.00 |
| 2011 | USAID යටතේ | 22,900,000.00 |
| | පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන සඳහා ලබාදුන් ප්‍රතිපාදන යටතේ | 181,571,784.55 |

මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

'අපි වවමු - රට නගමු' වැඩසටහන හඳුන්වාදීමටත් පෙර සිට ම පුරන් කුඹුරු වගා කිරීමේ වැඩසටහන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර තිබුණි. 'අපි වවමු රට නගමු' වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් පසුව ද පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක විය. මෙම වැඩසටහන සඳහා ගොවීන් වැඩි වැඩියෙන් පෙළඹවීම සඳහා පුරන් කුඹුරුවල පැවති ළඳු කැලෑව මර්දනය කිරීම සඳහා වල්නාශක ලබාදීම, වගා කිරීමට බිත්තර වී ලබාදීම යන කාර්යයන් සඳහා රජයේ මුදල් ප්‍රතිපාදන ලබාදීම 2010 වසරේ සිට ආරම්භ කරන ලදී. ඒ අනුව 2009/10 මහ සහ 2011 යල කන්නවල පුරන් කුඹුරු වගාකිරීම සඳහා රුපියල් මිලියන 112.6ක් වැය කර තිබුණි.

**කුඹුරුවල ඵලදායීතාවය ඉහළ නැංවීම**

වී වගාවට හිතකර පරිසරයක් සහිත වියළි හා අන්තර් මාධ්‍ය කලාපවල හා තෙත් කලාපයේ ද වී වගා ඉඩම්වල ඵලදායීතාවය හෙක්ටයාර් එකකට මෙට්‍රික් ටොන් 5.2 දක්වා ඉහළ නැංවීම මෙම වැඩසටහනේ තවත් ඉලක්කයකි. වගු සටහන් අංක 2.59, 2.61 සහ 2.63 යටතේ දක්වා ඇති වී වගාවේ සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 5.2 මට්ටමේ හා ඉන් ඔබ්බට වර්ධනය වී ඇත්තේ උඩවලව විශේෂ බල ප්‍රදේශය හා සහ මහවැලි එච් කලාපය

පමණි. එම නිසා කුඹුරුවල ඵලදායිතාවය ඉහළ නැංවීමේ අපේක්ෂාව ඉටු වී ඇත්තේ ප්‍රදේශ දෙකකින් පමණි.

### 2.2.9.6 පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ පෑමට සිදු වූ ගැටලු

ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ වගාකරන කුඹුරු ඉඩම් ප්‍රමාණය අඩුවීමේ ප්‍රවණතා නමින් පුරන් කුඹුරු අස්වැද්දීම පිළිබඳ අධ්‍යයනයක් මෙම ආයතනයේ ඇපාසිංහ මහතා විසින් 2007 වර්ෂයේ දී සිදු කර ඇත. එම අධ්‍යයනයේ සොයාගැනීම් අතර වාරි පද්ධති නිසි ලෙස ක්‍රියාත්මක නොවීම, අයහපත් කාලගුණික හා දේශගුණික තත්ත්වය, නිෂ්පාදන වියදම් ඉහළයාම, සත්ත්ව හානි, යාබද කුඹුරු වගා නොකිරීම, ගොවි පවුල්වල ආදායම පුරන් කුඹුරු යළි අස්වැද්දීමට තරම් ප්‍රමාණවත් නොවීම, කුඹුරුවල ලවණතාව-මලකඩ හා කිවුල, අඩු අස්වැන්න, මී උණ වැළදීම, ප්‍රවේශ මාර්ග නොමැතිකම, එකම යායක එකට වගා නොකිරීම නිසා අස්වනු හානිවීම, ඉඩම් භුක්තිය සම්බන්ධ ගැටලු, ඉඩම් හිමියන් කෘෂිකර්මයට පරිබාහිර රැකියාවල නිරතවීම නිසා වගාවට අවස්ථා අඩුකම, ගොවි ජනතාවට සමාජ පිළිගැනීමක් නොමැතිකම, ගොවීන්ගේ පෞද්ගලික රෝගාබාධ හා අබල දුබල වීම්, වී අලෙවිය සඳහා සාධාරණ මිලක් නොමැතිකම සහ නීතිමය ගැටලු පෙන්වා දී තිබුණි.

මෙම අධ්‍යයනයේ දී අප විසින් අවධානය යොමු කරන ලද්දේ පුරන් කුඹුරු වගා කිරීමේ වැඩසටහන ක්‍රියාවට නැංවීමේ දී ඒ පිළිබඳව ප්‍රධානත්වය ගෙන කටයුතු කළ ප්‍රධානතම නිලධාරීන් අයත් වූ ගොවිජන සංවර්ධන, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ කුඹුරු හිමියන් දක්වන ලද අදහස්ය. ඒ අනුව අතීතයේ පැවති සමාජයේ මෙන් නොව වර්තමාන සමාජයේ ගොවි පවුල්වල සාමාජිකයන්ගේ සිතුම් පැතුම් කෘෂිකාර්මික පසුබිමින් ඉවතට ගමන්කර වාණිජමය පරමාර්ථවලින් ඔවුන් පෝෂණය වී පැවතීම නිසා ඔවුන් කුඹුරු ඉඩම් පිළිබඳව දක්වන ආකල්පය වෙනසකට භාජනය වී ඇත. ඔවුන් අපේක්ෂා කරනුයේ සිය කුඹුරු ඉඩමෙන් ක්ෂණිකව විශාල මුදලක් උපයාගැනීමේ මාර්ග පිළිබඳවයි. එම නිසා දශක ගණනාවක් තිස්සේ වී නිෂ්පාදනය කළ කුඹුර නැමති ඉඩම් ඒකකය පුරන්වීමට ඉඩ හැර වල් බිහි කොට ඉන් පසුව රහසේ ගොඩ කර කොටස් කර අලෙවිකළ හැකි ගොඩ ඉඩම් ඒකකයක් ලෙසට පරිවර්තනය කිරීමටය. එසේ නොමැති නම්, එහි ගොඩනැඟිලි තනා ව්‍යාපාර පවත්වාගෙනයාම හෝ ඒවා කුලියට දීම හෝ නිවෙස් තනා පදිංචි වීම හෝ කුලියට දීම වැනි කරුණු ඔස්සේ මුදල් ඉපැයීම කෙරෙහි ය. එවැනි මානසික තත්ත්වයකට වර්තමාන සමාජ පත් වී ඇති නිසා පුරන් කුඹුරු වගා නොකොට මුදල් ඉපයිය හැකි වෙනත් රැකියාවල යෙදී පවුලේ පරිභෝජනය සඳහා වෙළඳපොළෙන් සහල් හෝ තිරිඟු මිලදී ගැනීම කෙරෙහිය.

වර්තමාන තරුණ පරපුර විශේෂයෙන් ම වී වගා කෘෂිකර්මයට පිවිසීමේ අකමැත්තක් දැක්වීම ප්‍රකට කරුණක් වී ඇත. තම දෙමවුපියන් වයෝවෘද්ධ වූ පසු පවුලේ ඉඩම් දරුවන්ට උරුම වුව ද ඔවුන් වෙනත් ක්ෂේත්‍රවල ජීවන මාර්ගවලට අනුගත වී සිටීම නිසා ඔවුන් කුඹුර පිළිබඳව දක්වන්නේ අලස ආකල්පයකි. එම නිසා වී වගා කර ආහාර සපයා ගැනීමට වඩා මුදලට සහල් මිලදී ගැනීම පහසු කාර්යයක් බව කල්පනා කිරීමට ඔවුන් පෙළඹීම නිසා කුඹුරු වගාකිරීම දුෂ්කර සහ ප්‍රතිඵල රහිත කාර්යයන් ලෙස සැලකීමට පුරුදු වී ඇත.

අයිතිකරුවන් සොයාගැනීමේ අපහසුව ද පුරන් කුඹුරු වගා කිරීමේ වැඩසටහනේ දී මුහුණ පෑමට සිදු වූ තවත් ගැටලුවකි. අයිතිකරුවන් විදේශගත වීම, ඇතැම් පවුල්වල සාමාජිකයන් වයස්ගතවීම හා පවුලේ සෙසු සාමාජිකයන් කොළඹ හෝ වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීම නිසා අයිතිකරුවන් ලෙස ඉදිරිපත්වීමට පුද්ගලයන් නොසිටීම ද කුඹුරු පුරන් ඇරීමේ දී මුහුණ පෑමට සිදු වූ තවත් ගැටලුවකි.

කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර අවශ්‍ය කාලයට සහ අවශ්‍ය වේලාවට සපයාගැනීමට නොහැකිවීම. නිසා ද ගොවීන් තම කුඹුර පුරන් වන්නට ඉඩහැර තිබුණි. ඒ අනුව කෘෂි යන්ත්‍රෝපකරණ හිඟය ද කුඹුරු පුරන්වීමට ප්‍රධාන හේතුවක් ලෙස හඳුනාගත හැකි විය. තෙත් කලාපයේ ගොවීන්ගෙන් බහුතරය අර්ධ කාලීනව කෘෂිකර්මයේ නියැලෙන්නෝ වෙති. ඔවුන්ට වගා කටයුතුවල යෙදීමට ඇති කාලය සීමිත නිසා කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ භාවිතා කරමින් කෙටි කාලයක් තුළ වගාකටයුතු කිරීමට උත්සාහ දරති. එම නිසා කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ හිඟයකින් තොරව අවශ්‍ය අවස්ථාවල දී සපයාගැනීමේ පහසුකම් නොතිබුණහොත් ඔවුහු එම කන්නය වගා කිරීමෙන් වැළකී සිටීමට උත්සාහ දරති.

පුරන් කුඹුරු වගා කිරීමේ වැඩසටහනේ දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් විසින් වල්නාශක, බිත්තර වී යනා දී යෙදවුම් අඩියරෙන් අඩියර ගොවීන්ට ලබාදීම සිදු කරනු ලදී. පුරන් කුඹුරු අස්වද්දන යායේ කුඹුරු හිමි ඇතැම් ගොවීන් යායේ නියමිත කාලසටහනට අනුව වැඩකරන සෙසු ගොවීන් සමඟ එකට වැඩ කිරීම කල්පසු කරන ප්‍රතිපත්තියක් අනුගමනය කළ නිසා කෘෂිකර්ම නිලධාරීන් අපහසුතාවයට පත් වූ අවස්ථා තිබුණි. මෙවැනි ඇතැම් ගොවීන් ග්ලයිපොසෙට් වල්නාශක යායේ සෙසු ගොවීන් සමඟ එකට යොදා නොතිබීම නිසා බිත්තර වී ලබාදීමට යන අවස්ථාවේ දී ද, කුඹුරේ වල් මර්දනය කර නොතිබුණි. මෙවැනි ගොවීන් පූර්ණ කාලීන ගොවීන් නොව අර්ධ කාලීන ගොවීන් වූ අතර ඔවුන් කුඹුර වගා කරනවා යැයි පවසමින් කල්ගත කිරීම නිසා එම ද්‍රව්‍ය ලබාදෙන කෘෂිකර්ම නිලධාරීන් අපහසුතාවයට පත් වූ බව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ අත්දැකීම විය. එබැවින් මෙම වැඩසටහන ක්‍රමානුකූලව සිදු කිරීමට බාධා එල්ල වූ බව ඔවුන්ගේ අත්දැකීම විය.

විශේෂයෙන් නෙත් කලාපයේ දී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් බිත්තර වී සහ කෘෂි රසායනික ද්‍රව්‍ය සැපයීම වැනි සානුබල යටතේ පුරන් කුඹුරු අස්වැද්දීමට කුඹුරු හිමියන් පොළඹවා ගැනීමට හැකි වුව ද කන්න දෙක තුනක් වගා කිරීමෙන් පසු යළිත් එම කුඹුරු පුරන් වන්නට ඉඩ හැර ඇති අවස්ථා ගණනාවක් වාර්තා වී ඇත. එම තත්ත්වය මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ පෑමට සිදු වූ ප්‍රබල ගැටලුවකි.

පුරන් කුඹුරු වගාකරවීම සඳහා රජය විසින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතට පවරා ගත්ත ද එම ඉඩම් වගා කිරීම සඳහා පවරා දීමට කැමැත්තෙන් ඉදිරිපත්වන පුද්ගලයන් සොයාගැනීම ගැටලුවක් වී ඇත. එම නිසා පවරා ගන්නා ලද ඉඩම් වුව ද වගා කිරීමට පවරාදීම සම්බන්ධයෙන් ගැටලු පවතී.

වසර ගණනාවක් තිස්සේ වල් බිහි වී කැඩී බිඳී පැවති ඇළ මාර්ග හා අමුණු පද්ධති නැවත ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලැබීම් ප්‍රමාදවීම, සීමිතවීම මෙන් ම ප්‍රතිසංස්කරණය කටයුතු කඩිනම් නොවීම වැනි හේතු පුරන් කුඹුරු අස්වැද්දීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම නොවීමට තවත් හේතුවක් වී තිබුණි.

### 2.2.9.7 පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහනේ දී මුහුණ පෑමට සිදු වූ ගැටලු සඳහා විසඳුම්

කුඹුරු පුරන් වීමට හේතු වූ ගැටලු වෙන වෙනම හඳුනාගැනීම මඟින් එම එක් එක් ගැටලුවේ ස්වභාවය අනුව ඒවාට විසඳුම් ලබාදීමට ක්‍රියාකළ යුතු වේ. ජලය ලබාගැනීමට අවශ්‍ය අමුණු හා ඇළමාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය පියවර ගැනීම තුළින් ජලය සපයාදීමෙන් යළිත් කුඹුරු අස්වැද්දීමට පුළුවන. ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා ගොවි සංවිධාන සහභාගීත්වයෙන් මිනිස් ශ්‍රමයෙන් ප්‍රතිසංස්කරණය කළ හැකි කොටස් ශ්‍රමදාන මඟින් ප්‍රතිසංස්කරණය කිරීම, යුධ හමුදාවේ බැකෝ යන්ත්‍ර යොදවා ගැනීම, ප්‍රාදේශීය සභාවලට අයත් බැකෝ යන්ත්‍ර සහ ට්‍රැක්ටර් යොදා ගැනීම මඟින් මෙම ඇළමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යොදවා ගැනීමට ක්‍රියා කළ යුතුය. කෘෂි පාරවල් නොමැතිකම නිසා ඇතැම් කුඹුරු යායවල්වලට ට්‍රැක්ටර් ගෙනයාමට නොහැකිවීමෙන් කුඹුරු පුරන්වීමට ඉඩහැරීමට ගොවීන්ට සිදු වී ඇත. එවැනි ගැටලුවල දී ඇළවල් හරහා ට්‍රැක්ටර් පැන්නුම් ඉදි කිරීම, කෘෂි මාර්ග ඉදිකිරීම වැනි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ක්‍රියාමාර්ග ගත යුත් වන්නේ ය. එම නිසා පුරන් කුඹුරු ඇතිවීමේ ගැටලුවට අදාළ වී ඇත්තේ යම් කිසි යටිතල පහසුකම පිළිබඳ ප්‍රශ්නයක් නම් එම ප්‍රශ්න විසඳීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාමාර්ග ගත යුතුය.

පුරන් කුඹුරු අස්වද්දීම සඳහා තෝරාගත් යායක පළමුවන බිම් සකස් කිරීම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කර දෙන්නේ නම් එම පුරන් කුඹුරු අස්වැද්දන ගොවීන් සඳහා එය දිරිගැන්වීමක් වේ.

ගොවි සංවිධාන සඳහා රෝද දෙකේ ට්‍රැක්ටර් , වී සුද්ද කරන යන්ත්‍ර, ගොයම් කපන කුඩා පරිමාණ යන්ත්‍ර, ගොයම් පාගන කුඩා යන්ත්‍ර, තෙල් ඉසින යන්ත්‍ර ආදී කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ 50% සහන මිලකට ලබාදෙන්නේ නම් එම පහසුකම් භාවිතා කිරීමෙන් තම කුඹුරු පුරන්වන්නට ඉඩ නොතබා අඛණ්ඩව වගාව කරගෙන යාමට හැකි බව ගොවීන් මෙන්ම කෘෂි ක්ෂේත්‍ර නිලධාරීහු ද ප්‍රකාශ කළහ.

ඇල මාර්ග ප්‍රතිසංස්කරණය කරන අවස්ථාවල දී ඇළ මාර්ග කිහිපයක් පමණක් ප්‍රතිසංස්කරණය කිරීම ප්‍රතිඵලදායක නොවන අතර සමස්ත වාරි පද්ධතියම ප්‍රතිසංස්කරණය කළ යුතු වෙයි. එසේ කළ විට ජලය සැපයීම පහසුවෙන් කළ හැකි අතර වැඩි ජලය නිසි පරිදි බැසයාම ද සිදුවන බැවින් වගාව සුරක්ෂිත වෙයි. එම නිසා ගොවීන් තුළ විශ්වාසයක් ගොඩනැගෙන අතර ඒ මත ගොවීන් තම පුරන් වී ඇති කුඹුරු වගා කිරීමට පෙළඹීමට පුළුවන.

පුරන් වී ඇති කුඹුරුවල වී වගාවට උත්සාහ නොගෙන ඒ වෙනුවට එළවළු, කිරි, මල් වැනි වෙනත් මුදල් බෝග වගාවලට ගොවීන් පෙළඹවීම සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය, උපදෙස් හා තාක්ෂණය සැපයීම කළ යුතු අතර එමඟින් ගොවියා සහ කුඹුරු ඉඩම අතර සම්බන්ධය නොබිඳී පවත්වාගෙන යාමට හැකියාව ලැබෙන අතර කුඹුරු පුරන්වීම සීමා කළ හැකිය.

පුරන් කුඹුරු අස්වද්දන ගොවීන් සඳහා බීජ, කෘෂි රසායනික ද්‍රව්‍ය පහසු මිල ගණන් යටතේ වසරක් පමණ (කන්න 02ක්) සැපයීම මඟින් ගොවීන් පුරන් කුඹුරු වගාවට පොළඹවා ගැනීමට හැකියාව ඇත. එළවළු වෙළඳපොළ සඳහා උසස් තත්ත්වයේ දේශීය එළවළු හා කිර වගා කිරීමට ගොවීන් පෙළඹවීම හා කාබනික පොහොර යෙදීමෙන් එළවළු වගා කිරීම මඟින් ඉහළ මිලක් ලබා ගැනීමට අවස්ථාව සලසාදීම මඟින් ගොවීන්ගේ ආදායම වැඩිකිරීමට ක්‍රියාමාර්ග ගැනීම තුළින් ද පුරන් කුඹුරු වගාවට ගොවීන් පෙළඹවිය හැකිය.

වී වගාව කාබනික පොහොර යෙදීම මඟින් අපනයනය වෙළඳපොළ පදනම් කරගත් දේශීය පාරම්පරික වී වගාවට ගොවීන් යොමු කරවීම මගින් ගොවීන්ට ඉහළ ආදායමක් ලබාගැනීමට අවස්ථාව සැලසීමෙන් පුරන් කුඹුරු වගා කිරීමට පෙළඹවීමට හැකිය. මෙහි වාසි පිළිබඳව ගොවීන්ට හොඳ අවබෝධයක් ලබාදීම කළ යුතු වේ. මෙවැනි ක්‍රියාමාර්ග තුළින් පුරන් කුඹුරු වගා කරවීමට ගොවීන් පොළඹවා ගැනීමට හැකිය.

මිනිස් සෞඛ්‍යට තර්ජනයන් ඇති කරන මී උණ වැනි රෝග මර්දනය සඳහා ගොවීන් දැනුවත් කිරීම, මී උණ සඳහා ගොවීන්ට නියම කර ඇති බෙහෙත් පෙති වගා කන්නයට පෙර ගොවි සංවිධාන හරහා ගොවීන්ට ලබාදීම වැනි ක්‍රියාමාර්ග තුළින් ගොවීන්ගේ බිය පහකොට ඔවුන් පුරන් කුඹුරු යළි අස්වැද්දීම සඳහා යොමු කළ හැකිය.

නව තාක්ෂණය, යන්ත්‍ර භාවිතය හා වෙළඳපොළ පනදම් කරගනිමින් මහා පරිමාණයෙන් වී වගා කිරීම සඳහා කැමති ව්‍යාපාරික මට්ටමේ ගොවීන් හා තරුණයින් සඳහා පුරන් කුඹුරු යායවල් කුඹුරු හිමියන් සමඟ ඇතිකරගන්නා ගිවිසුමක් මත ලබාදීමේ ක්‍රම මඟින් වී වගාවට ජනතාව යොමුකරවීමේ ක්‍රම පිළිබඳව ඇති ඉඩකඩ සොයාබැලීම ද කාලීන වශයෙන් පැහැදිලි විය.

**සිද්ධි අධ්‍යයනය 2.1 - පුරන් කුඹුරු අස්වැද්දීම**

මීරිගම ගොවිජන සේවා බල ප්‍රදේශයේ, බෝතලේ පහළගම පදිංචි කේ.ඒ.ඩේවිට් මහතා වයස අවුරුදු 85ක් වූ ගොවි මහතෙකි. ඔහු සිය පුත්‍රයාගේ ද සහයෝගයෙන් වී ගොවිතැන කරයි. අමුණකින් ජලය සපයාගෙන වගා කරනු ලබන අක්කර 23කින් යුතු කුඹුරු යායක වී ලාස් 10ක කුඹුරක් මෙම ගොවි මහතාට අයත් ය. පසුගිය ගංවතුරකට මෙම අමුණ අඩපණ වීම නිසා ජලය නොමැතිකමින් කුඹුර යාය වගා කිරීමට නොහැකිව පුරන් විය. එබැවින් කන්නයක් පාසා අවම වශයෙන් ලබාගනිමින් පැවති වී බුසල් 30ක පමණ ප්‍රමාණය අහිමි විය. මෙම නිවසේ සාමාජිකයින් පස් දෙනෙක් සිටින අතර ඔවුහු තුන්වේලම බත් අනුභව කරති. කුඹුර පුරන්වීම නිසා පවුලේ ආහාර සඳහා වෙළඳපොළෙන් සහල් මිල දී ගැනීමට සිදු විය. ඔවුන් නාඩු වර්ගයේ තැම්බූ සහල් පරිභොජනය කරන ලද අතර දිනකට සහල් කිලෝ ග්‍රෑම් 2ක් අවශ්‍ය විය. එවකට සහල් කිලෝ ග්‍රෑම් එකක මිල රුපියල් 55ක පමණ වූ අතර ඒ අනුව දිනකට රුපියල් 110.00 මුදලක් සහල් මිල දී ගැනීම සඳහා වැය විය. පුරන් කුඹුරු වගා කිරීමේ වැඩසටහන යටතේ ගොවීන්ගේ ශ්‍රමදානයෙන් අමුණ ප්‍රතිසංස්කරණය කර මීරිගම ගොවිජන සේවා මධ්‍යස්ථානයේ කෘෂිකර්ම උපදේශක හා අදාළ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වරයාගේ ද උදවු සහ මඟපෙන්වීම මත කුඹුර යාය යළි වගා කිරීමට හැකි විය. කුඹුරු වගා කිරීමේ දී සී සෑම, ඩැපොක් තවාන් සකස් කර ගොයම් පැළ සිටුවීම සහ ගොයම් කැපීම යන ප්‍රධාන කාර්යයන් ඇතුළු අනෙකුත් වියදම් සඳහා රුපියල් 12,000ක පමණ මුදලක් වැය විය. එක කන්නයක දී අවම අස්වැන්න ලෙස වී බුසල් 30ක් පමණ ලබාගත හැකි අතර එමඟින් වී කිලෝ ග්‍රෑම් 621ක් (30x 2.7=621) ලබාගත හැකිය. මෙම වී ප්‍රමාණයෙන් සහල් කිලෝ ග්‍රෑම් 414ක් (621 ÷ 1.5 = 414) ලබාගත හැකිය. මෙම නිවසේ සාමාජිකයන්ට දිනකට සහල් කිලෝ ග්‍රෑම් 02ක් පමණ අවශ්‍ය වේ. ඒ අනුව දින 207ක් (414÷2=207) ක් සඳහා සහල් ලබාගත හැකිය. මෙම සහල් ප්‍රමාණය මෙම පවුලට මාස 7කට ප්‍රමාණවත් වේ. (207÷ 30 = 6.9) එවකට පැවැති සහල් මිල අනුව රුපියල් 22770ක (414 x55= 22770) වටිනා සහල් ප්‍රමාණයක් ඔවුන් නිෂ්පාදනය කර ඇත. මෙම අස්වැන්න ලබාගැනීම සඳහා දරන ලද නිෂ්පාදන වියදම රුපියල් 12,000කි. එම නිසා රුපියල් 10770ක ලාභයක් ද පවුල සඳහා මාස 7කට ආසන්න ආහාර ආරක්ෂණයක් ද ලැබී ඇත. මෙම කුඹුරෙන් ලැබිය හැකි අවම අස්වැන්න බුසල් 30ක් වුවත් ගොවියාගේ අදහස අනුව මෙම ප්‍රමාණය බුසල් 60 දක්වා ඉහළ නැංවීමට පුළුවන. සතුටුදායක ලෙස ජලය සැපයීම හා හොඳ සාත්තුව මඟින් එම ඉහළ අස්වනු සඳහා යාමට හැකි බව ගොවි මහතාගේ අදහස විය. මේ නිසා කුඹුරු පුරන්වීමට ඉඩ නොදී වගා කිරීම ජාතික වගාකීමක් බව මෙම ගොවි පවුලේ සාමාජිකයන්ගේ අදහස විය.

## තුන්වැනි පරිච්ඡේදය

## ගෙවතු වගා ප්‍රවර්ධනය

"අපි වවමු - රට නගමු" වැඩසටහනෙ හි තවත් උපාංගයක් වූ ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කරන ලද ක්‍රමෝපායයන් එය දිවයින පුරා ක්‍රියාත්මක කිරීම පිළිබඳ වන ප්‍රගතිය ඇතුළත් සංඛ්‍යාත්මක විස්තර, මූල්‍යමය ප්‍රගතීන් හා වැඩසටහනේ දී ලද අත්දැකීම් මෙම පරිච්ඡේදය තුළ විස්තර කෙරේ.

### 3.0 ගෙවතු වගාව

### 3.1 හැඳින්වීම

"අපි වවමු රට නගමු" වැඩසටහන යටතේ වූ අරමුණු සපුරා ගැනීම සඳහා අනුගමනය කිරීමට සැලසුම් කළ ක්‍රමෝපායයන් අතර ගෙවතු වගා වැඩසටහන මූලික වේ. මේ යටතේ ග්‍රාමීය හා නාගරික ගෙවතු, පාසැල් භූමිවල ගෙවතු, පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ගෙවතු යනාදී ලෙස විවිධාකාරයේ වූ ගෙවතු ප්‍රචලිත කිරීම සඳහා සැලසුම් කර තිබිණ. ඒ අතර වඩාත් මූලික වූයේ ග්‍රාමීය හා නාගරික ගෙවතු වන අතර ඒ යටතේ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන පවුල් ලක්ෂ 40ක් පමණ වූ ප්‍රමාණයක ගෙවතු සංවර්ධනය සඳහා දායක කරගැනීම අපේක්ෂා කෙරිණි.

2002 වසරේ කෘෂිකාර්මික සංගණනයට අනුව කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර මිලියන 1.56ක් ගොවි කාණ්ඩ මිලියන 3.25ක් අතරේ බෙදී ගොස් තිබුණි. එම සංගණනයට අනුව මෙම ඉඩම් කට්ටිවල වගාකරුවන්ගෙන් ගෙවත්ත පමණක් ඇති ගොවින් 382,300ක් ද, ගෙවත්ත සහ වෙනත් ඉඩම් හිමි ගොවීන් 559,241ක් ද, වෙනත් ඉඩම් පමණක් ඇති ගොවි කාරකයින් 700,361ක් ද සිටින බව වාර්තා වේ. මෙම ඉඩම් කට්ටිවලින් 90% ට වැඩි ප්‍රමාණයක් තමන්ට අවශ්‍ය ආහාර බෝග සුළු වශයෙන් හෝ වගාකළ හැකි බව හඳුනාගෙන ඇත (කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය, 2007).

"අපි වවමු රට නගමු" වැඩසටහන අනුව තම එදානෙදා පරිභෝජනය සඳහා අවශ්‍ය එළවළු, පලතුරු, අල බෝග හා ඖෂධ වර්ග වගාකරනු ලබන්නේ තමන් පදිංචි ගෘහය ඇතුළත හෝ ඉන් කොටසක් හෝ ගෙවත්තේ වේ. නාගරික ප්‍රදේශයන්හි දී එහි ප්‍රමාණය පර්චස් 20 දක්වාත් ග්‍රාමීය ප්‍රදේශවල දී එය පර්චස් 80 දක්වාත් පැතිරිය හැකිය.

කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර (කෘ.ප.නි.ස), සමෘද්ධි නිලධාරී හා ග්‍රාම නිලධාරී යන ග්‍රාමීය මට්ටමේ සිටින රජයේ නිලධාරින්ගේ උපදෙස් හා මග පෙන්වීම යටතේ

සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇති ගෙවතු වගා වැඩසටහනින් "අපි වවමු - රට නගමු" ජාතික මට්ටමේ අරමුණු හා බද්ධ වූ ගෘහ මට්ටමේ ගෙවතු වගාව ප්‍රචලිත කිරීමේ මූලික අරමුණු කිහිපයක් ද සපුරා ගැනීමට අපේක්ෂිතය.

### 3.1.1 ගෙවතු වගාව ප්‍රචලිත කිරීමේ මූලික අරමුණු

වර්තමානයේ දී පැන නැගී ඇති ජීවන වියදම ඉහළ යාම, මන්දපෝෂණය හා ආහාර අනාරක්ෂිත භාවය පිළිබඳ ගැටලු සඳහා පිළියමක් ලෙස ගෙවත්ත සංවර්ධනය කිරීම මෙහි මූලික අරමුණයි. මේ යටතේ ජනතාවගේ එදිනෙදා ජීවිතයට අවශ්‍ය එළවළු, පලතුරු, අල බෝග හා ඖෂධ පැළෑටි වර්ග වගාකිරීමට උනන්දු කෙරේ. ගෙවතු වගාව තුළින් ළඟාකර ගැනීමට අපේක්ෂිත අරමුණු කිහිපයකි. එනම්,

- තමන්ගේ අහාරය තමන්ට රුචි ලෙස වගාකර ගැනීමේ ඉඩකඩ වැඩි කිරීම.
- පරිසර හිතකාමී වගා ක්‍රම ව්‍යාප්ත කිරීම තුළින් වස විස නැති ආහාර නිෂ්පාදනය දිරිගැන්වීම.
- පවුල් ඒකකය තුළ පෝෂණය සෞඛ්‍ය හා ආර්ථිකය වර්ධනය කිරීම. ගෙවතු වගාව ප්‍රචලිත කිරීමේ දී ගෙවත්ත සංවර්ධනයට යෙදවිය හැකි පවුලේ ධනය, ශ්‍රමය හා කැපකිරීම පිළිබඳව අවධානය යොමු කරවමින් හා දේශගුණික කලාප පිළිබඳව සැලකිල්ලට ගැනීම.
- කාබනික පොහොර භාවිතය සැලකිල්ලට ගැනීම.
- නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර භාණ්ඩ හුවමාරුවේ දී සිදුවන නාස්තිය අවම කිරීම.

(කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යංශය,2007)

එමෙන්ම මෙම වැඩසටහන යටතේ ගෙවතු වගාව සඳහා විවිධ මට්ටම්වලට අයත් ප්‍රජාව සම්බන්ධ කරගැනීමේ අරමුණින් විවිධාකාරයේ ගෙවතු වගාවන් ප්‍රචලිත කෙරිණි. එනම්,

1. ග්‍රාමීය හා නාගරික ගෙවතු
2. පාසැල් භූමි
3. පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ගෙවතු
4. කාර්යාල පරිශ්‍ර හා නිල නිවාස ගෙවතු හා ආදර්ශන
5. හමුදා කඳවුරුවල වගා කටයුතු

6. රාජ්‍ය නිලධාරීන්ගේ පෞද්ගලික'ගෙවතු

7. පුද්ගලික ආයතනවල කාර්යාල පරිශ්‍ර

8. ජනතා නියෝජිතයන්ගේ ගෙවතු

### 3.1.2 ගෙවතු වගාව දිරි ගැන්වීම සඳහා වූ ඉලක්ක හා ක්‍රමෝපායයන්

#### 3.1.2.1 ග්‍රාමීය හා නාගරික ගෙවතු :

නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන පවුල් ලක්ෂ 40ක් පමණ ඉලක්ක කරගෙන සංවර්ධනය කිරීමට අපේක්ෂිතය. ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ජනතාවට ගෙවතු සංවර්ධනයට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්, ග්‍රාම නිලධාරීන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ මැදිහත්වීමෙන් ලබාදෙන අතර සියලුම කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් තමන්ගේ ගෙවත්තේ ආදර්ශ ගෙවත්තක් බැගින් පිහිටුවිය යුතුය. එමෙන්ම ඉඩ පහසුකම් අඩු නගරබදව ජීවත්වන ජනතාව නාගරික ගෙවතු සංවර්ධනය සඳහා ද මෙම වැඩසටහන මඟින් දිරිමත් කර ඇත. ඒ යටතේ නාගරික කෘෂි කර්මාන්තයේ ජල රෝපිත වගාවන් වැනි තාක්ෂණ ක්‍රමවේදයන් ප්‍රවර්ධනය කර ඇත.

#### 3.1.2.2 පාසැල් භූමි :

දිවයින පුරා ජාතික හා පළාත් මට්ටමින් පිහිටි 9714ක් වන සියලු ම රජයේ පාසැල් සම්බන්ධ කරගෙන ගෙවතු හා වගා ආදර්ශන ආරම්භ කිරීමට අපේක්ෂා කෙරිණි. ඒ තුළින් පාසැලේ අලංකාරයත් කෘෂිකර්මය කෙරෙහි ශිෂ්‍යයන්ගේ ආකල්පමය සංවර්ධනයත් ඒ හරහා ජාතික ආහාර නිෂ්පාදනයට දායකත්වයත් අපේක්ෂා කෙරේ.

#### 3.1.2.3 පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ගෙවතු:

ලක්ෂ 38කට වඩා වැඩි පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් තම නිවෙස් ආශ්‍රිතව පවුලේ අනෙකුත් සාමාජිකයන්ගේ සහාය ද ලබාගෙන ගෙවතු වගා කිරීමට යොමු කෙරේ. ඒ තුළින් පවුලේ ආදායමට ඔවුන් දායක කරවීමත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් කෘෂිකර්මය කෙරේ ආකර්ෂණය කරවීමටත්, පරිසරයට ආදරය කරන පරම්පරාවක් ගොඩනැගීමත් මෙහි මූලික අරමුණු විය.

**සිද්ධි අධ්‍යයනය අංක 3.1 - පාසැල් ගෙවතු**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ යක්විල ගොවිජන සේවා බල ප්‍රදේශයේ පිහිටි දාරළුව මහා විද්‍යාලය මඟින් 2011 වර්ෂයේ සිට පාසල් ගෙවත්තක් පවත්වාගෙන යනු ලබයි. පර්චස් 10ක පමණ භූමි භාගයක පවත්වාගෙන යනු ලබන මෙම පාසැල් ගෙවත්ත පාසැල් දූ දරුවන්ගේ ශ්‍රමයෙන් ගොඩනැගුවකි. මෙම ගෙවත්තේ තක්කාලි, මල් ගෝවා, මිරිස්, මෑ, වම්බටු මෙන් ම පලාවර්ග ද රාශියක් දැක ගත හැක. "අපි වවමු - රට නගමු" වැඩසටහන යටතේ ආරම්භ කෙරුණු මෙම පාසැල් ගෙවත්ත සඳහා රජයෙන් වතුර බාල්දියක්, කි.ග්‍රෑම්. 10 පොහොර බෑගයක්, අත් මුල්ලුවක් හා බීජ වර්ග ලබා දී තිබේ. මෙම ගෙවත්ත සඳහා ළමයින් තුළ දැඩි උද්යෝගයක් පවතින බවත් ළමයින් ඉතා උනන්දුවෙන් එම කටයුත්ත සඳහා සහභාගී වන බවත් එම වැඩසටහන භාර ගුරුතුමිය සඳහන් කළාය. එමෙන් ම මෙම පාසැල් ගෙවත්ත සඳහා කොම්පෝස්ට් පොහොර භාවිතා කරන අතර කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා පාසැල් ළමුන් මාකඳුර කෘෂිකර්ම පර්යේෂණ ආයතනයේ පුහුණුවක් සඳහා ද සහභාගී කරවා ඇත. මෙහි දී ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකවරයාගේ නොමඳ සහාය අගය කළ යුතු බව ද ගුරුතුමිය සඳහන් කළාය. මෙම පාසැල් ගෙවත්ත පවත්වා ගැනීමේ දී ඔවුන්ට මුහුණ දීමට සිදු වන ප්‍රධානතම ගැටලු කිහිපයක් සඳහන් කරන ලදී.

- කෘෂිකර්ම විෂය පිළිබඳ ගුරුවරයෙකු තම පාසැලේ නොවීම.
- නිවාඩු කාලයේ දී මෙම ගෙවත්ත නඩත්තු කිරීම හා රැකබලාගැනීම අසීරු වීම.

මෙම ගෙවත්තෙන් ලැබෙන ඵලදාව ගුරුවරුන් විසින් මිලදී ගනු ලබන අතර එම මුදල් පාසැල් සංවර්ධන කමිටුව වෙත ලබා දේ. මෙම පාසැල් ගෙවත්තෙන් ලබාගත් අත්දැකීම් තුළින් පාසැල් දරුවන් පවා තම නිවෙස්වල යම් යම් බෝග වර්ග රෝපණය සඳහා උනන්දු වන බවත් එය ඉතා යහපත් ප්‍රවණතාවයක් බවත් වැඩසටහන භාර ගුරුතුමිය පැවසුවාය.

### 3.1.2.4 කාර්යාල පරිශ්‍ර හා නිල නිවාසවල ගෙවතු හා ආදර්ශන වගා :

රජයට අයත් සියලු ම අමාත්‍යාංශවල හා එම අමාත්‍යාංශවලට අයත් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන පිහිටි භූමිවල වගා ආදර්ශන හා ගෙවතු ඇරඹීම මේ යටතේ සිදු විය. මේ තුළින් දේශීය ආහාර නිෂ්පාදන දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම ශක්තිමත් වන අතර සමස්ත සමාජයේ ම අවධානය කෘෂිකර්මාන්තය වෙත නැඹුරු කරගැනීමේ අපේක්ෂාව විය. එහි දී මෙම වැඩසටහන ප්‍රවර්ධනය කිරීමේ ක්‍රමෝපායයන් ලෙස රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ මහ පෙන්වීම ඒ සඳහා ලැබී ඇත. එමෙන්ම මේ යටතේ රජයේ නිල නිවාස ආශ්‍රිතව ගෙවතු වගා කිරීම අනිවාර්යය කෙරිණි. ඒ සඳහා අවශ්‍ය බීජ හා රෝපණ ද්‍රව්‍ය පහසුවෙන් මිල දී ගැනීමට අවශ්‍ය සේවාවක් ද සපයා ඇත.

### 3.1.2.5 හමුදා කඳවුරු තුළ වගා කටයුතු :

ත්‍රිවිධ හමුදා කඳවුරුවල ඇති විශාල නිදහස් භූමිවල විවිධ බෝග වගාකිරීම මෙහි දී අපේක්ෂා කෙරිණි. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශයේ හා ත්‍රිවිද හමුදා සාමාජිකයින් මඟින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණය ද භාවිතා කරමින් වගාකළ හැකි භූමිවල වගා කිරීම මඟින් නිෂ්පාදන මට්ටම ඉහළ තැබීම මෙහි අපේක්ෂාව විය.

### 3.1.2.6 රාජ්‍ය නිලධාරීන්ගේ පුද්ගලික ගෙවතු :

ලක්ෂ 8ක් පමණ වන රාජ්‍ය නිලධාරීන් බහුතරයක් වාසය කරනු ලබන්නේ රජයේ නිල නිවාසවල නොවේ. එහෙයින් එම රජයේ නිලධාරීන් ද දේශීය ආහාර නිෂ්පාදන දිරිගැන්වීමේ ජාතික මෙහෙයුමට දායක කර ගැනීමට අපේක්ෂාව විය. ඒ යටතේ රාජ්‍ය නිලධාරීන් පෞද්ගලික නිවාසවල ගෙවතු වගාවන් ද ස්ථාපිත කිරීම මෙහි දී අපේක්ෂා කරන ලදී.

ඉහත සඳහන් සියලු ක්ෂේත්‍රවල ගෙවතු වගා වැඩසටහන ආරම්භ වුව ද මෙහි දැකිය හැකි විශේෂත්වය වූයේ එක වසරකින් මෙම වැඩසටහන අඩපණ වීමයි. එයට හේතුව මෙම වැඩසටහන ආරම්භ වූයේ කාර්යාල නියෝගයකින් වූ අතර මෙම සංකල්පය නාගරික සහ කාර්යාල පරිශ්‍රවල අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා කාර්යාල සේවකයින් හා නාගරිකයින් එම වැඩසටහනට අනුගතවී නොතිබීම යි.

වගු අංක 3.1 : නිලධාරීන්ගේ ගෙවතු 2008 -2010


| දිස්ත්‍රික්කය | වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 2009 | | 2010 | |
| | ලියාපදිංචි ගෙවතු සංඛ්‍යාව | වැඩ ආරම්භ කර ඇති ගෙවතු සංඛ්‍යාව | ලියාපදිංචි ගෙවතු සංඛ්‍යාව | වැඩ ආරම්භ කර ඇති ගෙවතු සංඛ්‍යාව |
| කොළඹ | - | 299 | - | 299 |
| ගම්පහ | 974 | 867 | 1748 | 538 |
| කළුතර | 500 | 545 | 678 | 625 |
| මහනුවර | 1365 | 1384 | - | - |
| මාතලේ | 453 | 459 | 439 | 516 |
| නුවර එළිය | 381 | 381 | 381 | 381 |
| ගාල්ල | 963 | 870 | 608 | 609 |
| මාතර | 543 | 474 | - | - |
| හම්බන්තොට | 801 | 725 | 391 | 539 |
| කුරුණෑගල | 1760 | 1928 | 787 | 723 |
| පුත්තලම | 857 | 617 | 248 | 248 |
| අනුරාධපුරය | 755 | 925 | 779 | 934 |
| පොලොන්නරුව | 562 | 473 | 289 | 594 |
| බදුල්ල | 11665 | 13283 | - | 380 |
| මොණරාගල | 154 | 306 | | |
| රත්නපුරය | 668 | 721 | 738 | 424 |
| කෑගල්ල | 365 | 431 | - | - |
| අම්පාර | - | 1200 | - | - |
| ත්‍රිකුණාමලය | 117 | 112 | 259 | 253 |
| යාපනය | 54 | 54 | 54 | - |
| වව්නියාව | 9 | 87 | - | - |

මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,2010

මෙම වැඩසටහන සඳහා රාජ්‍ය අංශයේ මෙන් ම පෞද්ගලික අංශයේ ද දායකත්වය ලබා ගැනීමේ අරමුණින් සියලු ම පෞද්ගලික කාර්යාල පරිශ්‍ර, කර්මාන්තශාලා පරිශ්‍රවල පිහිටි නිදහස් භූමිය තුළ ආදර්ශන වගා ඇරඹීම සිදු විය.


### 3.1.2.7 ජනතා නියෝජිතයන්ගේ ගෙවතු :

සියලු ම ජනතා නියෝජිතයින්ගේ පෞද්ගලික නිවෙස් ආශ්‍රිතව ගෙවතු වගාවන් ඇරඹීම මෙහි අරමුණ වූ අතර ඒ තුළින් සමාජයට යම් ආදර්ශයක් ලබා දීම අපේක්ෂාව විය. ඒ සඳහා වූ හොඳම නිදසුන වන්නේ ජනාධිපතිතුමන් වාසයකරන අරලියගහ මන්දිරයේ ආරම්භ කෙරුණු ගෙවත්තයි. එය ඉතා සාර්ථකව සිදු වූ අතර එය නැරඹීම සඳහා ද අවස්ථාව ලබා දී තිබිණි. එය නැරඹීමට දිවයින පුරා පිහිටි පාසැල් දරු දැරියන් දහස් සංඛ්‍යාවක් පැමිණ තිබිණ.





මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, 2011

**ප්‍රස්තාර සටහන් අංක 3.1 : පුද්ගලික ගෙවතු සංවර්ධන වැඩසටහන 2008 -2010**




මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, 2011

**ප්‍රස්තාර සටහන් අංක 3.2 : 2009 පුද්ගලික ගෙවතු වගා වැඩසටහන**




මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, 2011

**ප්‍රස්තාර සටහන් අංක 3.3: 2010 පුද්ගලික ගෙවතු වගා වැඩසටහන**

ඉහත දත්තයන්ට අනුව මෙම වැඩසටහන වව්නියාව,මන්නාරම, මුලතිව් හා කිලිනොච්චිය යන දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක වී නොමැත. ඇතැම් දිස්ත්‍රික්කවල ඉලක්කගත ගෙවතුවලට වඩා වැඩි ගෙවතු ප්‍රමාණයක් ස්ථාපිත වී ඇති අයුරු දැක ගත හැක. එමෙන්ම මෙම

වැඩසටහන සඳහා ජනතාවගේ සහභාගීත්වය හා උනන්දුව වැඩි කිරීම සඳහා තරඟ පවත්වා තෑගි ලබාදීම වැනි සානුබල ද හඳුන්වා දී තිබුණි.

## 3.2 මෙම වැඩසටහනේ 2010 වර්ෂයට වෙන්කළ ප්‍රතිපාදන අනුව ප්‍රගතිය

"අපි වවමු - රට නගමු" වැඩසටහන යටතේ ක්‍රියාත්මක කෙරුණු ගෙවතු වගා වැඩසටහන සඳහා වෙන් කළ මුදල රුපියල් මිලියන 6කි. ඉන් රුපියල් මිලියන 5.9ක් වැය වී ඇති අතර ඒ අනුව එම වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය 99.5% කි. මෙම වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා යොදාගත් මූලික ම ක්‍රමෝපාය වූ ගෙවතු වගා තරඟ හරහා ගෙවතු වගාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන මඟින් ඉහත දක්වා ඇති විවිධ ගෙවතු වගාවන් යටතේ ජයග්‍රාහකයින් 18 දෙනෙකු තෝරාගෙන ඔවුන්ට ත්‍යාග ලබා දී තිබේ.එහි දී 2010 වසර තුළ ගෙවතු 400,000ක් ස්ථාපිත කිරීමට අපේක්ෂා වූ අතර ඉන් ළඟාකරගත හැකි වූ ඉලක්කය වූයේ ගෙවතු 275,000ක් පමණි.

### 3. 2.1 නැගෙනහිර පළාත

"අපි වවමු - රට නගමු" වැඩසටහන යටතේ පළාත් සභා වෙත ද යම් කාර්ය භාර්යක් පැවරී තිබිණි. ඒ අනුව ගෙවතු වගා වැඩසටහන පළාත් සභාවේ මාර්ගෝපදේශකත්වය යටතේ සිදු විය. නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාර යන දිස්ත්‍රික්ක තුන තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක විය.

**වගු අංක 3.2 : 2010 වර්ෂයේ ගෙවතු වගා වැඩසටහනේ ප්‍රගතිය**

| දිස්ත්‍රික්කය | පෙර පැවති ගෙවතු,වගාවන් තවදුරටත් පවත්වාගෙන යන සංඛ්‍යාව | | කාබනික පොහොර භාවිතයෙන් පමණක් සිදු කරන ගෙවතු | |
|---|---|---|---|---|
| | සේවා ලාභීන් සංඛ්‍යාව | බෙදා දී ඇති ගෙවතු උපකරණ කට්ටල ප්‍රමාණය | සේවා ලාභීන් සංඛ්‍යාව | බෙදා දී ඇති ගෙවතු උපකරණ කට්ටල ප්‍රමාණය |
| ත්‍රිකුණාමලය | 500 | 500 | 300 | 300 |
| මඩකලපුව | 500 | 500 | 300 | 300 |
| අම්පාර | 500 | 500 | 300 | 300 |
| එකතුව | 1500 | 1500 | 900 | 900 |

මූලාශ්‍රය: නැගෙනහිර පළාත් සභා දත්ත වාර්තා, 2011

පාසැල් ගෙවතු සංවර්ධනය සඳහා ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාර යන දිස්ත්‍රික්ක තුන නියෝජනය වන පරිදි පාසැල් 100ක් තෝරාගෙන එම පාසැල් සඳහා අවශ්‍ය ගෙවතු වගා උපකරණ කට්ටල, බිංදු ජල තාක්ෂණ උපකරණ කට්ටල, ස්ප්‍රේ යන්ත්‍ර, බැරල් මෙන් ම කෘෂි වගාව පිළිබඳ සී ඩී තැටි යනාදිය බෙදා දී තිබිණි. මෙමඟින් ගුරුවරුන් කෘෂිකාර්මික ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් ඇති කර ඒ තුළින් ඔවුන්ගේ නිවෙස්වල පුද්ගලයින් මෙන් ම සමාජයේ අනෙක් පිරිස් සඳහා ද යම් අවබෝධයක් ලබාදීම අපේක්ෂාව විය.

**වගු අංක 3.3 : 2010 වර්ෂයේ ගෙවතු වගාව සඳහා වෙන් කළ මුදල් ප්‍රතිපාදන**

| වැඩසටහන | වෙන් කළ මුදල් (රු) | වියදම (රු) | % ලෙස වියදම (රු) |
|---|---|---|---|
| ගෙවතු වගා වැඩසටහන | 200,0000 | 13,46880 | 67.34 |
| පාසැල් ගෙවතු වගා වැඩසටහන | 200,0000 | 19,98996 | 99.94 |
| එකතුව | 400,0000 | 33,45876 | 83.64 |

මූලාශ්‍රය: නැගෙනහිර පළාත් සභා දත්ත වාර්තා, 2011

වගු අංක **3.4:** ගෙවතු වගා වැඩසටහන ගෙවතු හිමියන් සඳහා - නාගරික ගෙවතු ද ඇතුළුව

| දිස්ත්‍රික්කය | **2007-2010** ඉලක්කගත ගෙවතු සංඛ්‍යාව | | 2008 | | | |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක ගත ගෙවතු සංඛ්‍යාව | වැඩ ආරම්භ කර ඇති ගෙවතු සංඛ්‍යාව | ආරම්භ කර ඇති ගෙවතුවල භෞතික ප්‍රගතිය (ප්‍රතිශතය) | තරඟයට ඉදිරිපත්ව ඇති ගෙවතු සංඛ්‍යාව | ගම නැගුම වැනි වෙනත් වැඩසටහන් යටතේ ස්ථාපිත ගෙවතු සංඛ්‍යාව |
| කොළඹ | 5,200 | 2,135 | 3,263 | 70 | 108 | 61 |
| ගම්පහ | 42,000 | 13,942 | 11,103 | 76 | 592 | 2,130 |
| කළුතර | 8,400 | 2,400 | 1,847 | 51 | 1,492 | 9,884 |
| මහනුවර | 45,000 | | 35,100 | 78 | | |
| මාතලේ | 10,000 | 2,121 | 3,920 | 69 | 1,517 | 735 |
| නුවරඑළිය | 33,000 | 15,617 | 11,910 | 79 | 3,456 | 2,350 |
| ගාල්ල | 11,000 | 56,100 | 7,821 | 76 | 3,356 | 1,301 |
| මාතර | 65,000 | 30,463 | 24,835 | 61 | 1,577 | 1,524 |
| හම්බන් තොට | 29,118 | 14,593 | 9,588 | 76 | 4,672 | 4,676 |
| කුරුණෑගල | 125,000 | 69,522 | 42,125 | 64 | 23,675 | 6,784 |
| පුත්තලම් | 20,000 | 9,063 | 5,568 | 90 | 878 | 3,149 |
| අනුරාධපුරය | 70,000 | 27,910 | 13,838 | 66 | 1,825 | 1,017 |
| පොළොන්නරුව | 20,000 | 9,450 | 9,450 | 75 | 1,552 | |
| බදුල්ල | 20,000 | 4,112 | 4,087 | 73 | 1,459 | 1,390 |
| මොණරාගල | 10,000 | 3,826 | 3,385 | 95 | 1,716 | 942 |
| රත්නපුරය | 24,420 | 10,933 | 7,157 | 70 | 294 | 1,826 |
| කෑගල්ල | 25,000 | 8,353 | 7,668 | 11 | 5,550 | 3,784 |
| අම්පාර | 4,000 | 1,899 | 1,447 | 74 | | |
| ත්‍රිකුණාමලය | 5,000 | | 2,642 | 52 | | |
| මඩකලපුව | 650 | | | | | |
| යාපනය | 1,500 | 855 | 922 | 104 | 622 | |
| වවුනියාව | 650 | 300 | 275 | | | |
| මන්නාරම | 650 | | | | | |
| මුලතිව් | 500 | | | | | |
| කිලිනොච්චිය | 500 | | | | | |
| එකතුව | **576,588** | **283,614** | **207,951** | **83** | **54,311** | **41,553** |

මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, 2011

වගු අංක 3.5: ගෙවතු සංවර්ධන වැඩසටහන 2009.01.01 සිට 2009.12.31 දක්වා ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | 2007/2010 සම්පූර්ණ ඉලක්කය (ගෙවතු සංඛ්‍යාව) | 2009 සඳහා ඉලක්කගත ගෙවතු සංඛ්‍යාව | පුද්ගලික ගෙවතු | | නිලධාරීන්ගේ ගෙවතු | |
|---|---|---|---|---|---|---|
| | | | වැඩ ආරම්භ කර ඇති ගෙවතු සංඛ්‍යාව | තරඟයට ඉදිරිපත්ව ඇති ගෙවතු සංඛ්‍යාව | වැඩ ආරම්භ කර ඇති ගෙවතු සංඛ්‍යාව | තරඟයට ඉදිරිපත්ව ඇති ගෙවතු සංඛ්‍යාව |
| කොළඹ* | 15,064 | 9,125 | 4,957 | - | 299 | - |
| ගම්පහ | 62,689 | 26,430 | 11,798 | 368 | 867 | 64 |
| කළුතර* | | 26,585 | 13,700 | 2,342 | 545 | 245 |
| මහනුවර* | 74,143 | 34,229 | 20,783 | 6,160 | 1,384 | 869 |
| මාතලේ * | 50,733 | 19,052 | 10,721 | 2,179 | 459 | 371 |
| නුවරඑළිය | 32,910 | 21,600 | 20,230 | 3,389 | 381 | 381 |
| ගාල්ල | | 35,000 | 22,328 | 1,954 | 870 | 122 |
| මාතර* | 36,515 | 21,661 | 10,230 | 1,517 | 474 | 109 |
| හම්බන්තොට | 49,819 | 20,505 | 14,679 | 5,008 | 725 | 224 |
| යාපනය | 1,525 | 585 | 9,548 | * | 54 | 45 |
| කිලිනොච්චිය | | | | | | |
| මන්නාරම | | | | | | |
| වවුනියාව* | 18,200 | 6,350 | 8,120 | 835 | 87 | 21 |
| මුලතිව් | | | | | | |
| මඩකලපුව | | | | | | |
| අම්පාර* | | 3,099 | 1,899 | | 1,200 | |
| ත්‍රිකුණාමලය* | 14,079 | 6,885 | 2,457 | 727 | 112 | 66 |
| කුරුණෑගල | 19,0233 | 75,826 | 54,795 | 27,589 | 1,928 | 1,091 |
| පුත්තලම | 28,787 | 13,536 | 8,862 | 2,568 | 617 | 319 |
| අනුරාධපුරය | 110,098 | 44,882 | 38,470 | 2,568 | 925 | 236 |
| පොළොන්නරුව | 25,509 | 9,377 | 6,375 | 568 | 473 | 225 |
| බදුල්ල | 21,001 | 27,748 | 386 | | 13,283 | 972 |
| මොණරාගල* | 24,590 | 10,149 | 5,736 | 1,079 | 306 | 84 |
| රත්නපුර | 38,559 | 22,123 | 12,612 | 458 | 721 | 112 |
| කෑගල්ල* | 50,386 | 18,047 | 8,531 | 1,950 | 431 | 77 |
| **එකතුව** | **844,840** | **452,794** | **287,217** | **61,285** | **26,141** | **5,633** |

මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,2011

වගු අංක 3.6: ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමි සංවර්ධනය ප්‍රගතිය- ප්‍රගති වාර්තාව

**2009.01.01 සිට 2009.12.31 දක්වා ප්‍රගතිය**

| දිස්ත්‍රික්කය | 2009 ක්‍රියාත්මක භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය | | | | | දරා ඇති වියදම රු. |
|---|---|---|---|---|---|---|
| | බිම් සකස් කිරීම % | බෝග ස්ථාපනය % | කාබනික පොහොර ආදර්ශන | පාංශු සංරක්ෂණ ක්‍රම යෙදීම | කෘෂි ආදර්ශන ස්ථාපිත කිරීම | |
| කොළඹ | 45 | 45 | - | 39 | - | 8,085.00 |
| ගම්පහ | 74 | 73 | 61 | 59 | 62 | 60,682.00 |
| කළුතර | 55 | 47 | 45 | 37 | 32 | 20,980.00 |
| මහනුවර | 45 | 45 | 45 | 45 | 45 | |
| මාතලේ | 67 | 59 | 41 | 59 | 41 | 35,176.00 |
| නුවරඑළිය | 96 | 92 | 100 | 79 | 79 | 79,194.00 |
| ගාල්ල | 95 | 91 | 94 | 79 | 76 | 318,158.00 |
| මාතර | 50 | 32 | 30 | 25.3 | 21 | 43,980.00 |
| හම්බන්තොට | 81 | 85 | 63 | 64 | 49 | 42,790.00 |
| යාපනය | 72 | 63 | 44 | 52 | 39 | 12,425.00 |
| කිලිනොච්චිය | - | - | - | - | - | - |
| මන්නාරම | - | - | - | - | - | - |
| වවුනියාව | 52 | 43 | 13 | - | | 27,000.00 |
| මුලතිව් | - | - | - | - | - | - |
| මඩකලපුව | - | - | - | - | - | - |
| අම්පාර | - | - | - | - | - | - |
| ත්‍රිකුණාමලය | 33 | - | - | - | 31 | 39,300.00 |
| කුරුණෑගල | 78 | 72 | 60 | 50 | 44 | 245,863.00 |
| පුත්තලම | 78 | 65 | 55 | 51 | 62 | 100,480.00 |
| අනුරාධපුරය | 75 | 66 | 69 | 52 | 51 | 93,174.00 |
| පොළොන්නරුව | 86 | 77 | 68 | 55 | 51 | 48,576.00 |
| බදුල්ල | 79 | 61 | 51 | 58 | 49 | 16,3569.00 |
| මොණරාගල | 50 | 38 | 59 | 42 | 42 | 17,382.00 |
| රත්නපුර | 56 | 48 | 43 | 47 | 40 | 77,606.00 |
| කෑගල්ල | 63 | 47 | 42 | 40 | 24 | 37,730.00 |
| **එකතුව** | **70** | **60** | **58** | **58** | **52** | **1,472,150.00** |

මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, 2011

වගු අංක 3.7: ගෙවතු සංවර්ධන වැඩසටහන ප්‍රගතිය- ප්‍රගති වාර්තාව 2010.01.01 සිට 2010.12.31 දින දක්වා

| දිස්ත්‍රික්කය | 2007/2010 සම්පූර්ණ ඉලක්කය (ගෙවතු සංඛ්‍යාව) | 2010 සඳහා ඉලක්කගත ගෙවතු සංඛ්‍යාව | පුද්ගලික ගෙවතු | | නිලධාරීන්ගේ ගෙවතු | |
|---|---|---|---|---|---|---|
| | | | වැඩ ආරම්භ කර ඇති ගෙවතු සංඛ්‍යාව | තරඟයට ඉදිරිපත්ව ඇති ගෙවතු සංඛ්‍යාව | වැඩ ආරම්භ කර ඇති ගෙවතු සංඛ්‍යාව | තරඟයට ඉදිරිපත්ව ඇති ගෙවතු සංඛ්‍යාව |
| කොළඹ | 14,899 | 7,943 | 2,967 | 610 | 299 | - |
| ගම්පහ | 63,349 | 26,935 | 8,991 | 213 | 538 | 29 |
| කළුතර | 28,809 | 26,585 | 13,990 | 521 | 652 | 100 |
| මහනුවර | - | 6,150 | - | - | - | - |
| මාතලේ | 30,733 | 21,836 | 9,585 | 1,483 | 516 | 130 |
| නුවරඑළිය | 37,510 | 2,200 | 18,773 | 1,316 | 381 | 381 |
| ගාල්ල | | 19,767 | 12,445 | 717 | 609 | 72 |
| මාතර | - | - | - | - | - | - |
| හම්බන්තොට | 49,819 | 19,505 | 9,391 | 3,735 | 539 | 136 |
| යාපනය | 1,525 | 790 | 2,805 | | | |
| කිලිනොච්චිය | - | - | - | - | - | - |
| මන්නාරම | - | - | - | - | - | - |
| වවුනියාව | - | - | - | - | - | - |
| මුලතිව් | - | - | - | - | - | - |
| මඩකලපුව | - | - | - | - | - | - |
| අම්පාර | - | - | - | - | - | - |
| ත්‍රිකුණාමලය | 13,119 | 7,793 | 2,980 | 719 | 253 | 151 |
| කුරුණෑගල | 190,236 | 48,963 | 20,940 | 13,718 | 723 | 48 |
| පුත්තලම | 31,996 | 13,367 | 6,131 | 310 | 248 | 61 |
| අනුරාධපුරය | 112,098 | 46,930 | 39,160 | 2,652 | 934 | 273 |
| පොළොන්නරුව | 27,985 | 7,749 | 5,730 | 2,215 | 594 | 110 |
| බදුල්ල | 29,309 | 17,455 | 15,835 | 1,447 | 380 | |
| මොණරාගල | - | - | - | - | - | - |
| රත්නපුර | 36,184 | 14,714 | 8,874 | 621 | 424 | 29 |
| කෑගල්ල | - | - | - | - | - | - |
| **එකතුව** | **667,571** | **288,682** | **178,597** | **30,277** | **7,090** | **1,520** |

මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, 2011

වගු අංක 3.8 : කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් සඳහා ගෙවතු වගා තරඟය- ප්‍රගති වාර්තාව

| දිස්ත්‍රික්කය | 2008 ඉලක්කය (ගෙවතු සංඛ්‍යාව) | බිම් සකස් කිරීම් අවසන් සංඛ්‍යාව | වගාව ස්ථාපිත කර අවසන් සංඛ්‍යාව | ඵලදාව නෙළන ගෙවතු සංඛ්‍යාව | අය - වැය | |
|---|---|---|---|---|---|---|
| | | | | | ආදායම | වියදම |
| කොළඹ | 314 | 314 | 314 | 314 | | |
| ගම්පහ | 623 | 581 | 475 | 380 | 74,580.00 | 88,186.00 |
| කළුතර | 525 | 490 | 400 | 244 | 29,785.00 | 30,200.00 |
| මහනුවර | 990 | 899 | 899 | | | |
| මාතලේ | 451 | 448 | 447 | 291 | 37,130.00 | 49,650.00 |
| නුවරඑළිය | 475 | 371 | 348 | 332 | 101,880.00 | 106,075.00 |
| ගාල්ල | 669 | 462 | 377 | 281 | 44,585.00 | 67,410.00 |
| මාතර | 510 | 350 | 272 | 206 | 75,950.00 | 147,080.00 |
| හම්බන්තොට | 414 | 408 | 370 | 334 | 209,520.00 | 142,735.00 |
| කුරුණෑගල | 1,118 | 1,081 | 878 | 613 | 332,100.00 | 420,100.00 |
| පුත්තලම | 324 | 312 | 308 | 272 | 111,470.00 | 116,120.00 |
| අනුරාධපුරය | 638 | 581 | 485 | 354 | 237,350.00 | 150,000.00 |
| පොළොන්නරුව | 200 | 200 | 50 | 50 | | |
| බදුල්ල | 436 | 328 | 323 | 285 | 1,033,450.00 | 442,350.00 |
| මොණරාගල | 236 | 209 | 199 | 196 | 39,850.00 | 68,500.00 |
| රත්නපුරය | 256 | 241 | 220 | 171 | 44,585.00 | 51,451.00 |
| කෑගල්ල | 483 | 482 | 435 | 364 | 186,108.00 | 181,025.00 |
| අම්පාර | 113 | 95 | | | | |
| ත්‍රිකුණාමලය | 32 | | 20 | | | |
| මඩකලපුව | | | | | | |
| යාපනය | | | | | | |
| වවුනියාව | 150 | 54 | 54 | 54 | | |
| මන්නාරම | | | | | | |
| මුලතිව් | | | | | | |
| කිලිනොච්චිය | | | | | | |
| එකතුව | 8,957 | 7,906 | 6,874 | 4,741 | 2,558,343.00 | 2,060,882.00 |

මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, 2011

මෙම වැඩසටහන රාජ්‍ය අංශයේ සේවකයින් අනුබද්ධ කරගනිමින් කාර්යාල පරිශ්‍රවල සිදු කිරීමත් ජනතා නියෝජිතයින්ගේ ගෙවතුවල සිදු කිරීමත් නාගරික ජනාවාස ආශ්‍රයෙන් සිදු කිරීමත් ආරම්භක අවස්ථාවේ දී දැක ගත හැකි වුව ද වැඩසටහන වසර කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක වූ බවක් දක්නට නොලැබිණි. එයට හේතුව කාර්යාල නියෝග සහ බලපෑම් කිරීම මත මෙවැනි වැඩසටහන් ආරම්භ කිරීමට හැකි වුවත් ඒවායේ සාර්ථක අඛණ්ඩ ක්‍රියාකාරීත්වය

සිදු නොවන බවයි. එහෙත් ගෙවතු වගා වැඩසටහනක වැදගත්කම අවබෝධ කරගත් රජය සේවක ජනතා නියෝජිත, නාගරික නිවැසි සහ ග්‍රාමීය ගොවි යන ඕනෑම ක්ෂේත්‍රයක පුද්ගලයෙකු ස්ව කැමැත්තෙන් මෙම කාර්යයේ නියැලීමක් දක්නට ලැබීම මෙහි ප්‍රකටව පෙනෙන ලක්ෂණයකි.

'අපි වවමු රට නගමු' වැඩසටහන යටතේ ගෙවතු වගා වැඩසටහනට සම්බන්ධ වූ විවිධ පාර්ශවවල ක්‍රියාකාරීත්වය පිළිබඳව අධ්‍යයනයෙන් හෙළි වූ අදහස් පහත සඳහන් ආකාරයට දැක්විය හැකිය.

- පදිංචි ප්‍රදේශයේ ම ජීවනෝපායන් හි නියැලී සිටින පවුල්වල සාමාජිකයන්ට වගාව සඳහා යෙදීමට කාලවේලාව ප්‍රමාණවත් ලෙස තිබූ නිසා ඔවුන් ගෙවතු වගාවේ නිරත වූ බව හෙළි විය. එවැනි පවුල් ගෙවතු වගා වැඩසටහන සඳහා කැමැත්තෙන් ඉදිරිපත් වී අඛණ්ඩව කරගෙනයාමක් ද දක්නට ලැබුණි. මේ සඳහා ප්‍රධානත ම සාධකය වූයේ ගෙවතු වගාවක් කිරීම සඳහා ඉඩ ප්‍රස්ථාව සහ අවශ්‍ය වේලාව සහ පවුලේ ශ්‍රමය ප්‍රමාණවත් ලෙස පැවතීමත් නිදහස් ජීවනෝපායක යෙදීමත් ය. ගෙවතු වගාවේ අස්වනු නිවසේ පරිභෝජනය සඳහා භාවිතා කිරීමෙන් අනතුරුව එහි අතිරික්තය වෙළඳපොළේ අලෙවි කිරීමට ද ඔවුනට හැකියාව තිබුණි. එමගින් ඔවුන් යම් කිසි ආදායමක් උපයාගත් අතර එම ආදායම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ද ගෙවත්තේ වගා කිරීමට නොහැකි ආහාර ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා ද යොදාගෙන තිබුණි. මොවුන් ගෙවතු වගා වැඩසටහන නැවුම් එළවළු හා පලතුරු ලබාගැනීමේ මාර්ගයක් ලෙස සැලකුවා පමණක් නොව පවුලට ආදායම් ලැබෙන මාර්ගයක් ලෙස ද සලකා ගෙවතු වගාව කර තිබුණි. මොවුන් ඉතා කැප වී ප්‍රමිතියෙන් යුත් ගෙවතු ගොඩ නඟා තිබුණි. ශ්‍රී ලංකාවේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම මෙවැනි ගෙවතු කිහිපය බැගින් දක්නට ලැබුණි.
- රජයේ සේවකයන් ගෙවතු වගාව සම්බන්ධයෙන් දැක් වූ ප්‍රතිචාරය වූයේ සියලු දෙනා ම ඒ සඳහා කැමැත්තක් දැක්වීමයි. එහෙත් ප්‍රායෝගිකව වැඩසටහන් ක්‍රියාත්මක වීමේ දී බොහෝ ගැටලුවලට මුහුණ පෑමට සිදු විය. නිවෙස් පිරිසිදු කිරීම, දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු හා වෙනත් සමාජීය යුතුකම් ඉටු කිරීමේ කටයුතු සඳහා කාලය මිඩංගු කිරීමට සිදුවීම යනාදී සති අන්තයේ යෙදෙන අත්‍යවශ්‍යයෙන් සිදු කළ යුතු කාර්යයන් නිසා එබඳු පිරිස්වලට ගෙවතු වගාවක් සඳහා කැප කිරීමට කාලය සොයාගැනීම ප්‍රධාන ගැටලුවක් විය. මේ නිසා එක කන්නයක් ගෙවතු වගාව සඳහා උත්සාහ දැරූ රජයේ සේවකයින් ප්‍රායෝගික තත්ත්වය අවබෝධ වීම නිසා ඔවුන් වගා වැඩසටහටනේ අඛණ්ඩව රැඳී නොසිට ඉන් ඉවත් වී ඇති බව පැහැදිලි විය. එමෙන්ම රජයේ සේවකයින් තවත් කොටසක් කාලය කළමනාකරණය කරගනිමින් සුළු

වශයෙන් ගෙවතු වගා කටයුතුවල නිරත වී තිබූ අතර ඔවුහු දිගුකාලීනව භාවිතයට ගත හැකි ගෙවතු බෝග වූ කරපිංච, දෙහි, ඉඟුරු, කහ, පලතුරු පැළ වර්ග වගා කිරීමට පෙළඹී සිටියහ. විශ්‍රාමික රජයේ සේවකයන් තමන්ගේ කාලය ප්‍රයෝජනවත් මෙන්ම තෘප්තිමත් ආකාරයෙන් භාවිතා කිරීමේ මාර්ගයක් වශයෙන් ගෙවතු වගාව ඉතා හොඳින් යොදාගෙන තිබුණි. ඔවුන් විසින් සාර්ථක ගෙවතු සකසා තිබූ අතර ඒවා ඔවුන්හට ආදායම් ලැබෙන මාර්ග වී තිබුණි. එහි දී වැදගත්ම කාරණය වූයේ විශ්‍රාමික පුද්ගලයන්ට ගෙවතු වගාව සඳහා කාලය වැය කිරීම ගැටලුවක් නොවීමත් බෝග වගාව තුළින් ඔවුන් මානසික තෘප්තියක් ලැබීමත් මේ සඳහා ඇල්මක් දැක්වීමත් නිසා ගෙවතු වගාව අඛණ්ඩව කරගෙන ගිය පිරිසක් ලෙස ඔවුන් හඳුනාගත හැකි විය.

- රජයේ කාර්යාල පරිශ්‍ර තුළ ගෙවතු වගා වැඩසටහන් ක්‍රියාත්මකවීම පළමුවන වටයේ දී සාර්ථක බවක් පෙන්නුම් කළේය. එයට හේතුව කාර්යාල පරිශ්‍රවල ගෙවතු වගා කරන ලෙස චක්‍රලේඛයක් මඟින් රජයේ සේවකයින්ගෙන් ඉල්ලා සිටීමයි. එහෙත් කාර්යාලයක සිටින විවිධ තරාතිරම්වලට අයත් සියලුම දෙනා එකාමෙන්ම ගෙවතු වගා කටයුතුවල නිරත නොවූ බව පැහැදිලි කරුණක් විය. එයට හේතුව කාර්යාලයීය ඇඳුම් සමඟින් ගෙවතු වගාව වැනි කය වෙහෙසමින් විවෘත පරිසරයේ වැඩ කිරීමට සේවකයින් දැක් වූ අකමැත්තයි. එසේ වුවත් කාර්යාල වතු කම්කරු වැනි ශ්‍රේණිවල පුද්ගලයන් විසින් කාර්යාලීය භූමි තුළ දිගින් දිගටම වගා කටයුතු කරගෙනයාම දක්නට ලැබුණි. සෑම ක්ෂේත්‍රයකම සේවකයන්ගෙන් එවැනි වගා කටයුතු සඳහා සහයෝගය ලැබුණු අතර අස්වනු මිල දී ගැනීමට ද ඔවුහු ඉදිරිපත් වූහ. කාර්යාල තුළ සමස්ත කාර්යය මණ්ඩලයෙන් ම ගෙවතු වගාව වැනි කාර්යයන් සිදු කරවාගැනීම බලාපොරොත්තු විය නොහැකි අතර ඒ සඳහා කැමති ඇතැම් සේවක කොටස් පමණක් එහි නිරතව සිටි බව පසුකාලයේ දී ද දක්නට ලැබුණි. එහෙත් මෙම වැඩසටහන පිළිබඳ පසු විපරමක් සිදු නොකිරීම නිසා මෙම වැඩපිළිවෙළ ක්‍රමයෙන් අඩපණ විය.
- පාසැල් සිසුන් ස්ව කැමැත්තෙන් පාසැල් පරිශ්‍රවල වගා කටයුතු වල නිරත වී තිබුණු බව හෙළි විය. එහෙත් ඇතැම් පාසැල්වල සිසුන්ගේ පවුල් පසුබිම මත කෘෂිකර්මය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට දැක් වූ පසුබෑම නිසා වගාව අඛණ්ඩවම කරගෙන යෑමේ ගැටලු මතු විය. එමෙන්ම කෘෂිකර්ම විෂය සම්බන්ධ ගුරුවරු නොමැති පාසැල්වල වැඩසටහන් ක්‍රියාත්මකවීම ගැටලුවක් වී තිබුණි. ගුරු මණ්ඩලයෙන් හා දෙමවුපියන්ගෙන් මේ සඳහා මනා සහයෝගයක් නොලැබීම ද මෙම වැඩසටහන පාසැල් තුළ තිරසාර ලෙස ක්‍රියාත්මකවීම අඩපණවීමට හේතු විය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් මෙම වැඩසටහන ඇගයීමකට ලක් කර සිසුන්ට තෑගි බෝග

පවා ලබාදෙන බව ප්‍රකාශ කර තිබුණ ද වැඩසටහන පිළිබඳව පරීක්ෂා කර බැලීමට එහි නිලධාරීන් නොපැමිණි අතර ඇගයීම හෝ තැගි බෝග ලබාදීමක් ද සිදු කර නොතිබුණි. එම තත්ත්වය මත පාසැල් සිසුන් වැඩසටහනෙන් ක්‍රමයෙන් ගිලිහී ගොස් පාසැල් භූමිවල ගෙවතු වගා වැඩසටහන ක්‍රමයෙන් අඩපණ විය.

ඇතැම් ප්‍රදේශවල වන සත්ත්ව උවදුර දැඩි ලෙස පැතිර පැවති අතර ගෙවතු වගාවන් හි අස්වනු ලැබෙන කාලයේ දී වන සතුන් අස්වනු හානි කිරීම නිසා වගාකරුවන් අධෛර්යයට පත් වී තිබුණි. ගෙවතු වගාව හා සමගාමීව වන සත්ත්ව උවදුර මර්දනය කිරීමේ ක්‍රමෝපායයන් ද ක්‍රියාත්මක කරනු ඇතැයි ගෙවතු වගාකරුවන් බලාපොරොත්තුවෙන් සිටිය ද එම ගැටලුවට තිරසාර විසඳුමක් ලබාදීමක් සිදු නොවූ බැවින් ගෙවතු වගාවේ කැමැත්තෙන් ම යෙදුනු වගාකරුවන් අධෛර්යමත්ව ගෙවතු වගාවෙන් අකමැත්තෙන් වුවත් ඉවත් වී තිබුණු බව හෙළි විය .

## හතරවන පරිච්ඡේදය

# පලතුරු වගා ප්‍රවර්ධනය

### 4.0 ශ්‍රී ලංකාවේ පලතුරු වගාව සංවර්ධනය

### 4.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පලතුරු නිෂ්පාදනය දළ දේශීය නිෂ්පාදිතයට සියයට එකක දායකත්වයක් සපයන අතර මෑත වර්ෂවල දී එහි වේගවත් වර්ධන අනුපාතයක් පෙන්නුම් කරනු ලබයි. එහෙත් ලංකාවේ පලතුරු පරිභෝජනය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකිවන අතර ඒක පුද්ගල දෛනික පරිභෝජනය ග්‍රෑම් 40ක මට්ටමේ පවතී. මෙය වෛද්‍ය පර්යේෂණ ආයතනයන් නිර්දේශ කොට ඇති ඒක පුද්ගල දෛනික පලතුරු අවශ්‍යතාවය වන ග්‍රෑම් 112 ට වඩා බොහෝ සෙයින් අඩු අගයකි.

නිරෝගී ජනතාවක් බිහිකිරීම පිණිස පෝෂණීය අගයෙන් ඉහළ ආහාර වේලක් ලබාදීම් අතිශයින් වැදගත් වන අතර සිරුරට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ, විටමින්, ඛණිජ ලවණ වැඩි ප්‍රමාණයක් ඉතාමත් ම පහසුවෙන් සිරුරට ලබාගැනීම සඳහා දෛනික පලතුරු අවශ්‍යතාවය සම්පූර්ණ කළ යුතු වේ. මේ සඳහා දැනට ලංකාවේ පරිභෝජනය කෙරෙන ඒක පුද්ගල දෛනික පලතුරු පරිභෝජනය වූ ග්‍රෑම් 40 ප්‍රමාණය ග්‍රෑම් 112 දක්වා වැඩි කිරීම අවශ්‍ය කාරණයක් වූ අතර ඒ සඳහා පලතුරු නිෂ්පාදනය වර්ධනය කළ යුතු විය. 2008 වර්ෂයේ "අපි වවමු - රට නගමු " දේශීය ආහාර නිෂ්පාදනය දිරිගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මකවීමට පෙර 2004, 2005, 2006 යන වර්ෂයන් හි පලතුරු වවන ලද බිම් ප්‍රමාණය හා නිෂ්පාදනය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වගු අංක **4.1**: පලතුරු වගාකළ බිම් ප්‍රමාණය හා නිෂ්පාදනය **(2004 – 2006)**

| | **2004** | | **2005** | | **2006** | |
|---|---|---|---|---|---|---|
| | බිම් ප්‍රමාණය හෙක් | නිෂ්පාදනය මෙ.ටො. | බිම් ප්‍රමාණය හෙක් | නිෂ්පාදනය මෙ.ටො. | බිම් ප්‍රමාණය හෙක් | නිෂ්පාදනය මෙ.ටො. |
| කෙසෙල් | 50,376 | 405,000 | 51,147 | 408,996 | 48,856 | 378,336 |
| අඹ | 26,330 | 75,826 | 27,200 | 76,581 | 25,315 | 70,418 |
| අන්නාසි | 5,188 | 60,081 | 5,257 | 60,901 | 4,963 | 59,550 |
| පැපොල් | 5,013 | 20,173 | 4,941 | 19,754 | 5,079 | 21,138 |
| රඹුටන්* | 2,856 | - | 3,240 | - | 3,120 | - |
| අලිගැටපේර* | 1,625 | - | 1,458 | - | 1,591 | - |
| දෙළුම්* | 771 | - | 791 | - | 736 | - |
| සිට්‍රස් | | | | | | |
| දොඩම් | 4,291 | 4,119 | 4,433 | 3,692 | 4,292 | 3,772 |
| ජම්නාරං* | 429 | - | 538 | - | 447 | - |
| දෙහි | 9,945 | 5,387 | 9,678 | 5,210 | 8,973 | 4,965 |
| කොස් | 44,730 | 2,555,520 | 41.558 | 2,338,210 | 39,372 | 2,304,310 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,2010

ඉහත වගුවට අනුව 2006 වර්ෂය වන විට පලතුරු වගාවේ බිම් ප්‍රමාණය මෙන්ම පලතුරු නිෂ්පාදනය ද පසුබෑමකට ලක් ව ඇති බව පෙනී යයි.

එමෙන්ම පලතුරු නිෂ්පාදනයේ දී ක්ෂේත්‍රය තුළින් ලබාගන්නා"ඒකක ඵලදාව" හා ලබාගත හැකි මට්ටම හෙවත් "විභව මට්ටම" අතර ද විශාල පරතරයක් පවතී. එය වගු අංක දෙකෙන් පෙන්නුම් කෙරේ.

**වගු අංක 4.2: ක්ෂේත්‍ර මට්ටමේ ඒකක ඵලදාව හා විභව ඒකක ඵලදාව**

| වගාව | ඒකක ඵලදාව මෙ.ටො./ හෙක් | විභව ඒකක ඵලදාව මෙ.ටො./ හෙක් |
|---|---|---|
| කෙසෙල් | 7.1 | 20.0 |
| අන්නාසි | 10.0 | 20.0 |
| පැපොල් | 6.0 | 20.0 |
| වැල් දොඩම් | 7.4 | 12.0 |
| අඹ | 2.8 | 8.0 |
| රඹුටන් | 6.0 | 20.0 |
| ලෙමන් | 1.0 | 3.5 |
| දොඩම් | 1.0 | 4.0 |
| අලිගැටපේර | 11.5 | 23.0 |
| කොමඩු | 15.0 | 26.0 |
| දිවුල් | 10.0 | 12.0 |
| පේර | 11.0 | 17.0 |
| දෙළුම් | 10.0 | 15.0 |

මූලාශ්‍රය: කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 2010

## 4.2 පලතුරු අපනයනය

මෙම තත්ත්වයට සමගාමීව පලතුරු අපනයනය ද 2006 වර්ෂය වන විට පහළ ගොස් ඇත. 2004 වර්ෂයේ අපනයනය කරන ලද මුළු පලතුරු ප්‍රමාණය මෙ.ටො. 27,9687ක් වුව ද 2006 වර්ෂය වනවිට එය මෙ.ටො. 23,4107ක් වී ඇත.

**වගු අංක 4.3: පලතුරු අපනයනය ප්‍රමාණ හා වටිනාකම (2004 -2006)**

| | 2004 | | 2005 | | 2006 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය මෙ.ටො. | වටිනාකම රු.000 | ප්‍රමාණය මෙ.ටො | වටිනාකම රු.000 | ප්‍රමාණය මෙ.ටො | වටිනාකම රු.000 |
| සිට්‍රස් දොඩම් | 4.23 | 218 | 28.20 | 3,362 | 6.47 | 728 |
| ලෙමන් | 39.78 | 5,656 | 28.99 | 3,688 | 396.83 | 9,331 |
| අන්නාසි | 2,712.31 | 171,814 | 1,681.50 | 142,638 | 1,751.11 | 148,234 |
| පැපොල් | 11.87 | 3,631 | 59.97 | 11,500 | 113.36 | 23,711 |
| අඹ | 17.74 | 740 | 27.54 | 4,479 | 28.96 | 8,735 |
| කෙසෙල් | 11.25 | 1,367 | 8.53 | 1,992 | 31.45 | 937 |
| අලිගැටපේර | 3.82 | 165 | 0.51 | 29 | 4.26 | 223 |
| මැංගුස් | 0.010 | 8 | - | - | 8.63 | 952 |
| මුළු එකතුව | 2796.87 | 183599 | 1835.24 | 167688 | 2341.07 | 192851 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව, 2010

මෙවැනි පරතරයක් ඇති වීමට ප්‍රධාන ලෙස ම වගාවන් හි පවත්නා පහළ කළමනාකරණ මට්ටම, උණුසුම් දේශගුණික තත්ත්වය, අක්‍රමවත් වගා රටාවන් හා ශාක නඩත්තුව, ඉහළ නිෂ්පාදන පිරිවැය, ප්‍රමාණවත් නොවන යටිතල පහසුකම්, ගොවීන්ගේ අඩු දැනුම හා තොරතුරු ප්‍රමාණවත් පරිදි නොලැබීම යන සාධක හේතු වී ඇත. පලතුරු සඳහා ඉහළ මට්ටමේ අපනයන විභවයක් පවතී. එබැවින් ඒ සඳහා ද යොමු වූ නිෂ්පාදනයක් ඇති කිරීම ඉතා වැදගත් වේ.

## 4.3 පලතුරු ආනයනය

පලතුරු ආනයනයේ දී ශ්‍රී ලංකාවට ප්‍රධාන වශයෙන් ම ඇපල්, මිදි සහ දොඩම්, ජමනාරං, ලෙමන් වැනි සිට්‍රස් වර්ගයන් ආනයනය කරනු ලබයි. මේ අතරින් ඇපල් අප රටේ දේශගුණික තත්ත්වයන් යටතේ වගා කිරීම අපහසු අතර, අනෙක් වර්ගයන් ඉතා හොඳින් වගා කිරීමේ

පාරිසරික සාධක අප රට සතු වේ. මෙම පලතුරු වර්ග ආනයනය වෙනුවෙන් සැලකිය යුතු විදේශ විනිමයක් මෙරටින් පිටතට ඇදී යන අතර එය අවම කර ගැනීම ද වර්තමාන අවශ්‍යතාවයක් බවට පත් වී ඇත. මේ සඳහා දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම අත්‍යවශ්‍ය වන අතර ඒ සඳහා පවතින ගැටලු හඳුනාගැනීම වැදගත් වේ.

**වගු අංක 4.4: ශ්‍රී ලංකාවේ පලතුරු ආනයන ප්‍රමාණ හා වටිනාකම්**

| | 2004 | | 2005 | | 2006 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය මෙ.ටො. | වටිනාකම රු.මි. | ප්‍රමාණය මෙ.ටො. | වටිනාකම රු.මි. | ප්‍රමාණය මෙ.ටො. | වටිනාකම රු.මි. |
| මිදි | | | | | | |
| පලතුරු | 3,479 | 316.6 | 3,037 | 261.0 | 3,493 | 306.6 |
| වියළි | 1,755 | 80.1 | 1,386 | 53.3 | 1,822 | 74.9 |
| සිට්‍රස් | | | | | | |
| දොඩම් | 7,217 | 198.2 | 3,606 | 136.6 | 4,881 | 185.8 |
| ජමනාරං | 2,528 | 54.2 | 4,004 | 80.2 | 6,084 | 128.0 |
| ලෙමන් | - | - | 18 | 3.6 | 5 | 1.6 |
| ග්‍රේප් ෆෘට් | 10 | 0.2 | 60 | 1.8 | 5 | 0.3 |
| මුළු එකතුව | 14,989 | 650 | 12,111 | 537 | 16,290 | 697 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව,2010

ඉහත වගුව අනුව 2004 වර්ෂයේ දී පලතුරු ආනයන වටිනාකම රු. මිලියන 650ක් වන අතර 2006 වර්ෂය වනවිට එය රු. මිලියන 697 දක්වා වැඩි වී ඇත. මෙම තත්ත්වය මත දේශීය පලතුරු නිෂ්පාදනය ප්‍රවර්ධනය කර අපනයනාභිමුඛ ප්‍රතිලාභ ලබා පලතුරු ආනයනය අඩුකිරීම මගින් විදේශ විනිමය ඉතිරි කර ගැනීමත් අරමුණු කර ගනිමින් දේශීය පලතුරු නිෂ්පාදනය ඉහළ නැංවීමට ඇති බාධාවන් හඳුනාගෙන ඇත.

## 4.4 දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමට පවතින ප්‍රධාන ගැටලු

- සංවිධානාත්මක වාණිජ වගා (විශාල/මධ්‍ය පරිමාණ) සීමිත වීම (අන්නාසි කෙසෙල් හැර).
- ගුණාත්මක රෝපණ හිඟකම.
- නිෂ්පාදනය වසරේ එක් වකවානුවකට සීමා වීම හා එම කාලයන් හි අධික නාස්තිය.
- දියුණු තාක්ෂණයන් පිළිබඳ නොදැනුවත්බව.
- අස්වනු එකතු කිරීම ප්‍රවාහනය හා ගබඩා කිරීමේ දී ඇති දුර්වල පරිහරණය.

- ගබඩා පහසුකම් හිඟකම.
- ආහාර සැකසීමේ හා අගය වැඩි කළ නිෂ්පාදන සඳහා වූ වැඩි දියුණු තාක්ෂණික ක්‍රම ප්‍රමාණවත් නොවීම හා පවත්නා තාක්ෂණයන් පිළිබඳ දැනුවත් නොවීම.

පලතුරු වගා සංවර්ධනය සඳහා සැලසුම් සකස් කිරීමේ දී ඉහත ගැටලු හඳුනාගෙන ඇති අතර මේ සඳහා 2008 වර්ෂයේ දී "අපි වවමු - රට නගමු" දේශීය නිෂ්පාදනයන් දිරිගැන්වීමේ වැඩසටහන යටතේ විසඳුම් අපේක්ෂා කෙරිණි. ඒ අනුව මෙම ආහාර ප්‍රවර්ධන වැඩසටහන සඳහා පලතුරු වර්ග 11ක් තෝරා ගනිමින් ඒවායෙහි දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම හරහා පරිභෝජන අවශ්‍යතාවයත්, විදේශීය විනිමය ඉතිරි කර ගැනීමත්, ගොවීන්ගේ ආදායම් ඉහළ නැංවීම හා නව රැකියා මං විවර කර ගැනීමත් ආදී අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම අපේක්ෂා කෙරිණි. මේ සඳහා තුන් වසරක (2008-2010) ඉදිරි වැඩ සැලැස්මක් ආරම්භ කෙරිණි.

## 4.5 පලතුරු නිෂ්පාදන වැඩසටහන (2008-2010)

මෙම වැඩසටහන යටතේ ප්‍රවර්ධනය කිරීමට අන්නාසි, කෙසෙල්, අලිගැටපේර, පැපොල්, දෙළුම්, මිදි, මැංගුස්, රඹුටන්, කොස්, පැඟිරි කුලයේ බෝග (දෙළුම්, ජමනාරං හා දෙහි) යන පලතුරු වර්ග තෝරා ගෙන ඇත.

## 4.6 නිෂ්පාදනය ඉහළ නැංවීමේ ක්‍රමවේදයන්

1. නව වගා පිහිටුවීම (කුඩා/මධ්‍ය/ මහා පරිමාණ)
2. රෝපණ ද්‍රව්‍ය සුලභ කිරීම
3. ස්ථාපිත වගා පුනරුත්ථාපනය
4. පූර්ව හා පසු අස්වනු තාක්ෂණයන් දියුණු කිරීම හා ප්‍රචලිත කිරීම
5. නිමි අගය වැඩි නව නිෂ්පාදන බිහි කිරීම හා තිබෙන තාක්ෂණයන් හඳුන්වා දීම
6. දත්ත බැංකුවක් සංවිධානාත්මකව පවත්වාගෙන යාම

## 4.7 තෝරාගත් පලතුරු බෝග ප්‍රවර්ධනය සඳහා අපේක්ෂිත උපාය මාර්ග

"අපි වවමු - රට නගමු" දේශීය ආහාර බෝග ප්‍රවර්ධන ජාතික මෙහෙයුම තුළ තෝරාගත් පලතුරු බෝගයන්හි (අඹ, අන්නාසි, පැපොල්, කෙසෙල්, අලිපේර, දෙළුම්, මිදි, මැංගුස්ටින්, කොස්, රඹුටන් සහ පැඟිරි බෝග) නිෂ්පාදනය දිරිගැන්වීමට භාවිත ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ උපාය මාර්ග කිහිපයක් හඳුනාගෙන ඇත. විශේෂයෙන් ම පලතුරු බෝගයන්හි වගා භූමිය වර්ධනය කිරීම, බීජ නිෂ්පාදනය පුළුල් කිරීම, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා සුලභ කිරීම, නිෂ්පාදනයන්හි ගුණාත්මය ඉහළ මට්ටමකට ගෙන ඒම, නිෂ්පාදන වියදම අවම කිරීම, පසු අස්වනු තාක්ෂණය දියුණු කිරීම ආනයන අඩු කිරීම, යන්ත්‍ර

සූත්‍ර ලබාදීම, පැරණි වගා පුනරුත්ථාපනය, දිලීර හා රෝග පාලනය, දියුණු බෝග පාලන තාක්ෂණයක් හඳුන්වාදීම, පෞද්ගලික අංශය උනන්දු කිරීම වැනි මාර්ගයන් වේ.

## 4.8 2008 – 2012 දක්වා වූ පලතුරු බෝග ප්‍රවර්ධනය සඳහා වර්ෂයක් පාසා සිදු කෙරී ඇති වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය

"අපි වවමු - රට නගමු" දේශීය ආහාර දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම තුළ පලතුරු බෝග නිෂ්පාදනය වැඩි වර්ධනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ම පලතුරු බෝග නායකයෙකු යටතේ වැඩසටහන ක්‍රියාත්මක වී ඇත. අනතුරුව තෝරාගනු ලැබූ එක් එක් පලතුරු බෝගයන් සඳහා ප්‍රාදේශීය වශයෙන් බෝග නායකයෙකු පත්කර ගෙන ඇති අතර ඔවුන් යටතේ පලතුරු බෝග වගාවේ වර්ධනය අපේක්ෂා කර ඇත. 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා පලතුරු වගාවේ ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇති අතර මෙම වැඩසටහන හරහා ප්‍රාදේශීය වශයෙන් අදාළ පලතුරු බෝගයන්හි ප්‍රවර්ධනය සඳහා කටයුතු සිදු කර ඇත. ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාත්මක සැලසුම් සකස් කිරීමේ දී ඒ ඒ පලතුරු වැවීමට සුදුසු පරිසරය පිළිබඳ මූලික වශයෙන් අවධානය යොමු කර ඇති අතර උදාහරණයක් ලෙස "දෙළුම්" වගාව ප්‍රවර්ධනය කිරීමේ දී මන්නාරම, කල්පිටිය, හම්බන්තොට වැනි ප්‍රදේශ තෝරාගෙන ඇති බව අනාවරණය විය. 2008 වර්ෂයේ දී ක්‍රියාත්මක කළ මෙම ආහාර ප්‍රවර්ධන වැඩසටහන 2012 දක්වාම ක්‍රියාත්මක කෙරී ඇති බව ද පෙනිණි. 2008-2010 යන වර්ෂයන් හි එක් එක් පලතුරු බෝග වැවෙන ප්‍රදේශයන් හි එම බෝග ප්‍රවර්ධනයට මූලිකත්වය දී ඇති අතර 2011- 2012 යන වර්ෂයන් හි මූලික වශයෙන් හොරණ, පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ ජෛව විවිධත්ව පලතුරු උයන පිහිටුවීමේ ව්‍යාපෘතිය දියත් කර ඇත. 2008 සිට 2012 ජුනි මාසය දක්වා වූ කාලය තුළ මෙම ව්‍යාපෘතීන් හි ප්‍රගතිය විශ්ලේෂණය කිරීමේ දී තෝරාගත් පලතුරු බෝගයන්හි ප්‍රවර්ධනය සඳහා මූලික වශයෙන් හඳුනාගනු ලැබූ උපාය මාර්ගයන් වෙත ළඟාවීමේ තත්ත්වය පහත පරිදි විමර්ශනය කළ හැකිය.

## 4.9 2008 වර්ෂයේ පලතුරු බෝග ප්‍රවර්ධනය සඳහා සිදු කෙරී ඇති වැඩසටහන්

2008 වර්ෂයේ දියත් කළ වැඩසටහන් යටතේ ප්‍රධාන වශයෙන් ම තෝරාගත් පලතුරු බෝගයන්ට අදාළව මව් පැළ නිපදවීම, කුඩා හා මධ්‍ය පරිමාණ ගොවිපළවල් පිහිටුවීම, ගෙවතු සංවර්ධනය, භූමිය සැකසීම හා නව වගා පිහිටුවීම හා පැරණි වගා පුනරුත්ථාපනය, පුහුණු/ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, පසු අස්වනු තාක්ෂණය දියුණු කිරීම හා නිෂ්පාදන අපනයනය යන කාර්යයන් සිදු කර ඇත. එහි දී ඉලක්කගත කාර්යයන් හා එහි භෞතික ප්‍රගතියත්, වියදමත් ඇමුණුම අංක 01න් පැහැදිලි කෙරෙන අතර ඒ අනුව කෙසෙල්,

අඹ, අන්නාසි, පැපොල්, දෙළුම්, මිදි, පැෂන් ෆෘට් කුලයේ බෝග, අලිපේර, මැංගුස්, රඹුටන් වැනි පලතුරු සහ ඊට අමතරව කොස් බෝගය ද ඇතුළත්ව ඒවායෙ හි වම් පැළ නිපදවීමට ප්‍රධාන ඉලක්කයක් වී ඇත. ඒ අනුව බීජ මඟින්, ග්‍රාහක මඟින් සහ බද්ධ කිරීම මඟින් යට කී පලතුරු බෝගයන් සමඟ පැළ 102,000ක් නිපදවීමට ඉලක්කගත කර ඉන් බීජ මඟින්/ග්‍රාහක මඟින්/බද්ධ කිරීම යන ක්‍රම මඟින් පැළ 69,987ක් නිපදවා ඇත. පැළ නිපදවීමට අමතරව 2008 වර්ෂයේ දී වැඩි අවධානයක් යොමු කර ඇති ක්ෂේත්‍රයන් ඉලක්ක සහ ඒවායෙ හි ප්‍රගතිය මෙන්ම වියදම් පිළිබඳව ඇමුණුම අංක 01න් සවිස්තරාත්මකව පෙන්වා දී ඇත.

2008 වර්ෂයේ දී පලතුරු බෝග ප්‍රවර්ධනය සඳහා රු. මිලියන 15ක් වෙන් කර ඇති අතර එයින් හය මිලියන නව ලක්ෂ විසිතුන්දහස් නවසිය අනූහතරක් (6,923,994.00) වැයකර පලතුරු බෝග නිෂ්පාදනය ඉහළ නැංවීමේ ක්‍රමවේදයන්ට අදාළ කාර්යයන් සිදුකර ඇත. ඒ අනුව 2008 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය විමසීමේ දී 46%ක වැය ප්‍රතිශතයක් පෙන්නුම් කරයි.

## 4.10 2009 වර්ෂයේ පලතුරු බෝග ප්‍රවර්ධනය - ප්‍රාදේශීය මට්ටමේ ප්‍රවර්ධනය

මෙම වර්ෂයේ දී ප්‍රධාන වශයෙන්ම අදාළ පලතුරු බෝග ප්‍රාදේශීය මට්ටමේ දී ප්‍රවර්ධනය කිරීමේ කාර්යයයන් සිදු කර ඇත. තෙලිජ්ජවිල, මාකඳුර, පේරාදෙණිය, මහඉලුප්පල්ලම යන පර්යේෂණ මධ්‍යස්ථානයන් හි තෝරාගත් නිලධාරීන් බෝග නායකයින් ලෙස පත් කිරීම හරහා ඒ ඒ පලතුරු බෝග වැවීමට විභවයක් ඇති ප්‍රදේශයන්හි පලතුරු බෝගයන් ප්‍රවර්ධනය සඳහා කාර්යයන් රැසක් ඉටුකිරීමට ඉලක්ක කර ඇත. ඇමුණුම අංක 02න් ඉටු කළ කාර්යයන්, ඉලක්කයන් සහ ප්‍රගතිය පිළිබඳව තොරතුරු පැහැදිලි කෙරේ. ඒ අනුව

තෙලිජ්ජවිල, මාකඳුර, ගන්නෝරුව, බිබිල වැනි පර්යේෂණ මධ්‍යස්ථාන මූලික කරගනිමින් තෝරාගත් බෝගනායකයින් පලතුරු බෝග ප්‍රවර්ධනයට සිදුකර ඇති කාර්යයන් ලෙස ප්‍රධාන වශයෙන් නව තාක්ෂණික ක්‍රමවේදයන් (පටක රෝපණය වැනි) ඔස්සේ වැඩි ඵලදාවක් ලබන බීජ (පැපොල්- රත්න ප්‍රභේදය) නිපදවීම, බද්ධ පැළ නිෂ්පාදනය, නව යන්ත්‍ර සූත්‍ර භාවිතය, DNA තාක්ෂණය හරහා රෝග හඳුනාගැනීම, දැනුවත් කිරීමේ හා පුහුණු පංති පැවැත්වීම සිදුකර ඇති බව පෙනී යයි. එසේම කාලීනව පැතිරෙන වසංගත රෝග (පිටිමකුණා පාලනය) හා ඒ පිළිබඳ ක්ෂේත්‍ර නිරීක්ෂණ හරහා දැනුවත් කිරීම් සිදු කිරීම ද විශේෂත්වයකි.

පහත දැක්වෙන්නේ 2009 වර්ෂයේ දී පලතුරු සංවර්ධන වැඩසටහන සඳහා වෙන් වූ ප්‍රතිපාදන හා එක් එක් පලතුරු බෝග යටතේ වැය වූ මුදල් පිළිබඳ සංක්ෂිප්ත සටහනකි.

වගු අංක 4.5 : 2009 වර්ෂයේ දී එක් එක් පලතුරු බෝගයන් සඳහා වූ ප්‍රතිපාදන, ප්‍රගතිය හා වැය

| | බෝගය | ප්‍රතිපාදනය (රු.මිලියන) | ප්‍රගතිය (රු.මිලියන) | වැය ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 01 | කෙසෙල් | 1.275 | 1.228 | 96% |
| 02 | අන්නාසි | 1.7 | 1.369 | 81% |
| 03 | පැපොල් | 2.125 | 2.052 | 97% |
| 04 | මිදි | 1.02 | 0.370 | 36% |
| 05 | දෙළුම් | 0.85 | 0.396 | 47% |
| 06 | රඹුටන් | 2.0 | 1.386 | 69% |
| 07 | පැඟිරි කුලයේ බෝග (දොඩම්, ජමනාරං) | 2.38 | 2.080 | 87% |

මූලාශ්‍රය: පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය,2012

ඉහත පලතුරු වගා ප්‍රවර්ධන වැඩසටහන සඳහා මූලිකවම 2009 වසර තුළ ලබාදුන් මුළු ප්‍රතිපාදනය රු. මිලියන 9.350ක් වන අතර එයින් රු. මිලියන 7,495,645.56ක මුදලක් ඉහත කාර්යයන් සඳහා වැය කර ඇති අතර මුළු වියදම් ප්‍රතිශතය 80%කි.

## 4.11 2010 වර්ෂයේ පලතුරු බෝග ප්‍රවර්ධනය - ප්‍රජා බීජ වැඩසටහන

මූලික වශයෙන්ම ප්‍රජා බීජ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත්තේ 2010 වර්ෂයේය. 2009ට සාපේක්ෂව මෙ වැඩසටහන මගින් පලතුරු බෝග වැඩි ප්‍රමාණයක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සිදුකර ඇත. විශේෂයෙන් පෙර වසරවල දී ප්‍රවර්ධනයට අදාළ කරගත් පලතුරුවලට අමතරව, 2010 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන හරහා මැංගුස්, අලිපේර, අඹ සහ කොස් යන බෝගයන් හි බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිළිබඳව සැලකිලිමත් වී ඇත.

ප්‍රජා බීජ වැඩසටහන යටතේ ද ප්‍රාදේශීය මට්ටමේ නායකයින් පත්කිරීම හරහා මෙම කාර්යය සිදුකෙරී ඇති අතර තෙලිජ්ජවිල, පේරාදෙණිය, මාකඳුර, බිබිල, අගුණුකොළපැලැස්ස, ගන්නෝරුව, හොරණ, හෝමාගම යන කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයන් හි තෝරාගත් නිලධාරීන් බෝග නායකයින් ලෙස පත් කර ඇත. ප්‍රජා බීජ වැඩසටහන මගින් කෙසෙල් ආදර්ශන පිහිටුවීම සඳහා ඒ ඒ පළාත්වල පැළ තවාන්කරුවන් ඇති කිරීම යටතේ

පැළ 50,000ක් නිපදවා ඇති අතර ඉන් පැළ 25,000ක් නැගෙනහිර පළාතට යවා ඇත. එසේම පුහුණු පංති 21ක් පවත්වා ඇති අතර ප්‍රතිලාභීන් 2130ක් ඒ සඳහා සහභාගී වී ඇත. සෙවනගල ප්‍රදේශයේ හෙක්ටයාර් 262ක වගාව ආරම්භ කර ඇති අතර නිර්දේශිත වර්ගයන් හි මව් ශාක ස්ථාපිත කිරීම ද සිදුකර ඇත (ඇමුණුම අංක 03).

මාකඳුර, පස්යාල, තෙලිජ්ජවිල හා පොළොන්නරුව යන ප්‍රදේශයන්හි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතනයන් හි අන්නාසි පැළ 8,000ක් සකස්කර ඇති අතර මව්ශාක නඩත්තුව ද සිදුකෙරී ඇත. මිද්දෙනිය සහ අඹේපුස්ස ප්‍රදේශයන්හි නව රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන ඒකකය ඇරඹීම මඟින් අන්නාසි පැළ 5,000ක් නිපදවීමට ඉලක්ක කර ඇත.

පැපොල් වගාව සංවර්ධනය කිරීමට නව බීජ වර්ග නිපදවීමට හා කෘමි රෝග මර්දනයට මූලිකත්වය දී ඇත. අඹ වගාව යටතේ පැරණි ගස් පුනරුත්ථාපනය, අවාරයේ මල් පීදීම සඳහා තාක්ෂණ ක්‍රමවේදයන් භාවිතා කිරීම ("කුල්ටා" යෙදීමෙන් උත්තේජනය) සිදුකර ඇති අතර මේ මඟින් ආදර්ශන තුනක් සකස් කර ඇත. එසේම රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය යටතේ ටොම් ඊ.ජේ. සී.වර්ගයේ බද්ධ පැළ 150ක් නිෂ්පාදනය කර ඇත. මෙම වර්ගය නව වර්ගයක් වන අතර එයින් උසස් වර්ගයේ අඹ නිෂ්පාදනයක් අපේක්ෂා කෙරේ. කොස් බෝගය සඳහා හොරණ පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ අක්කර 05ක් මව්ශාක නඩත්තුව හා නිර්දේශිත වර්ගවල පැළ නිෂ්පාදනය කර රෝපණය කිරීමක් සිදු කර ඇත. මෙය වර්තමානයේ නඩත්තු වෙමින් පවතී. එසේම අගය වැඩි කළ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා පුහුණු පංති 10ක් පැවැත්වීමට කටයුතු කර ඇති අතර නාවලපිටිය, කුරුඳුවත්ත, නාලන්ද, ඉබ්බාගමුව, කුරුණෑගල, වාරියපොළ, කුලියාපිටිය වැනි ප්‍රදේශවල මේවා සිදු කර ඇත. එසේම මිදි , රඹුටන්, පැඟිරි කුලයේ බෝග සඳහා ද බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කර ඇත.

පහත දැක්වෙන්නේ 2010 වර්ෂය තුළ පලතුරු බෝග ප්‍රවර්ධනය සඳහා සිදු කළ ප්‍රජා බීජ වැඩසටහන සඳහා වෙන් කළ ප්‍රතිපාදන සහ වියදම් පිළිබඳ තොරතුරු වේ.

වගු අංක 4.6: 2010 වර්ෂයේ ප්‍රජා බීජ වැඩසටහන සඳහා වෙන් කළ මූල්‍ය ප්‍රතිපාදන සහ එහි ප්‍රගතිය

| | බෝගය | මුල් ප්‍රතිපාදනය (රු . මිලි.) | සංශෝධිත ප්‍රතිපාදනය (රු. මිලි.) | වියදම (රු. මිලි.) |
|---|---|---|---|---|
| 01 | කෙසෙල් | 1.0 | 0.6 | 1. 538 |
| 02 | අන්නාසි | 0. 911 | 0. 547 | 0. 306 |
| 03 | පැපොල් | 1. 0 | 0.6 | 0. 451 |
| 04 | අඹ | 2. 0 | 0.12 | 0. 228 |
| 05 | මිදි | 0.95 | 0. 57 | 0. 39 |
| 06 | දෙළුම් | 0. 614 | 0. 368 | 0. 436 |
| 07 | මැංගුස් | 0. 275 | 0.165 | 0. 117 |
| 08 | රඹුටන් | 0. 5 | 0. 3 | 0. 26 |
| 09 | අලිගැටපේර | 0. 4 | 0. 24 | 0.181 |
| 10 | කොස් | 0.15 | 0. 09 | 0.197 |
| 11 | පැඟිරි කුලයේ බෝග | 2.0 | 1. 2 | 0. 018 |

මූලාශ්‍රය: පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, 2012

## 4.12 2011- 2012 යන වර්ෂයන් හි පලතුරු බෝග ප්‍රවර්ධනය - ජෛව විවිධත්ව පලතුරු උද්‍යාන ව්‍යාපෘතිය

2011 වර්ෂයේ දී "අපි වවමු- රටට නගමු" වැඩසටහන යටතේ දී පලතුරු බෝග ප්‍රවර්ධනය සඳහා රු. මිලියන 10ක් වෙන් කර තිබූ අතර එම වෙන් කළ ප්‍රතිපාදනයන් හොරණ පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට අයත් භූමියේ ජෛව විවිධත්ව පලතුරු උද්‍යානයක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වැය කර ඇත. පර්යේෂණ මට්ටමේ ජාන සම්පත් සංරක්ෂණ කර ගැනීමේ අරමුණ ද මෙවැනි උද්‍යානයක් ස්ථාපනය කිරීමෙන් අපේක්ෂා කර ඇත.

**01. උද්‍යානයට අදාළ සිතියමක් සකස් කිරීම හා භූමි සංවර්ධනය**

2011 වර්ෂය තුළ සිදුකිරීමට ඉලක්කගත කාර්යයන් අතර ගොවිපළ භූමියට (හෙක්.120)ට අයත් හෙක්.40ක භූමිය ප්‍රමාණයක් සංවර්ධනය කිරීම ප්‍රධාන වී ඇත. පළමුවෙන්ම ගොවිපළට අයත් භූමියේ සිතියමක් නිර්මාණය කර එහි ඇති භූමියේ ගති ලක්ෂණ හඳුනාගෙන ඇත. අනතුරුව භූමි ප්‍රදේශයේ සංවර්ධනය කළ යුතු කොටස් හඳුනාගෙන හෙක්ටයාර් 20ක පමණ භූමි ප්‍රදේශයක් පුරා පැතිර තිබූ ඵලදාව රහිත රබර් යාය ඉවත් කර කැලෑ ප්‍රදේශය සංවර්ධනය කර ඇත. එම නව භූමි ප්‍රදේශය තුළ නව වගාවන් (කෙසෙල් පැළ - 661, මැංගුස් පැළ - 40, අඹ පැළ - 59, මඤ්ඤොක්කා පැළ - 300, කිරිඅල පැළ - 35) ස්ථාපිත කෙරී ඇත. එසේම කැලෑව ශුද්ධ කිරීම,

අනවශ්‍ය ගස් ඉවත්කිරීම(කටු පොල්, රබර්) සහ අවශ්‍ය ගස් ඉතිරි කර සංරක්ෂණ කිරීම සිදු කෙරී ඇත. පැරණි වගාවන් සංරක්ෂණ යටතේ පැරණි පලතුරු ගස් කප්පාදුව සහ පොහොර යෙදීම සිදුකෙරී ඇත.

**02. පැරණි වගාවන් පුනරුත්ථාපනය**

ගොවිපළට අයත් පැරණි වගාවන් පුනරුත්ථාපනය කිරීම 2011 වර්ෂයේ ඉලක්කගත කාර්යයක් වී ඇති අතර මෙහි දී පැරණි අඹ සහ දූරියන් වගාවන්හි කප්පාදුව සහ පොහොර යෙදීමෙන් ඒවා ඵලදාවක් ලබාගත හැකි මට්ටමට ගෙන ඒම සිදුකර ඇත. ඖෂධීය වගාවන් ද ස්ථාපිත කර ඇත. 2012 වර්ෂයේ දී එම පොහොර යොදා පුනරුත්ථාපනය කර ඇති වගාවන්ගෙන් ඉතා ඉහළ අස්වැන්නක් ලද බව නිලධාරීන් හා කෙරුණු සාකච්ඡාවල දී අනාවරණය විය.

**03. ගොවිපළ උපකරණ හා යන්ත්‍ර මිලදී ගැනීම**

අලුතින් සංවර්ධනය කරන ලද හෙක්ටයාර් 20ක් වූ භූමියේ කාර්යයන් සඳහා ට්‍රැක්ටර්, තණකොළ කපන යන්ත්‍ර මිලදී ගෙන ඇත.

**04. ප්‍රධාන පලතුරු සහ ඌන භාවිත පලතුරු සංරක්ෂණය හා නව පලතුරු විශේෂ හඳුනාගැනීම**

දැනට ගොවිපළ තුළ පවතින අඹ, මැංගුස්ටින්, දූරියන්, අන්නාසි,රඹුටන්, කෙසෙල් වැනි පලතුරු බෝග සංවර්ධනය සහ මව් ශාක නඩත්තුව මෙන් ම ඌන භාවිත පලතුරු වූ උගුරැස්ස, පලු,වීර, මා දං, හිඹුටු, වෙරළු වැනි දේශීය පලතුරු ද සංරක්ෂණය කර නඩත්තු කිරීමේ වැඩසටහනක් ආරම්භ කෙරී ඇත. නිවර්තන කලාපීය නව පලතුරු විශේෂ හඳුනාගැනීම සහ නැවත නිෂ්පාදනය කිරීම ද මේ යටතේ සිදු කෙරෙමින් පවතී. 2011 වසර අවසන් වන විට මව් ශාක වගාවන් සහ ජාන සම්පත් සංරක්ෂණය හෙක්ටයාර් 30ක භූමි ප්‍රමාණයක සිදු කර ඇත.

**05. රෝපණ ද්‍රව්‍ය හා තවාන් වැඩි දියුණු කිරීමේ වැඩසටහන**

මේ යටතේ නව පලතුරු පැළ තවාන් සංවර්ධනය කිරීම ඉලක්කය වන අතර බද්ධ පැළ හා බීජ පැළ නිෂ්පාදනය සිදු කර ඇත. බද්ධ පැළ( රඹුටන්, අඹ, දූරියන්, කොස්, වෙරළු, අනෝදා) 6820ක් නිෂ්පාදනය කර ඇති අතර බීජ පැළ(රඹුටන්, අඹ, දූරියන්, වෙරළු, අනෝදා, මැන්ඩරින්, සැපතිල්ලා, ස්ට්‍රෝබෙරි, පේර) 17,923ක් නිෂ්පාදනය කර ඇත. මෙයින් පැළ 198ක් අලෙවිකර ඇති අතර පැළ 827ක් ගොවිපළ තුළ වගාකර ඇත.(කොස්, රඹුටන්, පේර)

**06.** **පලතුරු බෝග පර්යේෂණ කාර්යයන් ශක්තිමත් කිරීමේ වැඩසටහන**

මේ යටතේ පැපොල්, පැෂන්ෆෘට්, සහ අඹ සඳහා දෙමුහුන් (Hybrids) බීජ නිෂ්පාදනය හා ස්වයං බීජ (self seed) නිෂ්පාදනය සඳහා පර්යේෂණ ආරම්භ කර වර්ෂය අවසාන වනවිට වැඩිදියුණු කළ බීජ මඟින් පැපොල් වගාවේ මව් පාර්ශවීය පැළ තවාන් සඳහා භූමිය සැලසුම් කිරීමක් ද සිදු කර ඇත. මීට අමතරව දූරියන් සහ පැඟිරි කුලයේ පලතුරු (දොඩම්, මැංඩරින්) සඳහා ද දෙමුහුන් බීජ නිෂ්පාදන කාර්යය සිදු කිරීම මඟින් පැළ ලබාගෙන ඇත. මේ යටතේ දූරියන් පැළ 700ක් ද පැඟිරි කුලයට අයත් පැළ 200ක් ද නිෂ්පාදනය කර ඇත.

**07.** **තාක්ෂණය ව්‍යාප්ත කිරීමේ වැඩසටහන්**

බීජ නිෂ්පාදනය , පැළ නිෂ්පාදනය, අගය එකතු කළ නිෂ්පාදන දියුණු කිරීම වැනි අංශ සඳහා දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 50ක් ඉලක්කකර පවත්වා ඇති අතර ඒ සඳහා 2844ක් ගොවීන් හා නිලධාරීන් සහභාගී වී ඇත.

**08.** **ගොවිපළ තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම**

මේ යටතේ ජලය ගලායාමේ පද්ධති, වගුරු කොටස් සකස් කිරීම, කෙටි මං මාවත් සකස් කිරීම, අගල් කැපීම ආදී ක්‍රම භාවිතයෙන් පාංශු සංරක්ෂණය කිරීම සිදු කර ඇත.

2011 වර්ෂයේ පලතුරු බෝග සංවර්ධනය සඳහා ලබාදුන් ප්‍රතිපාදන වැය කිරීමෙන් ඉහත කාර්යයන් සිදුකර ඇති අතර 2012 වර්ෂය සඳහා ද "අපි වවමු- රට නගමු" වැඩසටහන යටතේ රු.මිලියන 7.0ක් ලැබී ඇත. 2011 වසර තුළ ආරම්භ කළ වැඩසටහන් තවදුරටත් ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ප්‍රතිපාදන වෙන් කර ඇති බව නිලධාරීන් හා කෙරුණු සාකච්ඡාවලදී අනාවරණය විය.

**09.** **වැඩි දියුණුකළ බීජ නිෂ්පාදනය සහ අංකුර බද්ධ පැළ නිෂ්පාදනය**

2012 වසරේ දී වැඩි දියුණුකළ පලතුරු බීජ නිෂ්පාදනය හරහා ලබාගත් පැළ සහ වැඩි ඵලදාවක් ලැබිය හැකි හා දියුණු ලක්ෂණ සහිත පලතුරුවලින් ලබාගත් අංකුර බද්ධ කිරීමෙන් නිෂ්පාදනය කළ පැළ ගොවිපළ භූමියේ වගාකිරීම විශේෂත්වයකි. ඌන පාරිභෝජන පලතුරු වූ නමිනං(26), දිවුල්(08) , බෙලි(36), දඹ(05)කරඹ(15), දං(09)සියඹලා(02), ජම්බු(22), ලොවි(12), ලාවලු(16) යන පලතුරු සඳහා අංකුර බද්ධ කිරීමෙන් පැළ නිෂ්පාදනය කර ඇත.

## 10. පාංශු සංරක්ෂණය

ගොවිපළ භූමියේ පාංශු සංරක්ෂණය සඳහා 2012 වර්ෂයේ අවධානය යොමු කර ඇත. ගොවිපළ ඇතුළත තිබී ඉවත්කළ කටුපොල් ශාකය වැවී තුබූ භූමි ප්‍රදේශයේ පාංශු සංරක්ෂණ සඳහා සැවැන්දන(lemon grass) ශාකය වවා ඇති අතර එය අපනයන විභවයක් සහිත ශාකයක් බැවින් ඒ සඳහා ඉලක්කයක් ද ඇති බව සඳහන් විය. එසේම ග්ලිරිසිඩියා ශාකය ද පාංශු සංරක්ෂණය සඳහා වවා ඇත. පුහුණු වැඩසටහන් පැවැත්වීම හා උපදේශන සේවා සැපයීම, මේ යටතේ ගොවීන්ට සහ නිලධාරීන්ට, වගාව සිදුකිරීමට කැමැත්තක් ඇති පුද්ගලයින්ට තාක්ෂණික පුහුණුව ලබා දී ඇත. ඊට අමතරව රෝග හා පළිබෝධවලින් තොර උසස් මට්ටමේ තවාන් සැකසීමට හා පාලනයට උපදේශන සේවා සැපයීම සිදුකර ඇත. (ඇමුණුම අංක 04)

## 4.13 පලතුරු වගා වපසරිය සහ නිෂ්පාදනයන් හි විචලනය

2007 වර්ෂයේ දී ආරම්භ කළ "අපි වවමු - රට නගමු" වැඩසටහනට සාපේක්ෂව 2011 වර්ෂය වන විට පලතුරු බෝග නිෂ්පාදනයේ සහ වගා වපසරියේ විචලනය අධ්‍යයනය කිරීමේ දී සමස්තයක් ලෙස පලතුරු ප්‍රධාන බෝගයන් හි (අන්නාසි, අඹ, පැපොල්, දොඩම්) නිෂ්පාදනයත් වගා වපසරියත් ක්‍රමයෙන් ඉහළ ගොස් ඇත. අනෙකුත් පලතුරු බෝග වූ පේර, අලිගැටපේර, කොස් වැනි පලතුරුවල ද නිෂ්පාදනය සහ වගා වපසරිය ක්‍රමයෙන් ඉහළ ගොස් ඇති අතර පේර සහ අලිගැටපේරවල නිෂ්පාදනය හා වගා වපසරිය ද 2010 වර්ෂයේ සිට සැලකිය යුතු මට්ටමින් ඉහළ ගොස් ඇත. නමුත් 2008 වර්ෂයේ සිට සාපේක්ෂව 2009 වර්ෂයේ දී පැපොල්, අන්නාසි, කෙසෙල් යන ප්‍රධාන පලතුරු බෝගයන් හි නිෂ්පාදනය අඩු වී ඇත. 2009 වර්ෂය පුරා පැවති නොවැළැක්විය හැකි කාලගුණික විපර්යාසයන් හි බලපෑම මේ සඳහා හේතු පාදක වී ඇති අතර ඊට අමතරව, "අපි වවමු- රට නගමු" වැඩසටහන ප්‍රායෝගික ව ක්‍රියාකාරී වීම ඇරඹුනේ 2008 – 2009 වර්ෂයන් හි වීමත් එසේම පලතුරු වගාවන් සම්බන්ධයෙන් වූ ප්‍රජා බීජ ව්‍යාපෘති, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, පැළ නිෂ්පාදනය ආරම්භ වීම සිදු වූයේ 2010 දී වීමත් නිසා ආහාර ප්‍රවර්ධනය සම්බන්ධයෙන් කළ වැඩසටහන් හි ප්‍රගතිය එළිදැක්වීම 2010 – 2011 වැනි වර්ෂ දක්වා දීර්ඝ වී ඇත. මෙම තත්ත්වය නිසා 2010 වර්ෂය ආරම්භයත් සමග යම් කිසි මට්ටමකින් වගා වපසරිය මෙන් ම නිෂ්පාදනය ද ඉහළ ගොස් ඇත. 2011 වර්ෂය වන විට තවදුරටත් නිෂ්පාදනය සහ වගා වපසරිය ඉහළ ගොස් ඇති අතර "අපි වවමු- රට නගමු" වැඩසටහන හරහා සිදු කෙරුණු මව් ශාක නඩත්තුව, පොහොර යෙදීම, ප්‍රජා බීජ වැඩසටහන යටතේ සිදු කළ වැඩි ඵලදාවක් ලැබිය හැකි බීජ නිෂ්පාදනය, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, බද්ධ පැළ නිෂ්පාදනය සෘජුව ම හේතු වී ඇති අතර, ප්‍රාදේශීයව ඒ ඒ පලතුරුවලට යෝග්‍ය වූ පරිසරයන් හි වගා කිරීම නිසා අස්වැන්න වැඩි වීම, ජෛව විවිධත්ව පලතුරු

උද්‍යාන තුළ සිදු කෙරුණු ක්‍රියාකාරකම්, එසේම පලතුරු ගොවීන් හා ව්‍යාප්ති නිලධාරීන් අරමුණු කරගෙන පවත්වනු ලැබූ දැනුවත් කිරීමේ හා තාක්ෂණික දැනුම ලබාදීමේ වැඩසටහන් මෙම තත්ත්වයට සෘජුව ම දායක වී ඇත. 2010 වර්ෂයේ දී ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානයන් හරහා සිදු කළ ප්‍රජා බීජ වැඩසටහන යටතේ ප්‍රධාන පලතුරු බෝගයන් හි දෙමුහුන් බීජ ප්‍රවර්ධනය, පටක රෝපණය, අවාරයේ ඵල හටගැන්වීමේ තාක්ෂණය හඳුන්වාදීම ඉතාමත් ඉහළ මට්ටමින් සිදු කිරීම ආදී කාර්යයන් නිසා 2011 වර්ෂය වන විට පලතුරු වගා වපසරිය හා නිෂ්පාදන ප්‍රමාණය ක්‍රමයෙන් ඉහළ ගොස් ඇත.

එසේම ජෛව විවිධත්වය පලතුරු උද්‍යාන ව්‍යාපෘතිය 2011 සිට අරඹා කර ඇති අතර එහි දී විශේෂයෙන් ප්‍රධාන පලතුරු සහ ඌන පලතුරු සංරක්ෂණය හා නව පලතුරු විශේෂ හඳුනා ගැනීම සිදු කෙරී ඇත. වර්තමානයේ ත් එම කාර්යයන් සිදු වෙමින් පවතී. මෙම වගා ව්‍යාපෘතියේ දී පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට අයත් භූමි ප්‍රදේශය තුළ පැවති ඉතා පැරණි වගාවන් අඹ, දූරියන් වැනි වගාවන් පුනරුත්ථාපනය (ගස් කප්පාදුව සහ පොහොර යෙදීම) කිරීම ද විශේෂිතව සිදු කෙරී ඇත.

"අපි වවමු- රටනගමු" වැඩසටහන යටතේ ප්‍රවර්ධනය සඳහා තෝරාගනු ලැබූ පලතුරු බෝග කිහිපයක නිෂ්පාදනය සහ වගා වපසරිය ක්‍රමයෙන් ඉහළ යාම 2008 සාපේක්ෂව පහත පරිදි වේ.

**වගු අංක 4.7 : අන්නාසි බෝගයේ නිෂ්පාදනය සහ වගා වපසරිය 2008 වර්ෂයට සාපේක්ෂව වැඩිවීමේ ප්‍රතිශතය**

| වර්ෂය | භූමි ප්‍රමාණය (හෙක්.) | වැඩි වීමේ ප්‍රතිශතය (%) | නිෂ්පාදනය (මෙ.ටො.) | වැඩි වීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| 2008 | 4.963 | | 43,480 | |
| 2009 | 4,782 | -3.6% | 41,289 | -5.0% |
| 2010 | 4,957 | -0.1% | 44,188 | + 1.6% |
| 2011 | 6,294 | +26.8% | 44,566 | + 2.5% |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2012

2008 වර්ෂයට සාපේක්ෂව 2009 වර්ෂයේ දී අන්නාසි බෝගයේ භූමි ප්‍රමාණය 3.6%න් අඩු වී ඇත. එම වසරේ නිෂ්පාදනය ද 2008 ට සාපේක්ෂව පහළ ගොස් ඇති අතර 2011 වර්ෂය වන විට අන්නාසි භූමි ප්‍රමාණය(26.8%) මෙන්ම නිෂ්පාදනය ද (2.5%) ක්‍රමානුකූලව ඉහළ ගොස් ඇත. (වගුව 4.8 දොඩම් බෝගයේ ද වගා භූමි ප්‍රමාණය හා නිෂ්පාදනය 2008 ට

සාපේක්ෂව 2011 වර්ෂය වන විට ක්‍රමයෙන් ඉහළ ගොස් ඇති බව වගු අංක 4.8 න් පැහැදිලි වේ.

**වගු අංක 4.8 : දොඩම් බෝගයේ නිෂ්පාදනය සහ වගා වපසරිය 2008 වර්ෂයට සාපේක්ෂව වැඩි වීමේ ප්‍රතිශතය**

| වර්ෂය | භූමි ප්‍රමාණය (හෙක්.) | වැඩි වීමේ ප්‍රතිශතය (%) | නිෂ්පාදනය (මෙ.ටො.) | වැඩි වීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| 2008 | 5,150 | | 28,847 | |
| 2009 | 5,354 | +4% | 33,163 | +15% |
| 2010 | 5,767 | +8% | 35,771 | +9% |
| 2011 | 6,057 | +5.6% | 36,138 | +1.3% |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2012

පැපොල්, කෙසෙල්. අඹ, දෙහි, කොස්, අලිගැටපේර සහ පේර යන පලතුරුවල ද වගා බිම් ප්‍රමාණය සහ නිෂ්පාදනය 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය වන විට ඉහළ ගොස් ඇති ආකාරය පහත දැක්වෙන ප්‍රස්තාර සටහන්වලින් පැහැදිලි කෙරේ. ඒ අනුව "අපි වවමු - රට නගමු" වැඩසටහන මගින් පලතුරු බෝග ප්‍රවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග යම් සාධනීය මට්ටමකට ප්‍රවේශ වී ඇති බව පැහැදිලි වේ.

## 4.14 ආනයන අපනයන් හි විචලනය

දේශීය ආහාර දිරිගැන්වීමේ මෙහෙයුම 'යටතේ දේශීය ආහාර ප්‍රවර්ධනයේ මූලික අරමුණ වූයේ, ආනයන ප්‍රමාණය අඩු කිරීම හරහා විදේශ විනිමය ඉතිරි කිරීමත් ආනයන විභවයක් පවතින පලතුරු බෝග සඳහා ඇති ඉල්ලුම සැපිරීමත් ය.

ලංකාවට ප්‍රධාන වශයෙන් ම මිදි (වියළි හා නැවුම්) ඇපල් සහ දොඩම් ආනයනය කෙරෙන අතර පැපොල් ද ආනයනය කරනු ලබයි. 2007 වර්ෂයේ ආහාර ප්‍රවර්ධන වැඩසටහන ආරම්භ වීමෙන් අනතුරුව ආනයනික පලතුරු ප්‍රමාණයන් හා වටිනාකම් පිළිබඳ පහත වගුවෙන් පැහැදිලි කෙරේ.

වගු අංක **4.9 : පලතුරු ආනයනය(2007 – 2010)**

| වර්ෂය | (මිදි නැවුම්) | | මිදි (වියළි) | | දොඩම් | | ඇපල් | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (මෙ.ටො) | වටිනාම (රු.000) | ප්‍රමාණය (මෙ.ටො) | වටිනාම (රු.000) | ප්‍රමාණය (මෙ.ටො.) | වටිනාකම (රු.000) | ප්‍රමාණය (මෙ.ටො.) | වටිනාකම (රු.000) |
| 2007 | 3430.03 | 326978.67 | 1786.33 | 78521.82 | 3346.85 | 158736.54 | 18025.76 | 625752.81 |
| 2008 | 3703.69 | 338849.15 | 1768.79 | 89195.98 | 3579.08 | 169548.87 | 17222.37 | 585110.67 |
| 2009 | 3418.82 | 363866.13 | 1548.89 | 140450.49 | 4305.12 | 225255.09 | 20138.5 | 885048.56 |
| 2010 | 4258.19 | 476079.27 | 1753.77 | 160691.12 | 4499.63 | 261691.73 | 22385.4 | 1090023.44 |

මූලාශ්‍රය : රේගු දෙපාර්තමේන්තුව, 2012

ඉහත වගුව අනුව ආහාර ප්‍රවර්ධන වැඩසටහන මගින් අපේක්ෂා කළ මට්ටම කරා ආනයන තත්ත්වය ප්‍රවේශ වී නොමැත. ඒ සඳහා හේතු විමර්ශනය කිරීමේ දී පැහැදිලි වූ ආකාරයට, මේ සඳහා කරුණු කිහිපයක් හේතු වී ඇත. 2007 ආහාර ප්‍රවර්ධන වැඩසටහන ප්‍රායෝගිකව ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මකවීම ආරම්භ වන්නේ, 2008/2009 වර්ෂයන් හි වන අතර අනතුරුව පලතුරු බෝග සඳහා සැලසුම් කළ ව්‍යාපෘතින් වෙනුවෙන් ඉහළ සිට පහළට ප්‍රතිපාදන ගලා ඒමේ දී මුහුණු දුන් දුෂ්කරතාවන් ද මැඩ පවත්වා ගනිමින් එම ව්‍යාපෘතීන් ආරම්භ කිරීමට ද කාලයක් ගත වී ඇත. පරිපාලනමය අපහසුකම් මධ්‍යයේ වුව ද සිදු කළ ක්‍රියාකාරකම් හි ප්‍රතිඵලයක් ලෙසින් 2010/2011 වන විට පලතුරු වගා වපසරියේ සහ නිෂ්පාදනයන් හි යම් ප්‍රගතියක් පෙන්නුම් කළ ද ආනයනය සම්බන්ධයෙන් වූ ඉලක්ක කරා ප්‍රවේශ වීමට තව දුරටත් කාලය ගත වන බව අදාළ නිලධාරීන් (බෝගනායක) හා කළ සාකච්ඡාවල දී පැහැදිලි විය. ඉහත වගු අංක 4.9න් ප්‍රකාශිත 2007 – 2010 පලතුරු ආනයන ප්‍රමාණ සහ වටිනාකම් විමර්ශනය කිරීමේ දී ද එය පැහැදිලි වේ.

අඹ, රඹුටන්, දූරියන් වැනි පලතුරු ප්‍රභේදයන් සිටුවා අවම වශයෙන් වසර 1 ½ - 5 අතර කාලයේ අස්වැන්න නෙළීමේ හැකියාව ලැබේ. (වැඩි දියුණු කළ බීජ හා රෝපණ ද්‍රව්‍ය භාවිතයෙන්) එබැවින් ආනයනය අඩු කිරීමේ ඉලක්කය කරා ප්‍රවේශවීම වර්තමානය තුළ නොදැකිය හැකි නමුත් ඉදිරි වසර කිහිපය තුළ සාධනීය තත්ත්වයේ ප්‍රතිඵලයක් අපේක්ෂා කළ හැකි බව ද සාකච්ඡාවල දී පැහැදිලි විය.

පලතුරු අපනයනය සම්බන්ධයෙන් සලකා බලන විට ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් කෙසෙල්, අන්නාසි, අඹ, ගස්ලබු අපනයනය කරන අතර ඉතා සුළු ප්‍රමාණවලින් අලිගැටපේර, දොඩම්, දෙහි, ස්ට්‍රෝබෙරි අපනයනය කෙරෙන බව සංඛ්‍යාන දත්තවලින් පැහැදිලි කරයි. අන්නාසි , අඹ නැවුම් පලතුරු ලෙසත්, වියළි තත්ත්වයෙන් සහ යුෂ තත්ත්වයෙන් අපනයනය කරයි.

ආහාර ප්‍රවර්ධන වැඩසටහනේ මූලික අරමුණක් වූයේ, අපනයන විභවයක් සහිත පලතුරු බෝග නිෂ්පාදනයක් ඇති කිරීම හරහා ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම සහ නව රැකියා බිහි කිරීමයි. අන්නාසි, අඹ, පැපොල් සහ කෙසෙල් ප්‍රධාන වශයෙන් ආහාර ප්‍රවර්ධන වැඩසටහන ආරම්භවීමට පෙර සිට ම අපනයනය සඳහා යොමුව පැවති අතර 2009/2010 වර්ෂය වන විට ඒවායෙ හි ප්‍රමාණයන් ඉහළ ගොස් ඇත. අලිගැටපේර, ස්ට්‍රෝබෙරි, දෙහි, දොඩම් වැනි අපනයනය විභවයක් සහිත පලතුරුවල අපනයන ප්‍රමාණයන් ද 2007/2008 වර්ෂයන්ට සාපේක්ෂව 2009/2010 පමණ වනවිට ඉහළ ගොස් ඇත. පලතුරු ආනයනය අඩු කිරීමත් අපනයනය ප්‍රමාණය වැඩි කිරීමත් වඩාත් ඉහළ මට්ටමින් සිදු වීම පිළිබඳ අනාගත අපේක්ෂාවන් පවත්වාගත හැකි බව අදාළ නිලධාරීන් හා කෙරුණු සාකච්ඡාවල දී පැහැදිලි වූ අතර 2009/2010 වර්ෂයන් හි පලතුරු බෝගයන් හි රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා දියුණු තාක්ෂණ ක්‍රමවේදයන් භාවිතයෙන් පැළ හා බීජ නිෂ්පාදනය කිරීම මගින් තව දුරටත් පලතුරු නිෂ්පාදනය වර්ධනය වීම ඉදිරියේ දී අපේක්ෂා කළ හැකි බව පැහැදිලි වේ.

ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩලයේ නව අධ්‍යයනයකින් හෙළිකරන පරිදි ශ්‍රී ලංකාව නැවුම් එළවළු සහ පළතුරු අපනයනයෙන් ඩොලර් මිලියන 8.95ක් 2013 ප්‍රථම භාගය තුළ උපයා ඇත. මෙය 21.8%ක වැඩිවීමකි. (සන්ඩේ ඔබ්සර්වර්, 2014 ඔක්තෝබර් 5)

පලතුරු වගා ප්‍රවර්ධනය වැඩසටහන් ගොවි ජනතාව සමඟ බද්ධ වී ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මකවීම පිළිබඳ අවස්ථා කිහිපයක් පහත සඳහන් සිද්ධි අධ්‍යයනවලින් විදහා දැක්වේ.

**සිද්ධි අධ්‍යයනය අංක 4.2 - අන්නාසි වගාව**

හතලිස් දෙහැවිරිදි චන්දන රාමනායක, හොරවඩුන්න, පන්නල ප්‍රදේශයේ උසස් පෙළ දක්වා උගත් ගොවි මහතෙකි. 2010 වර්ෂයේ දී "අපි වවමු -රට නගමු" වැඩසටහනට සමගාමීව පලතුරු බෝග ප්‍රවර්ධනය කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් අන්නාසි පැළ 4000ක් එක් ගොවියෙකු වෙත ලබා දී ඇත. එහි දී දෙපාර්තමේන්තුව මගින් 50% ක වැය බරක් දරණ අතර ගොවි මහතා විසින් ඉතිරි 50% දැරිය යුතුය. ඒ අනුව අන්නාසි පැළයක් රු.7.50 බැගින් පැළ 4000 ට රු. 30,000 ක් වී ඇති අතර හොරුවඩුන්න චන්දන රාමනායක මහතාට ද රු.15,000ක මුදලක් අන්නාසි වගා කිරීම සඳහා ලැබී ඇත. ආරම්භයේ දී අක්කර එකක අන්නාසි වගාව ස්ථාපිත කර ඇත. අන්නාසි පැළ ඉන්දවීමේ දී කුලී ශ්‍රමය උපයෝගී කරගෙන ඇති බැවින් එක් පැළයක් ඉන්දවීම සඳහා රු.2.50ක මුදලක් වැය වී ඇති අතර ඒ අනුව අක්කරයක පැළ ඉන්දවීම සඳහා චන්දන මහතාට වැය වූ පිරිවැය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| අන්නාසි එක් පැළයක් ඉන්දවීමට වැය වූ වියදම | = | රු.2.50 |
| පැළ 4000ක් ඉන්දවීමට වැය වූ වියදම | = | රු.2.50 x 4000 |
| | = | රු. 10,000.00 |

ඒ අනුව පැළ ඉන්දන අවස්ථාවේ වැය වූ වියදම රු.10,00 0ක් වී ඇත. අන්නාසි පැළ ඉන්දවීමේ දී මූලික වශයෙන් පොහොර යෙදීමක් කර නොමැති අතර මාසයක් ඉක්ම වූ පසු පොහොර යෙදීම ආරම්භ කර එක් පැළයකට පොහොර ග්‍රෑම් 30ක් වැටෙන සේ මිශ්‍ර පොහොර යොදා ඇත. පැළ ඉන්දවීමෙන් මාස 07ක් ගිය විට පැළය පීදෙන අතර 8 වෙනි මාසයේ දී මල පෙන්නුම් කරයි. චන්දන මහතා තම වගාවෙන් වසරක් ගිය තැන පළමු අස්වැන්න නෙළාගෙන ඇත. හොඳින් නඩත්තු කරන අන්නාසි පැළයකින් 1kg ක ගෙඩියක් ගත හැකි බව සඳහන් විය. චන්දන මහතා තම වගාවෙන් දළ වශයෙන් ගෙඩි 3000ක් පමණ ලබාගෙන ඇත.

| | |
|---|---|
| අන්නාසි 1kg ක සාමාන්‍ය මිල | = රු. 60.00 |
| අන්නාසි 3000 kg මිල | = රු.60.00 x 3000 |
| | = රු.1,80,000 |

මෙම ගොවි මහතා විසින් වගාව ඉතා ඉහළ මට්ටමින් නඩත්තු කර ඇති අතර ඒ සඳහා උපදෙස් හා දැනුම ලබාගැනීමට කෘෂිකර්ම උපදේශක මහතාගේ යොමු කිරීම මත මාකඳුර කෘෂිකර්ම පර්යේෂණ ආයතනයේ පැවැත්වූ පුහුණු කිරීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහන් මහෝපකාරී වූ බව සඳහන් විය. චන්දන ගොවි මහතා තම පළමු අස්වැන්නෙන් ම රු.180,000ක මුදලක් ලබාගෙන ඇත. මීට අමතරව අන්නාසි වගාවේ අස්වැන්න නෙළූ පසුව ගසෙන් හැදෙන පැළ ඉවත්කර විකිණීමෙන් ද චන්දන මහතා මුදලක් උපයාගෙන ඇත. සාමාන්‍යයෙන් ගෙඩි කැපූ අන්නාසි ගසකින් පැළ 2 – 3 අතර ප්‍රමාණයක් ලබාගත හැකිය. පැළයක විකුණුම් මිල රු. 15ක් වේ. ආරම්භයේ දී එක් අක්කරයකට සීමා වූ අන්නාසි වගාව වර්තමානය වනවිට අක්කර 3ක් පුරා ව්‍යාප්තව ඇති අතර පළමු වගාවෙන් ලබාගත් පැළ මේ සඳහා භාවිත කළ බව චන්දන මහතා පැවසීය. සාමාන්‍යයෙන් වසර 05ක් පුරා අන්නාසි වගාව පවත්වා ගත හැකි අතර වසර 5 ඉක්ම වූ පසු අන්නාසි ගෙඩි කුඩා වන බැවින් ලාභ ලැබීම අපහසු බවත් සඳහන් විය. ප්‍රාදේශීය මට්ටමේ පලතුරු අලෙවිසැල් හා වෙනත් පලතුරු රැස් කරන්නන් (collectors) බොහෝමයක් මේ සඳහා සිටින බැවින් අන්නාසි නිෂ්පාදනය අලෙවි කිරීම ගැටලුවක් නොවන බව චන්දන මහතා සඳහන් කරන ලදී. "අපි වවමු - රට නගමු" වැඩසටහන නිසා තමා අන්නාසි වගාවට යොමු වූ බවත් වර්තමානයේ මෙය ඔහුගේ ප්‍රධාන ආදායම් මාර්ගය වී ඇති බවත් සඳහන් කරන ලදී.

**සිද්ධි අධ්‍යයනය අංක 4.3 - කෙසෙල් වගාව**

පද්මකුමාර ජයසුන්දර මයා මොහොත්තව, නාරංගොඩ ප්‍රදේශයේ වයස අවු. 48ක් වයසැති උසස් පෙළ දක්වා උගත් ගොවි මහතෙකි. මුල් කාලීනව බුලත්, වී සහ ඉඟුරු වගාවේ නිරතව සිට 2011 වර්ෂයේ දී "අපි වවමු - රට නගමු" වැඩසටහනට සමගාමීව කෙසෙල් වගාවට යොමු වී ඇත. ආරම්භයේ දී වගාවේ ක්‍රමානුකූලව නියැළීම පිළිබඳ මාකඳුර පර්යේෂණ ආයතනයෙන් ලත් පුහුණුව ද මෙ සඳහා පිටුබලයක් වූ බව සඳහන් කරන මෙම ගොවි මහතා දිගින් දිගටම නියැළිය හැකි වගාවක් නිසා මෙයට යොමු වූ බව ද සඳහන් කරන ලදී.

පැළ සඳහා යන වියදමින් 50%ක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව දරන අතර ඒ අනුව රු.7500 ක මුදලක් ඔහුට ලැබී ඇත. පැළ 400ක් මිල දී ගෙන අක්කර එකකින් වගාව ආරම්භ කර ඇත. ඇඹන්, කෝලිකුට්ටු සහ ඇඹුල් වර්ග වගා කර ඇති අතර ඒ සඳහා උසස් ඉල්ලුමක් පවතින බව සඳහන් විය. කෙසෙල් වගාව විධිමත්ව ආරම්භ කිරීමට පෙර බුලත් වගා භූමියේ අතරින් පතර කෙසෙල් වගා කර ඇත. බුලත් වගාවට අමුද්‍රව්‍ය ලෙස අවශ්‍ය වන කෙසෙල් රඹ සපයා ගැනීමට එසේ වගා කිරීමේ අරමුණ වී ඇති අතර බුලත් තට්ටු ගැසීමට අවශ්‍ය කෙසෙල් රඹ පහසුවෙන් සපයා ගැනීමට කෙසෙල් වගාව ආධාරකයක් ද වී ඇත. පැළ ඉන්දවීමෙන් පසු අස්වැන්න නෙළන තෙක් මිශ්‍ර පොහොර (පොටෑසියම්, නයිට්‍රජන් සහ පොස්පරස් - NPK) තෙවරක් යොදා ඇති අතර පැළ අවධියේ දී ජලය සපයා ඇත. වගාව මැද අවධියේ දී පැනමා නම් රෝගයක් වැළඳුනු බවත් රෝගය වැළඳුනු ගස් උගුල්ලා දැමූ බවත් සඳහන් විය. ඉන් ගස් සුළු ප්‍රමාණයක් විනාශ වූ බව ඔහු සඳහන් කළේය. මේ සඳහා කුලී ශ්‍රමය සපයාගෙන නොමැති අතර ගොවි මහතා ස්වකීය ශ්‍රමය පමණක් වැය කර ඇත. කෙසෙල් වගාවේ පැළ වර්ග කිහිපයක් පවතින බව ද මුල් ම අස්වැන්න ලෙස ඇඹන් වර්ගයෙන් කෙසෙල් කැන් 50ක් ලබාගත් බව සඳහන් විය. එක් කැනක බර සාමාන්‍යයෙන් 20kg- 25kg ත් අතර බවත්· කෙසෙල් 1 kg ක් රු.50, 55,60 අතර මිල ගණන්වලට අලෙවි කළ බවත් පද්මකුමාර මහතා සඳහන් කරන ලදී. පළමු අස්වැන්නෙන් පසු සාමාන්‍යයෙන් දින 15කට වරක් කෙසෙල් කැන් 2- 3ක් වශයෙන් ලබාගන්නා බව සඳහන් විය.

**පළමු අස්වැන්නෙන් ලද ආදායම**

| | |
|---|---|
| කෙසෙල් කැන් ගණන | = 50 |
| එක් කැනක ඇති ප්‍රමාණය | = 20 kg |
| කෙසෙල්1 kg ක මිල රු. | = 50 |
| අලෙවියෙන් ලද ආදායම | = (50 x 20) xරු.50 |
| | = රු.50,000 |

අලෙවිය සම්බන්ධයෙන් කිසිදු ගැටලුවක් නොමැති බැව් සඳහන් කළ අතර ප්‍රදේශයේ පලතුරු රැස් කරන පුද්ගලයන් නිවසටම පැමිණ අස්වැන්න රැගෙන යන බව සඳහන් විය.

## පස්වැනි පරිච්ඡේදය

## සුළු අපනයන බෝග වගාව

*සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා හදබිම අධිකාරිය, පසු අස්වනු තාක්ෂණ ආයතනය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, උද්‍යාන බෝග සංවර්ධන හා පර්යේෂණ ආයතනය යන ආයතනයන් විසින් "අපි වවමු රට නගමු වැඩසටහන" යටතේ හඳුන්වාදුන් වැඩසටහන් හා ඒවා ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපායයන් හා ප්‍රගතිය මෙම පරිච්ඡේදය තුළ දී විස්තර කෙරෙන අතර මෙම වැඩසටහන් සමඟ ක්ෂේත්‍රයේ දී ගොවීන් සම්බන්ධ වූ ආකාරය පිළිබඳ විග්‍රහයක් සිද්ධි අධ්‍යයන හා සම්මුඛ සාකච්ඡා කිහිපයක් ඇසුරෙන් ඉදිරිපත් කිරීම ද මෙම පරිච්ඡේදයේ දී සිදු කෙරේ.*

### 5.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝග ක්ෂේත්‍රය වඩාත් දියුණු කරමින් අපනයන වෙළඳපොළ ජයගැනීම සඳහා එහි ශක්තීන් වැඩි දියුණු කිරීම, සඳහා සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ අපේක්ෂාව වන අතර "අපි වවමු - රට නගමු" වැඩසටහන යටතේ කුරුඳු සහ ගම්මිරිස් යන පාරම්පරික අපනයන බෝග වගාව පුළුල් කිරීමත් නිෂ්පාදන ඵලදායිතාවය වැඩි දියුණු කිරීම අරමුණු කරගත් වැඩසටහන් ගණනාවක් හඳුන්වා දී ඇත.

### 5.1.1 ගම්මිරිස් බෝග සංවර්ධන වැඩසටහන

"අපි වවමු - රට නගමු" වැඩසටහන යටතේ ගම්මිරිස් බෝගය ප්‍රවර්ධනය කිරීම හරහා විදේශ විනිමය ඉහළ නංවාගැනීම අපේක්ෂාව විය. ඒ යටතේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඒ සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස ක්‍රියාත්මක වී ඇත. ඒ අනුව 'අපි වවමු - රට නගමු' වැඩසටහන යටතේ 2010 වනවිට ගම්මිරිස් අපනයන පරිමාව 15%න් වැඩි කිරීමට අපේක්ෂා කරන ලදී.

ඒ අනුව 2007 වර්ෂය වන විට එනම් "අපි වවමු - රට නගමු" වැඩසටහන ආරම්භ කිරීමට පෙර ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් 30,520ක් වූ අතර 2010 වර්ෂය වන විට එය හෙක්ටයාර් 37,344ක් දක්වා ඉහළ ගොස් තිබේ.

වගු අංක 5.1.1: ගම්මිරිස් නිෂ්පාදනය හා අපනයන පරිමාව

| වර්ෂය | වගා බිම් ප්‍රමාණය හෙක්. | නිෂ්පාදනය පරිමාව මෙ.ටො. | අපනයන පරිමාව මෙ.ටො. | අපනයන ආදායම රු.(මිලියන) |
|---|---|---|---|---|
| 2003 | 30,030 | 17,860 | 7,740 | 1,233 |
| 2004 | 31,330 | 18,561 | 4,851 | 934 |
| 2005 | 31,150 | 18,290 | 8,053 | 1,227 |
| 2006 | 30,490 | 18,600 | 8,191 | 1,774 |
| 2007 | 30,520 | 19,390 | 9,015 | 3,508 |
| 2008 | 34,070 | 22,870 | 6,236 | 2,841 |
| 2009 | 36,180 | 25,300 | 6,585 | 2,365 |
| 2010 | 37,344 | 26,622 | 12,219 | 4,824 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2010

ගම්මිරිස් බෝගය මගින් 2007 වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂය වනවිට ආදායම 72%න් වැඩි වී තිබේ. එය 2007 "අපි වවමු - රට නගමු" වැඩසටහන මගින් අපේක්ෂා කළ වර්ධනයට වඩා ඉහළ වර්ධනයකි. 2007 වර්ෂයේ දී ඉහත වැඩසටහනෙහි අපේක්ෂාව වූයේ අපනයන ආදායම ඉදිරි වසර 3 තුළ දී 15%න් ඉහළ නංවා ගැනීමයි. එමෙන්ම මෙම කාලය තුළ ගම්මිරිස් නිෂ්පාදනයේ ද ඉහළ යාමක් පෙන්නුම් කෙරේ.

වගු අංක 5.1.2 :ගම්මිරිස් වගාවේ ව්‍යාප්තිය හා නිෂ්පාදන පරිමාව

| වර්ෂය | වගා බිම් ප්‍රමාණය (හෙක්) | ගම්මිරිස් නිෂ්පාදනය (මෙ. ටො.) |
|---|---|---|
| 2003 | 30030 | 17860 |
| 2004 | 31330 | 18561 |
| 2005 | 31150 | 18290 |
| 2006 | 30490 | 18600 |
| 2007 | 30520 | 19390 |
| 2008 | 34070 | 22870 |
| 2009 | 36180 | 25300 |
| 2010 | 37344 | 26622 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2010

### 5.1.2 කුරුඳු වගාව

ලෝක වෙළඳපොළ තුළ සත්‍ය කුරුඳු සැපයුමෙන් 80%- 90%ත් අතර ප්‍රමාණයක් මගින් සපයනු ලබන්නේ ශ්‍රී ලංකාවයි (කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය). "අපි වවමු - රට නගමු" වැඩසටහන යටතේ 2007 සිට ඉදිරි වසර තුන තුළ දී අපනයන පරිමාව මෙ.ටො. 300න් ඉහළ නැංවීමටත් ඒ තුළින් ලෝක වෙළඳපොළට ශ්‍රී ලංකා කුරුඳු දායකත්වය 5%න් පමණ ඉහළ නැංවීමටත් බලාපොරොත්තු විය.

**වගු අංක 5.1.3: කුරුඳු නිෂ්පාදනය හා අපනයනය**

| වර්ෂය | කුරුඳු වගා බිම් ප්‍රමාණය (හෙක්) | නිෂ්පාදන පරිමාව(මෙ.ටො.) | අපනයන පරිමාව (මෙ.ටො.) | අපනයන ආදායම රු. (මිලියන) |
|---|---|---|---|---|
| 2003 | 26110 | 13020 | 11025 | 4335 |
| 2004 | 25090 | 12805 | 11395 | 4727 |
| 2005 | 26100 | 13380 | 12365 | 5854 |
| 2006 | 25620 | 12990 | 12334 | 6878 |
| 2007 | 25760 | 13360 | 13054 | 8381 |
| 2008 | 26770 | 13430 | 12278 | 8947 |
| 2009 | 28090 | 14600 | 12110 | 8517 |
| 2010 | 28864 | 15792 | 8237 | 6280 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2010

ශ්‍රී ලංකාව 2013 වර්ෂයේ දී සුළු අපනයන බෝග නිෂ්පාදනයේ දියුණුවක් ලබා තිබේ. කුරුඳු, ගම්මිරිස්, කරාබු, කොකෝවා වාර්තාගත නිෂ්පාදනයක් 2013 සිදු වී ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන බෝග වර්ග හය අතරින් කුළුබඩු ප්‍රධානතම අපනයන භාණ්ඩය වී ඇත. ඇමරිකන් ඩොලර් මිලියන 315 වූ අපනයන වටිනාකමින් 45% ක් ම කුළුබඩු විය.

## 5.2 පාංශු සංරක්ෂණය සහ ඉඩම්වල ඵලදායීතාවය නැංවීම

### 5.2.1 හැඳින්වීම

පාංශු ඛාදනය හා හායනයට ලක් වී ඇති ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරය මූලික කරගත් ප්‍රදේශයන් හි ඉඩම් සංරක්ෂණය සංවර්ධනය හා ඵලදායීතාවය ඉහළ නැංවීම ප්‍රධාන අරමුණ කරගනිමින් ශ්‍රී ලංකා හදබිම අධිකාරිය වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

### 5.2.2 ශ්‍රී ලංකා හදබිම අධිකාරිය විසින් සිදු කරන ලද සංවර්ධන වැඩසටහන්

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සංවර්ධන අරමුණු ඉටුකරගැනීම, ආකාර තුනකින් පවත්වාගෙන යනු ලබයි. ඒවා පහත සඳහන් ආකාරයට දැක්විය හැකිය.

1. භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන
2. අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක විශේෂ සංවර්ධන වැඩසටහන
3. අධිකාරියේ ස්වයං ප්‍රතිපාදන මත ක්‍රියාත්මක අලෙවි සංවර්ධන වැඩසටහන

### 5.2.3 "අපි වවමු - රට නගමු" වැඩසටහන සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන

අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන විශේෂ සංවර්ධන වැඩසටහන "අපි වවමු- රට නගමු" වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ වැඩසටහන වේ. මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද සියලු ව්‍යාපෘති හදබිම අධිකාරියේ අරමුණු, වගකීම්, හා බලතල සීමාවන්ට යටත්ව අමාත්‍යාංශයේ අරමුණු හා කාලීන ජාතික අවශ්‍යතාවයනට මූලිකත්වය ලබාදීම සඳහා ගන්නා ලද උත්සාහයක් වශයෙන් 'අපි වවමු රට නගමු' වැඩසටහන යටතේ ක්‍රියාත්මක වී ඇත. පාංශු පුනරුත්ථාපනය සඳහා වන විධිවිධාන වර්ධනය කර ගැනීමටත් දේශීය ආහාර බෝග සුරක්ෂිතභාවය සඳහා උපරිම මැදිහත්වීම ලබාදීමටත් හැකිවන ආකාරයට මෙම ව්‍යාපෘති සැලසුම් කිරීමට උත්සාහගෙන ඇති අතර විශේෂයෙන් පස හා ජල සංරක්ෂණය, වැසි ජල කළමනාකරණය වැනි ස්වාභාවික සම්පත් සංරක්ෂණය හා කළමනාකරණය සඳහා මෙම විශේෂ ව්‍යාපෘති තුළ ප්‍රධාන තැනක් ලබා දී ඇත (ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය). අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද (2007 සිට 2011) විශේෂ ව්‍යාපෘති ක්‍රියාකාරකම් වගු අංක 5.2.1 යටතේ දක්වා ඇති අතර එම ක්‍රියාකාරකම්වල මූල්‍ය ප්‍රගතිය(2007 සිට 2011 දක්වා) වගු අංක 5.2.2 යටතේ දක්වා ඇත.

වගු අංක 5.2.1: 2007- 2011 දක්වා කාලය තුළ හදබිම අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ විශේෂ ව්‍යාපෘති

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 2007 | 2008 | 2009 | 2010 | 2011 | එකතුව |
| සහභාගීත්ව ගැමි පිවිසුම | සංඛ්‍යාව | 07 | - | 14 | 48 | 24 | 93 |
| සමාජ සජීවීකාරකයින් | සංඛ්‍යාව | | 75 | 30 | | | 105 |
| පුහුණු හා දැනුවත් කිරීම | සංඛ්‍යාව | 07 | 10 | 04 | 43 | 149 | 213 |
| | සහභාගීත්වය | - | 985 | - | 2571 | 552 | 4118 |
| පාංශු සංරක්ෂණ ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් | හෙක්ටයාර් | 62 | 400 | - | 1131 | 1557 | 3150 |
| | ගොවිපවුල් | 975 | - | - | - | 4085 | 5080 |
| කෘෂි උපකරණ ලබාදීම | සංඛ්‍යාව | 975 | 1145 | 59 | 10632 | 6506 | 19317 |
| බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබාදීම | අක්කර | 262 | 1654 | - | - | - | 1916 |
| | බීජ කිලෝ ග්‍රෑම් | 859 | - | - | 62 | 1297 | 2162 |
| | වැඩසටහන් සංඛ්‍යාව | - | - | - | 500 | 600 | 1100 |
| කාබනික පොහොර නිෂ්පාදනය | මෙ.ටො. | - | 7000 | | 125 | | 7125 |
| | ගොවි පවුල් | | 5000 | - | - | - | 5000 |

මූලාශ්‍රය: සංවර්ධන ව්‍යාපෘති ප්‍රගති වාර්තාව-2011

වගු අංක 5.2.2 : 2007-2011 විශේෂ ව්‍යාපෘති සම්බන්ධ මූල්‍ය ප්‍රගතිය (රු.මි)

| ක්‍රියාකාරකම් | උප ක්‍රියාකාරකම් | මූල්‍ය ප්‍රගතිය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 2007 | 2008 | 2009 | 2010 | 2011 | එකතුව |
| ව්‍යාපෘති සංඛ්‍යාව | - | 2 | 3 | 4 | 12 | 18 | 37 |
| වැසි ජල ටැංකි සංඛ්‍යාව | - | - | - | - | - | 54.1 | 54.1 |
| වැසි ජල කළමනාකරණය | ටැංකි ඉදිකිරීම හා නඩත්තුව | 1.0 | 1.7 | 1.5 | 0.2 | - | 4.5 |
| විශේෂ පාංශු සංරක්ෂණ හා ආහාර සුරක්ෂිතතාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහන | පාංශු සංරක්ෂණ ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් | - | 2.2 | 3.2 | 4.8 | 11.9 | 22.0 |
| | කෘෂි උපකරණ ලබාදීම | - | 2.9 | 0.6 | 1.7 | 7.9 | 13.1 |
| | බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබාදීම | - | 2.3 | 1.9 | 5.4 | 8.4 | 18.1 |
| | වෙනත් උපකරණ සැපයීම | - | - | - | 0.5 | 4.9 | 5.4 |
| | තාක්ෂණික සහකාර සේවය ලබාගැනීම | - | - | 0.5 | 1.0 | 4.3 | 5.8 |
| | යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | - | - | - | 3.6 | - | 3.6 |
| | වෙනත් | - | 0.3 | - | - | 1.2 | 1.5 |
| | පරිපාලන වියදම් | - | - | 0.4 | 2.0 | 1.0 | 3.3 |
| | එකතුව | 1.0 | 9.8 | 9.8 | 21.9 | 41.6 | 84.1 |

මූලාශ්‍රය: සංවර්ධන වැඩසහන්වල ප්‍රගති වාර්තාව, 2011

සංවර්ධන වැඩසටහනේ තෙවන අදියර වශයෙන් ප්‍රජාවට නැවුම් ගුණාත්මක, පලතුරු මෙන් ම පැළ වර්ග වැනි කෘෂි නිෂ්පාදන ජනතාවට අභිමත පරිදි මිලට ගැනීමට අවස්ථාව සලසාදීම සඳහා අලෙවිකරණ වැඩසටහනක් ආරම්භ කර ඇත.

**වගු අංක 5.2.3: අලෙවිකරණ වැඩසටහන 2007-2011 දක්වා මූල්‍ය ප්‍රගතිය**

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | 2007-2011 දක්වා වියදම හා ආදායම (රු.මි.) |
|---|---|---|
| අලෙවිකරණය | එළවළු හා පලතුරු මිලදී ගැනීම | 163.7 |
| | පැළ මිලදී ගැනීම | 34.5 |
| | සම්පූර්ණ වියදම | 257.3 |
| | එළවළු හා පලතුරු ආදායම | 200.5 |
| | පැළ ආදායම | 42.2 |
| | සම්පූර්ණ ආදායම | 313.4 |
| | ලාභ හා අලාභ | 56.0 |

මූලාශ්‍රය: ප්‍රගති වාර්තා, ශ්‍රී ලංකා හදබිම අධිකාරිය, 2011

**වගු අංක 5.2.4: කෘෂි අලෙවි වැඩසටහන 2007-2011 මූල්‍ය ප්‍රගතිය**

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වර්ෂවල මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | | | | |
|---|---|---|---|---|---|---|
| | | 2008, | 2009 | 2010 | 2011 | එකතුව |
| අලෙවිකරණය | එළවළු හා පලතුරු මිලදීගැනීම | 44.5 | - | 57.9 | 61.3 | 163.7 |
| | පැළ මිලදීගැනීම | 9.3 | - | 9.3 | 15.9 | 34.5 |
| | සම්පූර්ණ වියදම | 53.8 | 59.2 | 67.1 | 77.2 | 257.3 |
| | එළවළු හා පලතුරු ආදායම | 52.4 | - | 71.0 | 77.1 | 200.5 |
| | පැළ ආදායම | 11.0 | - | 12.2 | 19.0 | 42.2 |
| | සම්පූර්ණ ආදායම | 63.4 | 70.6 | 83.2 | 96.1 | 313.4 |
| | ලාභ හා අලාභ | 9.6 | 11.4 | 16.1 | 18.9 | 56.0 |

මූලාශ්‍රය: සංවර්ධන වැඩසටහන් හි ප්‍රගති වාර්තා

ඉහත වගුව අනුව පැහැදිලි වන්නේ ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ අලෙවිකරණ වැඩසටහනේ සෑම වසරක ම වියදම ඉක්ම වූ ආදායමක් වාර්තා වූ බවයි. 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ වර්ෂ 4ක අලෙවිකරණ ක්‍රියාකාරකම්වලින් ශ්‍රී ලංකා හදබිම අධිකාරිය රුපියල්

මිලියන 56.0ක ආදායමක් උපයා ඇත. ශ්‍රී ලාංකික ජනතාවට ගුණාත්මක හා නැවුම් එළවළු හා පලතුරු ඔවුන්ගේ අභිමතය පරිදි මිලදී ගැනීමට ද තත්ත්වයෙන් උසස් එළවළු හා පලතුරු පැළ මිලදී ගැනීමට ද මෙම අලෙවිකරණ සේවාව තුළින් අවස්ථාව සලසා දී ඇත.

යුධ හමුදා සාමාජිකයින් සම්බන්ධ කරගනිමින් "රණ බිමෙන් ගොවිබිමට" හා "මුඩු පොළවට හරිතපැහැය" යන තේමාව යටතේ ක්‍රියාත්මක වූ සහභාගීත්ව ඉඩම් හා බෝග ඵලදායිතා වැඩසටහන 2010 වර්ෂයේ අගභාගයේ සිට ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන සඳහා 2011 වසර සඳහා මිලියන 11ක් 2012 වසර තුළ මිලියන 15ක් වශයෙන් වැඩි මුදල් ප්‍රමාණයක් ප්‍රතිපාදන ලබා දී ඇත. මෙම වැඩසටහන සඳහා 2011 වසරේ හමුදා කඳවුරු 17ක් සහ 2012 වසරේ කඳවුරු 26ක් ඇතුළත් වීම ද වැඩසටහනේ ප්‍රගතිය පෙන්වීමක් වන අතර වැඩසටහන තුළින් සංවර්ධනය කිරීමට අපේක්ෂිත කඳවුරු තුළ භූමි ප්‍රමාණය අක්කර 2500කි. මෙම වපසරිය තුළ කන්න බෝග වගාව 2011 දී අක්කර 200ක් ලෙසත් 2012 දී අක්කර 75ක් ලෙසත් දැක්වේ. දේශීය ආහාර සුරක්ෂිතතාවය සඳහා අතිරේක ආහාර බෝග වගා නිෂ්පාදන සුලභ කිරීම, ගුණාත්මක බීජ නිෂ්පාදනය, බහුවාර්ෂික බෝග වගාව තුළින් පලතුරු ගම්මාන හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඉඩකඩ සැලසීම අපේක්ෂිත සංවර්ධන ඉලක්කයන් වේ. මේ සඳහා 2011 වසරේ බහුවාර්ෂික බෝග අක්කර 25ක් වගා කර ඇති අතර 2012 දී මෙම ප්‍රමාණය අක්කර 250දක්වා වැඩිකිරීමට අපේක්ෂිත විය.

2012 වසරේ කඳවුරු ආශ්‍රිතව ආරම්භ කළ මිරිස් බෝගය මූලික කරගත් බඩඉරිඟු රටකජු හා පැළ ඇතුළත් ගුණාත්මක බීජ නිෂ්පාදිත වැඩසටහන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක විය. මෙයින් මිරිස් බීජ කිලෝ ග්‍රෑම් 2000ක් නිපදවීමට අපේක්ෂිතය. මොණරාගල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද ප්‍රජා මූලික බීජ නිෂ්පාදන වැඩසටහන තුළ අතිරේක ආහාර බෝග වන මුං, කව්පි, රටකජු, තල යන බෝගයන්වලින් බීජ නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු විය.

මුං, කව්පි, කුරක්කන් යන ආහාර වර්ග දේශීය අවශ්‍යතාවයට ප්‍රමාණවත් තරම් නිෂ්පාදනය වීමක් සිදු නොවේ. මේවායේ දේශීය බීජ ගොවීන් සතු නොවීමත් ඉහළ මිල ගණන් ගෙවා ආනයනික බීජ මිල දී ගැනීමත් දිගු කලක සිට රසායනික පොහොර භාවිතය නිසා වගාබිම්හි පස නිසරු වීමත් එයට හේතු විය. මේ සඳහා විසඳුමක් ලෙස ශ්‍රී ලංකා හදබිම අධිකාරිය විසින් අපි වවමු රට නගමු වැඩසටහනට දායක වෙමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අතිරේක ආහාර දේශීය බීජ ගොවීන්ට නොමිලේ බෙදාදීමට කටයුතු කරන ලදී. එම බීජ කොම්පෝස්ට් පොහොර භාවිතයෙන් වගාකිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ද

ලබාදෙමින් 2007 වසරේ සිට මාස් කන්න 05ක් වගාකරවීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. මෙම වැඩසටහන මඟින් ගොවීන්ට පුළුල් ප්‍රතිලාභ අත් විය. සාකච්ඡා අංක 5.2.1 යටතේ ගොවීන්ට මින් ලැබුණු ප්‍රතිලාභ පිළිබඳ සාකච්ඡා කර ඇත.

**සාකච්ඡාව අංක 5.2.1 – අතිරේක ආහාර බෝග වගාකිරීමේ වැඩසටහන - ශ්‍රී ලංකා හඳබිම සංවර්ධන අධිකාරිය - ඌව පළාත**

**ඌව පළාත් සම්බන්ධීකරණ නිලධාරී සමඟ කරන ලද සාකච්ඡාව**

ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය වෙත "අපි වවමු- රට නඟමු" වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන ලැබුන ද එය සුළු මුදලක් වූ අතර එම මුදල සකසුරුවම් අන්දමින් වියදම් කරමින් "අපි වවමු-රට නගමු" වැඩසටහන යටතේ අතිරේක ආහාර බෝග වගාකිරීමේ වැඩසටහන ඌව පළාතේ බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්ක දෙකේ ක්‍රියාවට නංවන ලදී. 2007 වර්ෂයේ දී පළමුවෙන්ම හඳබිම අධිකාරිය විසින් ඌව පළාතේ මොණරාගල සහ බදුල්ල දිස්ත්‍රික්ක දෙකේ මාස් කන්න 5ක් තුළ අතිරේක බෝග වගා කිරීමේ වැඩසටහන ක්‍රියාවට නඟා ඇත. මෙම වැඩසටහනේ මුඛ්‍ය පරමාර්ථය වූයේ අතිරේක ආහාර බෝග දේශීය බීජ ගොවීන් අතර සුලභ කිරීමත් දේශීය බීජ ආශ්‍රිත වගාව ප්‍රචලිත කිරීමත් ය. මේ වැඩසටහන සඳහා එක් එක් වසරවලදී තෝරාගන්නා ලද ගොවි කණ්ඩායම යොදවා අතිරේක ආහාර බෝග වර්ග වන රටකජු, මුං ඇට, කව්පි සහ බඩඉරිඟු (රුවන් වර්ගය) මිරිස් (MI 2) වර්ගය සහ කුරක්කන් සහ තල වගාව කරන ලදී. ඉහත බෝග වර්ගවල දේශීය බීජ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන ගොවීන් අතර නොමිලේ බෙදාදීමෙන් මෙම වගාව සිදු කරන ලදී. මෙම ගොවීන් මෙතෙක් භාවිතා කර තිබුණේ ආනයනික වැඩි දියුණු කළ ප්‍රභේදවලට අයත් බීජයි. වැඩි දියුණු කරන ලද බීජ රසායනික පොහොර භාවිතා කරමින් දිගු කාලයක් තිස්සේ තම ගොවි බිම්වල වගා කිරීම නිසා ඒවායේ පස නිසරුවීමෙන් ඵලදායීතාවය අඩුවීමේ තර්ජනයකට මුහුණු පා සිටියහ. "අපි වවමු - රට නගමු" වැඩසටහන යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සපයන ලද දේශීය බීජ කාබනික පොහොර භාවිතයෙන් වගා කිරීම සඳහා හඳබිම අධිකාරියේ ක්ෂේත්‍ර නිලධාරීන් විසින් අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදෙන ලදී. ගොවීන්ට නව තාක්ෂණය ලබාදෙන ලද්දේ හඳබිම අධිකාරියේ ශ්‍රව්‍ය දෘෂ්‍ය ඒකකය සහභාගීකරවා ගනිමිනි. දරිද්‍රතාවයෙන් පෙළෙන ගොවීන් වුවද අතිරේක බෝග වගාවට සුදුසු ගොවීන් මෙම වැඩසටහන සඳහා තෝරාගැනීමට හැකි විය. ඔවුන් වෙත බවලට අමතරව උදලු තලය බැඟින් ද ලබා දීමට ක්‍රියාකරන ලදී. දේශීය බීජ වගාව සහ කාබනික පොහොර භාවිතය නිසා සශ්‍රීකත්වය අඩුවෙමින් පැවති පස යථා ස්වභාවට පත්වීම ද ක්‍රමයෙන් සිදු විය. වසරින් වසර නව ගොවි කණ්ඩායම් තෝරාගනිමින් ඔවුන් වෙත දේශීය බීජ ලබා දී වගාවට යොමු කිරීමෙන් ප්‍රතිඵල දෙකක් ඉටුකරගැනීමට හැකි වී ඇත. අතිරේක ආහාර බෝග දේශීය බීජ ගොවීන් විසින් නිෂ්පාදනය කරගැනීමත් ඒවා ඉදිරි වගා කන්නවල වගාවට භාවිතා කරගැනීමට අවස්ථාව ලැබීමත් කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය මඟින් මෙම බෝග වගාකිරීමට ගොවීන් පෙළඹීමත් එම ප්‍රතිඵල දෙකයි. මෙම වැඩසටහන යටතේ පළමු වසරේ දී රුපියල් ලක්ෂ 60ක් වැය කළ අතර රුපියල් ලක්ෂ 253ක වටිනාකමකින් යුත් අතිරේක ආහාර බෝග නිෂ්පාදනයක් සිදු කිරීමට හැකියාව ලැබුණි. වගාවෙන් සාර්ථක අස්වනු නෙළාගත් ගොවීන් සිටි අතර කිලෝ එකක මුං වගාවකින් කිලෝ 70ක් වැනි ඉහළ අස්වනු මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවීන් විසින් ලබා ගන්නා ලදී.

**සාකච්ඡාව අංක 5.2.1 – අතිරේක ආහාර බෝග වගාකිරීමේ වැඩසටහන - ශ්‍රී ලංකා හදබිම සංවර්ධන අධිකාරිය - ඌව පළාත**

**ඌව පළාත් සම්බන්ධීකරණ නිලධාරී සමඟ කරන ලද සාකච්ඡාව - ඉතිරි කොටස**

මොවුන්ගේ අස්වැන්න අලෙවි කිරීම සම්බන්ධයෙන් ද හදබිම අධිකාරිය මැදිහත් වූ අතර ගැමිදිරිය වැඩසටහන සමඟ ඒකාබද්ධ වී මිල දී ගැනීම සිදු කරන ලදී. ඊට අමතරව හදබිම අධිකාරියේ ගන්නෝරුව ප්‍රධාන කාර්යාලයේ අලෙවි මධ්‍යස්ථානය විසින් ද අලෙවි කටයුතු සිදු කරන ලදී. එසේ වුවත් ගොවීන්ගේ නිෂ්පාදන සියල්ල අලෙවි කරදීමට මෙම වැඩසටහන් මඟින් නොහැකි වූ අතර ගොවීන්ට තම නිෂ්පාදන සාධාරණ මිලකට අලෙවි කරගැනීමට හැකියාවක් නොවීම ගොවීන්ට ගැටලුවලට මුහුණු පෑමට සිදු විය. මෙම වැඩසටහන අඛණ්ඩව වසර 5ක් ක්‍රියාත්මක වූ අතර එම නිසා දේශීය බීජ ගොවීන්ගේ ඉදිරි වගා කටයුතු සඳහා ගැනීමේ හැකියාව ද ඇතිවීම ගොවීන් ලද ප්‍රතිලාභයක් වශයෙන් සඳහන් කිරීමට පුළුවන. මෙම වැඩසටහන සිදු කරගෙන යාමේ දී සිදු වූ ගැටලු වශයෙන් සඳහන් කළ හැක්කේ වැඩසටහන ක්‍රියාවට නැංවීම සඳහා පිරිස් බලය හිඟකමයි. වැඩසටහන ක්‍රියාත්මක කරන ලද දිස්ත්‍රික්ක දෙකේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරියාගේ සේවය හදබිම අධිකාරියේ කෘෂිකර්ම නිලධාරීන්ට නොලැබීම මුහුණු පෑමට සිදු වූ ගැටලුවකි. එසේම කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ද හිඟයක් 2007, 2008 වසරවල පැවති අතර මෙම වැඩසටහන සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම සඳහා කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ප්‍රමාණවත් සේවයක් ලබාගැනීම අපහසු මට්ටමක පැවතියේ කෘෂි උපදේශකවරුන්ගේ හිඟයයි. එම නිසා මෙම වැඩසටහන හදබිම අධිකාරියේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ට තනිව කිරීමට සිදු විය. මේ සඳහා තාක්ෂණ දැනුවත් කිරීම් සිදු කරන ලද්දේ අධිකාරියේ ශ්‍රව්‍ය දෘෂ්‍ය අංශය විසිනි. මෙම වැඩසටහන පැවැත් වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සියල්ලෙහිම ප්‍රාදේශීය ලේකම්වරුන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරවීම සඳහා මනා සහයෝගයක් ලබා දී ඇති බව හෙළි විය. රටේ කෘෂිකර්මාන්තය නැංවීම සඳහා මෙවැනි විශේෂ තේමාවකින් යුක්ත වූ වැඩසටහනක් ක්‍රියාත්මක කරවීම රටට හොඳ ප්‍රතිඵල ලැබීමට හේතු වේ. මෙවැනි නව සංකල්පයක් නමින් වැඩසටහන් හඳුන්වා දුන් විට සියලුම ආයතන ඒ සඳහා පූර්ණ කැපවීමෙන් යුක්තව කටයුතු කරන බව පෙනේ. එක් එක් ආයතනවලට ඉලක්ක ලබා දී රටේ සමස්ත කෘෂිකර්මය දියුණු කිරීම සඳහා මෙවැනි ඒකාබද්ධ වැඩපිළිවෙළක් සැකසිය හැකි බව අපි වවමු- රට නගමු වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් ලත් අත්දැකීම් තුළින් ප්‍රකාශ කිරීමට හැකි බව හදබිම අධිකාරියේ අදහස් වේ.

මොණරාගල සහ බදුල්ල යන දිස්ත්‍රික්ක දෙකේ 2007- 2011 කාල පරිච්ඡේදය තුළ මුං ඇට, කව්පි සහ කුරක්කන් වගාබිම් ප්‍රමාණය වැඩි වී ඇති අන්දම පහත සඳහන් වගුවෙන් දැක්වේ.

වගු අංක 5.2.5:මොණරාගල සහ බදුල්ල දිස්ත්‍රික්ක දෙකේ 2007- 2011 කාල පරිච්ඡේදය තුළ කුරක්කන්,කව්පි සහ මුං ඇට වගා බිම් ප්‍රමාණය සහ අස්වැන්න

| බෝගය | දිස්ත්‍රික්කය | 2007 | | 2008 | | 2009 | | 2010 | | 2011 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වගා බිම් ප්‍රමාණය හෙක්. | අස්වැන්න මෙ. ටො | වගාබිම් ප්‍රමාණය හෙක්. | අස්වැන්න මෙ. ටො. | වගාබිම් ප්‍රමාණය හෙක්. | අස්වැන්න මෙ. ටො. | වගාබිම් ප්‍රමාණය හෙක්. | අස්වැන්න මෙ. ටො. | වගාබිම් ප්‍රමාණය හෙක්. | අස්වැන්න මෙ. ටො. |
| කුරක් කන් | බදුල්ල | 304 | 392 | 323 | 424 | 297 | 424 | 341 | 580 | 304 | 520 |
| | මොණරාගල | 837 | 1167 | 967 | 1190 | 905 | 1005 | 998 | 1104 | 1029 | 1108 |
| කව්පි | බදුල්ල | 372 | 375 | 326 | 324 | 316 | 336 | 339 | 352 | 337 | 348 |
| | මොණරාගල | 1704 | 2113 | 1966 | 2249 | 1827 | 1949 | 2192 | 2733 | 1924 | 2167 |
| මුං ඇට | බදුල්ල | 293 | 294 | 245 | 253 | 183 | 192 | 214 | 203 | 213 | 203 |
| | මොණරාගල | 1760 | 1473 | 1880 | 1615 | 1724 | 2428 | 1938 | 2147 | 1162 | 1416 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 5.3 පසු අස්වනු තාක්ෂණය ප්‍රචලිත කිරීම

### 5.3.1 හැඳින්වීම

පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් "අපි වවමු- රට නගමු" තේමාව යටතේ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කර ඇත. 2009, 2010 සහ 2011 වර්ෂය සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත ආකාරයට දැක්වීමට පුළුවන.

**වගු අංක 5.3.1 : 2009 සහ 2010 වර්ෂවල දී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්**

| වර්ෂය | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති | ප්‍රතිපාදන වෙන් කිරීම රු.මිලියන | වියදම රු. මිලියන |
|---|---|---|---|
| **2009** | සහල් ගම්මාන ස්ථාපිත කිරීම<br><br>සියඹලා ආශ්‍රිත නිෂ්පාදන ප්‍රචලිත කිරීම | **2.5**<br><br>**1.1** | **1.64** |
| **2010** | ජංගම එළවළු සහ පලතුරු අලෙවිය සඳහා සිල්ලර අලෙවි කුටි නිර්මාණය | **0.055** | **0.036** |

**5.3.2: පසු අස්වනු තාක්ෂණය සම්බන්ධයෙන් 2011 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්**

| වැඩසටහනේ තේමාව | සිදු කරන ලද කාර්යයන් |
|---|---|
| සහල් සැකසුම් ගම්මානවල තෝරාගත් කුඩා හා මධ්‍ය පරිමාණ මෝල්වල පහසුකම් වැඩි දියුණු කිරීම | සහල් මෝල් 160ක් සඳහා පුහුණු වැඩසටහන් උපාංග 50% සහන මිලට සැපයීම |
| සහල් පිටි මෝල් කර්මාන්තය වැඩි දියුණු කිරීම | දිස්ත්‍රික්ක 10ක තෝරාගත් මෝල් 20ක් දැනුවත් කිරීමේ වැඩසටහන් 30ක්, උපාංග 50% සහන මිලට සැපයීම |
| ග්‍රාමීය ප්‍රදේශවල පලතුරු ආශ්‍රිත ව්‍යවසායන් ඇරඹීම | දිස්ත්‍රික් 7ක් නියමු සැකසුම් ඒකක ඇරඹීම, දැනුවත් කිරීම හා පුහුණු වැඩසටහන්, පැවැත්වීම මගින් පුද්ගලයන් 600ක් පුහුණු කිරීම ,අලෙවි ප්‍රවර්ධන ව්‍යාපාර සිදු කිරීම උපාංග 50% සහන මිලට සැපයීම |
| ග්‍රාමීය ප්‍රදේශවල සහල් ආශ්‍රිත කුඩා ව්‍යවසායන් ඇරඹීම | දිස්ත්‍රික් 7ක නියමු සැකසුම් ඒකක 7ක් පිහිටුවීම, පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා පුද්ගලයන් 400ක් පුහුණු කිරීම උපාංග 50% සහන මිලට සැපයීම |
| ග්‍රාමීය ප්‍රදේශවල ධාන්‍ය සහ කුළු බඩු ආශ්‍රිත සැකසුම් ව්‍යවසායන් ඇරඹීම | අනුරාධපුර තරුණ ගොවි කණ්ඩායමක් තෝරා නියමු සැකසුම් ඒකකයක් පිහිටුවීම පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම පුද්ගලයන් 200ක් පුහුණු කිරීම. |
| ගොවීන්ගේ ආදායම් වැඩි කිරීම සඳහා ගෘහස්ථ වී ගබඩා පහසුකම් සංවර්ධනය කිරීම | කෘමි මර්දනය හා වී ගබඩා කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, ග්‍රාමීය වී බිසි 69ක් වැඩි දියුණු කිරීම,ගෝනි බිස්ස කට්ටල 25ක් ප්‍රතිලාභීන්ට බෙදා දීම,ගබඩා දියුණු කිරීම සඳහා රු. 1,500ක උපරිම මුදලක් ලබාදීම. |
| එළවළු හා පලතුරු අලෙවිය සඳහා වැඩි දියුණු කළ ජංගම වෙළඳ කුටි හඳුන්වාදීම | පලතුරු සහ එළවළු වෙළඳුන් කණ්ඩායමක් සඳහා වෙළඳසැල් වැඩි දියුණු කිරීම හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ පුහුණුව ලබාදීම, වැඩි දියුණු කළ ජංගම වෙළඳකුටි 15ක් මහනුවර හා මාතර සිල්ලර වෙළඳුන් අතර 50% සහන මිලට ලබාදීම |
| පසු අස්වනු තාක්ෂණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම | දිස්ත්‍රික් 7ක පුහුණු වන්නන් තෝරා ගැනීම හා වැඩසටහන් සංවිධානය කිරීම, වැඩි දියුණු කරන ලද පසු අස්වනු තාක්ෂණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම හා පුහුණුව ලබාදීම, පුහුණු පාඨමාලා 30ක් මගින් 1500 දෙනෙකු පුහුණු කිරීම |
| පලතුරු හා එළවළුවල පසු අස්වනු හානිය අඩු කිරීම සඳහා ප්‍රවාහන හා ඇසුරුම් ක්‍රම දියුණු කිරීම | ප්ලාස්ටික් කුඩා නිර්මාණය සහ ප්‍රචාරණය, ප්ලාස්ටික් කුඩා ප්‍රවාහනය සඳහා ට්‍රක් රථ නිර්මාණය. දැනුවත් කිරීමේ වැඩසටහන් 30ක් සහ 2500 දෙනෙකු පුහුණු කිරීම, ප්ලාස්ටික් කුඩ 38,616ක් විවිධ පාර්ශවකරුවන් අතර බෙදා දීම. |

වගු අංක 5.3.3: සංවර්ධන ව්‍යාපෘති සඳහා දරන ලද වියදම - 2011

| ව්‍යාපෘතිය | වියදම රු. |
|---|---|
| එළවළු හා පලතුරුවල පසු අස්වනු හානි අවම කිරීම | 1,29,33,121.00 |
| එළවළු හා පලතුරු අලෙවිය සඳහා ජංගම වෙළඳකුටි නිර්මාණය | 806885.00 |
| ආදර්ශ ගම්මාන පිහිටුවීමේ වැඩසටහන | 80,731.00 |
| ග්‍රාමීය මට්ටමේ දී ධාන්‍ය කුළු බඩු නිෂ්පාදන සැකසීම | 454643.00 |
| දිස්ත්‍රික් 7ක් ආවරණය වන පරිදි සුළු පරිමාණ පලතුරු ආශ්‍රිත කර්මාන්ත ශාලා ස්ථාපනය කිරීම | 237,745.00 |
| තෝරාගත් මධ්‍ය හා කුඩා පරිමාණ සහල් පිටි සැකසීමේ මෝල්වල පහසුකම් වැඩි දියුණු කිරීම | 681,580.00 |
| තෝරාගත් කුඩා පරිමාණ සහල් මෝල්වල පහසුකම් වැඩි දියුණු කිරීම | 109,9519.00 |
| පසු අස්වනු තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම සම්බන්ධ ප්‍රචාරක පුහුණු වැඩසටහන් | 450216.00 |
| ගොවීන්ගේ ආදායම වැඩි කිරීම සඳහා ගෘහස්ථ වී ගබඩා පහසුකම් සංවර්ධනය කිරීම | 1559370.00 |
| ග්‍රාමීය ප්‍රදේශවල සහල් ආශ්‍රිත කුඩා ව්‍යවසායන් ඇරඹීම | 599709.00 |
| **මුළු වියදම** | **203,839,51.00** |

### 5.3.2 පසු අස්වනු හානි අවම කිරීමේ ක්‍රමවේද හඳුන්වාදීම

#### 5.3.2.1 ගෘහස්ථ වී ගබඩා ඉදිකිරීම

ඉන් එක් ව්‍යාපෘතියක් වන ගොවීන්ගේ ආදායම වැඩි කිරීම සඳහා ගෘහස්ථ වී ගබඩා පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳව විමසීමක් කරන ලද අතර එහි සොයාගැනීම් පහත පරිදි වේ.

- ගෘහස්ථ වී ගබඩාව ඉදි කරගැනීමේ තාක්ෂණය පිළිබඳ දැනුවත්වීම.
- ගබඩා කිරීමට පෙර වී පිරිසිදු කිරීම හා වියළීමේ තාක්ෂණය පිළිබඳව දැනුවත් වීම.
- විශේෂයෙන් සකසන ලද නිවසේ ම කාමරය තුළ වී ගබඩා කිරීම පිළිබඳ දැනුවත් වීම.
- කෘමීන්ගෙන්, මීයන්ගෙන් හා ලේනුන්ගෙන් වී තොගය ආරක්ෂාවීම.
- වී මිල ඉහළ නගින කාලයට තත්ත්වයෙන් උසස් වී ලෙස ඉහළ මිලකට අලෙවි කළ හැකිවීම.
- මෙය සාර්ථක වැඩසටහනක් ලෙස ගොවිජනතාවගේ ප්‍රසාදය දිනාගෙන ඇත. මෙම වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතු බව ප්‍රතිලාභීහු ප්‍රකාශ කළහ.

#### 5.3.2.2 ප්ලාස්ටික් ඇසුරුම් හඳුන්වාදීම

පසු අස්වනු හානිය අවම කරගැනීමේ අරමුණින් හඳුන්වාදෙන ලද ප්ලාස්ටික් ඇසුරුම් එළවළු නිෂ්පාදනයේ සහ බෙදාහැරීමේ කොටස්කරුවන් වන ගොවීන්, එකතුකරන්නන්, ප්‍රවාහකයන් හා වෙළඳුන් අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් ආර්ථික මධ්‍යස්ථාන හරහා ඒවා අලෙවි කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. ආරම්භයේ දී නියමු ව්‍යාපාරයක් යටතේ පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් 50% සහන මිල යටතේ ප්ලාස්ටික් ඇසුරුම් බෙදා හැර ඇති අතර ඒ යටතේ 2006 සිට 2011 දක්වා ප්ලාස්ටික් කූඩා 150,000ක් අලෙවි කර ඇත. ඉන් පසුව ආර්ථික මධ්‍යස්ථාන හරහා මෙම ප්ලාස්ටික් කූඩා බෙදා හැරීම සඳහා ආර්ථික මධ්‍යස්ථානවලට කූඩා සපයා ඇති අතර ආර්ථික මධ්‍යස්ථානවල ගබඩා කර ඇත. එහෙත් ගොවීන් වෙළඳුන් හා ප්‍රවාහකයන් විසින් මෙම කූඩා මිල දී ගැනීම ඉතාම මන්දගාමී මට්ටමක පවතී. හේතුව වශයෙන් කරුණු ගණනාවක් ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබයි.

- උඩරට ප්‍රදේශවල බෑවුම් ඉඩම්වල වගාකරන එළවළු නිෂ්පාදන ප්ලාස්ටික් පෙට්ටිවල අසුරා කරමතින් රැගෙන ඒමේ දී ගොවීන්ගේ කර තුවාලවීම වැනි ශාරීරික පීඩාවලට මුහුණ පෑම
- වර්තමානයේ එළවළු ප්‍රවාහනය කරනු ලබන ලොරිවල මෙම ප්ලාස්ටික් කූඩා ඇසිරීම නිසා සම්ප්‍රදායික ලෙස ගෝනි ඇසුරුම්වල ප්‍රවාහනය කිරීමෙන් 53%ක් පමණක් ප්‍රවාහනය කිරීමට සිදුවීම.

- ප්‍රවාහනය කිරීමට අධික වියදමක් වැය වීම නිසා ගොවීන්ට එය ආර්ථික පාඩුවක්වීම.
- ප්ලාස්ටික් කූඩාවලින් එළවළු ප්‍රවාහනය කර ආපසු එන ගමනේ දී හිස් ප්ලාස්ටික් කූඩා පමණක් ගෙන ඒමට සිදුවීම නිසා ලොරිකරුවන්ට ආර්ථික වශයෙන් එය පාඩුවක්වීම.
- එළවළු ගොවිපළවල එළවළු අස්වනු නෙළීමේ දී ප්ලාස්ටික් කූඩාවල ඇසුරුම් කිරීම නිසා වාර කිහිපයකට අස්වනු නෙළීම නිසා එළවළු මේරීමට භාජනය වීමෙන් ගොවීන්ට පාඩු සිදුවීම.
- ආර්ථික මධ්‍යස්ථානවලට නිකුත් කරන ලද කූඩා තොගය තත්ත්වයෙන් බාල ඒවා බවට ගොවීන් තුළ ආකල්පයක් ඇතිවීම නිසා මිලදී ගැනීමට පසුබෑමක් දැක්වීම.

මෙවැනි හේතූන් නිසා ප්ලාස්ටික් කූඩා ගොවීන් වෙළඳුන් හා ප්‍රවාහනකරුවන් අතර ව්‍යාප්තවීම ඉතා මන්දගාමී ස්වරූපයක් ගෙන ඇත.

ගස්ලබු සහ තක්කාලි ඇසුරු කිරීම සඳහා පමණක් ප්ලාස්ටික් කූඩා භාවිතා කරනබව පෙනී යන අතර කාර්ගිල්ස් වැනි සුපිරි වෙළඳසැල් සඳහා එළවළු සැපයුම්කරන්නන් විසින් මෙම ප්ලාස්ටික් කූඩා භාවිතා කරන බව විමර්ශනය කළ හැකි විය. එළවළු ප්‍රවාහනය කිරීම සඳහා විශේෂයෙන් නිමවන ලද ලොරි රථ හඳුන්වාදීම, දුම්රිය මඟින් ප්‍රවාහනය කිරීම හඳුන්වාදීම වැනි වැඩපිළිවෙළක් තුළ මෙම කූඩා ජනප්‍රිය කළ හැකිය.

2007-2011 දක්වා කාලය තුළ පසු අස්වනු හානිය අවම කිරීම සඳහා ප්ලාස්ටික් ඇසුරුම් භාවිතය ප්‍රචලිත කිරීම සඳහා රුපියල් මිලියන 150.90 ප්‍රතිපාදන ලැබී ඇති අතර ඒ සඳහා මුළු වියදම රුපියල් මිලියන 97.937ක් වී ඇත. පහත සඳහන් වගු මඟින් ලැබුණු මුදල් ප්‍රතිපාදන සහ එක් එක් වර්ෂවල කරන ලද වියදම පිළිබඳ විස්තර දැක්වේ.

### 5.3.2.3 ප්ලාස්ටික් ඇසුරුම් ලබාදීම 2006-2011 කාලය

'අපි වවමු- රට නගමු' ව්‍යාපෘතිය යටතේ 2009 වර්ෂයේ දී සිදු කරන ලද කාර්යයන් සඳහා මුදල් වෙන්කිරීම් හා වියදම වගු අංක 5.3.5 යටතේ දක්වා ඇත.

වගු අංක 5.3.4: ප්ලාස්ටික් ඇසුරුම්

| වර්ෂය | ජම්බෝ | විශාල | මධ්‍යම | ස්ටැකබල් | සී-60 | වැය කළ මුදල රු. | වෙන් කළ මුදල රු.මි |
|---|---|---|---|---|---|---|---|
| 2006 නොමිලේ | 780 | - | 3000 | - | - | - | 20 |
| 2006 | | 3947 | | | | 1,815,620.00 | 50.9 |
| 2007 | 17295 | 37500 | 6850 | | | 48.883,291.50 | 10.0 |
| 2008 | - | 28974 | 1999 | 5000 | 5000 | 6,407,608.00 | 10.00 |
| 2009 | 2497 | 8498 | 2500 | 2000 | | 10,770,995.20 | 30.00 |
| 2011 | 25,672 | 95,919 | 19,349 | 11000 | 5000 | 89,431,914.70 | 150.9 |
| | | | | | 156,940 | | |

මූලාශ්‍රය: පසු අස්වනු තාක්ෂණ ආයතන වාර්තා,

වගු අංක 5.3.5 ප්ලාස්ටික් ඇසුරුම් ලබාදීමේ දී දරන ලද වියදම්

| වර්ෂය | ප්‍රතිපාදන ලැබීම රු.මිලියන | වියදම රු.මිලියන | | |
|---|---|---|---|---|
| | | ඇසුරුම් මිලට ගැනීම | ප්‍රවාහනය හා හඳුන්වාදීම | මුළු වියදම |
| 2007 | 50.90 | 48.88 | 1419 | 50.299 |
| 2008 | 10.00 | 6.407 | 0.726 | 7.133 |
| 2009 | 30.00 | 21.554 | 4.289 | 25.843 |
| 2010 | 30.00 | - | 1.588 | 1.588 |
| 2011 | 30.00 | 10.77 | 2.304 | 13.074 |
| | 150.00 | 87.611 | 10.326 | 97.637 |

මූලාශ්‍රය: පසු අස්වනු තාක්ෂණ ආයතන වාර්තා,

පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද විවිධ ආදායම් උත්පාදන වැඩසටහන් කිහිපයක් සම්බන්ධ සිද්ධි අධ්‍යයන සහ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා කිහිපයක් පහත දැක්වේ. ඒවායින් හෙළිවන ආකාරයට මෙතෙක් නොදියුණු තත්ත්වයේ පැවති ග්‍රාමීය ව්‍යවසායන් තාක්ෂණික දැනුවත්වීම සහ උපකරණ ලබාදීම මත දියුණු මට්ටමකට පත් වී ඇති බව පෙනේ.

**සිද්ධි අධ්‍යයනය අංක 5.3.2 - චාන්දනී සහල් සැකසුම් මධ්‍යස්ථානය - අම්පාර**

චාන්දනී සහල් සැකසුම් මධ්‍යස්ථානය 2000 වර්ෂයේ දී ආරම්භ වී ඇත. එහි හිමිකරු එච්.ජී. විජේතුංග මහතායි. සුළු පරිමාණ සහල් සැකසුම් මධ්‍යස්ථානයක් ලෙස ආරම්භ කෙරුණු මෙම සහල් මෝලේ මුල් කාලයේ සිදු කෙරුණේ කැකුළු සහල් නිෂ්පාදනය පමණි. 2008 වර්ෂයේ දී සහල් සැකසුම් මධ්‍යස්ථානය නවීකරණය කරමින් සහල් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ස්ටීමරයක් සවි කර නාඩු සහල් නිෂ්පාදනය ද ආරම්භ කර ඇත. ඒ සඳහා අවශ්‍ය සියලු ම තාක්ෂණික දැනුම පසු අස්වනු තාක්ෂණ ආයතනය මඟින් ලබා දී ඇත. ඒ අනුව මුලින් ම බැංකු ණය ලබාගැනීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති වාර්තාව සැකසීමේ සිට ගොඩනැඟිල්ල ඉදිකිරීම යන්ත්‍ර සූත්‍ර සවි කිරීමේ පිළිවෙළ, වී තැම්බීමේ ටැංකිවල ප්‍රමාණය ආදී සියලු ම තාක්ෂණික දැනුම පසු අස්වනු තාක්ෂණ ආයතනය මඟින් ලබා දී ඇත. ව්‍යාපෘති වාර්තාවට අනුව රාජ්‍ය බැංකුවකින් රුපියල් ලක්ෂ 50ක ණය මුදලක් ලබාගෙන ඇති අතර තාක්ෂණික දැනුම ලබා ගැනීම සඳහා සහල් සැකසුම් මධ්‍යස්ථානයේ හිමිකරු වන ජී.එච්. විජේතුංග මහතාට අනුරාධපුරයේ පිහිටි පසු අස්වනු තාක්ෂණ ආයතනයේ දින 05ක පුහුණුවක් ද ලබා දී තිබේ. ඒ තුළින් ලැබූ තාක්ෂණික දැනුම ද උපයෝගී කර ගනිමින් මේ වන විට සහල් සැකසුම් මධ්‍යස්ථානයේ නිෂ්පාදනය කෙරෙන සහල් ප්‍රමාණය ඉහළ ගොස් ඇති අතර සතියකට සහල් කි.ග්‍රෑ. 10,000ත් කි.ග්‍රෑ. 20,000 අතර ප්‍රමාණයක් නිෂ්පාදනය කෙරේ. එම සහල් ගාල්ල, බදුල්ල හා නුවරඑළිය යන ප්‍රදේශවලට අලෙවි කෙරේ. කැකුළු සහල් කිලෝවක් රු. 43 ට අලෙවි කෙරේ. එහෙත් ඔවුන් ගොවීන්ගෙන් වී කිලෝවක් මිලට ගනු ලබන්නේ රු. 25.30ට වන අතර වර්තමානය වන විට සහල් නිෂ්පාදන වියදම ඉහළ ගොස් ඇති බැවින් එතරම් ලාභයක් ඉපයිය නොහැකි බව ඔවුහු සඳහන් කරති. අම්පාරේ පිහිටි චාන්දනී සහල් සැකසුම් මධ්‍යස්ථානය සමස්ත ලංකා මෝල් හිමියන්ගේ සංගමයේ ඒ ශ්‍රේණියේ සහල් මෝලක් වශයෙන් ලියාපදිංචි වී සිටී.

චාන්දනී සහල් සැකසුම් මධ්‍යස්ථානයේ හිමිකරු වන එච්.ජී. විජේතුංග මහතාගේ උපන් ගම් බිම් වන කල්මුනේ ප්‍රදේශයේ සිට යුධමය වාතාවරණය හේතුවෙන් අම්පාර ප්‍රදේශයට පැමිණ සුළු පරිමාණ වශයෙන් ආරම්භ කළ චාන්දනී සහල් සැකසුම් මධ්‍යස්ථානය පසු අස්වනු තාක්ෂණ ආයතනයේ මඟපෙන්වීම යටතේ අද වන විට ඉහළ මට්ටමකට පත්ව ඇති අතර ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය බවට ද පත්ව ඇත. ඔවුන්ගේ ආදායම් තත්ත්වය ද එදාට වඩා අද වන විට හොඳ මට්ටමකට ද පැමිණ තිබේ.

පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද තෝරාගත් කුඩා හා මධ්‍ය පරිමාණ සහල් මෝල්වල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ වැඩි දියුණු කරන ලද සහල් මෝලක් සම්බන්ධයෙන් මෙම සිද්ධි අධ්‍යයනය ඉදිරිපත් කර ඇත. කුඩා පරිමාණ සහල් මෝලක් ලෙස පවත්වාගෙන එන ලද මෙම සහල් මෝලේ හිමිකරුවන්ගේ උත්සාහවන්තභාවය ප්‍රදර්ශනයවීම නිසා පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් මෙම සහල් මෝල තම වැඩසටහන සඳහා තෝරාගන්නා ලද අතර ඉන් පසුව ව්‍යාපාරය පිළිබඳව ව්‍යාපෘති වාර්තාවක් පිළියෙළ කරගැනීමට අවශ්‍ය තාක්ෂණ උපදෙස් සපයා දී ණය මුදලක් ලබාගැනීමට

සුදුසුකම් සපුරා දී ඇත. ණය මුදල ලබාගෙන ගොඩනැඟිලි ද ඇතුළුව සහල් මෝලේ තත්ත්වය වැඩිදියුණු කිරීමෙන් පසුව එහි ක්‍රියාකාරීත්වය ඉහළ මට්ටමකින් පවත්වාගෙනයාම සඳහා හිමිකරුට අවශ්‍ය පුහුණුවද පසු අස්වනු තාක්ෂණ ආයතනයේ දී ලබා දී ඇත. නවීන අංගයන්ගෙන් සමන්විත ගොඩනැඟිලි සංකීර්ණය හා වී මෝල මඟින් තත්ත්වයෙන් උසස් සහල් නිෂ්පාදනය කිරීමට හැකියාව ලැබී ඇති අතර ඉන් පසුව වී මෝලේ ආදායම් තත්ත්වය ඉහළ ගොස් ඇති බව ද කරන ලද සාකච්ඡාවේ දී හෙළි විය. සහල් මෝල්වල තත්ත්වය වැඩි දියුණු කරමින් ග්‍රාමීය කර්මාන්ත වැඩි දියුණු කිරීමේ පසු අස්වනු තාක්ෂණ අංශයේ කාර්යභාරය මේ වී මෝල් හිමිකරුවන් පැසසුමට ලක් කර ඇති බව මෙම සිද්ධි අධ්‍යයනය පෙන්වාදෙයි.

**සිද්ධි අධ්‍යයනය අංක 5.3.3- සෙවණ පැළ තවාන - අම්පාර**

සෙවණ පැළ තවාන මුලින් ම ආරම්භ වන්නේ 1993 වර්ෂයේ දී ය. එහි හිමිකරු වන ආර්.ඒ.ඩී. රත්නජීව මහතා මෙය ආරම්භ කර තිබෙන්නේ අක්කර ½ ක බිම් ප්‍රමාණයෙනි. අද වන විට මෙම පැළ තවාන අක්කර 18ක් පුරා ව්‍යාප්තව ඇත. මුලින්ම ලොරියක් කුළියට ගෙන පැළ නගරයට ගෙන ගොස් අලෙවි කර ඇති මොහු ක්‍රම ක්‍රමයෙන් දියුණුවට පත්ව අද වන විට පලතුරු අපනයන ව්‍යාපාරයක් ද ආරම්භ කර තිබේ. ඒ සඳහා අවශ්‍ය දැනුම පසු අස්වනු තාක්ෂණ ආයතනය මඟින් ලබා දී ඇත. එමෙන්ම ඇතැම් පලතුරු (විශේෂයෙන් ම අඹ) බීජ ලබා ගැනීම සඳහා භාවිතයට පුරුදුව සිටි රත්නජීව මහතා පලතුරු ගෙඩියේ ඉතිරි සියල්ල අපද්‍රව්‍ය ලෙස ඉවත් කරයි. එහි දී පසු අස්වනු ආයතනයේ මඟපෙන්වීම යටතේ ඉවතලන පලතුරු කොටස් මඟින් පලතුරු බීම නිෂ්පාදනය සඳහා පොළඹවා ඇත. ඒ අනුව 2010 වර්ෂයේ දී ආරම්භ කෙරුණු මෙම පලතුරු බීම නිෂ්පාදනය අද වන විට ඔවුන්ට අමතර ආදායමක් වී ඇත. දැනට අඹ, දිවුල්, අන්නාසි, ගස්ලබු හා මිශ්‍ර වශයෙන් පලතුරු බීම වර්ග රැසක් ම නිෂ්පාදනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා ගැනීම සඳහා අනුරාධපුර පසු අස්වනු තාක්ෂණික ආයතනය මඟින් රත්නජීව මහතා දින 05ක පුහුණු වැඩසටහනකට ද සහභාගී කරවා ඇත. ආරම්භක අවධියේ සතියකට පලතුරු බීම බෝතල් 300ක් පමණ නිපදවා ඇති අතර වර්තමානය වන විට සාමාන්‍යයෙන් මසකට බීම බෝතල් 10,000ක් පමණ නිෂ්පාදනය කෙරේ.

මේ සඳහා ඔහු රු. ලක්ෂ 06ක පමණ මුදලක් ආයෝජනය කර ඇති අතර තවදුරටත් මුදල් ආයෝජනය කර මෙම ව්‍යාපාර දියුණු කිරීමට අපේක්ෂා කර ඇතත් ඒ සඳහා තවදුරටත් රාජ්‍ය අංශයේ මැදිහත්වීම අවශ්‍ය බව රත්නජීව මහතාගේ අදහසයි. එනම්, පවතින කෘත්‍රිම බීම සමඟ වෙළෙඳපොළ තුළ විශාල තරඟයක් පවතින අතර ප්‍රමිති සහතිකයවත් (S.L.S.) නොමැතිව ඒවා සමඟ තරඟ කිරීම අපහසු බව ඔහු සඳහන් කළේය. ඒවා ලබා ගැනීම සඳහා මඟපෙන්වීමක් හෝ නවීන තාක්ෂණික දැනුම හා යන්ත්‍ර සූත්‍ර පිළිබඳව දැනුවත් වීමට රාජ්‍ය අංශයේ මඟපෙන්වීමක් තවදුරටත් අවශ්‍ය බව ඔහු අවධාරණය කර ඇත.

ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන පළතුරු බීම නිෂ්පාදන කිරීමේ කුඩා පරිමාණ නිෂ්පාදකයෙකු බිහිකිරීමේ උත්සාහයක් පිළිබඳ උදාහරණයක් අම්පාර රත්නජීව මහතාගේ පලතුරු බීම නිෂ්පාදන කර්මාන්තය සම්බන්ධ සිද්ධි අධ්‍යයන මඟින් පෙන්වා දෙනු ලබයි. ප්‍රදේශයේ පවත්නා වියළි ස්වභාවය සැලකිල්ලට ගැනීමෙදී මෙම කර්මාන්තයේ වූ උචිත බව , අමුද්‍රව්‍ය පහසුවෙන් ලබාගත හැකි බව යන කරුණු සහ පැළ තවාන්ද පවත්වාගෙනයාම නිසා

අඹ, ගස්ලබු, වැනි පලතුරු සම්බන්ධයෙන් අමුද්‍රව්‍ය සපයා ගැනීමේ පහසුව ද යන කරුණු ගණනාවක් නිසා මෙම ව්‍යාපාරය තැනට සුදුසු, ප්‍රදේශයට සුදුසු සහ පුද්ගලයාට සුදුසු යනා දී වශයෙන් නිවැරදි සාධක මත ඇරඹූ ව්‍යාපාරයක් ලෙස දැක්විය හැකිය. දේශීය නිෂ්පාදන සම්බන්ධයෙන් වටිනාකම් එකතු කිරීමේ කාර්යයක් ද මෙම කුඩා නිෂ්පාදන ව්‍යාපාරය මගින් සිදුවන අතර එය පෝෂ්‍යදායී සහ සෞඛ්‍යාරක්ෂිත දේශීයත්වයට ගැළපෙන අනාගත ව්‍යාපාරික විභවයක් ඇති කර්මාන්තයක් ලෙස වැදගත්කමත් දරයි.

**සාකච්ඡා අංක 5.3.4 - රන්කෙත් සහල් පිටි - අනුරාධපුරය**
**ප්‍රදීප් වර්ණකුලසූරිය**

ප්‍රදීප් වර්ණකුලසූරිය මහතා කුඩා පරිමාණ සහල් පිටි සැකසුම් කර්මාන්තශාලා හිමියෙකි. තම පියාට මුල් කාලයේ එනම් මීට වසර 10කට පමණ පෙර තෙත හාල් පිටි කෙටීමේ මෝලක් පැවති අතර 2008 වර්ෂයේ දී මොහු ඉඳිආප්ප පිටි නිෂ්පාදනය කිරීම ආරම්භ කරන ලදී. අනුරාධපුරය පසු අස්වනු තාක්ෂණ ආයතනය මගින් ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහන් කිහිපයකට ම සහභාගී වී ඇති ප්‍රදීප් මහතාට "අපි වවමු රට නගමු" වැඩසටහන යටතේ පසු අස්වනු තාක්ෂණ ආයතනය මගින් කුඩා පරිමාණයේ සහල් පිටි නිෂ්පාදකයන් වෙත ලබාදෙන විදුලි බලයෙන් ක්‍රියාත්මක කෙරෙන පිටි හලන යන්ත්‍රයක් (shifter) ලබා ගත හැකි විය. එම යන්ත්‍රයේ වටිනාකමින් 50% අදාළ නිෂ්පාදකයා විසින් දැරිය යුතු වූ අතර ඉතිරි 50% පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් දරනු ලබයි. ඒ අනුව ප්‍රදීප් මහතාට මෙම යන්ත්‍රය සඳහා රු.27500ක මුදලක් ගෙවීමට සිදු විය. මෙම යන්ත්‍රය සවි කිරීම සඳහා අවශ්‍ය සියලුම තාක්ෂණික දැනුම පසු අස්වනු තාක්ෂණ ආයතනය මගින් ලබා දී ඇත.

පිටි හලන යන්ත්‍රය සවි කිරීමෙන් අනතුරුව ඉඳිආප්ප පිටි නිෂ්පාදන මට්ටම ඉහළ ගොස් ඇති අතර දිනකට පිටි 150 kg පමණ නිෂ්පාදනය කෙරේ. ඊට පෙර දිනකට නිෂ්පාදනය කර තිබෙන්නේ 95 kg - 100 kg අතර ප්‍රමාණයකි. මේ මගින් තම නිෂ්පාදන සඳහා වන ඉල්ලුම ද ඉහළ ගොස් ඇති අතර පසු අස්වනු තාක්ෂණ ආයතනයේ ලැබූ පුහුණුවත් මෙම යන්ත්‍රයත් හේතුවෙන් තම ව්‍යාපාරය දියුණු කරගත් බව ප්‍රදීප් වර්ණකුල මහතා පැවසීය. දැනට තම නිෂ්පාදන අනුරාධපුර නගරය තුළ පමණක් බෙදාහරිනු ලබන අතර ඉදිරියේ දී එය තව දුරටත් ව්‍යාප්ත කිරීමට සැලසුම් කර තිබේ.

සහල් පිටි සකස් කිරීමේ කුඩා පරිමාණ මෝලක් වසර 10ක පමණ කාලයක් තිස්සේ පියා සමඟ කරගෙන ගොස් ඉන් ඉවත් වී තනිවම සහල් පිටි ව්‍යාපාරයක් පසු අස්වනු තාක්ෂණ ආයතනය සහයෝගයෙන් අරඹා අදියරෙන් අදියර උසස් නිෂ්පාදකයෙකු බවට පත්වීමේ සිද්ධියක් රන්කෙත් සහල් පිටි නිෂ්පාදන ආයතනය සම්බන්ධව සිද්ධි අධ්‍යයනය මගින් ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධයෙන් මෙම පුද්ගලයාට පසු අස්වනු ආයතනයේ සහල් පිටි සකස් කිරීම පිළිබඳව පුහුණුව ලබා දීම හා 'අපි වවමු - රට නගමු' වැඩසටහන මගින් ක්‍රියාත්මක කරන ලද වටිනාකමින් 50% ක් පමණක් ගෙවීමේ පදනම මත උපාංග සැපයීමේ වැඩසටහන මත සහල් පිටි සැකසීමේ කර්මාන්ත ඇරඹීම ව්‍යවසායකත්වයක් ඇරඹීමකට අතදීමක් ලෙස දැක්විය හැකිය. කෘෂිපාදක කර්මාන්ත සම්බන්ධව ව්‍යවසායකයින් වැඩි වැඩියෙන් බිහි කිරීම හා ස්වයං රැකියා ජනිතකිරීම ශ්‍රී ලංකාවේ කාලීන අවශ්‍යතාවයක් වන

අතර මෙම රන්කෙත් සහල් පිටි කර්මාන්තය ඒ සඳහා සාර්ථක උදාහරණයක් ලෙස දැක්විය හැකිය.

| |
|---|
| **සාකච්ඡා අංක 5.3.5 - හිරිපිටියාගම ගෘහස්ථ වී ගබඩා - ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාව**<br><br>වී ගබඩා ලබාදීමේ වැඩසටහන "අපි වවමු රට නගමු" වැඩසටහන යටතේ පසු අස්වනු තාක්ෂණ ආයතනය මගින් ක්‍රියාත්මක කළ වැඩසටහනකි. මන්ද, ගොවීන් තම වී අස්වැන්න ලබා ගත්ත ද නියමිත ගබඩා පහසුකම් නොවීම නිසා කාලයක් ගබඩාකොට තබා වැඩි මිලකට අලෙවිකර ගැනීමේ අවස්ථාව අහිමි වන අතර සතුන් බෝ වීම නිසා සිදුවන නාස්තිය හේතුවෙන් දිගින් දිගටම පාඩු විදීමට සිදු වී ඇත. මේ හේතුවෙන් මේ තත්ත්වය මඟහරවා ගැනීම සඳහා මෙම වැඩසටහන හඳුන්වා දී ඇත. ඒ අනුව අනුරාධපුර හිරිපිටියාගම ප්‍රදේශයේ ගොවීන්ට මෙම ගබඩා පහසුකම් ලබා දී ඇත. ඒ යටතේ අඩි 10x12 ප්‍රමාණයේ වී ගබඩාවක් ඉදිකිරීම සඳහා පසු අස්වනු තාක්ෂණ ආයතනය මගින් එක් ගොවියෙකුට රු. 15,000ක මුදලක් ලබා දී තිබිණි. ඉතිරි මුදල ගොවිමහතා විසින් දැරිය යුතුය. ඒ අනුව ඉහත ප්‍රමාණයේ වී ගබඩාවක් ඉදිකිරීම සඳහා පසු අස්වනු තාක්ෂණ ආයතනයෙන් ලබා දුන් රු. 15,000ට අමතරව ගොවි මහතුන් විසින් රු.30,000ත් 40,000 අතර මුදලක් ඒ සඳහා යොදවා ඇත. මෙම වැඩසටහන 2011 වර්ෂයේ ආරම්භ වී ඇති අතර මුලින් ම පසු අස්වනු තාක්ෂණ ආයතනයේ නිලධාරීන් පැමිණ ගොවීන් දැනුවත් කර ඇත. එහි දී ඊට කැමති ගොවිමහතුන් පිරිසක් ඒ සඳහා දායක කරගෙන තිබිණි.<br><br>ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් අනතුරුව වහලයත් බිත්තියත් අතර හිදැස් වැසීම සඳහා දැලක් උපයෝගී කරගෙන ඇති අතර වී ගබඩා කළ යුත්තේ බිම් මට්ටමේ සිට අඩි 1/2 ක් පමණ උසකින් වන ලී තට්ටුවක් මතය. වී ගබඩා කිරීම් දී කිසිවිටෙකත් බිත්තිවල ආසන්නයේ වී ගෝනි නොතැබිය යුතු අතර බිත්තියත් වී ගෝනිත් අතර අඩි 1 1/2ක පමණ පරතරයක් තිබිය යුතුය. ඒ නියමාකාරයෙන් වාතාශ්‍රය ලැබීම සඳහාය. මෙවැනි ගබඩාවක වී 1000 kg -1500 kg අතර ප්‍රමාණයක් ගබඩාකර තැබිය හැක.<br><br>මෙම වැඩසටහනට සම්බන්ධ වූ ගොවීන්ට තම වී ගබඩා කරගැනීමට මෙය විශාල පහසුවක් වී ඇති අතර කෘමීන්ගෙන් හා මීයන්ගෙන් සිදුවන හානිය අවමකර ගැනීමට එය පිටිවහලක් වී ඇත. එමෙන්ම වී ගබඩාකර තැබීම නිසා ඉහළ ආදායමක් ලබාගැනීමට ද හැකි වී තිබිණි. |

වියළි කලාපීය වී ගොවීන් මුහුණු පා සිටින ප්‍රබල ගැටලුවක් වී ඇත්තේ තම වී සාධාරණ මිලකට අලෙවි කරගැනීමට අපහසුවීමයි. මේ ගැටලුව සඳහා පර්යේෂකයන් ඉදිරිපත් කරනු ලබන විසඳුම වනුයේ වී අස්වනු ලබා ගත් වහාම අලෙවි නොකොට වී හිඟ සමයේ දී අලෙවි කිරීම සඳහා ගබඩාකර තබාගැනීමයි. මේ ආකාරයට පසුව වී අලෙවි කිරීමෙන් ඉහළ මිලකට තම වී අලෙවි කර ගැනීමට හැකියාව ලැබේ. එහෙත් මෙම ක්‍රමය අනුගමනය කිරීමේ දී ද ගොවීන් මුහුණු පා සිටින ප්‍රධාන ගැටලුව වනුයේ තම වීවලට හානියක් නොවන ආකාරයට ඒවා ගබඩා කර තබාගන්නේ කෙසේ ද යන්නයි. මීයන් වැනි සතුන් හා කෘමි සතුන් ගබඩා කර තබා ගන්නා ලද වී තොගවලට හානි පමුණුවන බැවින් හා වී නිසිපරිදි වාතාශ්‍රය නොලැබීමෙන් විනාශ වී යයි. එය කල් තබාගැනීමට උත්සහා දරන ගොවීන්ට පාඩුවකි. එම නිසා පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් හිරිපිටියාගම ප්‍රදේශයේ ගොවීන්ට හඳුන්වා දී ඇති තම නිවෙසේම කාමරයක වී ගබඩා කිරීමේ විධික්‍රමය හා එහිදී භාවිතා කර ඇති තාක්ෂණය නිසා ඉතා

සුරක්ෂිතව වී ගබඩා කර තබාගෙන පසුව අලෙවි කිරීමට හැකි වී ඇති බව ප්‍රායෝගිකව ඔප්පු කර පෙන්වා ඇත. මෙම ක්‍රමයේ සාර්ථකභාවය නිසා මෙය ගොවීන් අතර ඉතාමත් ජනප්‍රිය වී ඇත.

| |
|---|
| **සාකච්ඡා අංක 5.3.6- වී තැම්බීම - හිඟුරක්ගොඩ, පොළොන්නරුව සහල් සැකසුම් ගම්මාන වැඩසටහන**<br><br>පසු අස්වනු තාක්ෂණ ආයතනය මගින් "අපි වවමු රට නගමු" වැඩසටහන යටතේ සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතියක් ආරම්භ කර තිබේ. ඒ යටතේ වී තැම්බීම පිළිබඳ පුහුණුවක් ද සමඟින් වී තැම්බීම සඳහා අවශ්‍ය බැරල් ද 50% මූල්‍ය සහනය මත ලබා දී තිබිණ. ඒ අනුව ගොවියෙකු බැරලයක් සඳහා රු.3200ක මුදලක් ගෙවිය යුතු විය. මෙම ව්‍යාපෘතිය යටතේ හිඟුරක්ගොඩ සමඟිපුර ප්‍රදේශයේ ගොවි පවුල් 10කට පමණ බැරල් ලබා දී තිබිණ. ඔවුන් ගෘහස්ථව වී තැම්බීම කරන අතර ප්‍රදේශයේ බොල් වී කොටා ගල් වැලි ඉවත් කර ප්‍රදේශයේ ජනතාවට අලෙවි කරයි. ප්‍රදේශයේ වී නිෂ්පාදනය නොකරන රජයේ සේවකයින් වැඩි පාරිභෝගිකයන් පිරිසක් මෙම සහල් මිල දී ගැනීමට පෙළඹී සිටිති. |

## 5.4 ගොවීන්ගේ කෘෂිකාර්මික දැනුම වැඩි කිරීම

ආහාර ආරක්ෂණය සහ තිරසාර කෘෂිකාර්මික සංවර්ධනය හා ග්‍රාමීය සංවර්ධනයේ දී ඉතා වැදගත් වේ. ආහාර ආරක්ෂණයේ එක් ගැටලුවක් ලෙස හඳුනාගෙන ඇත්තේ දැනුම හිඟකමය. කෘෂිකාර්මික අධ්‍යාපනය හා පුහුණුව ව්‍යාපෘතීන් සඳහා ගොවීන් සූදානම් කිරීමේ දී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි. බෝග නිෂ්පාදනය වැඩිකිරීම සඳහා ක්ෂේත්‍ර මට්ටමින් ගොවි පුහුණු වැඩසටහන් පැවැත්විය යුතුය. ක්ෂේත්‍ර මට්ටමේ වැඩසටහන් ප්‍රධාන වශයෙන් ගොවීන්ගේ ක්ෂේත්‍ර ගැටලු විසඳන අතර ආයතනික මට්ටමේ පුහුණු ඔවුන්ගේ කෘෂි නිෂ්පාදන හා සැකසීමේ තාක්ෂණික හැකියාව පුළුල් කරයි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් බෝග වගාව දියුණු කිරීම සඳහා බෝග නායක නමින් හඳුන්වන ලද වැඩසටහනක් ක්‍රියාත්මක කර එම බෝගයන් හි බීජ හා රෝපණ ද්‍රව්‍ය උසස් තත්ත්වයෙන් නිෂ්පාදනය කර එම බෝග වැඩි දියුණු කිරීම සඳහා පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

### 5.4.1 බෝගනායක වැඩසටහන්

බෝග නායක අර්තාපල් යටතේ පටක රෝපණ තාක්ෂණය භාවිතයෙන් ඉහළ ගුණාත්මයෙන් යුත් අර්තාපල් මූලික බීජ කි.ග්‍රෑ. 189,076ක් සහ රෝගවලින් තොර අර්තාපල් පැළ 7,309ක් නිෂ්පාදනය කර ඇත. ඒ සඳහා පිළිවෙළින් රු.මි. 1.1ක් හා 0.6ක් වැය වී ඇත. පළාත් සභා සම්බන්ධීකරණය මගින් බීජ නිපදවීම සඳහා මූලික බීජ කි.ග්‍රෑ. 305,345ක් ලබා දී ඇති අතර ඒ සඳහා රු.මි. 0.42ක් වැය වී ඇත. පටක රෝපණ තාක්ෂණය යටතේ අර්තාපල් ක්ෂුද්‍ර බීජ කි.ග්‍රෑ. 95046ක් නිෂ්පාදනය කර ඇත. ඒ සඳහා රු.මි. 0.6ක් වැය වී ඇත. බීජ අර්තාපල්

මෙ.ටො.482ක ප්‍රමිතිය සහතික කිරීම සඳහා රු.මි. 0.09ක් සහ බීජ සාම්පල් 63ක පශ්චාත් පාලන පරීක්ෂාව සිදු කිරීම සඳහා රු.මි. 0.09ක් වැය වී ඇත. මෙමඟින් උසස් බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, බීජ ආනයනය අඩුවීම, නිෂ්පාදන වියදම අඩු කිරීම, දේශීය බීජ අවශ්‍යතාවය දේශීයව නිපදවීමට දිරිගැන්වීම යනාදී ප්‍රතිලාභ අත්කරගත හැකි විය.

බෝග නායක බෝංචි යටතේ අභිජනන බෝංචි බීජ කි.ග්‍රෑ. 608ක් නිෂ්පාදනය කර ඇති අතර ඒ සඳහා රු.මි. 0.3ක් වැය වී ඇත. බෝංචි මූලික බිජ කි.ග්‍රෑ. 1,950ක් නිෂ්පාදනය කර ඇති අතර ඒ සඳහා රු.මි. 0.12ක් වැය වී ඇත. බෝංචි ක්ෂේත්‍ර ආදර්ශන පවත්වාගෙන යාම සඳහා රු.මි. 0.046ක් වැය කර ඇත. එමඟින් අත්කරගත් ප්‍රතිලාභ ලෙස ගුණාත්මක බෝංචි බීජ සුලභ කිරීම, බෝංචි නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම, කෘමි රෝග හානි අවම කිරීම දැක්විය හැකිය.

බෝග නායක තක්කාලි යටතේ දෙමුහුන් බීජ කි.ග්‍රෑ. 7.8ක් අභිජනනය බීජ කි.ග්‍රෑ. 315ක් නිෂ්පාදනය කිරීම සඳහා පිළිවෙළින් රු.මි. 0.18ක් සහ 0.2ක් වැය කර ඇත. තක්කාලි නව දෙමුහුන් ප්‍රභේද ප්‍රචලිත කිරීම මඟින් නිෂ්පාදනය ඉහළ නැංවීමට පියවර ගෙන ඇත. අවාරයේ වගාව ප්‍රචලිත කිරීම සඳහා හෙක්ටයාර් 130ක් තක්කාලි වගා කර ඇත. පුහුණුලාභීන් 714 දෙනෙක් සඳහා තක්කාලි සැකසූ ආහාර පිළිබඳව දැනුවත් කිරීම් සිදු කර ඇත. තක්කාලි අස්වනු සමීක්ෂණයක් පවත්වා ඇත. බෝග නායක දේශීය අල බෝග යටතේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, ආදර්ශන හා පුහුණු වැඩසටහන්, පත්‍රිකා බෙදාදීම්, ආදර්ශ ගම්මාන 10ක් පවත්වාගෙනයාම, අල බෝගවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම, බතල රෝපණ ද්‍රව්‍ය ලබාදීම් හා අස්වනු සමීක්ෂණය යන කාර්යයන් සඳහා රු.මි. 1.18ක් වැය විය. තිරිඟු පිටි පරිභෝජනයට ආදේශක ලෙස දේශීය අල පරිභෝජනය වැඩි කිරීම මින් අත්කරගැනීමට බලාපොරොත්තු වූ ප්‍රතිලාභය වේ.

### 5.4.2 පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව- උතුරු මැද පළාත

උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් "අපි වවමු - රට නගමු" වැඩසටහන යටතේ අතිරේක බෝග සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර ලොකු ළූණු වගා ප්‍රවර්ධන වැඩසටහන ප්‍රමුඛත්වයක් ගනී.

වගු අංක **5.4.1:** ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා එහි ප්‍රගතිය

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වියදම් කළ මුදල රු. | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ලොකු ළූණු වගා ප්‍රවර්ධනය | ගොවි පුහුණු පැවැත්වීම | 3660 | 5 | 132 |
| | වර්ග මීටර් 1000 ලොකු ළූණු ආදර්ශන ඇති කිරීම | 156167 | 32 | 32 |
| | වර්ග මීටර් 500 ලොකු ළූණු සත්‍ය බීජ නිෂ්පාදන ආදර්ශන | 135532 | 32 | 32 |
| | වර්ග මීටර් 30 ලොකු ළූණු නිෂ්පාදන ආදර්ශන | 430125 | 75 | 75 |
| | ලෙකු ළූණු චක්‍රීය ණය | 288339 | 78 | 162 |
| වගාකරුවන්ට පහසුකම් සැපයීම | මධ්‍යම ප්‍රමාණ ලොකු ළූණු ගබඩා ඇති කිරීම | 180000 | 03 | |
| | වෙනත් වියදම් | 142115 | | |

පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් බෝග නිෂ්පාදනය, බීජ නිෂ්පාදනය, නව තාක්ෂණික ක්‍රම පිළිබඳව දැනුම ලබාදීම, වගා කළමණාකරණය වැනි විෂයන් ඇතුළත් වැඩසටහනක් "අපි වවමු -රට නගමු" වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද අතර එම වැඩසටහන් සඳහා සහභාගී වූ ගොවීන්ගේ අදහස් ඇතුළත් සිද්ධි අධ්‍යයන සහ සම්මුඛ සාකච්ඡා කිහිපයක් පහතින් දැක්වේ. මෙම වැඩසටහන යටතේ එම අංශ ලබා ඇති ප්‍රගතිය එම අදහස්වලින් පැහැදිලි වේ.

**සිද්ධි අධ්‍යයනය අංක 5.4.1**
**අනුරාධපුර - පලාගල ගොවිජන සේවා බල ප්‍රදේශය**
**ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාව**
**බීජ වී නිෂ්පාදන වැඩසටහන - මී වැව**

බීජ වී නිෂ්පාදනය සඳහා මී වැව ප්‍රදේශයෙන් (කිරිදිවත්ත, මී වැව, තුලාන) ගොවීන් 7 දෙනෙකු පමණ සහභාගී වී ඇත. ඒ සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ගොවීන්ට BG 300 හා BG352 යන වර්ගයන්වල බීජ වී 2011 මහ කන්නයේදී ලබා දී තිබුණි. එහි දී බීජ වී බුසලක් සඳහා ගොවින්ගෙන් අයකරනු ලැබුවේ රු. 537ක් වැනි මුදලකි. එනම් මුළු මුදලින් 50%ක මුදලක් පමණි. මෙම ගොවීන් නිෂ්පාදනය කරනු ලබන බීත්තර වී මහඉලුප්පල්ලම බීජ නිෂ්පාදන ගොවිපළ මඟින් මිලට ගන්නා පදනම මත මෙම වැඩසටහන ක්‍රියාත්මක වී ඇත. මහඉලුප්පල්ලම බීජ නිෂ්පාදන ගොවිපළේ නිලධාරීන් වරින් වර පැමිණ බීජ ගොවිපළවල් නිරීක්ෂණය කර ඇති අතර ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකගේ ද නිරන්තර නිරීක්ෂණයට භාජනය වී තිබුණි. අස්වැන්න නෙළා අවසන් වූ පසු මහඉලුප්පල්ලම නිලධාරීන් එම බීජ වී ගබඩා කරන ආකාරය පිළිබඳව ගොවීන් දැනුවත් කර තිබිණි. එනම් පොළව මට්ටමේ සිට අඩි 1 ½ ක පමණ උසකින් වී මළු තැබිය යුතු අතර එම වී මළු බිත්තියට හේත්තු නොවන ආකාරයට තබන ලෙස උපදෙස් ලැබී තිබිණි. එහෙත් එම නිලධාරීන් වී මිලදී ගැනීමට පැමිණි අවස්ථාවේ ප්‍රමිතියට අනුව වී මළු ගබඩා නොකිරීම හේතුවෙන් බීජ වී ලෙස එම වී මිලදී ගැනීම ප්‍රතික්ෂේප වී ඇත. ඉන් අනතුරුව එම ගොවීන් තම ගම් ප්‍රදේශයේම ගොවීන්ට බීජ වී ලෙස එම වී අලෙවි කර ඇත. බීජ වී කිලෝවක් රු. 35 බැගින් අලෙවි කර ඇත.

එහිදී ගොවීන්ගේ අදහස වුයේ එම වැඩසටහන යටතේ මහඉලුප්පල්ලම බීජ වී ගොවිපළින් තම බීජ වී මිල දී නොගත්ත ද එම වැඩසටහන යටතේ ලැබූ දැනුම ඉතා වැදගත් වූ බවය. දැනට එම පුහුණුව ලැබූ ගොවීන් 7 දෙනෙකුගෙන් තිදෙනෙක්ම මෙම බීජ වී නිෂ්පාදනය සිදු කරති. එය ඔවුන්ට වැඩි ආදායමක් උපයා ගැනීමට හේතු වී ඇත. මෙම බීජ නිෂ්පාදන වැඩටසටහන යටතේ කාබනික පොහොර භාවිතයේ වැදගත්කම පිළිබඳව ද අවබෝධයක් ලබා දී තිබිණි. ඔවුන් ලබාගත් මෙම දැනුම අදටත් ඔවුහු භාවිත කරති. ඒ මඟින් අස්වැන්න යම් ප්‍රමාණයකට ඉහළ ගොස් ඇති අතර මෙම දැනුම භාවිත කිරීමට පෙර අක්කරයකින් ලැබූ අස්වැන්න බුසල් 120කි. එහෙත් මෙම දැනුම භාවිත කිරීමෙන් අනතුරුව අක්කරයකට බුසල් 130-150 අතර ප්‍රමාණයක අස්වැන්නක් ඔවුහු ලබති.

යෝජනා:

- මෙම වැඩසටහන ඉතා හොඳ වැඩසටහනක් වන අතර බීජ වී නිෂ්පාදනය පිළිබඳව දැනුවත්භාවයක් මෙයින් ගොවීන්ට ලැබීමත්, කොම්පෝස්ට් පොහොර භාවිතය, පිදුරු කුඹුරට එක්කිරීමෙන් ලැබෙන වාසි පිළිබඳ දැනුවත්කිරීමත් සිදු කළ යුතුය.

- නිලධාරීන් උපදෙස් දෙන ආකාරයට බීජ වී ගබඩා කරගැනීමේ පහසුකම් ජනතාව සතුව නොමැති බැවින් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසාදීමට පියවර ගත යුතුය.

බීජ වී නිෂ්පාදන තාක්ෂණය ගොවීන් අතරට ගෙනයාම සඳහා සිදු කරන ලද වැඩසටහන් ඉහත සිද්ධි අධ්‍යනය මඟින් විවරණය කරනු ලබයි.

**සාකච්ඡා අංක 5.4.2 - උඳු බීජ නිෂ්පාදන වැඩසටහන - ආඩියාගල ගොවිජන සේවා මධ්‍යස්ථානය කහල්ල - ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාව**

2007 වර්ෂයේ දී "අපි වවමු රට නගමු" වැඩසටහන යටතේ ආඩියාගල ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් තෝරාගත් ගොවීන් 10 දෙනෙකුට පමණ උඳු බීජ ලබා දී ඇත. කෘෂිකර්ම උපදේශක මහතා විසින් ඒ සඳහා අවශ්‍ය උපදෙස් ගොවීන් වෙත ලබා දී තිබූ අතර අක්කරයක් සඳහා එක් ගොවියෙකුට උඳු බීජ10 kg බැගින් ලබා දී තිබිණි. මෙම ගොවීන් මීට පෙර ද උඳු වගා කළත් ඒවායින් සරු ඵලදාවක් ලබාගත නොහැකි වූ බව ඔවුහු සඳහන් කළහ. එහෙත් මෙම වැඩසටහන මඟින් ලබා දුන් "රුවන්" වර්ගයේ බීජ ඉතා සාර්ථක ඵලදාවක් සඳහා තමන්ට රුකුලක් වූ බව ගොවීහු සඳහන් කළහ. මේ වැඩසටහනට පෙර මෙම ගොවීන් අක්කරයකට උඳු 250 kg - 500 kg අතර අස්වැන්නක් ලබාගෙන තිබූ අතර "රුවන්" වර්ගයේ බීජ මඟින් අක්කරයකට 800 kg -1000kg -අතර අස්වැන්නක් ලබාගෙන තිබුණි. උඳු කිලෝවක් රු.150 බැගින් අලෙවිකර තිබූ අතර ඉදිරි කන්න සඳහා අවශ්‍ය බීජ ගොවීන් සතුව තිබේ. එමෙන්ම මෙම වැඩසටහන යටතේ ගොවීන්ගෙන් උඳු බීජ මිල දී ගැනීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඉදිරිපත් වී සිටි අතර ගොවිජන සේවා මධ්‍යස්ථානය ද බීජ නිෂ්පාදන ගොවීන් වෙත ඔවුන්ව යොමුකර ඇත. මෙම වැඩසටහනින් අනතුරුව ඊට සහභාගී වූ සියලු ම ගොවීහු මේ වන විට දිගින් දිගටම උඳු වගාවට යොමු වී සිටිති. එමෙන්ම මෙම ගොවීන් උඳු බීජවලින්ද ස්වයංපෝෂිතය. මෙම ගොවීන්ට අනුව උඳු වගාව තමන්ට වාසිදායක අතර අලෙවිය පිළිබඳ වෙළඳපළ ගැටලුවක් ද නොපවතී. උඳු බොහෝවිට වගාකරනු ලබන්නේ යල කන්නයට ය.මාස් කන්නයේ දී එතරම් සරු ඵලදාවක් ලබාගත නොහැකි බව ගොවීහු සඳහන් කළහ. උඳු සඳහා පොහොර හා කෘමිනාශක භාවිතය අවම වන අතර යූරියා ප්‍රමාණයක් සුළු වශයෙන් යොදයි. ඒ නිසාම නිෂ්පාදන් පිරිවැය ද උඳු සඳහා අඩුය.

වර්තමානයේ දී විදේශවලින් ආනයනය කරනු ලබන බීජයක් වන උඳු බෝගය මෙරට නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා අපි වවමු රට නඟමු' වැඩසටහන යටතේ ගොවීන් සම්බන්ධ කරගනිමින් සිදු කර ඇති කාර්යයන් ඉහත සිද්ධි අධ්‍යයනය ආශ්‍රයෙන් පැහැදිලි වේ.

***සිද්ධි අධ්‍යයනය අංක 5.4.3 - ලොකු ළූණු බීජ නිෂ්පාදනය , ඩී.එම්.ජේ.සී. දිසානායක ආඩියාගල ගොවිජන සේවා මධ්‍යස්ථානය***

*දිසානායක ගොවි මහතා ලොකු ළූණු බීජ වගාවට යොමු වීමට පෙර මිරිස් වගාවේ නිරත වී ඇත. 2011වර්ෂයේ ලොකු ළූණු බීජ වගාකිරීමේ වැඩසටහන යටතේ දිසානායක ගොවි මහතාට ද මව් බල්බ 50kg ලැබිණි. ඒ යටතේ කෘෂිකර්ම උපදේශක මහතාගෙන් ලැබුණු උපදෙස් මත අඩි 20x3 ප්‍රමාණයේ තවාන් සකස් කොට මව් බල්බ තවාන් දැමීම සිදු කෙරිණි. මෙම වැඩසටහන යටතේ තවාන් සඳහා අවශ්‍ය පොලිතින් හා දැල් ද නොමිලයේ ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ඔහුට ලැබී ඇත. ඒඅනුව දිසානායක මහතා බීජ ඇට 5 kg නිෂ්පාදනය කර තිබේ. එම බීජ කිලෝවක් රු.10,000ක් බැගින් අලෙවි කර ඇති අතර බීජ නිෂ්පාදනයෙන් ලැබෙන ආදායම මිරිස් වගාකිරීමෙන් ලැබෙන ආදායමට වඩා ඉහළ බව ඔහු සඳහන් කළේය. ඒ අනුව දිගින් දිගට ම ලොකුළූණු බීජ නිෂ්පාදනයේ තමන් නිරතවන බව ඔහු සඳහන් කළේය. තමන් සතුව බීජ පවතින නිසා ඉදිරි කන්නවල දී ළූණු වගාවට ද යොමු වීමට ඔහුගේ අදහසයි. මුලින්ම අක්කර ¼ ළූණු වගාකළ දිසානායක මහතා ඉදිරියේදී එය අක්කරයක පමණ බිම් ප්‍රමාණයකට ව්‍යාප්ත කිරීමට ඔහු බලාපොරොත්තු වේ. ඒ අනුව මෙම වැඩසටහන යටතේ නොමිලයේ මව් බල්බ ලබා දී ගොවීන් දිරිමත් කිරීමෙන් තමන්ගේ ආදායම් මට්ටම ඉහළ ගොස් ඇති බව දිසානායක මහතා සඳහන් කළේය.*

**සාකච්ඡා අංක 5.4.4- ලොකු ළූණු බීජ නිෂ්පාදනය - ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාව**
**සඳගල , පලාගල ගොවිජන සේවා බල ප්‍රදේශය**

2011 වර්ෂයේ දී ලොකුළූණු වගාකිරීම සඳහා ගොවීන් වෙත මව් බල්බ ලබා දීම සිදු විය. මව් බල්බ 25kgක් ගොවියෙකුට නොමිලයේ ගොවිජන සේවා මධ්‍යස්ථානය මඟින් ලබා දී ඇත. මෙම වැඩසටහන යටතේ බීජ තවාන් සඳහා අවශ්‍ය දැල් හා පොලිතීන් ද නොමිලයේ ගොවීන්ට සපයා දී ඇත. එමෙන්ම බීජ ළූණු නිෂ්පාදනය මෙම ප්‍රදේශවල ගොවීන්ට නව අත්දැකීමක් නිසා ම කෘෂිකර්ම උපදේශකගේ නිරන්තර අධීක්ෂණයට යොමු වී තිබිණි. මව් බල්බ සිටුවා මාස 1 1/2කින් පමණ පුෂ්ප හට ගැනීම සිදු වේ. මෙම මව් බල්බ 25kgන් 200.2kg පමණ ලබාගත හැකි අතර බීජ ඇට කිලෝවක් අලෙවි කරනුයේ රු.12000 -15,000 අතර මිලකටය. මෙම වැඩසටහන යටතේ බීජ නිෂ්පාදනය සඳහා යොමු වූ සියලුම ගොවීන් පාහේ දිගින් දිගටම එම කාර්යයේ නියුක්ත වේ. එහිදී ගොවීන් පැවසුයේ තමන්ට ලොකු ළූණු බීජ ඇට නිෂ්පාදනය සඳහා මනා දැනුමක් ලබාගත හැකි වූ අතර ඒ යටතේ තමන්ට අවශ්‍ය බීජ තමන්ට ම නිපදවා ගැනීමේ හැකියාව මේ වන විට ඔවුන් සතුව පවතින බවකි. එමෙන්ම ඉන්දියානු බීජ වලට වඩා ලංකාවේ බීජවල ගුණාත්මකභාවය ද ඉහළ වන අතර ලැබෙන අස්වැන්න ද ඉහළ අගයක් ගනී. ඒ අනුව මෙම වැඩසටහන යටතේ ගුණාත්මකභාවයෙන් ඉහළ බීජ තමන්ට ම නිෂ්පාදනය කරගැනීමේ හැකියාව' ගොවීන්ට ලැබී තිබේ. ඉන්දියානු බීජවලින් අක්කරයකට ලබාගත හැක්කේ 3500kg- 4500kg අතර ප්‍රමාණයකි. එහෙත් ලංකාවේ බීජ වලින් අක්කරයකට 7500 kg -8500 kg අතර අස්වැන්නක් ලබාගතහැකි බව ද සඳහන් විය.

ශ්‍රී ලංකාවේ දේශගුණයට සහ පසට ගැළපෙන ආකාරයෙන් ලොකු ළූණු බීජ දේශීය වශයෙන් නිපදවීමේ වැඩසටහනක් 'අපි වවමු රට නඟමු වැඩසටහන යටතේ සාර්ථක අයුරින් ක්‍රියාත්මක වෙමින් පැවති බව ඉහත සිද්ධි අධ්‍යයන පෙන්වා දෙයි.

**ප්‍රතිලාභී ගොවීන්ගේ අදහස් හා යෝජනා**

- ලොකු ළූණු මව් බල්බ නොමිලයේ ලබාදීම හේතුවෙන් විශාල සහනයක් ගොවීන්ට හිමි වූ බවත් ඒ තුළින් ගොවීන්ට වෙනත් අය මත යැපෙන්නේ නැතිව බීජවලින් ස්වයංපෝෂිත වීමේ හැකියාව හිමි වූ බවත් සඳහන් විය.

- එමෙන්ම බීජ වගාව සඳහා අවශ්‍ය දැල් හා ඉටි රෙදි ලබාදීමෙන් ගොවියාට දැරිය යුතු වියදම අවම කිරීම මෙම වැඩසටහන සාර්ථක වීමට ද හේතුවක් වී ඇත.

- බීජ ආදර්ශන ලබාදීම මඟින් ද ගොවීන්ට දැනුම ලබාගතහැකි විය. එය ගොවීන්ට තම වගාව වැඩි දියුණු කරගැනීමට ප්‍රයෝජනවත් වී ඇත.

- කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳව මාකඳුර පර්යේෂණ මධ්‍යස්ථානයෙන් ලබා දී ඇති පුහුණුව ද ඔවුන්ගේ ගොවිතැන් සාර්ථක කරගැනිමට හේතු වී තිබිණි.

- ලොකු ළූණු බීජ නිෂ්පාදනය සඳහා අවශ්‍ය මව් බල්බ දැනට ලබා දෙන්නේ දෙසැම්බර් මාසයේදී ය. ඒවා නොවැම්බර් මුල් කාලයේ ලබාදීමෙන් මල් පූදින කාලයේ වර්ෂාව හේතුවෙන් මල් කුණු වී බීජ ලබාගැනීම අපහසු වීම මඟ හරවා ගත හැකි බව සඳහන් විය.

**සිද්ධි අධ්‍යයනය අංක 5.4.5- ලොකු ළූණු ගබඩා ඉදි කිරීම -**
**ආර්.එම්. ජයතිස්ස - කුඩා හල්මිල්ලෑව**
**කිරිදිවත්ත - පලාගල ගොවිජන සේවා මධ්‍යස්ථානය**

2011 වර්ෂයේ දී " අපි වවමු රට නගමු " වැඩසටහන යටතේ ලොකුළූණු ගබඩා ලබා දීම සිදු විය. එහිදී රජය 50% වැය බරක් දරන අතර ඉතිරි 50% ගොවි මහතා දැරිය යුතුය. ඒ යටතේ රජයෙන් රු.30,000ක මුදලක් ජයතිස්ස මහතාට හිමි විය. ඒ අනුව අඩි 12x10 ප්‍රමාණයේ ලොකු ළූණු ගබඩාවක් ඉදිකෙරිණි. ඒ සඳහා කෘෂිකර්ම උපදේශක මහතාගෙන් මෙන්ම තාක්ෂණ නිලධාරියාගෙන් ද උපදෙස් මත ගබඩාව ඉදි විය. මෙම ගබඩාවේ ගබඩා කළහැකි ලොකු ළූණු ප්‍රමාණය 5000 kgකි. ජයතිස්ස මහතා අක්කර දෙකක ලොකුළූණු වගාව සිදු කරයි. ඒ අනුව 2011 වර්ෂයේ දී ඔහු අස්වැන්න නෙළන අවධියේ දී ලොකුළූණු කිලෝවක මිල රු. 50-55 අතර අලෙවි වුවද තමන් සතුව ගබඩා පහසුකම් තිබූ නිසා මාස 06ක පමණ කාලයක් ගබඩාකොට තබා අලෙවිකර ඇත. එහිදී ඔහු ලොකු ළූණු කිලෝවක් රු.70 බැගින් අලෙවිකර තිබිණි. එහිදී ඔහු ලැබූ අමතර ආදායම:

| | | |
|---|---|---|
| අස්වැන්න නෙළන අවධියේ අලෙවි කළේනම් | = | 5000 x55 |
| | = | රු.2, 75000 |
| මාස 6ට පසුව | | |
| ගබඩාකර තිබූ ප්‍රමාණය | = | 5000 kg |
| අපතේ ගිය ප්‍රමාණය | = | 5% |
| | = | 250 kg |
| | = | 5000-250 |
| | = | 4750 |
| | = | 4750x70 |
| | = | 3 32500 |
| ගබඩා කිරීමෙන් ලැබූ අමතර වාසිය | = | 3, 32500 – 2 ,7500 |
| | = | 57,500 |

එහෙත් එම අවධියේදී රජය ඉන්දියාවෙන් ලොකු ළූණු ආනයනය නොකළේ නම් තම ළූණු කිලෝවක් රු. 105බැගින් අලෙවි කිරීමේ හැකියාව තිබූ බව ඔහුගේ අදහස විය. කෙසේ වුවත්, ගබඩා කිරීම නිසා තමන්ට ආර්ථික වශයෙන් වාසිදායක බවත් මෙම වැඩසටහන ඉතා ප්‍රයෝජනවත් බවත් ජයතිස්ස මහතා සඳහන් කළේය.

අස්වනු නෙළන සමයේ නිෂ්පාදන මිල පහළ යෑම සම්බන්ධ ගැටලුවට විසඳුමක් ලෙස ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් යෝජනා කරනු ලබන අස්වනු ගබඩා කිරීමේ වැඩපිළිවෙළ ගොවීන් සමඟ ප්‍රායෝගිකව අත්හදා බැලීමේ අවස්ථාවක් ඉහත සිද්ධි අධ්‍යයනයෙන් පෙන්වා දෙයි. මෙම ක්‍රමවේදය යටතේ තාක්ෂණය ගොවීන් වෙතට සම්ප්‍රේෂණය වී ඇත.

**සාකච්ඡා අංක 5.4.6 - මුං හා කව්පි වගාව - ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාව**

පලාගල ගොවිජන සේවා බල ප්‍රදේශයේ මුං හා කව්පි වගාව සඳහා බීජ ලබාදුන් කිහිප දෙනෙකු ම මුණ ගැසුණු මුත් එම වැඩසටහන අනෙක් වැඩසටහන් මෙන් සාර්ථකව ක්‍රියාත්මක වූ වැඩසටහනක්.ලෙස හඳුනාගත නොහැකි විය. මෙම වැඩසටහන යටතේ මුං බීජ ලැබූ ගොවි මහතෙකු වූයේ පලාගල පතිරත්න ගොවි මහතායි. ඔහුට ගොවිජන සේවා මධ්‍යස්ථානය මඟින් බීජ මුං 1 kgක් නොමිලේ ලබා දී තිබූ අතර අක්කර ¼ බිම් ප්‍රමාණයක ඒවා වගාකළ ද සාර්ථක වී තිබුනේ නැත. පැළ මට්ටමේ දී රෝගයක් වැළදීමෙන් වගාව විනාශ වී ගොස් තිබුණි.

එම ප්‍රදේශයේ ම හද්‍රාවතී මහත්මියට ද 2011 යල කන්නයට 10 kgක මුං බීජ ලැබී තිබිණ. එමඟින් 25kgක් පමණ අස්වැන්නක් නෙළා ගැනීමට ඇයට හැකි වී තිබිණ. එම අස්වැන්නෙන් 15kක් පමණ කිලෝව රු. 110 බැගින් අලෙවිකර තිබූ අතර ඉතිරිය තම පරිභෝජනය සඳහා භාවිතයට ගෙන ඇත.

පැල්බැදියාව ග්‍රාමයේ මල්ලිකා කුමාරි මහත්මියට මෙම වැඩසටහන යටතේ ගොවිජන සේවා මධ්‍යස්ථානය මඟින් කව්පි බීජ නොමිලේ ලබා දී තිබිණි. ඇයට බීජ කව්පි 5kgක් ලබා දී තිබූ අතර වගා ක්‍රම පිළිබඳව කෘෂිකර්ම උපදේශක මහතාගේ උපදෙස් ලැබී තිබිණි. එම බීජ කව්පිවලින් 40 kg පමණ අස්වැන්නෙන් ලබාගෙන තිබූ අතර කව්පි කිලෝවක් රු.150 බැගින් අලෙවිකර ඇත. එම අස්වැන්නෙන් ඊළඟ කන්නය සඳහා අවශ්‍ය බීජ සපයාගෙන තිබිණි. මල්ලිකා මහත්මිය කව්පි වගා කිරීම සඳහා තම ගෙවත්තේම අක්කර ½ ක් පමණ ප්‍රමාණයක් භාවිතා කරන්නීය. කව්පි සිටුවීමට පෙර ඇය සෝයා බෝංචි වගා කළ ද ඒවාට තිබූ ඉල්ලුම අඩු වීමත් සමඟ කව්පි වගාවට යොමු වී ඇත. කව්පි අස්වැන්න මෙන් ම ආදායම ද වාසිදායක බව ඇය සඳහන් කළාය. එහෙත් එම වගාවන් සඳහා ද පොහොර සහනාධාරය ලැබෙනවානම් ගොවීන් මීට වඩා වැඩි පිරිසක් මෙවැනි බෝග සඳහා යොමුවන බව ඇය සඳහන් කළාය. එමෙන්ම මෙම වැඩසටහන යටතේ බීජ ලබාදීම නොවැම්බර් මස සිදු වූ බවත් ඒ අවධියේ තද වැසි හේතුවෙන් ඉහළ අස්වැන්නක් ලබාගත නොහැකි වූ බවත් ඇය පැවසුවාය. බීජ කලට වේලාවට ලැබෙනවානම් මෙම වැඩසටහන මඟින් මීට වඩා ඉහළ ඵලදායිතාවයක් ලබාගත හැකිවන බව ඇය සඳහන් කළාය.

මුං හා කව්පිවල දේශීය පාරිභෝජන අවශ්‍යතාවය සැපිරීම සඳහා අවශ්‍ය බීජ ගොවීන් විසින් ම නිෂ්පාදනය කරවීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක වූ අතර ඒ සම්බන්ධයෙන් පැවති තත්ත්වය ඉහත සිද්ධි අධ්‍යයනය හෙළි දරවු කරයි.

**සාකච්ඡා අංක 5.4.7 - ඒ.අයි. කැකුලන්දර මෙනවිය- පුද්ගල සාකච්ඡාව**
**පලාගල ගොවිජන සේවා මධ්‍යස්ථානය**.

"අපි වවමු රට නගමු" වැඩසටහන යටතේ සිදු කළ කාර්යයන් යටතේ වගා ක්‍රම පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම් සිදු කෙරිණ. විශේෂයෙන්ම බීජ නිෂ්පාදන වැඩසටහන් යටතේ ගොවීන්ට අවශ්‍ය සියලුම තාක්ෂණික දැනුම ලබා දීම සිදු විය. ඒ යටතේ බීජ වැපිරීම වෙනුවට පේළිවලට සිටුවීම, සහතික බීජ ලබා දීම සිදු කෙරිණි. ඒ සඳහා අවශ්‍ය උපදෙස් ද ගොවීන් වෙත නිරන්තර ලබා දුනි. මෙම වැඩසටහන ඉදිරියට ගෙනයාම සඳහා අවශ්‍ය යෝජනා වශයෙන්,

- අතිරේක බෝග වගාව සඳහා ගොවීන් වැඩි වශයෙන් යොමු වන්නේ යල කන්නයටයි. ගොවීන් මෙම අතිරේක බෝග වගාවට යොමු වීම අවම වීමට ප්‍රධාන හේතුව වන්නේ පොහොර සහනාධාරයයි. කුඹුරු සඳහා පොහොර සහනාධාරය ලැබෙන නිසා සියලුම ගොවීන් වී ගොවිතැනට යොමුවෙනවා මිස අතිරේක බෝග වගාවට යොමු නොවේ. ඒ සඳහා යොමු කරවීමට නම් අනිවාර්යෙන්ම අතිරේක බෝග වගාවන් සඳහා ද පොහොර සහනාධාරය ලබා දීම අවශ්‍ය වේ.

- මෙම වැඩසටහන හරහා මතු වූ තවත් ප්‍රධාන ගැටලුවක් ලෙස හඳුනාගත හැක්කේ වෙළඳපළ ගැටලුවයි. ගොවීන්ට වගා කිරීම දිරිමත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක වුව ද තම නිෂ්පාදන අලෙවිකර ගැනීමේ වැඩසටහනක් පිළිබඳව මෙම වැඩසටහන් මගින් ගොවීන්ට හඳුන්වා නොදීම හේතුවෙන් ඇතැම් ගොවීහු දැඩි අපහසුතාවයට පත් වී සිටිති.

- එමෙන්ම බීජ ලබා දීමේදී ඇතැම් බීජ ගුණාත්මකභාවයෙන් අඩුවීම ද ගැටලුවක් විය. මෙම වැඩසටහන හරහා කෙටි කාලීන බීජ ලබා දුන්නානම් වඩා සාර්ථකය. නිදසුන් ලෙස උඳු සඳහා MI 1 වර්ගයේ බීජ ගොවීන්ට ලබා දුන්න ද ඒ සඳහා මාස තුනක් අවශ්‍ය වේ. එහෙත් අනුරාධ වැනි බීජවර්ගයක් ලබා දුන්නේ නම් මාස 1 ½ක් වැනි කෙටි කාලයකින් අස්වැන්න ලබාගත හැක. මන්ද ගොවීන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වන්නේ ජල ප්‍රශ්නය යි. ඒ සඳහා කෙටිකාලීන බීජ ලබාදීම ඵලදායි විය හැකිය.

- බීජ නියමිත වේලාවට නොලැබීම ද මෙම වැඩසටහන යටතේ මුහුණ පෑ ප්‍රබල ගැටලුවකි. බීජ ලබා දීම නියමිත වේලාවට සිදු වුවා නම් මෙම වැඩසටහන මීටත් වඩා ඵලදායි වන්නට තිබිණි.

**සාකච්ඡා අංක 5.4.8 - 'සරුකෙතයාය' වැඩසටහන- අනුරාධපුර දිස්ත්‍රික්කය- පුද්ගල සාකච්ඡාව**

**ධම්මිකා දිසානායක මහත්මිය - වී සහ ගෙවතුවගා ගෙවිළියක්**

අනුරාධපුර නාච්චදූව ව්‍යාපාරය යටතේ අක්කර 02ක කුඹුරක් වගා කරයි. තුරුවිල වැව යටතේ ගොවීහු 20දෙනෙක් සරුකෙතයාය වැඩසටහනට සහභාගී වූහ. අනුරාධපුර අන්තර් පළාත් කෘෂිකර්ම කාර්යාලය මඟින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ අතර ශ්‍රාවස්තිපුර කෘෂිකර්ම උපදේශක මහතා විසින් මෙම වැඩසටහන මෙහෙයවන ලදී. 2009/2010 මාස් කන්නයේ දී සරුකෙතයාය සමිතිය පිහිටුවන ලදී.

වී වගාව සම්බන්ධයෙන් ගොවීන් මෙතෙක් දැනුවත් වී නොසිටි පැති කිහිපයක් පිළිබඳව නව දැනුම ලබාදීමක් මෙම වැඩසටහන යටතේ සිදු කළ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් තුළින් ලබා දී ඇත. පැරෂුට් ආදර්ශන වැඩසටහන ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවූ අතර ඒ යටතේ ට්‍රේස්වල බීජ දමා පැළ සෑදුණු පසු දින 14ක් පමණ ගත වූ පසු කුඹුරට ගෙනගොස් නියමිත පරතරයක් සහිතව කුඹුරට පැළ විසිකිරීම කර ඇත. දහයියා පොහොරක් ලෙස භාවිතා කිරීම සඳහා අඟුරු ලෙස පුච්චාගන්නා ආකාරය ගැන දැනුවත්වීම කර ඇති අතර ගොවීන් එම ක්‍රමය ප්‍රායෝගිකව අනුගමනය කිරීමට පටන්ගෙන ඇත. කාබනික පොහොර සාදාගන්නා ආකාරය පිළිබඳව එක් දින පුහුණු වැඩමුළුවක් සඳහා ගොවීන් කණ්ඩායම මාකඳුර කෘෂිකර්ම පර්යේෂණ ආයතනයට රැගෙන ගොස් කාබනික පොහොර නිෂ්පාදනය පමණක් නොව යෙදීමේ වැදගත්කම ආශ්‍රිත පසුබිම් කරුණු පිළිබඳව ද අවබෝධයක් ලබාදී තිබේ. මෙම වැඩසටහනට අමතරව කෘෂිකර්ම උපදේශක මහතා විසින් ගොවි කණ්ඩායමේ ගොවීන්ගේ ගෙයක් ගෙයක් පාසා ගොස් කාබනික පොහොර සාදාගන්නා ආකාරය පිළිබඳව පුහුණුවක් ලබාදීමට පියවර ගෙන ඇත. කුඹුරු සීසෑමට පෙර ඇල්බීසියා අතු සහ පිදුරු කුඹුරට යෙදීමට ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ද කරන ලදී.අක්කර එකට යොදමින් සිටි මූලික පොහොර ප්‍රමාණය සීමාකර වී වගාවේ නිෂ්පාදන වියදම අඩුකිරීමට ක්‍රියාකළේ ය. කෘමිනාශක භාවිතය කරන අවධිය වනවිට(2008 වර්ෂය) අක්කර එකක අස්වැන්න බුසල් 75-80ක් විය. එහෙත් වැඩසටහන යටතේ සිදු කරන ලද නව තාක්ෂණික උපක්‍රම පිළිබඳව දැනුවත්වීමත් එම ක්‍රම ක්‍රියාවට නැඟීමත් නිසා අක්කර එකක අස්වැන්න බුසල් 120-130 දක්වා ඉහළ යාම නිසා මෙම වැඩසටහන ගොවීන්ගේ පැසසුමට ලක් වී ඇත.

ගොඩ ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන යටතේ පාංශුඛාදනය අඩුකරන ක්‍රමවේද ලෙස වැටි දමන ආකාරය පිළිබඳව දැනුවත් කිරීම් කරන ලදී. එක් ගොවි මහතෙකුගේ ඉඩමක් තෝරාගෙන එහි ආදර්ශනයක් ද ක්‍රියාත්මක කරන ලදී. මෙම ගම්මානය අඹ ගම්මානයක් ලෙස සංවර්ධනය කිරීමේ අරමුණින් 50%ගොවි දායකත්වය යටතේ එක් එක් ගොවියාට අවශ්‍ය තරම් අඹ පැළ ලබාදීම ද සිදු විය. මී මැසි පාලනය පුහුණුව ද ලබාදුණි. විසිදෙනකුගෙන් සමන්විත සමිතිය යටතේ අරමුදලක් පිහිටුවා ඇති අතර වර්තමානය වන විට රුපියල් 22,197ක මුදලක් පවතී. මෙම මුදල තව දුරටත් වර්ධනය කරගැනීමට ගොවීන් කණ්ඩායම බලාපොරොත්තුවන අතර සරුකෙතයාය නමින් ගිණුමක් අරඹා එය තැන්පත් කර තිබේ.

මෙම ගොවි පිරිස සම්බන්ධ කරගෙන ගොවි ක්ෂේත්‍ර පාසලක් ද අරඹා ඇත. මෙමඟින් ගොවි ද්‍රව්‍යවල මිල හැසිරීමට පිළිබඳව හා ඒ අනුව බෝග වගා කිරීම, පැළ බද්ධ කිරීම ආදිය කරයි. ඊට අමතරව මෙම ගොවීන් කණ්ඩායම විසින් ගෙවතු වගාව යටතේ එළවළු වගාව කරන අතර ඒ සඳහා කාබනික පෙහොර භාවිතා කරයි. මිරිස්, කැකිරි, ගෝවා, බෝංචි, වැටකොළු දඹල වැනි කුඩා ගොවිපළ ගෙවතු ආශ්‍රිතව වගාකිරීම කරගෙන යයි.

**සාකච්ඡා අංක 5.4.9 - පී. එඩ්මන්ඩ් මහතා- කෝන්වැව- වී වැව ගොවි මහතෙකි. බිත්තර වී නිෂ්පාදනය**

අනුරාධපුර අන්තර් පළාත් කෘෂිකර්ම කාර්යාලයේ මැදිහත්වීම මත 2008 වර්ෂයේ ගොවීන් 20 දෙනෙකුගෙන් සමන්විත ගොවි කණ්ඩායමක් පිහිටුවන ලදී. මෙම ගොවීන් කණ්ඩායම ද නාච්චදූව ව්‍යාපාරය යටතේ වී වගා ගොවීන් වූ අතර "අපි වවමු- රට නගමු" වැඩසටහන යටතේ වී වගාව දියුණු කිරීම සඳහා නව තාක්ෂණය භාවිතය හා බිත්තර වී නිෂ්පාදනය සඳහා පුහුණු කිරීම සිදු කරන ලදී. බී.ජී. 352, බී.ජී.358, බී.ජී.300 යන වර්ගවලට අයත් බීජ වී ගොවීන්ගේ කැමැත්ත පරිදි 50% ගොවියෙකු හට බුසල් දෙක බැගින් බීජ වී ගබඩාවෙන් ගොවීන්ට නිකුත් කරන ලදී. බිත්තර වී වගාව සඳහා අවශ්‍ය වෙනත් දැනුවත් කිරීම් සිදුකරන ලද අතර මේවායින් නිෂ්පාදනය කරනු ලබන බිත්තර වී ගොවීන්ටම සැපයීම මඟින් ඉහළ මිලක් ලබාගත හැකිවිය. මෙම වැඩසටහන ඇරඹීමට පෙර අක්කරයක සාමාන්‍ය අස්වැන්න බුසල් 90-95 මට්ටමක පැවති අතර වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් පසු අනුගමනය කරන ලද උපදෙස් නිසා සාමාන්‍ය අස්වැන්න බුසල් 100-110 වැනි ඉහළ මට්ටමකට පත්විය. මීට අමතරව කුඹුර හාන්නේ නොමැතිව ඉපනැල්ලට වී වැපිරීමේ ආදර්ශන, පේළියට දැමීමේ ආදර්ශන, පැරෂුට් ක්‍රමයට වී වගාව යන නව තාක්ෂණික ක්‍රම පිළිබඳව ද ප්‍රායෝගික පුහුණුව ගොවීන්ට ලබා දී ඇත. පිදුරු කුඹුරට යෙදීමට ගොවීන් හුරු කරවා ඇත. මේ පුහුණු නිසා ගොවීන්හට වී වගා කිරීමේ විවිධ ක්‍රම හා උසස් ප්‍රතිලාභ ලබාගත හැකි වී ඇත. එම නිසා ආර්ථිකය ද දියුණුවීමට හේතු වී ඇත.

වී වගාවට අමතරව මෙම ගොවීන් කණ්ඩායම කාබනික පොහොර නිෂ්පාදනය හා කුඩා පරිමාණයෙන් ගෙවතුවල එළවළු වගාවට යොමු කරවා ඇත. කාබනික පොහොර නිපදවීම මෙම ගොවි මහතා විසින් ද සිදු කරන අතර ගෙවත්තේ පවුලේ පරිභෝජනයට අවශ්‍ය තරම් එළවළු නිපදවා ගැනීම සිදු කරයි. ගොඩ සහ මඩ ගොවිතැන සම්බන්ධයෙන් මෙම පුහුණු හා දැනුවත් කිරීම්වලින් ලැබුණු දැනුම ගොවීන්ගේ ගොවි ජීවිතයට ආර්ථිකමය වශයෙන් ප්‍රතිලාභ අත්කරදෙන බව මෙම ගොවි මහතා ප්‍රකාශ කරයි.

වී වගා නව තාක්ෂණික ක්‍රම, කොම්පෝස්ට් භාවිතය සම්බන්ධ ගොවි ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රම 'අපි වවමු රට නගමු' වැඩසටහන යටතේ සිදු කර ඇති ආකාරය ඉහත සිද්ධි අධ්‍යයන මඟින් විස්තර කෙරේ.

## 5.5 පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - නැගෙනහිර පළාත

නැගෙනහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 'අපි වවමු රට නගමු' වැඩසටහන යටතේ කෘෂිකාර්මික සංවර්ධනය වෙනුවෙන් සිදු කරන ලද කාර්යයන් පහත පරිදි දැක්විය හැකිය.

### 5.5.1 ක්ෂේත්‍ර මට්ටමේ ගොවි පුහුණු වැඩසටහන්

කෘෂිකාර්මික උපදේශකවරුන් කෘෂි උපදේශක කලාපය හා දිස්ත්‍රික්ක මට්ටමේ විෂය භාර නිලධාරීන්ගේ ද සහයෝගය ඇතිව ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් විවිධ විෂය ක්ෂේත්‍ර ඇතුළත්ව 2010 වර්ෂයේ දී ක්‍රියාත්මක කර තිබේ.

### 5.5.2 දිස්ත්‍රික් කෘෂිකාර්මික පුහුණු මධ්‍යස්ථාන

දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යෂ්ඨාන ත්‍රිකුණාමලය, අම්පාර, මඩකලපුව දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වේ. මෙම මධ්‍යස්ථාන විශේෂිත ක්ෂේත්‍රයන් සම්බන්ධව ප්‍රායෝගික පුහුණු සැපයීම හා නවාතැන් පහසුකම් සැපයීම සිදු කර ඇත. ගොවීන්ට පාසැල් සිසුන්ට හා වෙනත් නිලධාරීන්ට කෘෂිකර්මාන්තයේ අලුත්ම තාක්ෂණය භාවිතා කරන අයුරු ප්‍රායෝගිකව නැරඹිය හැකි ආදර්ශ ගොවිපළ ලෙස ද මෙම ගොවිපළවල් ක්‍රියාත්මක වේ.

### 5.5.3 කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය

කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය වැඩිකිරීම ගොවීන් අතර ප්‍රචලිත කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙවලම් කට්ටල, පුහුණු පංති හා යෙදවුම්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නොමිලේ ලබා දී ඇත. මෙ වැඩසටහන යටතේ වී,අතිරේක බෝග, පලතුරු සහ එළවළු ප්‍රායෝගික ලෙස වගා කර ඇති අතර එම සෑම ගොවියෙකුටම කාබනික පොහොර ලබා දී ඇත.

### 5.5.4 පුහුණු පංති පැවැත්වීම

නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක තුනෙහි ගොවි පුහුණු පංති සහ ආදර්ශන 109ක් පවත්වා ඇති අතර ඒ සඳහා ගොවීන් 2271ක් දෙනෙකු සහභාගී වී ඇත.

### 5.5.5 බිත්තර වී නිෂ්පාදන වැඩසටහන

'අපි වවමු රට නගමු' වැඩසටහන යටතේ බිත්තර වී නිෂ්පාදන වැඩසටහනක් නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක තුනෙහි 2010 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව දිස්ත්‍රික්ක තුන සඳහාම බිත්තර වී බුසල් 940ක් අක්කර 320ක් ප්‍රමාණයක් සඳහා ගොවීන් 201 දෙනෙකු යටතේ බෙදා දී ඇත.

### 5.5.6 මුං බීජ නිෂ්පාදන වැඩසටහන

නැගෙනහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ප්‍රදේශයේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මුං බීජ නිෂ්පාදන වැඩසටහනක් අරඹා තිබුණි. මේ යටතේ ගොවීන්ට මුං බීජ නිකුත් කර තිබූ අතර අක්කර 48.5ක වපසරියක් සඳහා ගොවීන් 100 දෙනෙකු සඳහා මුං බුසල් 550ක් බෙදා දී තිබුණි. මොවුන් විසින් මුං බීජ නිෂ්පාදනය කර දෙපාර්තමේන්තුව වෙත ලබාදිය යුතුය.

## 5.6 බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය

**වගු අංක 5.6.1 : බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය "අපි වවමු- රට නගමු" වැඩසටහන යටතේ 2008 වර්ෂයේ දී සිදු කරන ලද කාර්යයන්**

| සිදු කරන ලද ක්‍රියාකාරකම් | 2008 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම රු. මිලියන | 2008 අවසාන කාර්තුවේ දී භෞතික ප්‍රගතිය |
|---|---|---|
| යතුරුපැදි මිලදීගැනීම | 3.8 | 30% |
| සංයුක්ත කොළමඩින යන්ත්‍ර මිලදීගැනීම | 10.5 | 2% |
| පැල්වෙහෙර ශීතාගාරයක් ඉදිකිරීම | 16.0 | 3% |
| උසස් ක්‍රියාකාරීත්වයක් සහිත කොළමඩින යන්ත්‍ර මිලට ගැනීම | 1.2 | 2% |
| කුන්ඩසාලේ හා කන්තලේ කෘෂි ළිං ඉදිකිරීම | 2.0 | 2% |
| ගබඩා නවීකරණය | 1.4 | 7% |
| වියලන මිදුල් ඉදිකිරීම | 1.0 | 1% |
| දුම් ගැසීමේ ටැංකි මිලදීගැනීම | 0.5 | 1% |
| පාංශු සංරක්ෂණ ක්‍රියාකාරකම් | 3.0 | 25% |
| භාවිතයට නොගත් ඉඩම් සංවර්ධනය කිරීම හා වාර්ෂික හා බහුවාර්ෂික බෝග වගා කිරීම | 5.6 | 100% |
| එකතුව | 45.0 | |

මූලාශ්‍රය: කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### 5.6.1: බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය "අපි වවමු - රට නගමු" වැඩසටහන යටතේ 2009 වර්ෂයේ දී සිදු කරන ලද කාර්යයන්

2009 වර්ෂයේ දී හෙක්ටයාර් 4.8ක බහුවාර්ෂික බෝග අලුතෙන් වගා කිරීම, රඹුටන් සහ කජු හෙක්ටයාර් 11ක වගාව නඩත්තු කිරීම සඳහා රුපියල් මිලියන 1.15ක් ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම වසරේ අවසාන කාර්තුවේ දී මෙම මුදලින් වැය කර තිබූ ප්‍රමාණය වූයේ 5%කි. එම නිසා එහි ප්‍රගතිය එතරම් සතුටුදායක තත්ත්වයක නොතිබුණි. සීතාඑළිය ගොවිපළේ ශීතාගාරයක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 10.8ක් වෙන් කර තිබුණි. සංයුක්ත අස්වනු නෙළීමේ යන්ත්‍ර 2ක් මිලදී ගැනීම සහ බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීම සඳහා රුපියල් මිලියන 5.05ක් වෙන්කර තිබුණි.

## 5.6.2: බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය "අපි වවමු - රට නගමු" වැඩසටහන යටතේ 2010 වර්ෂයේ දී සිදු කරන ලද කාර්යයන්

සියලුම රජයේ ගොවිපළවල දැල් ගෘහ ගොඩනැගීම සඳහා රුපියල් මිලියන 1.5ක් වෙන් කර තිබුණි. අළුත්තරම, මිද්දෙනිය, අඹේපුස්ස යන කෘෂිකර්ම මධ්‍යස්ථානවල මව්ශාක උද්‍යාන ගොඩනැගීම සඳහා රුපියල් මිලියනයක් වෙන් කර තිබුණි. 2010 අවසාන කාර්තුව වන විට හෙක්ටයාර් පහක මව් ශාක උද්‍යාන ගොඩනගා තිබුණි. බහුවාර්ෂික බෝග වගාව නඩත්තු කිරීම(අළුත්තරම- කජු,අඹේපුස්ස- කෙසෙල් සහ රඹුටන්, කන්තලේ - කජු, මහඉලුප්පල්ලම කජු සහ පැපොල්, මිද්දෙනිය - කෙසෙල්) සඳහා රුපියල් මිලියන 0.85ක් ප්‍රතිපාදන ලබා දී තිබූ අතර හෙක්ටයාර් 05 ප්‍රමාණයක නඩත්තු කර තිබුණි. වාරිමාර්ග පහසුකම් සංවර්ධනය සහ බීජ අර්තාපල් ආරක්ෂිත ගෘහ නඩත්තු කිරීම (සීතාඑළිය) සඳහා රුපියල් මිලියන 2.4ක් වෙන් කර දී තිබුණි.

**වගු අංක 5.6.2: අතිරේක ආහාර බෝග ආනයනය (මෙ.ටො)**

| බෝගය | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2008ට සාපේක්ෂව වෙනස්වීමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|
| රතුළූණු | 26,890 | 16,207 | 11,907 | 6,807 | 7017 | 74% |
| ලොකු ළූණු | 146,623 | 143,274 | 158,086 | 176,730 | 145,911 | 5% |
| බඩඉරිඟු | 83,194 | 28,033 | 10,506 | 8,244 | 2,782 | 97% |
| මිරිස් | 34,942 | 36,218 | 37,762 | 42,781 | 40,665 | 16% |
| මුංඇට | 13,728 | 14,182 | 11,514 | 10,447 | 7,911 | 42% |
| කව්පි | 745 | 429 | 45 | 905 | 667 | 10% |
| සෝයා බෝංචි | 2,444 | 1,790 | 1,610 | 38 | 100 | 96% |
| රටකජු | 4,174 | 4,004 | 4,604 | 4,920 | 1,791 | 57% |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඉහත දත්ත අනුව රතුළූණු, බඩඉරිඟු, සෝයා බෝංචි ආනයනය 2008 වර්ෂයේ ආනයනවලට සාපේක්ෂව 70%කට වඩා අඩු වී ඇති බව පෙනේ. වියළි මිරිස් ආනයනය වැඩි වී ඇත. 'අපි වවමු රට නගමු' වැඩසටහන යටතේ 2010 වර්ෂය වන විට රතුළූණු, බඩඉරිඟු, කව්පි, සෝයා බෝංචි, රට කජු, කුරක්කන් යන බෝග වර්ග ආනයනය 100%කින් අඩු කිරීමට අපේක්ෂා කරන ලදී. එම අපේක්ෂාව ඉටු කරගැනීමට හැකි වී ඇත්තේ බඩඉරිඟු සහ සෝයා බෝංචි සම්බන්ධයෙන් පමණි. රතුළූණු සහ රට කජු ආනයනය අඩු කිරීම ඉටුකරගත හැකි වී ඇත්තේ සුළු ප්‍රමාණයකින් පමණි.

'අපි වවමු රට නගමු' වැඩසටහන යටතේ 2008-2010 කාලය තුළ දී කෘෂි බෝගවල දේශීය නිෂ්පාදනය වැඩිකර ආනයනය කරනු ලබන ප්‍රමාණය 50% සිට 100% දක්වා එක් එක් බෝග සම්බන්ධයෙන් පහත සඳහන් ආකාරයට අඩු කිරීමට අපේක්ෂා කරන ලදී (අපි වවමු රට නගමු සැලැස්ම, 2007).

**වගු අංක 5.6.3 : එක් එක් බෝග සම්බන්ධයෙන් ආනයනය අඩු කිරීමට අපේක්ෂා කරන ලද ප්‍රතිශතය**

| බෝගය | ආනයනය අඩු කිරීමේ ප්‍රතිශතය | | |
|---|---|---|---|
| | 2008 | 2009 | 2010 |
| රතුළූණු | 80 | 100 | 100 |
| ලොකු ළූණු | 30 | 32 | 50 |
| බඩඉරිඟු | 100 | 100 | 100 |
| මිරිස් | 17 | 30 | 50 |
| මුංඇට | 40 | 84 | 90 |
| කව්පි | 100 | 100 | 100 |
| සෝයා බෝංචි | 100 | 100 | 100 |
| උඳු | 83 | 90 | 100 |
| රටකජු | 100 | 100 | 100 |
| කුරක්කන් | 80 | 100 | 100 |

මූලාශ්‍රය: 'අපි වවමු රට නගමු' සැලැස්ම

**වගු අංක 5.6.4: දේශීය නිෂ්පාදනය වැඩි කිරීම**

| බෝගය | වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 2007 | 2008 | 2009 | 2010 |
| රතුළූණු | 57,040 | 49,290 | 48,230 | 61,807 |
| ලොකු ළූණු | 92,160 | 57,370 | 81,710 | 58,930 |
| බඩඉරිඟු | 56,440 | 112,290 | 129,770 | 161,690 |
| මුං ඇට | 8,520 | 8,880 | 9,260 | 11,700 |
| කව්පි | 10,850 | 11,950 | 13,480 | 11,610 |
| සෝයා බෝංචි | 4,799 | 3,032 | 7,521 | 7,521 |
| උඳු | 7,747 | 9,477 | 7,071 | 9,991 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ලොකු ළූණු හැර ඉහත දක්වා ඇති සියලුම අතිරේක බෝග නිෂ්පාදන ප්‍රමාණය 2007 වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේ දී වැඩි වී ඇත.

## 5.7 උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධනය

### 5.7.1 උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් සිදු කළ කාර්යයන් හි ප්‍රගතිය

උද්‍යාන බෝග පර්යේෂණ ආයතනය විසින් 2011 වර්ෂයේ දී බීජ හා රෝපණ ද්‍රව්‍ය බෙදාදීම යටතේ ගම්මාන තුනක ප්‍රතිලාභීන් 75 දෙනෙකු සඳහා පලතුරු පැළ, එළවළු බීජ, බිම්මල් බීජ, අල බෝග සහ කොළ එළවළු වර්ග බෙදා දී ඇත. පුහුණු වැඩසටහන් 20ක් පවත්වා ඇති අතර එක් එක් පුහුණු වැඩසටහන් සඳහා ආදර්ශන පවත්වා තාක්ෂණික පත්‍රිකා ද ලබා දී ඇත. යෙදවුම් සැපයීම යටතේ පෑන්, පොත් සහ ලිපි ගොනු ලබාදීම, රසායනික පොහොර වර්ග 3ක් සහ අත් පිස්නා සහ මල් බාල්දි ලබා දී ඇත. කොම්පෝස්ට් සෑදීම සඳහා පොලිතීන් ගම්මාන 3ටම ලබා දී ඇති අතර මී මැසි පාලනය සඳහා මී මැසි ජනපද පෙට්ටි 20ක් ද ඇණවුම් කර ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථාන ගණනාවක් ඇති අතර මෙම වැඩසටහන යටතේ එම මධ්‍යස්ථානවලින් බීජ හා රෝපණ ද්‍රව්‍ය පුහුණු වැඩසටහන් හා ආදර්ශන යෙදවුම් හා සැපයුම් සිදු කර ඇති අතර ඒ පිළිබඳව පහතින් විග්‍රහ කෙරේ.

ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ ඒකකය විසින් 2011 වර්ෂයේ දී ප්‍රතිලාභීන් 30 දෙනෙකු සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය බෙදා දී ඇත. මේ සඳහා වියදම රුපියල් 87,253.00කි. මාකඳුර ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විසින් 2011 වර්ෂයේ දී ප්‍රතිලාභීන් 24 දෙනෙකු සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය බෙදා දී ඇත. මේ සඳහා රුපියල් 320,223.00ක් වැය කර ඇත. තෙලිජ්ජවිල කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය විසින් 2011 වර්ෂයේ දී බීජ හා රෝපණ ද්‍රව්‍ය බෙදාදීම යටතේ ප්‍රතිලාභීන් 23 දෙනෙකු සඳහා කෙසෙල් පැළ 200ක්, අන්නාසි පැළ 1,100ක් ද ගොවීන් 08 දෙනෙකු සඳහා පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය ද බෙදා දී ඇත. මේ සඳහා රුපියල් 439,755.00ක් වැය වී ඇත.

වාගොල්ල, එරමිනිගොල්ල, පස්යාල, වල්පිට උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයන් හි පලතුරු අංශය විසින් 2011 වර්ෂයේ දී බීජ හා රෝපණ ද්‍රව්‍ය බෙදාදීම යටතේ ගොවීන් 120 දෙනෙකු සඳහා පලතුරු පැළ 250ක් සහ බීජ කට්ටල 50ක් බෙදා දී ඇත. පුහුණු වැඩසටහන් 12ක් පවත්වා ගොවීන් 200කට පුහුණුව ලබා දී ඇත. ආදර්ශන 10ක් ස්ථාපිත කොට ඇත. කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම සඳහා මුහුන් පැකට් 60ක් සහ පොලිතීන් 50ක් ලබා දී ඇත. රඹුටන් සහ කෙසෙල් වගා පුනරුත්ථාපනය යටතේ ගොවීන් 10 දෙනෙකු සම්බන්ධ කරගනිමින් පලතුරු වගා අක්කර 10ක් ක්‍රමවත් කර ඇත. මේ සඳහා රුපියල් 160,200ක් වැය කර ඇත. උල්පතගම උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපළ විසින් 2011 වර්ෂයේ දී බීජ හා රෝපණ ද්‍රව්‍ය බෙදාදීම යටතේ ගොවීන් 13 දෙනෙකු සඳහා පැපොල් පැළ 240ක් බෙදා දී ඇත. පැපොල් වගාව සඳහා පුහුණු වැඩසටහනක් පවත්වා පුහුණු කර ඇත. මේ සඳහා රුපියල් මිලියන එකක් වැය විය.

මොණරාගල කෘෂිකර්ම පර්යේෂණ ගොවිපළ විසින් 2011 වර්ෂයේ දී බීජ හා රෝපණ ද්‍රව්‍ය බෙදාදීම යටතේ ගොවීන් 41 දෙනෙකු තෝරාගෙන ඇත. මේ සඳහා රුපියල් 91,694.00ක් වැය කර ඇත.

## හයවැනි පරිච්ඡේදය

## කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය

*"අපි වවමු රට නගමු" වැඩසටහනේ තවත් උප වැඩසටහනක් වූ කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහනේ ප්‍රගතින් හා එය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපායයන් කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීමේ දී රටේ විවිධ ප්‍රදේශවල දී මුහුණ දීමට සිදු වූ අපහසුතා හා එම දුර්වලතා මඟහරවාගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග මෙම පරිච්ඡේදය යටතේ විස්තර කරයි.*

### 6.0 කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන

### 6.1 හැඳින්වීම

අතීතයේ සිට ශ්‍රී ලාංකිකයන් සිය වගාවන් සඳහා කාබනික පොහොර හා සත්ත්ව අස්ථි යනා දී ස්වාභාවික දෑ යොදා ගන්නා ලදී. කාබනික පොහොර ලෙස හඳුන්වනු ලබනුයේ ශාක කොටස් හෝ සත්ත්ව අපද්‍රව්‍ය වේ. ගොම, කුකුළු පොහොර, එළු පොහොර, පිදුරු, කොළ පොහොර, කුණු රොඩු, කොම්පෝස්ට් යනාදිය බෝග වගාවේ දී යොදා ගනු ලබන ප්‍රධාන කාබනික පොහොර වර්ග වේ. 1950 දශකයේ හඳුන්වාදුන් හරිත විප්ලවයත් සමඟ සංවර්ධනය වෙමින් පවතින රටවලට හඳුන්වාදුන් වැඩි දියුණු කළ ප්‍රභේදවලට අයත් බීජ හා රසායනික පොහොර සඳහා දේශීය ගොවීන් අනුගත වූ අතර එතෙක් භාවිතා කරමින් සිට කාබනික පොහොරින් ඉවත්වීම ක්‍රමයෙන් සිදු වීය. 1970 දශකයේ සිට බොහෝ ගොවීන් රසායනික පොහොර පමණක් සිය වගාවලට භාවිතයට පුරුදුවීම නිසා අදවන විට පසේ සාරවත්භාවය පිරිහී බෝග වගාවන් ආර්ථිකමය වශයෙන් වාසිදායක නොවන තත්ත්වයකට පත් වී ඇත. රසායනික පොහොර ආනයනය සඳහා වාර්ෂිකව විශාල විදේශීය විනිමය ප්‍රමාණයක් වැය කරනු ලබන අතර දිනෙන් දින ලෝක වෙළඳපළේ රසායනික පොහොර මිල ඉහළ යමින් පවතී. මෙම තත්ත්වය ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටවලට දරාගැනීම ඉතා අපහසු වී ඇත. දිවයිනේ බොහෝ ප්‍රදේශවල පසේ අඩු සාරවත් බවක් ඇති බව සිදු කරන ලද පර්යේෂණ ගණනාවකට අනුව පෙනී ගොස් ඇත. පසේ සමස්ත සාරවත්භාවය රැකගැනීම සඳහා ක්‍රමානුකූලව කාබනික පොහොර හා රසායනික පොහොර යන දෙවර්ගයම යෙදිය යුතු වේ. තව ද මේ ආශ්‍රිතව සිදු කරන ලද පර්යේෂණවලින් පෙන්වා දී ඇත්තේ කාබනික පොහොර යෙදීම මඟින් බෝගවලට යොදනු ලබන නිර්දේශිත රසායනික පොහොර ප්‍රමාණයෙන් 25% ප්‍රමාණයක් අඩු කර යෙදිය හැකි බවය.

කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීම 'අපි වවමු - රට නගමු' වැඩසටහනෙහි 2008 වර්ෂයෙහි අපේක්ෂිත ක්‍රියාකාරකමකි. කාබනික පොහොර

දිරිගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ඒකකයක් බත්තරමුල්ල කෘෂිකර්ම අමාත්‍යාංශයේ ස්ථාපිත කරනු ලැබ ඇත. මේ සඳහා කැප වූ නිලධාරී මණ්ඩලයක් මාර්ගයෙන් කාබනික පොහොර දිරිගැන්වීමේ වැඩසටහන දිවයින පුරා ක්‍රියාත්මක කිරීම අරඹා ඇත. නව තාක්ෂණික ක්‍රමවේද මගින් උසස් ප්‍රමිතියෙන් යුත් කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතයට ගොවීන් නැඹුරු කිරීම ද මෙමගින් සිදු කරනු ලැබේ.

### 6.1.1 ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු:

1. රසායනික පොහොරවලට අමතරව කාබනික පොහොර භාවිතය හඳුන්වාදීම තුළින් පසේ සාරවත් බව වැඩිකර බෝග අස්වැන්න වැඩි කිරීම.

2. කාබනික පොහොර නිෂ්පාදනය ඉහළ නැංවීම හා ගොවින් කාබනික පොහොර භාවිතයට නැඹුරු කරවීම.

3. කාබනික පොහොර නිෂ්පාදනය සඳහා තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වාදීම තුළින් ප්‍රමිතියෙන් යුත් කාබනික පොහොර නිෂ්පාදනයට යොමු කිරීම.

4. කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීම තුළින් රසායනික පොහොර භාවිතය අඩු කිරීම.

### 6.1.2 ක්‍රියාකාරකම්:

1. කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ ගොවීන්, පාසැල් සිසුන්, කාබනික පොහොර නිෂ්පාදකයින් ආදී සමාජයේ විවිධ තරාතිරම්වල අය පුහුණු කිරීම.

2. කුඩා පරිමාණ කොම්පෝස්ට් නිෂ්පාදකයින් සඳහා කොම්පෝස්ට් නිෂ්පාදනයට අවශ්‍ය උපකරණ කට්ටල හා මුහුන් ලබා දී ඒ ඒ අයට අවශ්‍ය කාබනික පොහොර ඔවුන් අතරේම නිෂ්පාදනය කරවීම.

3. කොම්පොස්ට් හා මුහුන් නිෂ්පාදනය.

4. කොම්පෝස්ට් නිෂ්පාදන පිළිබඳව ආදර්ශන ගොවිජන සේවා මධ්‍යස්ථානවල හා කෘ.ප.නි.ස කොට්ඨාසවල පිහිටුවීම.

5. රසායනික පොහොර භාවිතය අඩුකර කාබනික පොහොර භාවිතා කිරීම තුළින් වැඩි අස්වැන්නක් ලබාගත හැකිබව පෙන්වීම සඳහා ආදර්ශන පැවැත්වීම.

6. කොළ පොහොර නිෂ්පාදනය වැඩි කිරීම.

7. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාංශු රසායනාගාරවල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් කොම්පෝස්ට් පස් හා වෙනත් දෑ ගොවීන්ට විශ්ලේෂණය කරගැනීමට අවස්ථාවන් සලසා දීම.

8. කාබනික පොහොර නිෂ්පාදන ගම්මාන පිහිටුවීම.

9. පාසැල් ආශ්‍රිත කොම්පෝස්ට් නිෂ්පාදන ඒකක පිහිටුවීම.

10. කොම්පෝස්ට් ආශ්‍රිත පර්යේෂණ පැවැත්වීම.

### 6.1.3 ප්‍රතිලාභ:

1. බෝග අස්වැන්න වැඩිවීම.

2. කාබනික පොහොර භාවිතය තුළින් බෝගවලට යොදන රසායනික පොහොර ප්‍රමාණය අඩුකරගැනීම.

3. කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ඉහළයාමු,

4. කාබනික පොහොර සඳහා වෙළඳපොළක් ඇතිවීම.

5. කාබනික අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය තුළින් යහපත් පරිසරයක් නිර්මාණය වීම.

6. කාබනික පොහොර භාවිතයට යොමුවීම තුළින් සමස්ත ජනතාවට සමාජීය, ආර්ථිකමය හා සෞඛ්‍යමය සහන රැසක් හිමිවීම.

7. රැකී රක්ෂා උත්පාදනය.

### 6.1.4 ක්‍රියාත්මක කරන ආයතන:

කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ශ්‍රී ලංකා හදබිම අධිකාරිය හා ආහාර ප්‍රවර්ධන මණ්ඩලය.

2008, 2009, 2010, 2011, 2012 යන වර්ෂ 5 තුළ දී කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන යටතේ සිදු කරන ලද ක්‍රියාකාරකම් හා එහි මූල්‍ය ප්‍රගතියන් පහත සඳහන් වගු අංක 6.1- 6.8 දක්වා සඳහන් කර ඇත.

## 6.1.5 කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන (2008 – 2011)

**වගු අංක 6.1 : කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන (2008 – 2011)**

| අනු අංකය | විස්තරය | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| 1 | ප්‍රතිපාදන | 50 | රු.මි. 359.2 | රු.මි. 200 | රු.මි. 295 |
| 2 | වියදම | 48.67 | රු.මි. 185.7 | රු.මි. 136.55 | රු.මි. 242.5 |
| 3 | ප්‍රතිශතය | 97.34% | 51.70% | 68.27% | 82.20% |

මූලාශ්‍රය: කෘෂිකර්ම අමාත්‍යාංශය - කාබනික පොහොර විශේෂ ඒකකය

කාබනික පොහොර නිෂ්පාදනය සම්බන්ධ තාක්ෂණය ගොවිජනතාවට ලබාදීම සඳහා 2008-2011 දක්වා සිදු කරන ලද ප්‍රායෝගික වැඩසටහන් පහත සඳහන් වගුවෙන් දැක්වේ.

වගු අංක 6.2 :භෞතික ප්‍රගතිය 2008-2011

| අනු අංකය | ක්‍රියාකාරකම් | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| 1 | කොම්පෝස්ට් නිෂ්පාදනය | මෙ.ටො. 7760 | මෙ.ටො. 39,300 | මෙ.ටො. 46,638 | මෙ.ටො. 1,23,000 |
| 2 | කාබනික පොහොර නිෂ්පාදන ගම්මාන පිහිටුවීම | ගොවීන් 3500 | ගොවීන් 12,337 | ගොවීන් සංඛ්‍යාව- 5,314 | ගොවීන් සංඛ්‍යාව 58,000 |
| 3 | ගොවිජන සේවා මධ්‍යස්ථාන ආශ්‍රිත කොම්පෝස්ට් ආදර්ශන ස්ථාපිත කිරීම | ආදර්ශන සංඛ්‍යාව 471 | පාසැල් සංඛ්‍යාව 630 | පාසැල් සංඛ්‍යාව- 512 | පුහුණු පාසැල් සිසුන් සංඛ්‍යාව 66,305 පාසැල් සංඛ්‍යාව- 2,798 |
| 4 | මුහුන් පැකට් බෙදා හැරීම | කි.ග්‍රෑ.5 මුහුන් පැකට් - 1000 | ආදර්ශන සංඛ්‍යාව -16,656 | කි. ග්‍රෑ.5 මුහුන් පැකට්- 13,110 | ආදර්ශන සංඛ්‍යාව 1,100 |
| 5 | ඒකාබද්ධ පැළෑටි පෝෂණ ප්‍රචලිත කිරීමේ ආදර්ශන | ආදර්ශන සංඛ්‍යාව 2016 | කි.ග්‍රෑ. 5 මුහුන් පැකට් -18,976 | ආදර්ශන- 2,839 | කි. ග්‍රෑ.5 මුහුන් පැකට් 29,327 |
| 6 | කාබනික පොහොර නිෂ්පාදකයින් ලියාපදිංචි කිරීම | ලියාපදිංචි නිෂ්පාදකයින් - 1 | ආදර්ශන සඛ්‍යාව 933 | ආදර්ශන- 2,378 | ආදර්ශන 3,234 |
| 7 | කොම්පොස්ට් ආශ්‍රිත පර්යේෂණ | පර්යේෂණ සංඛ්‍යාව 19 | ආදර්ශන සඛ්‍යාව 3,047 | අක්කර ගණන- 19 | ආදර්ශන 2,660 |
| 8 | සාම්පල/නියැදි විශ්ලේෂණය | සාම්පල් සංඛ්‍යාව 215 | ලියාපදිංචි නිෂ්පාදකයින් සඛ්‍යාව- 374 | ලියාපදිංචි නි.පා.සං 49 | අක්කර ගණන 292 |
| 9 | ගවගාල් වැඩි දියුණු කිරීම | ගොවීන් සඛ්‍යාව 975 | පර්යේෂණ සංඛ්‍යාව- 25 | පර්යේෂණ සංඛ්‍යාව 32 | ලියාපදිංචි නි.පා.සං 45 |
| 10 | මාධ්‍ය වැඩසටහන් | ගුවන් විදුලි වැඩසටහන් 113 පත්‍රිකා 4,10,000 | සාම්පල් සංඛ්‍යාව 881 | සාම්පල් සංඛ්‍යාව 852 | පර්යේෂණ සංඛ්‍යාව- 08 |
| 11 | පුහුණුවීම් හා දැනුවත් කිරීම | පුහුණු සංඛ්‍යාව 72,872 | ගොවීන් සංඛ්‍යාව 244 | රූපවාහිනී වැඩසටහන් 10 ගුවන් විදුලි වැඩසටහන් 483 පත්‍රිකා ප්‍රමාණය(සිංහල/ දෙමළ)- 6,50,000 පුවත්පත් දැන්වීම්- 33 ඩී.වී.ඩී. තැටි නිෂ්පාදනය- 17,000 | සාම්පල් සංඛ්‍යාව 8,638 |
| 12 | පත්‍රිකා බෙදා හැරීම | පත්‍රිකා ප්‍රමාණය 72,774 | රූපවාහිනී වැඩසටහන්- 59 ගුවන් විදුලි වැඩසටහන්- 17 පත්‍රිකා ප්‍රමාණය(සිංහල /දෙමළ)4,95,00 0 පුවත්පත් දැන්වීම්- 12 ප්‍රදර්ශන- 12 | පුහුණු සංඛ්‍යාව- 110,063 | රූපවාහිනී වැඩසටහන් 20 ගුවන් විදුලි වැඩසටහන් 5,520 පුවත්පත් දැන්වීම් 33 ප්‍රදර්ශන 4 ප්‍රචාරණ පුවරු 140 |

මූලාශ්‍රය: කෘෂිකර්ම අමාත්‍යාංශය - කාබනික පොහොර විශේෂ ඒකකය

## 6.2 කාබනික පොහොර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී මුහුණදීමට සිදු වී ඇති ගැටලු

- ගම්පහ ප්‍රදේශයේ ජනතාව බහුතරයක් ප්‍රධාන රැකියාව කෘෂිකර්මය නොව වෙනත් රාජ්‍ය හා පෞද්ගලික අංශවල රැකියා නිසා ඔවුන්ට කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳව කාලවේලාව මදිකම ගැටලුවකි.
- අනුරාධපුර ප්‍රදේශයේ වගා ඉඩම් අක්කර 4 – 5 වැනි විශාල ඒකක වන අතර ඒවාට ප්‍රමාණවත් ලෙස කාබනික පොහොර නිපදවීමට නොහැකි වී ඇත.
- වියළි ස්වභාවය සහ අවශ්‍ය තරම් අමුද්‍රව්‍ය සපයාගැනීමට නොහැකිකම තවත් ගැටලුවකි.
- අනුරාධපුර ප්‍රදේශයේ අඳ හා බදු ඉඩම් වසරින් වසර අඳය හා බද්දට මාරුකරන නිසා කාබනික පොහොර දිරීමට කාලයක් ගතවන නිසා ඊළඟ වසරේ වගා කන්නයේ දී වෙනත් පුද්ගලයෙකුට දෙන නිසා මෙවැනි ඉඩම් සම්බන්ධයෙන් කාබනික පොහොර භාවිතා කිරීමට අපහසු කාර්යයක් බව ගොවීන් කල්පනා කිරීම.
- මාතර ප්‍රදේශයේ කුඹුරු ඉඩම් ගංවතුරට සේ දී යා හැකි බැවින් තම වගාවන්වලට කාබනික පොහොර යෙදීම ප්‍රායෝගික නොවන බව ගොවීන්ගේ මතය බැවින් කාබනික පොහොර නිපදවීමට පෙළඹීමක් නොමැති වීම.
- රසායනික පොහොර ක්ෂණික ප්‍රතිඵල ලබාදීම- කාබනික පොහොර ප්‍රතිඵලදීමට කාලයක් ගතවීම නිසා ද කාබනික පොහොර ජනප්‍රිය වී නැත.
- බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල, කුඹල්වෙල, කිරින්ද, හල්පේ යන ප්‍රදේශවල ගොවීන්ට කාබනික පොහොර නිෂ්පාදනය කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටලුවට මුහුණ දී සිටී. ගොම, කුකුල් පොහොර, පිදුරු ආදී කාබනික පොහොර නිපදවීමට අමුද්‍රව්‍යවල හිඟයක් බදුල්ල දිස්ත්‍රික්කයේ පවතී.
- රසායනික පොහොර මඟින් බෝගවලට ලැබෙන ප්‍රමිතියට සමාන ප්‍රමිතියක් සහිත පෝෂණයක් කාබනික පොහොරවලින් ලැබේද යන්න ගොවීන් සැක කරයි. හේතුව ගොම, කුකුල් පොහොර, ග්ලිරිසීඩියා, පිදුරු වැනි අත්‍යවශ්‍ය අමුද්‍රව්‍ය සපයාගැනීමේ අපහසුතාවය හා ඒවා පිට ප්‍රදේශවලින් ප්‍රවාහනය අධික වියදම් සහිත කාර්යයක් වීමය.

## 6.3 සාර්ථක ලෙස කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා යෝජනා

රජයේ ආයතන හා පෞද්ගලික නිෂ්පාදකයන් විසින් කාබනික පොහොර නිපදවයි. බළංගොඩ, බණ්ඩාරවෙල, මීගමුව, පන්නල, තිහගොඩ, කුලියාපිටිය වැනි නගරසභා බොහොමයක ම කාබනික පොහොර නිපදවීම ව්‍යාපාරික මට්ටමින් සිදු කෙරේ.

මෙම ආයතන කාබනික පොහොර නිපදවන්නේ නගරවල එකතුවන කැළි කසළ වලිනි. මෙම ආයතන මුහුණු දී සිටින ගැටලුව වී ඇත්තේ පොහොර අලෙවි කිරීමට මාර්ග සොයාගත නොහැකි වීමයි. මෙම ගැටලුව නිසා නිෂ්පාදනවලින් ඉවත්වීමක් දක්නට ලැබේ.

මෙම ගැටලු මගහරවා ගැනීමට යෝජනා කිහිපයක් ඉදිරිපත් කළ හැකිය.

- පෞද්ගලික අංශයේ කාබනික පොහොර නිෂ්පාදකයන් සඳහා අලෙවි මාර්ග සම්බන්ධ කරදීම මහාපරිමාණ එළවළු හා වී ගොවීන් සම්බන්ධ කිරීම මගින් සබඳතාවය ඇති කිරීම.
- ප්‍රාදේශීය මට්ටමේ ගොවිජන සේවා මධ්‍යස්ථාන ප්‍රාදේශීය සභා මට්ටමින් කාබනික පොහොර නිෂ්පාදනය ඇරඹීම හා පහසුකම් සැලසීම.
- රසායනික පොහොර යෙදීම මගින් පස, ජලය විසවීම හා මිනිස් සෞඛ්‍යයට විවිධ තර්ජන එල්ලවීම පිළිබඳ ගොවි සංවිධාන මට්ටමින් දැනුවත් කර කාබනික පොහොර යෙදීමට ඔවුන් තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීම.
- රසායනික පොහොර සහනාධාරය මෙන් ප්‍රමිතියෙන් යුත් කාබනික පොහොර ලබාදීමේ සහනාධාර ක්‍රමයක් ඇති කිරීම.
- කාබනික පොහොර නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා ගෘහස්ත මට්ටමින් සත්ත්ව පාලනය ව්‍යාප්ත කිරීම.

මේ ආකාරයට කාබනික පොහොර නිෂ්පාදනය හා සම්බන්ධ රජයේ වැඩපිළිවෙළ හි ගැටලු අවම කර ජනතාව අතරට ගෙනයාමට හැකියාව ලැබෙනු ඇත.

## හත්වැනි පරිච්ඡේදය

# 'අපි වවමු රට නගමු' වැඩසටහන සම්බන්ධයෙන් කෘෂිකාර්මික හා ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ අදහස් විමසීම

## 7.0 ගොවිජන සංවර්ධන, කෘෂිකර්ම, සිවිල් පරිපාලන නිලධාරීන් මෙම වැඩසටහන සම්බන්ධයෙන් දැක්වූ අදහස්

## 7.1 හැඳින්වීම

'අපි වවමු රට නගමු' දේශීය ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ අදහස් ලබා ගන්නා ලදී. මෙම නිලධාරීන් ඔවුන්ගේ තනතුර අනුව කාණ්ඩ තුනකට බෙදා දැක්වීමට පුළුවන. ඉහළ ආයතන ප්‍රධානී පළාත් හා දිස්ත්‍රික් ලේකම්, මධ්‍යම අංශභාර අධ්‍යක්ෂ, අංශ ප්‍රධාන, නියෝජ්‍ය අධ්‍යක්ෂ, පහළ සංවර්ධන නිලධාරී, කෘෂි උපදේශක එම කාණ්ඩ තුනට අයත් නිලධාරීන් විය. ඉහළ ආයතන ප්‍රධානී කාණ්ඩයේ වැඩිම ප්‍රතිශතය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් නිලධාරීන් විය. එය 37.5% කි. දෙවන වැඩිම ප්‍රතිශතය වූයේ දිස්ත්‍රික් ලේකම්වරු සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වූ අතර එය 25%ක් විය. මධ්‍යම කාණ්ඩයට අයත් නිලධාරීන් වූයේ අංශභාර අධ්‍යක්ෂ, අංශ ප්‍රධාන, නියෝජ්‍ය අධ්‍යක්ෂ යන කාණ්ඩය යි. මෙම කාණ්ඩයේ වැඩිම නිලධාරීන් ප්‍රමාණයක් නියෝජනය කර තිබුනේ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විය. එය 36.4%කි. දෙවැනි වැඩිම සංඛ්‍යාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම අමාත්‍යාංශය නියෝජනය කළ අතර එය 27.3%ක් විය. පහළ කාණ්ඩය නියෝජනය කරමින් අදහස් දක්වා තිබූ වැඩිම සංඛ්‍යාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලයන් හි කෘෂිකර්ම උපදේශකවරුන් වූ අතර එය 35.0%කි. දෙවන අදහස් ප්‍රකාශ කර තිබූ පිරිස පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 20.0% නියෝජනය කර තිබුණි (ඇමුණුම 02, වගු අංක 7.2.1 බලන්න).

## 7.2. විවිධ ආයතනය නියෝජනය කරන ඉහත නිලධාරීන් වැඩසටහනට සම්බන්ධ වූ වර්ෂ

අදහස් ලබා ගන්නා ලද විවිධ කාණ්ඩවලට අයත් නිලධාරීන්ගෙන් වැඩිම පිරිසක් වැඩසටහන හා සම්බන්ධයෙන් කටයුතු කිරීම අරඹා ඇත්තේ 2008 හා 2009 යන වර්ෂ දෙක තුළදී ය. එනම් වැඩසටහන ආරම්භකර වසරක් ගත වූ පසුව ය (ඇමුණුම 02 වගු අංක 7.2.2 බලන්න).

### 7.2.1 එක් එක් නිලධාරී කාණ්ඩ අනුව ඔවුන්ට වැඩසටහන පිළිබඳව ඇති අවබෝධය

එක් එක් කාණ්ඩවලට අයත් ඉහත සඳහන් නිලධාරීන්ගෙන් මෙම වැඩසටහන පිළිබඳව ඔවුන්ට ඇති අවබෝධය පිළිබඳව අදහස් ලබාගන්නා ලදී. ඒ අනුව ඉහළ නිලධාරී කාණ්ඩය වන ආයතන ප්‍රධානී පළාත් හා දිස්ත්‍රික් ලේකම් යන පිරිසෙන් 19%කට පවැතියේ සාමාන්‍ය අවබෝධයක් බව ප්‍රකාශ කර ඇත. එම කාණ්ඩයේ අදහස් දැක් වූ මුළු සංඛ්‍යාවෙන් 18% ඉතා හොඳ අවබෝධයක් පැවති බව ප්‍රකාශ කර තිබේ. මධ්‍යම මට්ටමේ නිලධාරී කාණ්ඩයෙන් 45%කට මෙම වැඩසටහන පිළිබඳව ඉතා හොඳ අවබෝධයක් පැවති බවත් 12%කට සාමාන්‍ය අවබෝධයක් පැවති බවත් ප්‍රකාශ කර තිබේ. පහළ මට්ටමේ නිලධාරී කාණ්ඩය සම්බන්ධයෙන් ගත් කළ අදහස් ලබා දුන් නිලධාරී සංඛ්‍යාවෙන් 76%කට සතුටුදායක මට්ටමේ අවබෝධයක් ද, 69%කට සාමාන්‍ය අවබෝධයක් පමණක් පැවති බව ද පවසා ඇත.

මෙම ඉහළ, මධ්‍යම සහ පහළ යන කාණ්ඩ තුනටම අයත් අදහස් ලබාගත් නිලධාරීන් මුළු සංඛ්‍යාවෙන් ආයතන අතුරින් අදහස් ලබාගත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශය නියෝජනය කරමින් 34%ක් ද, දිස්ත්‍රික් ලේකම් කාර්යාල නියෝජනය කරමින් 5% ද, කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාල නියෝජනය කරමින් 7%ක් ද, ගොවිජන සේවා මධ්‍යස්ථාන නියෝජනය කරමින් 5%ක් ද, පළාත් කෘෂිකර්ම දෙපර්තමේන්තුව නියෝජනය කරමින් 24%ක් ද අදහස් ලබා දී ඇත (ඇමුණුම 02 වගු අංක 7.2.3 බලන්න).

### 7.2.2 වැඩසටහනෙ හි අරමුණු පිළිබඳව එක් එක් නිලධාරී කාණ්ඩය දැක් වූ අදහස්

අදහස් ප්‍රකාශ කරන ලද සෑම කාණ්ඩයකටම අයත් නිලධාරී කාණ්ඩ අතුරින් බහුතරය "අපි වවමු රට නගමු" වැඩසටහනෙහි අරමුණු පිළිබඳව දක්වා ඇති අදහස නම්, මෙය කාලයට උචිත වැදගත් අරමුණුවලින් සමන්විත එකක් බවය (ඇමුණුම 02 වගු අංක 7.2.4 බලන්න).

### 7.2.3 වැඩසටහනෙහි සැලසුම පිළිබඳව එක් එක් නිලධාරී කාණ්ඩයේ අදහස්

මෙම වැඩසටහනෙහි සැලසුම ඉතා හොඳ, හොඳ, තරමක් හොඳ, හොඳ නැති වශයෙන් කාණ්ඩ ගත කර එක් එක් නිලධාරී කාණ්ඩයට ඒ පිළිබඳව දැනුණු ආකාරය විමසීමක් කරන ලදී. ඒ අනුව ඉහළ ආයතන ප්‍රධානීන් බහුතරයක් 50%ක් සහ පහළ මට්ටමේ නිලධාරීන් කාණ්ඩය වන කෘෂි උපදේශකවරුන්ගෙන් බහුතරය 47.5% ප්‍රකාශ කර ඇත්තේ මෙය තරමක් හොඳ සැලසුම් සහගත වැඩසටහනක් ලෙස ය. මධ්‍යම මට්ටමේ නිලධාරී කාණ්ඩයෙන් බහුතරය ප්‍රකාශ කර ඇත්තේ මෙය හොඳ සැලසුම් සහගත වැඩසටහනක් බවයි (ඇමුණුම 02 වගු අංක 7.2.5 බලන්න).

### 7.2.4 'අපි වවමු රට නගමු' වැඩසටහනෙහි ක්‍රියාත්මකභාවය පිළිබඳ එක් එක් නිලධාරී කාණ්ඩවල අදහස්

මෙම වැඩසටහන ක්‍රියාත්මකවීමේ තරාතිරම පිළිබඳව එක් එක් නිලධාරී කාණ්ඩය දරනු ලබන අදහස් පිළිබඳව විමසීමක් කරන ලදී. එහිදී ක්‍රියාත්මකවීමේ තරාතිරම ලෙස ඉතා හොඳින්, හොඳින්, තරමක් හොඳින්, හොඳ නැත යනුවෙන් හතර ආකාරයක් යටතේ අදහස් ලබාගන්නා ලදී. මේ අනුව ඉහළ 50% මධ්‍යම 72% පහළ 52.5% යන නිලධාරී කාණ්ඩ තුනෙහිම බහුතරයේ අදහස පොදුවේ ප්‍රකාශ වී තිබුනේ තරාතිරම අතින් දෙවන ස්ථානය වන වැඩසටහන හොඳින් ක්‍රියාත්මක වූ බවය. (ඇමුණුම 02 වගු අංක 7.2.6 බලන්න).

### 7.2.5 වැඩසටහනෙහි සාර්ථකභාවය පිළිබඳව නිලධාරීන්ගේ අදහස් දැක්වීම

'අපි වවමු රට නගමු' වැඩසටහනෙහි සාර්ථකභාවය පිළිබඳ මෙම නිලධාරී කාණ්ඩ තුනෙන් විමසීමක් කරන ලදී. සාර්ථකභාවය ස්වභාවයන් හතරකට වෙන් කර ඒ පිළිබඳ නිලධාරී කාණ්ඩ තුනෙහි අදහස විමසන ලදී. ඉතා සාර්ථක, සාර්ථක හා තරමක් සාර්ථක යනු එම ස්වභාවයන් ය. ඒ අනුව ඉහළ පහළ නිලධාරීන්ගේ බහුතරය පිළිවෙළින් 50% හා නිලධාරීන් බහුතරය 63.6%ක් ප්‍රකාශ කර ඇත්තේ මෙය සාර්ථක වැඩසටහනක් යනුවෙන් දෙවන අදහස දක්වා ඇත. එනම් ඉතා සාර්ථකව යන පළමු තත්ත්වය කිසිවකු ප්‍රකාශ කර නැත (ඇමුණුම 02 වගු අංක 7.2.7 බලන්න).

### 7.2.6 වැඩසටහනෙහි සාර්ථක හා අසාර්ථභාවයට හේතු වශයෙන් විවිධ මට්ටම්හි නිලධාරීන් දක්වන ලද හේතු

'අපි වවමු රට නගමු' වැඩසටහන සාර්ථක වැඩසටහනක් ලෙස අදහස් ඉදිරිපත් කරන ලද නිලධාරීන් හා අසාර්ථක වූවක් ලෙස අදහස් ඉදිරිපත් කරන ලද නිලධාරීන් එයට හේතු වශයෙන් දක්වා ඇති අදහස් පහතින් ඉදිරිපත් කර ඇත.

**සාර්ථක වැඩසටහනක් ලෙස නිලධාරීන් දක්වා තිබූ අදහස්**

- සාර්ථක වැසටහනක් ලෙස අදහස් ඉදිරිපත් කරන ලද නිලධාරීන් එයට හේතු වශයෙන් ඉදිරිපත් කර තිබූ අදහස් අතර අතිරේක ආහාර බෝග වගාවට ගොවීන් යොමුවීම
- ගොවීන් මෙතෙක් වගා කළ බෝගවලට අමතරව අලුත් බෝග වගාවලට යොමුවීම
- සුළු පරිමාණ ගොවීන් මහා පරිමාණ ගොවීන් බවට පත්වීම
- ආහාර හිඟයක් ඇති නොවන පරිද්දෙන් සියලුදෙනා වගාවලට යොමුවීම

- කලින් පැවති අන්දමට වඩා 2008 වර්ෂයේ සිට ක්‍රමවත්ව වගා කටයුතු කිරීමට හැකිවීම හා ප්‍රාදේශීය නිලධාරීන්ගේ සෘජු දායකත්වය ලබාගැනීමට හැකිවීම
- ගොවීන් තාක්ෂණය හා බද්ධව කටයුතු කිරීමට යොමුවීම
- දුප්පත් ගොවීන්ට වගාව සඳහා උපකාර කිරීම සහ ඔවුන්ගේ ආර්ථිකයට දායකවීමට හැකියාවක් ලැබීම
- කෘෂිකර්ම ව්‍යාප්ති කටයුතුවලට පහසු කටයුත්තක්වීම
- ප්‍රදේශවල ඇති සම්පත් භාවිතයට ගැනීමට හැකිවීම
- කාබනික පොහොර භාවිතයට ගොවීන් පුරුදු කිරීම
- නිලධාරීන්ගේ දැනුවත් භාවය වැඩි කිරීම සඳහා පුහුණු පංති පැවැත්වීම
- ගොවීන් සඳහා ඉලක්කගත වැඩසටහන් පැවැත්වීම
- ගෘහස්ථ වියදම් අඩු කිරීමට හැකිවීම වැනි කරුණු වේ.

**අසාර්ථක වැඩසටහනක් ලෙස නිලධාරීන් දක්වා තිබූ අදහස්**

- ගොවීන්ට ගුණාත්මක බීජ කලට වේලාවට නොලැබීම හා බීජ සහන මිලට ලබාදීම නිසා ගොවීන් අඛණ්ඩව ඉදිරියේ දී ත් සහන මිලට බීජ බලාපොරොත්තු වීම හා පසු විපරමක් සිදු නොකිරීම
- බීජ නොමිලේ නිකුත් කිරීම නිසා ගොවීන් උනන්දුවෙන් වගා කටයුතුවල නොයෙදීම
- වැඩසටහන් අවශ්‍ය වේලාවල දී ක්‍රියාත්මක නොකිරීම
- අලුතින් පත් වූ කෘෂි උපදේශකවරුන්ට දැනුම මදිකම
- ක්‍රියාත්මකවීමේ දී ආර්ථික ප්‍රතිලාභ වෙනුවට දේශපාලන ප්‍රතිලාභ ඉදිරියට පැමිණීම
- අතිරේක බෝග සඳහා පොහොර සහනාධාර නොලැබෙන බැවින් එම බෝග සඳහා පොහොර නොයෙදීම
- වැඩසටහන සඳහා මූලික සැලැස්මක් නොමැතිකම යන කරුණු වේ.

### 7.2.7 සැලසුම් කිරීමේ දී ආයතනවල අදහස් විමසීම

'අපි වවමු රට නගමු' වැඩසටහන සැලසුම්කිරීමේ දී එක් එක් කාණ්ඩවල නිලධාරීන්ගේ සහ එම ආයතනවල අදහස් විමසීම හෝ සහභාගීත්වය ලබාගැනීම කෙබඳු මට්ටමක සිදුවූවා ද යන්න පිළිබඳව අදහස් විමසීමක් කරන ලදී. අදහස් විමසීමේ මට්ටම් ලෙස සලකන ලද්දේ ඉතා හොඳින් , හොඳින්, සාමාන්‍ය මට්ටමකට, කළේ නැත වශයෙනි. අදහස් විමසීම පිළිබඳව මෙම කාණ්ඩ තුනෙහි නිලධාරීන් දක්වන අදහස් වගු අංක 10 යටතේ දක්වා ඇත. ඒ අනුව

පෙනී යන්නේ හොඳින් සිදු කෙරිණි හා සාමාන්‍ය මට්ටමකට සිදු කෙරිණි යන අදහස් බහුතරයක් නිලධාරීන් ප්‍රකාශ කර තිබුණි. අදහස් ලබාගැනීම හා සහභාගී කර ගැනීම හොඳින් සිදු කළ බව ඉහළ නිලධාරී කාණ්ඩයෙන් 28.6% ද මධ්‍යම කාණ්ඩයෙන් 36.4% ද, පහළ නිලධාරී කාණ්ඩයෙන් 47.5% ක්ද ප්‍රකාශ කිරීම තුළින් පෙනී යන්නේ අදහස් විමසීමක් කර ඇති බවයි. මෙම වගුවට අනුව ඉහළ මට්ටමේ නිලධාරීන් අතුරින් 42.9% හා මධ්‍යම මට්ටමේ නිලධාරීන් 36.4%ක් ඔවුන්ගෙන් අදහස් විමසීමක් කළේ නැති බව ප්‍රකාශ කිරීම ද සැලකිල්ලට ගන්නා විට අදහස් ලබාගැනීම සාමාන්‍ය මට්ටමකට සිදු කර ඇති බවයි. (ඇමුණුම 02 වගු අංක 7.2.9 බලන්න).

### 7.2.8 මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් නිලධාරීන්ට ලබාගත හැකි වූ අත්දැකීම්

'අපි වවමු රට නගමු' වැඩසටහනින් මෙම නිලධාරීන් ට ලබාගතහැකි පාඩම් හෝ අත්දැකීම් පිළිබඳව අදහස් විමසීමක් කළ අතර එක් එක් කාණ්ඩයට අයත් නිලධාරීන් ඒ පිළිබඳව අදහස් දක්වා ඇත. ඉහළ ආයතන ප්‍රධානීන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් තම අත්දැකීම් ආශ්‍රයෙන් පළකළ අදහස්

- අනෙකුත් බෝග සඳහා බීජ නිෂ්පාදන වැඩසටහන් ඇරඹීම.
- මෙම වැඩසටහන යටතේ හොඳ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මකවීම
- දේශීය කෘෂි නිෂ්පාදන ඉහළ නැංවීමට දායකත්වයක් දැක්වීම
- ගොවීන්ගේ ආදායම ඉහළ යාම
- රටේ සංවර්ධනය සඳහා ග්‍රාමීය මට්ටමේ දායකත්වය ලබාගැනීමට සුදුසු වැඩසටහනක් ලෙස හැඳින්විය හැකිවීම

මධ්‍යම මට්ටමේ නිලධාරීන් ලැබූ අත්දැකීම් පහත ආකාරයට දැක්විය හැකිය.

- සමහර වැඩසටහන් සමහර ප්‍රදේශවලට පමණක් ගැළපීම.
- මෙම වැඩසටහන යටතේ හොඳ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මකවීම
- නිෂ්පාදන සම්බන්ධයෙන් අලෙවි ගැටලු මතුවීම නිසා ඉදිරි වැඩසටහන් සඳහා යොමු කරවා ගැනීමට අපහසුවීම
- නිෂ්පාදන මිල ඉහළයාම නිසා ගොවීන් අපහසුතාවයට පත්වීම
- ගොවීන් තෝරාගැනීමේ දී සුදුසු ගොවීන් පමණක් තෝරා ගැනීමට සැලකිලිමත්වීම
- කන්න වගා නිසි කලට සිදු කිරීමට හැකිවීම
- යාය වැඩසටහන් බීජ සහ ඉහළ අස්වනු ලබාගැනීම සඳහා ක්‍රියාත්මක කිරීම යන ඒවා වේ.

පහළ කාණ්ඩයේ නිලධාරීන් ලැබූ අත්දැකීම් වනුයේ,

- කුඩා කණ්ඩායම් බිත්තර වී නිෂ්පාදනය කිරීමේ වැඩසටහන් සාර්ථකවීම
- නිලධාරීන්ට ලබාදුන් පුහුණු වැඩසටහන් සාර්ථකවීම.
- ජනතාව කුඩා කණ්ඩායම් ලෙස වගාවට යොමුවීම.
- එකම බෝගය වගා කිරීමේ දී එම ගොවීන්ට අලෙවි ගැටලු මතුවීම.
- අනෙකුත් බෝග සඳහා බීජ නිෂ්පාදන වැඩසටහන් ඇරඹීම
- ගොවියාගේ ආදායම ඉහළ නැංවීමට දායකවීම.
- සමහර වැඩසටහන් සමහර ප්‍රදේශවලට පමණක් ගැළපීම යන යහපත් අයහපත් දෙපැත්තම පැවති බවයි.
- ගොවීන්ගේ දායකත්වය ඉහළ යාම නිසා ඉහළ නිෂ්පාදන අතිරික්තයක් ලැබීමෙන් අලෙවි ගැටලු මතුවීම හා එම නිසා ගොවීන් අධෛර්යමත්වීම
- බීජ සහ යෙදවුම් නොමිලේ ලබාදීම නිසා වැඩසටහන හොඳින් ක්‍රියාත්මක කළ හැකිවීම

  අවශ්‍ය අමුද්‍රව්‍ය නිසි වේලාවට ලබා ගැනීමට අපහසුවීම

  බීජ අලෙවිකරගැනීමේ ගැටලුවලට මුහුණ පෑමට සිදුවීම යන ඒවා වේ.

### 7.2.9 වැඩසටහනෙහි දුර්වලතා

මෙම වැඩසටහනෙහි දුර්වලතා පිළිබඳව මෙම නිලධාරී කාණ්ඩ තුනෙන් අදහස් විමසීමක් කරන ලදී. ඒ අනුව පහත සඳහන් දුර්වලතා ඔවුන් විසින් ඉදිරිපත් කර තිබුණි.

ඉහළ මට්ටමේ නිලධාරී කාණ්ඩය විසින් ඉදිරිපත් කර තිබූ අදහස්

- ප්‍රාදේශීය මට්ටමෙන් අදාළ කාර්යයන් හඳුනාගෙන නොතිබීම
- සැලසුම් කිරීම හා ප්‍රතිපාදන වෙන්කිරීම කල් ඇතිව සිදු නොවීම
- පසු විපරමක් නොමැතිවීම හා ගොවීන්ගේ මූලික කෘෂිකාර්මික අවශ්‍යතා සැපිරීම
- බිම් මට්ටමේ නිලධාරීන් ඉලක්කගත සංවර්ධනයකට ගොස් නොමැතිවීම හා ඒකාබද්ධ ප්‍රවේශයක් නොමැතිවීම
- දේශපාලන අවශ්‍යතා අනුව ව්‍යාපෘතිවලට මුදල් වෙන් කිරීම
- අපේක්ෂිත සාර්ථකත්වය ඇතැම් අංශ සම්බන්ධයෙන් ලබාගත නොමැතිවීම යන ඒවා වේ.

මධ්‍යම මට්ටමේ නිලධාරී කාණ්ඩය විසින් ඉදිරිපත් කර තිබූ අදහස්

- සුදුසු ගොවීන් ක්ෂේත්‍ර මට්ටමින් තෝරා නොගැනීම
- අවශ්‍ය යෙදවුම් අවශ්‍ය වේලාවට නොලැබීම හා මෙම වැඩසටහනෙහි අඛණ්ඩභාවය පිළිබඳව සැකසහිතවීම
- පුහුණුවීම් සාර්ථකව කරගැනීමට නිලධාරීන්ට දැනුමක් නොමැතිකම
- ව්‍යාපෘතියේ අවසන් ප්‍රගති සමාලෝචනයක් නොමැතිවීම
- ඉදිරි ගිවිසුම් නිසි පරිදි සිදු නොවීම
- අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක නොවීම යන ඒවාය.

පහළ මට්ටමේ නිලධාරී කාණ්ඩය විසින් ඉදිරිපත් කර තිබූ අදහස්

- ගොවීන්ට අවශ්‍ය පහසුකම් සැපයීම දුර්වල මට්ටමක පැවතීම
- නිෂ්පාදන අලෙවිය සඳහා ක්‍රියාමාර්ග මෙම වැඩසටහන තුළ නොවීම
- යෙදවුම් නිසි කලට ලබානොදීම හා කෘෂි උපදේශකවරුන්ගේ කාර්යභාරය ඇගයීමකට ලක් නොකිරීම
- පළාතින් පළාතට වෙනස් වන දේශගුණ හා අනෙකුත් සම්පත්වලට අනුව සංවර්ධන අරමුණු සකස් නොවීම
- ස්වභාවික දේශගුණික විපර්යාස නිසා නඩත්තු කිරීම අපහසුවීම
- බීජ හා රෝපණ ද්‍රව්‍ය 50% මිලට ලබාදීමේ දී මුදල් ලබාගැනීමේ අපහසුතාව
- ගමන් වියදම් නොමැතිවීම නිසා නිලධාරීන්ගේ කැපවීම අඩුවීම
- යෙදවුම් නිසි කලට නොලැබීම නිසා නිලධාරීන් අපහසුතාවයට පත්වීම
- ප්‍රදේශයේ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක නොවීම
- ගොවියාට ලැබෙන බීජ කට්ටල ගොවියාගේ අවශ්‍යතාවය මත නොවීම හා ගොවියාගේ අවශ්‍යතාවය නිසා පරිදි හඳුනා නොගැනීම
- ගබඩා පහසුකම්, අගය වැඩිකිරීමේ වැඩසටහන් පිළිබඳ දැනුවත් භාවයක් නොමැතිකම
- වැඩසටහන් සැලසුම් කිරීමේ දී ගොවීන්ට අවශ්‍ය වැඩසටහන් වෙනුවට නිලධාරීන්ට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක වීම
- කෘෂි උපදේශකවරුන්ගේ කාර්ය භාරය ඇගයීමට ලක් නොවීම
- පහළ මට්ටමේ නිලධාරීන්ගේ අදහස් වැඩසටහන් සැලසුම් අවධියේ දී ලබා නොගැනීම යන ඒවා වේ.

### 7.2.10 වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා නිලධාරීන් විසින් ඉදිරිපත්කරන ලද යෝජනා

'අපි වවමු රට නගමු' වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන්නේ නම් එය සාර්ථක කරගැනීම සඳහා සිය අත්දැකීම් මත පදනම්ව ඉහළ විවිධ කාණ්ඩවලට අයත් නිලධාරීන් විසින් කරනු ලැබූ යෝජනා පහත දක්වා ඇත.

මේ සම්බන්ධයෙන් ඉහළ මට්ටමේ නිලධාරීන් ඉදිරිපත් කරන ලද අදහස් වූයේ,

- ග්‍රාමීය මට්ටමේ ගොවීන් රාශියක් විසින් නිෂ්පාදනය කරනු ලබන බෝග සාධාරණ මිලට අලෙවිකරගැනීමට අවස්ථා සලසාදීම
- ගොවීන් සමඟ සාකච්ඡාකර ඔවුන්ගේ අවශ්‍යතා මත වැඩසටහන ඇරඹීම
- ප්‍රදේශවලට යෝග්‍ය වැඩසටහන් ප්‍රදේශ අනුව ක්‍රියාත්මක කිරීම හා දිස්ත්‍රික්ක මට්ටමින් වැඩසටහන් ප්‍රගතිය සමාලෝචනය කිරීම
- වගාවේදී යන්ත්‍ර සූත්‍ර වෙනුවෙන් ඉන්ධන සඳහා සහනාධාරයක් ලබාදීම
- දිස්ත්‍රික් මට්ටමේ වගා ප්‍රගතිය සමාලෝචනය කිරීම
- 'අපි වවමු රට නගමු' වැඩසටහන් යටතේ නිෂ්පාදනය කෙරෙන බීජ හා රෝපණ ද්‍රව්‍ය බෙදාහැරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම
- වාරිමාර්ග හා කෘෂිකර්ම යන විෂයයන් දෙක සම්බන්ධ දෙපාර්තමේන්තු ඒකාබද්ධ ප්‍රවේශයක් යටතේ ක්‍රියාත්මක වීම
- පලතුරු ගම්මාන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම
- මනා අධීක්ෂණයක් හා සම්බන්ධීකරණයක් පවත්වාගැනීම
- නියමිත කාල වකවානු නිශ්චිතව තීරණය කර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යන ඒවා වේ.

මධ්‍යම මට්ටමේ නිලධාරීන් ඉදිරිපත් කරන ලද අදහස් වූයේ,

- දේශීය ශක්‍යතාවය හා ගෝලීය ප්‍රවණතාවයට සුදුසු වන සේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- කාල රාමුවකට යටත්ව දිගුකාලීන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ගොවීන්ට අවශ්‍ය ජල පහසුකම් හා ගබඩා පහසුකම් ලබාදීම
- ගොවීන්ගේ අවශ්‍යතා පිළිබඳ ගණනයක් කර ඒ අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අස්වනු සාධාරණ මිලට අලෙවිකිරීම සඳහා යාන්ත්‍රණයක් සැකසීම
- නිලධාරීන්ට මෙම වැඩසටහන සම්බන්ධ පුහුණු ලබාදීම
- වැඩසටහන සම්බන්ධ පසු විපරම් කටයුතු අඛණ්ඩව සිදු කිරීම

- පාසැල් යන දරුවාගේ සිට මෙම වැඩසටහන් සම්බන්ධව සුබවාදී ආකල්පයක් ඇති කිරීම
- ස්වාභාවික වගා හානි සඳහා පූර්ව සූදානමක් ඇති කර ගැනීම
- නොමිලේ ලබා නොදී ගොවි දායකත්වය මත අවශ්‍ය බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබාදීම
- ප්‍රතිපාදන නිසි කලට නිසි ස්ථානයට ලබාදීමට සැලකිලිමත්වීම යන ඒවා වේ.

පහළ මට්ටමේ නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් වූයේ,

- ගොවීන් තෝරාගැනීමේ දී හොඳ අධීක්ෂණයකින් යුක්ත වීම
- කන්න වැඩසටහන් කලින් සැලසුම් කිරීම
- ගුණාත්මකභාවයෙන් යුක්ත යෙදවුම් ලබාදීමට පියවර ගැනීම
- බිත්තර වී වැඩසටහන් හි නිෂ්පාදන අලෙවිය සඳහා ක්‍රමානුකූල සැලැස්මක් සකස් කර ගැනීම
- බීජ නිෂ්පාදන වැඩසටහන් සඳහා ගොවීන් දිරිගැන්වීමට දායකත්වය ලබාදීම
- නිෂ්පාදන වියදම් අඩු කිරීමට කොම්පෝස්ට් භාවිතය හා පවුලේ ශ්‍රම භාවිතයට ගොවීන් දිරිගැන්වීම
- නිෂ්පාදන සඳහා ගොවීන්ට සාධාරණ මිලක් ලබාගැනීමට අවශ්‍ය පසුබිම සැකසීම
- ගොවි නිෂ්පාදන සමිති සහ ගොවි සංවිධාන ශක්තිමත් කර පවත්වාගෙන යාම
- තත්වයෙන් උසස් බීජ වර්ග සහ දේශීය බීජ වර්ග ගොවීන්ට ලබාදීම යන ඒවාය.

## අටවැනි පරිච්ඡේදය

## අධ්‍යයනයේ සොයාගැනීම්, නිගමන හා නිර්දේශ

*මෙම අධ්‍යයනය සිදු කිරීමෙන් බැසගත හැකි අවසාන නිගමනය, අධ්‍යයනයේ ප්‍රධාන සොයාගැනීම් හා මෙවැනි වැඩසටහනක් අනාගතයේ දියත් කරන්නේ නම් ඒ සඳහා භාවිතයට ගත හැකි නිර්දේශ මෙම පරිච්ඡේදය මඟින් ඉදිරිපත් කරනු ලබයි.*

### 8.0 හැඳින්වීම

'අපි වවමු - රට නගමු' වැඩසටහන පිළිබඳව කරන ලද අධ්‍යයනයේ සොයාගැනීම් පහත සඳහන් ආකාරයට ඉදිරිපත් කළ හැකි අතර අනාගතයේ මෙවැනි ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම්කර ක්‍රියාවට නැංවීම සඳහා උපයෝගී කරගත හැකි නිර්දේශ කිහිපයක් ද ඉදිරිපත් කර ඇත.

### 8.1 අධ්‍යයනයේ සොයාගැනීම්

- මෙම වැඩසටහන රටේ සියලුම කෘෂි ක්ෂේත්‍රයන් ආවරණය කරමින් ක්‍රියාත්මකවීම හේතුවෙන් රට පුරා ගොවි ජනතාව ගොවි ගෘහස්ථ කෘෂි ක්ෂේත්‍රයේ ඉහළ, මධ්‍යම, පහළ නිලධාරීන් මේ සඳහා සහභාගීවීම නිසා ශ්‍රී ලංකාව පුරා කෘෂිකාර්මික නවෝදයක් ඇති විය.
- රටේ සියලුම ප්‍රදේශවල කුඹුරු පුරන්වීමේ ප්‍රවණතාව නවතා ඒවා යළි වගාකිරීමේ වැදගත්කම පිළිබඳ පණිවුඩය මෙම වැඩසටහන තුළින් සමාජය අතරට ගෙනයාම සිදු විය. පුරන් කුඹුරු හෙක්ටයාර් 38,728ක් යළි වගා කිරීමට හැකි විය.
- පුරන් කුඹුරු අස්වැද්දීම,ගෙවතු වගාව හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මුදල් අවශ්‍ය ප්‍රමාණයෙන් අවශ්‍ය අවස්ථාවල දී නොලැබීම නිසා ඊට අදාළ වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට බාධා පැමිණුනි.
- පුරන් කුඹුරු බහුලව පැවති ප්‍රදේශවල ගොවිජන සමාජයෙහි අඩපණ වෙමින් පැවති ගොවි සංවිධාන ද මෙම වැඩසටහන යටතේ ප්‍රකෘතිමත් වී ඇත.
- පුරන් කුඹුරු අස්වැද්දීමට අමතරව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් 26 තුළම 2007/08 මාස් කන්නයේ වී වගා කළ බිම් ප්‍රමාණයට වඩා 2010 වර්ෂය වන විට වගා බිම් ප්‍රමාණය ඉහළ ගොස් ඇති අතර එම ප්‍රදේශවල දේශපාලන අස්ථාවරත්වය අඩුවීමත් සමඟ වගාවට එක් වූ කුඹුරු ප්‍රමාණය නිසා පමණක් නොව 'අපි වවමු රට නගමු' වැඩසටහන නිසා වගාවට එක් වූ කුඹුරු ප්‍රමාණය ද මෙසේ වගා ඉඩම් ප්‍රමාණය ඉහළ යාමට බලපා ඇත.

❖ අදාළ කාලය තුළ වවුනියාව, මුලතිව්, අනුරාධපුර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, උඩවලව විශේෂ බල ප්‍රදේශය, මහවැලි එච් කලාපය යන දිස්ත්‍රික්ක හා කලාපවල වී වගාවේ සාමාන්‍ය අස්වැන්න ඉහළ ගොස් ඇත.

❖ එසේම තිරිඟු පිටි ආනයනය 2010 වර්ෂය වන විට මෙට්‍රික් ටොන් 130 දක්වා පහත බැස ඇත. ඒක පුද්ගල වාර්ෂික සහල් පරිභෝජනය 2009/10 වර්ෂය වන විට කිලෝ ග්‍රෑම් 113 දක්වා ඉහළ ගොස් ඇත.

❖ පුරන් කුඹුරු වගාවේ දී මුහුණ දීමට සිදු වූ ගැටලු වශයෙන් ඇළ මාර්ග යළි පුනරුත්ථාපනය වැනි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මුදල් ප්‍රතිපාදන සීමිතවීම නිසා යායවල් වශයෙන් පුරන් වී පැවති කුඹුරු සියල්ල අස්වැද්දීමට නොහැකි විය. ශ්‍රම හිඟය, ඉහළ නිෂ්පාදන වියදම යන හේතු මත ඇතැම් ගොවීන් පුරන් කුඹුරු අස්වැද්දීමට පසුබටවීමත් නිසා යායේ තැන තැන කුඹුරු පුරන් කුඹුරු තත්ත්වයෙන්ම පැවතීමෙන් මීයන් වැනි සතුන් බෝවීමෙන් වගා කරන ගොවීන්ගේ ගොයමට හානි සිදු වීම නිසා වගා කිරීමට උත්සාහ කරන ගොවීන් කිහිපදෙනා ද අධෛර්යමත්වීම ද හඳුනාගත් ගැටලු විය.

❖ ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මකවීම නිසා ගෙවතු වගා පිළිබඳ සංකල්පය අඩපණ වීමට ඉඩ නොදී ග්‍රාමීය අර්ධ නාගරික, නාගරික යන සෑම කොටසකම ඒ පිළිබඳව නව පිබිදීමක් ද ජනතාව තුළ එහි වැදගත්කම පිළිබඳ අවබෝධයක් ද ඇතිවීමට හේතු විය. නැවුම් එළවළු, පලතුරු පරිභෝජනය හා ඉන් ලද හැකි ආර්ථික වාසි පිළිබඳව ජනතාව තුළ යම් කිසි හැඟීමක් වගාකරවීමට ද ගෙවතු වගාවට හැකි වී ඇත. 2008 වර්ෂයේ දී වැඩ ආරම්භ කර ඇති පුද්ගලික ගෙවතු සංඛ්‍යාව 207951 ද, 2009 දී වැඩ ආරම්භ කර ඇති පුද්ගලික ගෙවතු සංඛ්‍යාව 287217 ද එම වර්ෂයේ වැඩ ආරම්භ කර ඇති නිලධාරීන්ගේ ගෙවතු සංඛ්‍යාව 26141 ද 2010 වර්ෂයේ දී වැඩ අරම්භ කර ඇති පුද්ගලික ගෙවතු සංඛ්‍යාව 178597 ද නිලධාරීන්ගේ වැඩ ආරම්භ කර ඇති ගෙවතු සංඛ්‍යාව 7090 ද වශයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් විය. මෙතෙක් ගෙවතු වගාවේ නියැලී නොසිටි සාමාන්‍ය ජනතාව හා රජයේ සේවකයින් ගෙවතු වගාව වෙත සිත් යොමුකිරීමට පෙළඹවීම මෙම වැඩසටහන විසින් සිදු කර ඇත.

❖ මෙම වැඩසටහන සම්බන්ධයෙන් පැවති දුර්වලතා වූයේ වැඩසටහන ක්ෂේත්‍ර මට්ටමේ දී ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපකරණ, බීජ හා රෝපණ ද්‍රව්‍ය සඳහා යෙදවීමට මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් තරම් අවශ්‍ය අවස්ථාවල නොලැබීමයි. අනෙක් ගැටලුව වූයේ බීජ පැළ නොවීම හා අස්වනු සත්ත්ව උවදුරුවලට ගොදුරුවීමයි. අනෙක් දුර්වලතාවය වූයේ මෙම වැඩසටහන නිසි පසුවිපරමකට ලක් නොකිරීමයි. එසේම රජයේ හා පෞද්ගලික ආයතනයන් හි, නිලධාරීන්ගේ නිල නිවාසයන්හි හා නාගරික

අංශයේ දී මෙම වැඩසටහන එක් කන්නයක් පමණ ක්‍රියාත්මක වීමෙන් පසු අඩපණවීමක් දැක ගත හැකි විය.

❖ දේශීය පලතුරු නිෂ්පාදනය වර්ධනය කිරීමේ වැඩසටහන යටතේ පලතුරු වගාව ව්‍යාප්ත කිරීමටත් පවතින පලතුරු වගාවන් හි ඵලදාව වැඩි කිරීමටත් අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇත. මේ සඳහා රජය සතු ඉඩම් හා හමුදා කඳවුරු භූමිවල, පෞද්ගලික සමාගම් සතු ඉඩම්වල නව පලතුරු වගා ඇරඹීම, බීජ හා පැළ තවාන් වැඩියෙන් පිහිටුවීමෙන් රට තුළ රෝපණ ද්‍රව්‍ය සුලබ කිරීම, පැරණි පලතුරු වගාබිම්වල පවත්නා පලතුරු වගා පුනරුත්ථාපනය මඟින් අස්වනු නැංවීමත් පූර්ව හා පසු අස්වනු තාක්ෂණය වැඩි දියුණු කිරීම මඟින් පලතුරු නිෂ්පාදනය වන ප්‍රමාණයම ජනතාවගේ පරිභෝජනය සඳහා සැපයීමට තාක්ෂණය හඳුන්වාදීමත් පලතුරු ආශ්‍රිත සැකසුම් නිෂ්පාදන කර්මාන්ත දියුණු කිරීම මඟින් දේශීය පලතුරු පරිභෝජනය අවාරයේ සිදු කිරීමට සැලැස්වීමටත් පරිභෝජනය අපනයනය ඉහළ නැංවීමටත් පියවර ගෙන ඇත. මේ යටතේ අන්නාසි, අඹ, අලිපේර, කෙසෙල්, කොස්, දෙළුම්, පැපොල්, මිදි, මැංගුස්, රඹුටන්, පැඟිරි බෝග හා පාරම්පරික පලතුරු බෝග වන මාදං, වෙරළු වැනි පලතුරු ව්‍යාප්තිය හා අස්වනු නැංවීමටත් පියවර ගෙන ඇත. මෙම වැඩසටනේ දී මුහුණදීමට සිදු වූ ගැටලු වන්නේ රෝපණය කරන සෑම බීජයක්ම හා පැළයක් සඳහා ම පෝෂණ ලබාදීම, රැකබලාගැනීම, කෘමි හා සත්ත්ව හානි ජන්මය හා ස්වභාව ධර්මය යන හේතු රාශියක් මත වගාකරන මුළු ප්‍රමාණයම ගස් වශයෙන් වර්ධනය නොවීමේ ස්වාභාවික ගුණයට යටත්වීම නිසා වගා සීමා සහිත වෙයි. වන සත්ත්ව හානිය නිසා ලැබෙන සියලුම ඵලදාව මිනිස් පරිභෝජනයට ගැනීමට ද නොහැකි වී ඇත.

❖ සුළු අපනයන බෝග වගාව ඉහළ නැංවීම හා අස්වනු වැඩිකිරීම සඳහා 'අපි වවමු රට නගමු' වැඩසටහනෙන් ප්‍රධානත්වය ලබාදුන් අතර ඒ යටතේ කුරුඳු සහ ගම්මිරිස් වගා බිම් ප්‍රමාණය හා කුරුඳු ගම්මිරිස් නිෂ්පාදනය 2010 වර්ෂය වන විට ඉහළ ගොස් ඇත.

❖ පරිසර හිතකාමී කෘෂිකර්මය සෞඛ්‍යයට හිතකර කෘෂි නිෂ්පාදන වැඩි වශයෙන් සිදු කිරීම කොම්පෝස්ට් පොහොර වැඩසටහන් ප්‍රවර්ධනය හරහා සිදුවිය. කාබනික පොහොර භාවිතයේ වැදගත්කම හා පරිසර සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව සංකල්පය කාබනික පොහොර වැඩසටහන මඟින් වර්ධනය වී තිබේ. කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය හා භාවිතය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇති කිරීමට මෙම වැඩසටහන උත්සාහ දරා ඇත. රටේ විවිධ ප්‍රදේශවල පවතින වගා බිම් ප්‍රමාණ ගොවීන්ගේ මූලික හා ද්විතීයික රැකියා හා වෙනත් ජීවනෝපායන් අනුව මේ සඳහා

කැප කළ යුතු දින ගණන හා ශ්‍රමය විශාල වීම නිසා කාබනික පොහොර නිෂ්පාදනයට යොමුවීමේ ප්‍රවණතාවය මන්දගාමී වී තිබුණි.

❖ පරිසර සංරක්ෂණය හා පාංශු සංරක්ෂණය යන ප්‍රධාන අභිමතාර්ථ ඉටුකරගනිමින් ශ්‍රී ලංකා හදබිම සංවර්ධන අධිකාරිය විසින් තෝරාගත් ගොවි පවුල්වලට බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබාදීම විශේෂයෙන්ම දේශීය බීජ සැපයීම, තාක්ෂණික සහායක සේවා සැපයීම හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යනා දී කාර්යයන් මඟින් ගොවීන්ගේ ජීවන තත්ත්වය සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇත. මුං, කව්පි, බඩඉරිඟු, මිරිස් සහ කුරක්කන් යන දේශීය බීජ තෝරාගත් ගොවි කණ්ඩායම්වලට නොමිලේ සැපයීම නිසා දේශීය බීජ හිඟයකින් දුෂ්කරතා විඳි ඌව පළාතේ ගොවීන්ට සහනයක් සැලසී තිබේ. මෙම බීජ යොදාගනිමින් ඉදිරි කන්නවල ගොවිතැන් කිරීම එම ගොවීන්ට හැකි වී ඇති අතර පාංශු සංරක්ෂණ වැඩසටහන් ද අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත.

❖ පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් වී සහල් එළවළු සහ කුළු බඩු නිෂ්පාදන සම්බන්ධයෙන් පසු අස්වනු තාක්ෂණය ආශ්‍රිත ව්‍යාපෘති හඳුන්වාදීමත් පවත්නා ව්‍යාපෘති තවදුරටත් දියුණු කිරීමත් ගොවි ජනතාවගේ ආදායම් ඉහළ නැංවීමේ කෘෂි ව්‍යවසායන් ග්‍රාමීය හා නාගරික අංශවල ස්ථාපනය කර ඇත. තත්ත්වයෙන් උසස් සහල් නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට ලබාදීම මඟින් ශ්‍රී ලංකාවේ සහල් නිෂ්පාදනයේ ගුණාත්මක තත්ත්වය වර්ධනය වීමට ද හේතු වී ඇති අතර එය සහල් අපනයනය සම්බන්ධයෙන් අපනයන සැකසුම් ප්‍රජාවක් බිහිකිරීමේ කාර්යයට පිටිවහලක් වී ඇත. මෙම ආයතනය විසින් හඳුන්වා දුන් ප්ලාස්ටික් ඇසුරුම් ව්‍යාපෘතිය පමණක් තරමක් පසුබෑමකට ලක්වී ඇති අතර ප්‍රවාහන සේවා විධිමත්වීම ගොවි ජනතාවට, තොග වෙළඳුන්ට හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ කොටස්කරුවන්ට කරුණු අවබෝධවීමට මත දිගුකාලීන වශයෙන් මෙයින් යහපත් ප්‍රතිඵල ළඟාවනු ඇති බව සඳහන් කළ හැකිය.

❖ මෙම වැඩසටහන මඟින් බීජ නිෂ්පාදනය, පටක රෝපණය, පැළ නිෂ්පාදනය වැනි කෘෂිකර්මයේ මූලික අවශ්‍යතා ඉටුකිරීම නිසා රටේ වගාව සඳහා ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය වීමෙන් අනාගතයේ නිෂ්පාදනයට හිතකර බලපෑමක් ඇති කරවයි. මේ යටතේ සිදු කළ ප්‍රජා බීජ නිෂ්පාදන වැඩසටහන යටතේ වී , ලොකු ළූණු, උඳු, මුං, කව්පි වැනි බීජ නිෂ්පාදනය සම්බන්ධයෙන් විශාල ප්‍රගතියක් අත් වී ඇත.

❖ දඹුල්ල, මහවැලි එච් කලාපය, නාච්චදූව ව්‍යාපාරය යන ප්‍රදේශවල ගොවීන් ලොකු ළූණු බීජ නිෂ්පාදනය සම්බන්ධයෙන් වූ තාක්ෂණය උකහාගෙන ඇති අතර ඔවුන් වර්තමානයේ තම වගාවට අවශ්‍ය බීජ නිපදවීමට අමතරව ව්‍යාපාරික වශයෙන් ද බීජ

නිපදවීමේ තත්ත්වයට දියුණු වී තිබේ. කෘෂි ක්ෂේත්‍රයේ මෙවැනි සාර්ථකවීම් කිහිපයක්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල තාක්ෂණික සහාය සහ ව්‍යාප්ති සේවා මත 'අපි වවමු රට නගමු' වැඩසටහන යටතේ ශක්තිමත්ව සැපයීම මත ඉටුකර ගත හැකි වී තිබේ. බීජ වී සහ වෙනත් බීජ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවය විසින් සහතික කිරීමේ ප්‍රමාදයක් පවතින අතර බොහෝ බීජ ඉතා සුළු හේතු මත අසමත් කරන අවස්ථා පවතින බව ද හෙළි විය. එම නිසා බීජ සහතික කිරීමේ සේවය විසින් බීජ සහතික කිරීම මීට වඩා කඩිනම් කිරීමේ අවශ්‍යතාවය ගොවීන් පෙන්වා දෙන ලදී.

- ❖ රටේ අවශ්‍යතාවයේ ප්‍රමාණයට තවදුරටත් නිෂ්පාදනයක් සිදු නොවන අලබෝග, එළවළු බෝග, ධාන්‍ය හා ලොකු ළූණු වැනි බෝග සඳහා බෝගනායක තනතුරු හඳුන්වාදීම එම බෝග වගා වැඩි දියුණු කිරීම, අවශ්‍ය තාක්ෂණය, බීජ සැපයීම වැනි වැඩසටහන් හඳුන්වාදීම මඟින් මෙම බෝගවලට නිෂ්පාදනයේ යම් කිසි ප්‍රගතියක් පෙන්වීමට හේතුවන ක්‍රියාකාරකම් සිදු කර ඇත.
- ❖ මෙම වැඩසටහන් යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්ට පුහුණුව ලැබුණු අතර එම පුහුණුව අනාගතයේ මෙවැනි වැඩසටහන් සිදු කිරීමට හා ඔවුන්ගේ රාජකාරී ජීවිතයේ ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීමට මහඟු පිටිවහලක් වී ඇත.
- ❖ අතිරේක ආහාර බෝග වගාකිරීම සඳහා ලබාදුන් ප්‍රමුඛතාවය මත බඩ ඉරිඟු මඟින් ස්වයංපෝෂිත මට්ටමට පැමිණ ඇති අතර අපනයනයට ද පිවිසී ඇත. බඩඉරිඟු වගාව සම්බන්ධයෙන් වැඩි අස්වනු ලබාදෙන ප්‍රභේද හඳුන්වාදීම පෞද්ගලික සමාගම් ගණනාවක් ගොවීන් සමඟ ගිවිසුම්ගත ගොවිතැනට එකතුවීම මත බඩඉරිඟු වගාව ඉහළම නිෂ්පාදනයක් වාර්තා කර ඇත. අක්කරයක අස්වැන්න කිලෝ ග්‍රෑම් 2500-3000 දක්වා වූ ඉහළ අස්වනු ලැබීමේ තත්ත්වයට දියුණු වී ඇත.
- ❖ මෙම වැඩසටහන සැලසුම් කිරීමේ අවදියේ දී කෘෂිකර්ම, පරිපාලන හා ගොවිජන සංවර්ධන යන ක්ෂේත්‍රවලට අයත් ඉහළ, මධ්‍යම සහ පහළ මට්ටමේ නිලධාරීන්ගේ අදහස් ප්‍රමාණවත් තරම් ලබාගෙන නොතිබුණි. 'අපි වවමු රට නගමු' වැඩසටහන සම්බන්ධයෙන් ඉහළ, මධ්‍යම හා පහළ යන කාණ්ඩවලට අයත් කෘෂිකර්ම හා පරිපාලන සේවයේ මෙම වැඩසටහනට සම්බන්ධ වූ විවිධ නිලධාරීන්ගෙන් දිස්ත්‍රික් ලේකම් වැනි පරිපාලන නිලධාරීන්ට මෙම වැඩසටහන පිළිබඳව පැවතියේ සාමාන්‍ය අවබෝධයක් පමණක් බව දක්නට ලැබුණ අතර කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඉහළ නිලධාරීන් මේ පිළිබඳව ඉහළ අවබෝධයක් පැවති බව දක්වා තිබුණි. මෙම සියලුම නිලධාරීන්ගෙන් බහුතර පිරිස දක්වා තිබුණේ 'අපි වවමු රට නගමු' වැඩසටහන

තරමක් සාර්ථක වැඩසටහනක් වශයෙනි. මෙම වැඩසටහනේ සැලසුම් අවදියේ දී මෙම නිලධාරීන්ගෙන් අදහස් ලබාගැනීම එතරම් හොඳින් සිදු නොකළ බව ඔවුන් බහුතරය පවසා තිබුණි. කෙසේ වුවත් මෙම වැඩසටහන පිළිබඳව ඔවුන්ගේ බහුතර මතය වූයේ මෙය කාලයට උචිත ඉතා වැදගත් අරමුණුවලින් යුතු වැඩසටහනක් වන අතර මෙය වර්තමානයට ගැළපෙන පරිදි සංශෝධනය කර දිගටම පවත්වාගෙනයාම රටේ කෘෂිකර්මයේ දියුණුවට හේතුවිය හැකි බවයි.

## 8.2 නිගමනය

'අපි වවමු-රට නගමු' වැඩසටහන ඉහළ සිට පහළට සැලසුම් කිරීමේ සාම්ප්‍රදායික ප්‍රවේශය මත සැලසුම්කර දේශපාලන මුහුණුවරක් ද සහිතව හඳුන්වාදුන් දේශීය ආහාර නිෂ්පාදනය දිරිගැන්වීමේ ජාතික වැඩසටහනක් විය. දේශීය කෘෂිකාර්මික නිෂ්පාදන ධාරිතාවය වැඩිකොට ආනයන පරිමාව අඩු කිරීම සඳහා වූ ක්‍රමෝපායයන් ගණනාවක් මේ යටතේ ක්‍රියාවට නංවන ලදී. ආහාර වැඩි වැඩියෙන් වගාකිරීම තුළින් දේශීය නිෂ්පාදනය වැඩි කිරීම ප්‍රධාන අරමුණ කොටගත් මෙම වැඩසටහන කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සියලුම ආයතන, නිලධාරීන් හා ගොවි ජනතාවගේ පුළුල් සහයෝගීතාවය ලබාගනිමින් සාර්ථකව ක්‍රියාත්මක විය. මධ්‍යම රජයේ හා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු මෙම වැඩසටහන කෙරෙහි සිදු කළ කැපවීම මත රතුළූණු, ලොකු ළූණු, බඩඉරිඟු, මුං ඇට, කව්පි, සෝයාබෝංචි, රටකජු යනාදී ක්ෂේත්‍ර බෝගවල නිෂ්පාදනය වැඩි වී ඒවායේ ආනයනික ප්‍රමාණය 42% සිට 97% දක්වා අඩු කිරීමට හැකියාව ලැබුණි. වාර්ෂික ඒක පුද්ගල සහල් හා සහල් පිටි ආශ්‍රිත ආහාර පරිභෝජනය කිලෝග්‍රෑම් 108 සිට කිලෝග්‍රෑම් 115 දක්වා වැඩිකර ගැනීමට හැකි විය. පුරන් කුඹුරු වගා කිරීමේ වැඩසටහන ශීඝ්‍රයෙන් ක්‍රියාත්මක වූ අතර රට පුරා පුරන් කුඹුරු හෙක්ටයාර් 65,710ක් වගා කිරීමටත්, කුඹුරු පුරන් වන්නට ඉඩනොදී වගා කළ යුතුය යන සංකල්පය සමාජ ගතකිරීමටත් මෙම වැඩසටහන සමත් විය. ගෙවත්ත යනු නාගරික හා ග්‍රාමීය ගෙවතු හිමියාට සමීපතම ආහාර නිෂ්පාදන ඒකකය ලෙස ගෙවතු වගාව තුළින් නැවුම් එළවළු, පලතුරු, පලා වර්ග සපයාගැනීමේ හොඳම මාර්ගය යන සංකල්පය ජනතාවට ඒත්තු ගැන්වීමට ක්‍රියා කරන ලදී. රටපුරා ග්‍රාමීය නාගරික පාසල් පරිශ්‍ර, කාර්යාල හා හමුදා පරිශ්‍ර ගෙවතු වගා බිම් බවට පත් විය. අදාළ කාලය තුළ ගෙවතු වගා සංකල්පය පුළුල් ලෙස සමාජයට සමීපවීම නිසා ගෙවතු වගා කිරීමේ නැඹුරුව වැඩි විය. ශ්‍රී ලංකාවේ නිර්දේශිත දෛනික ඒක පුද්ගල පලතුරු පරිභෝජනය ග්‍රෑම් 112 ප්‍රමාණයට වඩා අඩු බව සමාජයට ඒත්තුගන්වන ලදී. පලතුරු පරිභෝජනය වැඩිකිරීම සඳහා පලතුරු සුලබ කිරීම අවශ්‍ය වන අතර ඒ සඳහා තෝරාගත් පලතුරු වර්ග 11ක වගා ව්‍යාප්තිය වැඩිකිරීමටත් පවතින ඵලදාව වැඩිකිරීමටත් අවශ්‍ය පියවර ගන්නා ලදී. ජෛව විවිධත්ව පලතුරු උද්‍යාන ව්‍යාපෘතිය අරඹා පලතුරු බෝග ප්‍රවර්ධනය

කිරීමේ ශක්තිමත් පසුතලයක් නිර්මාණය කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස පලතුරු වගා භූමි ප්‍රමාණය 5.6%කින් ද, පලතුරු නිෂ්පාදනය ඉහළයාම 1.3%කින් ද සනිටුහන් වී තිබුණි. අනාගතයේ දී මෙම පදනම මත වඩා විපුල ඵල ලැබෙනු ඇත. සුළු අපනයන බෝග වගා නැංවීම යටතේ ගම්මිරිස් හා කුරුඳු වගා බිම් ප්‍රමාණය වැඩිකර ගැනීම හා අපනයන පරිමාව ඉහළ නංවා ගැනීමට හැකි වී ඇත. කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතයේ වැදගත්කම අවබෝධ කිරීම සඳහා කාබනික පොහොර නිෂ්පාදනය හා එහි භාවිතය දිරිගැන්වීමේ තාක්ෂණික දැනුම රටපුරා ප්‍රචලිත කිරීමේ විශේෂිත මෙහෙයුම් මධ්‍යස්ථානයක් පවා ස්ථාපිත කරන ලදී. රසායනික පොහොර භාවිතය අඩුකර කාබනික පොහොර භාවිතය වැඩි කිරීමේ වැදගත්කම ජන මනස තුළට කා වැද්දීමටත් එම සංකල්පය සමාජය තුළ පැළපදියම් කිරීමටත් මෙම වැඩසටහන ඉවහල් විය. පසු අස්වනු තාක්ෂණය ප්‍රචලිත කිරීම යටතේ අස්වනු ගබඩා කිරීම හා සැකසීමේ තාක්ෂණික ක්‍රමවේද ජනතාව වෙත සමීප කිරීමේ ක්‍රමෝපායයන් ගණනාවක් ක්‍රියාත්මක විය. පෝෂ්‍යදායී සහල් නිෂ්පාදනය, ධාන්‍ය සැකසීම, ඇසිරීම යනාදී සැකසුම් කාර්යයන් සඳහා ගම්බද ගොවි ජනතාවගේ නැඹුරුව වැඩි වී ඇත. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විවිධ ශ්‍රේණිවලට අයත් නිලධාරීන්ට පුහුණු අවස්ථා ගණනාවකට සහභාගීවීමට අවස්ථාව ලැබී ඇත. මෙය කෘෂිකර්ම ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය සඳහා ලැබුණු වටිනා අවස්ථාවක් ලෙස නිලධාරීන් අගය කර තිබුණි.

මෙම වැඩසටහන සැලසුම් අවදියේ දී කෘෂි ක්ෂේත්‍රයේ ඉහළ, මධ්‍යම, පහළ නිලධාරීන්ගෙන් පුළුල් අදහස් විමසීමක් සිදු නොකිරීම, වැඩසටහනේ ප්‍රගති පාලනයක් සිදු නොකිරීම, ආයතන අතර අන්තර් සම්බන්ධතාවයක් සහිතව වැඩසටහන ක්‍රියාත්මක කරනවා වෙනුවට එක් එක් ආයතන හුදකලාව මෙය ක්‍රියාත්මක කිරීම නිසා එකම වැඩසටහන ආයතන කිහිපයකින් ක්‍රියාත්මකවීම, වැඩසටහනේ අවසන් අදියරේ දී කෘෂිකර්ම සහ ගොවිජන සංවර්ධන ක්ෂේත්‍රයේ සියලු නිලධාරීන් මෙම වැඩසටහන පසෙකලා වෙනත් වැඩසටහනක් වෙත යොමු වීම යන දුර්වලතා කිහිපයක් ද මෙහි අන්තර්ගත විය. එසේ වුවත් සමස්තයක් ලෙස ගත් කළ මෙය මෑතකදී කෘෂිකර්ම ක්ෂේත්‍රයේ භෞතිකමය දියුණුවක් ඇති කිරීමටත් නිලධාරීන්ගේ හා ගොවීන්ගේ ආකල්පවලට ධනාත්මක බලපෑමක් ඇතිකිරීමටත් ඉවහල් වූ ජාතික වැඩසටහනක් වශයෙන් "අපි වවමු - රට නගමු" වැඩසටහන අගය කළ හැකිය.

## 8.3 නිර්දේශ

- කෘෂිකර්ම හා ගොවිජන ක්ෂේත්‍රයේ සියලු අංශ නියෝජනය වන පරිදි ජාතික මට්ටමේ මෙවැනි වැඩසටහනක් යළි සැලසුම් කර ක්‍රියාවට නැංවීම කෘෂි ක්ෂේත්‍රයේ මෙතෙක් ලබාගත් දියුණුව අඛණ්ඩව පවත්වාගෙනයාම සඳහා වැදගත් වේ.

- මෙවැනි වැඩසටහන් සැලසුම්කිරීමේ අවධියේ දී කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ, කෘෂිකර්ම උපදේශක, ගොවිජන සංවර්ධන නිලධාරී වැනි කෘෂි ක්ෂේත්‍රයේ ඉහළ,මධ්‍යම සහ පහළ නිලධාරීන් සමඟ සෘජුව අදහස් හුවමාරු කර ගත යුතුය.

- මෙවැනි වැඩසටහනකින් අපේක්ෂිත අරමුණු සපුරාගැනීම සඳහා විවිධ ආයතන මඟින් සපුරාලීමට ඉලක්ක කරන ලද කාර්යයන් ඉටු කර ඇත්දැයි සොයා බැලීම සඳහා ක්‍රමවත් පසු විපරම් කිරීමේ ක්‍රමයක් ස්ථාපිත කළ යුතුය.

- ප්‍රධාන වගා කන්න පදනම් කර ගනිමින් කෘෂි බෝග වගා කිරීමට අවශ්‍ය යෙදවුම් හා පිළිසකර කිරීම සඳහා අවශ්‍ය මුදල් නියමිත කාලයට ලබාදීමට කටයුතු කළ යුතුය.

- වැඩසටහන ක්‍රියාත්මකවීම අන්තර් ආයතන සම්බන්ධීකරණ ක්‍රමෝපායය යටතේ සිදු විය යුතුය. උදාහරණ ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග සංවර්ධන හා පර්යේෂණ ආයතනය

- නෙත් කලාපයේ අයිතිකරුවන් වගාකිරීමට අකමැත්තක් දක්වන බව හඳුනාගත් පුරන් කුඹුරු යායවල් වගා කිරීම ව්‍යාපාරික කෘෂිකර්මයේ නියැලීමට කැමැත්තක් දක්වන පුද්ගලයන්ට පවරා දිය යුතුය. පුරන් කුඹුරු අයිතිකරුවන් සමඟ බදු ක්‍රමයක් හෝ වෙනත් ගිවිසුමක් ඇති කර ගැනීම මත මෙම කුඹුරුවල සම්ප්‍රදායික දේශීය වී වගා කිරීම, කාබනික වී ගොවිතැන ආදී ක්‍රම මත කෘෂිකර්මාන්තය සිදු කිරීම හා ඒවා අපනයනය කිරීම සඳහා යොමු වූ ව්‍යාපාරික ගොවිපළවල් බවට ඒවා පත් කළ යුත්තේ ය. හිමිකරුවන්ම මෙම කාර්යය කිරීමට ඉදිරිපත් වන්නේ නම් ඔවුන්ට ද අවශ්‍ය බීජ, ව්‍යාප්ති සේවා හා වෙළඳපළ තොරතුරු ලබාදීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතුය.

- ගෙවතු වගාවේ නිරතවීමට කැමති පවුල් පමණක් තෝරා ඔවුන් සඳහා දැනුම සහ වෙනත් පහසුකම් සපයා දී ගෙවතු වගාවට යොමු කිරීම

- එළවළු, ලොකු ළූණු, මිරිස් හා ධාන්‍ය බීජ නිෂ්පාදනයේ යෙදී සිටින සියලුම ගොවීන් ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන මට්ටමින් ලියාපදිංචි කරවා ඔවුන් නිෂ්පාදනය කරනු ලබන බීජ වර්ග සාධාරණ මිල ගණන් යටතේ මිල දී ගැනීමට පියවර ගැනීම ඔවුන්

බීජ නිෂ්පාදන ගොවීන් වශයෙන් විශේෂ ප්‍රාගුණ්‍යයකින් හෙබි කණ්ඩායමක් බවට පත්වීමට ඉඩ හැරීම.

- කොම්පෝස්ට් පොහොර භාවිතයෙන් පසේ පෝෂණ තත්ත්වය දියුණුවීම පිළිබඳව හා විශේෂයෙන් තොර ආහාර නිෂ්පාදනයෙන් ප්‍රජාවගේ සෞඛ්‍ය සංරක්ෂණය පිළිබඳව දැනුවත් කිරීමේ පුළුල් ප්‍රචාරක වැඩසටහන් ගොවිජනතාව උදෙසා ක්‍රියාවට නැංවීම හා කොම්පෝස්ට් පොහොර සාධාරණ මිල ගණන් යටතේ මිල දී ගැනීමට පහසුකම් සැලසීම කොම්පෝස්ට් භාවිතය දැනට වඩා ප්‍රචලිතවීමට හේතු වන්නකි.
- කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරනු ලබන අනාගත වැඩසටහන් හොඳින් ක්‍රියාත්මකවීම සඳහා පළමුව ජනමනසට ඒවා ඇතුළත් කළ යුතු වන අතර ඒ සඳහා රූපවාහිනී මාධ්‍ය භාවිත කළ යුතුය.

ආශ්‍රිත ග්‍රන්ථ


- දේශීය ආහාර නිෂ්පාදන දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම, ජනාධිපති කාර්ය සාධන බලකායට යෝජිත සැලැස්ම (2008-2010 ) කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය, කොළඹ
- ආදායම් හා වියදම් සමීක්ෂණ (2006-2007), (2009-2010) ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, කොළඹ
- ආහාර හා කෘෂිකර්ම සංවිධානය, කොළඹ
- කාබනික පොහොර නිෂ්පාදන වාර්තා, (2008) කෘෂිකර්ම අමාත්‍යාංශය, කොළඹ
- කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්තා, (2010-2011) ගන්නෝරුව පේරාදෙණිය
- ජාතික පොහොර ලේකම් කාර්යාල වාර්තා, (2005) කොළඹ
- නැගෙනහිර පළාත් කෘෂිකර්ම අමත්‍යාංශ වාර්තා (2010-2011) නැගෙනහිර පළාත් කෘෂිකර්ම අමත්‍යාංශය, ත්‍රිකුණාමලය
- පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන වාර්තා (2012) පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, කනංවිල, හොරණ
- ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන වාර්තා (2012) ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, මාකඳුර
- උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්තා (2012) පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අනුරාධපුරය
- උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන වාර්තා (2012) උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, ගන්නොරුව, පේරාදෙණිය
- ප්‍රගති වාර්තා ,ශ්‍රී ලංකා හදබිම අධිකාරිය (2012) ගන්නෝරුව, පේරාදෙණිය
- ප්‍රගති වාර්තා ,පසු අස්වනු තාක්ෂණ ආයතන (2010, 2011, 2012), අනුරාධපුරය
- රේගු දෙපාර්තමේන්තු වාර්තා, (2005) කොළඹ
- ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව (2010) ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ
- සන්ඩේ ඔබ්සර්වර් 2014 ඔක්තෝබර් 05, එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, ලේක්හවුස්, කොළඹ

## ඇමුණුම 01: 2008 වර්ෂයේ පලතුරු ප්‍රවර්ධන ක්‍රියාවලියේ ප්‍රගතිය

| | බෝගය | ප්‍රතිපාදන (රු .මි.) | භෞතික ප්‍රගතිය | | | වියදම (රු.) |
|---|---|---|---|---|---|---|
| | | | ක්‍රියාකාරකම් | ඉලක්කය | ප්‍රගතිය | |
| 01 | කෙසෙල් | 1.0 | • මව්පැළ නිපදවීම<br>• පුහුණු කිරීම (හම්බන්තොට, ගාල්ල, මාතර, වලව) | 10,000 | 7,000 | 598,079.00 |
| 02 | අන්නාසි | 1.0 | • පැළ නිපදවීම | 20,000 | 17,447 | 588,096.00 |
| 03 | පැපොල් | 1.5 | • කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ගොවිපළවල් පිහිටුවීම<br>• සෑම ගෙවත්තකම පැපොල් පැළයක් පිහිටුවීම(ග්‍රෑම් 5 දෙමුහුම් බීජ ලබාදීම)<br>• පුහුණු පංති | 25<br>15<br>12 | 18<br>15<br>04 | 144,000.00 |
| 04 | මිදි | 2.2 | • භූමි සැකසීම හා නව වගා පිහිටුවීම<br>• පැළ බෙදාදීම(තවාන් කරුවන්)<br>• පුහුණු පංති<br>• මාධ්‍ය වැඩසටහන් | හෙක්. 10<br>360<br>23<br>01 | 10.6<br>80<br>22<br>01 | 270,000.00 |
| 05 | දෙළුම් | 0.7 | • මව්ශාක තඩත්තුව<br>• බීජ පැළ නිපදවීම<br>• පුහුණු කිරීම(ගොවීන්) | <br>100<br>15,000<br>100 | 100<br>4,460<br>50(පත්‍රිකා 05)<br>60(අත්පත්‍රිකා ) | 343,098.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 06 | පැඟිරි කුලයේ බෝග | 2.0 | • පැළ නිපදවීම<br>• මව් ශාක උද්‍යාන ඇති කිරීම<br>• නව වගා ඇති කිරීම<br>• පුහුණු පංති | 25,000<br>8,000(බද්ධ පැළ)<br>අක්.02<br>04<br>15 | 27,000(ග්‍රාහක)<br>2,000(බද්ධ පැළ)<br>අක්. 01<br>04<br>10 | 1,000,000.00 |
| 07 | අලි පේර | 2.0 | • පැළ නිෂ්පාදනය<br>• මුදුන් බද්ධය(ගස් ගණන)<br>• නව වගා<br>•<br>• පුහුණු කිරීම (පසු අස්වනු තාක්ෂණය) | 10,000<br>1,000<br>ගස් 3,000<br>ගොවීන් 1,000 | 4,700<br>1,00<br>400<br>550 | 972,674.00 |
| 08 | මැංගුස් | 1.1 | • නව වගා ඇති කිරීම<br>• පැළ නිෂ්පාදනය<br>• දැනුවත් කිරීම්(ගොවීන්) පාසැල් සිසුන්(පාසැල් 06) | හෙක්.48(4810පැළ)<br>5,000<br>2,000 | හෙක්. 38(3756 පැළ)<br>4,000(බීජ පැළ)<br>837<br>400 | 560,000.00 |
| 09 | අඹ | 1.5 | • පැළ නිපදවීම<br>• පැරණි වගා පුනරුත්ථාපනය<br>• පසු අස්වනු තාක්ෂණය වැඩි දියුණු කිරීම, නිෂ්පාදන පිටරට යැවීම් | 1,000<br>1,000<br>10 | 500<br>-<br>10 | 558,047,00 |
| 10 | රඹුටන් | 1.0 | • නව වගා පිහිටුවීම<br>• ස්ප්‍රේ යන්ත්‍ර බෙදා දීම<br>• ගොවීන් පුහුණු | හෙක්.40 (පැළ 4,000)<br>25<br>2,000 | හෙක්. 50.5(පැළ 5,050)<br>25<br>460 | 1,000,000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | කිරීම<br>• පැරණි ගස් පුනරුත්ථාපනය<br>• ගස් කප්පාදු කිරීමට උපකරණ මිලදී ගැනීම | 300<br><br>25 | -<br><br>23 | |
| 11 | කොස් | 1.0 | • මව් ශාක පිහිටුවීම(ගොවිපළ වල්)<br>• පැළ නිපදවීම(බද්ධ පැළ)<br>• බීජ පැළ නිපදවීම<br>• පුහුණු පංති<br>• Tree injector මිල දී ගැනීම(රෝග හා පළිබෝධ)<br>• පෝස්ටර්<br>අත්පත්‍රිකා | 200<br><br>5,000<br><br>3,000<br><br>60<br><br>100<br><br>5,000<br><br>10,000 | 100(ගොවිපළ 4)<br><br>1,880<br><br>1,000<br><br>50(පුහුණුකරුවන්2,400)<br><br>100<br><br>5,000(2,500 බෙදා දී ඇත.)<br><br>10,000 | 890,000.00 |
| | **මුළු එකතුව** | | | | | **6,923,994.00** |

ඇමුණුම අංක 02: 2010 වර්ෂයේ පලතුරු බෝග ප්‍රවර්ධනය හා ප්‍රගතිය (ප්‍රජා බීජ වැඩසටහන)

| | බෝගය | ක්‍රියාකාරකම් | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | කෙසෙල්<br><br>කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය- තෙලිජ්ජවිල | වගා ආදර්ශන පිහිටුවීමට ඒ ඒ පළාත්වල පැළ තවාන්කරුවන් ඇති කිරීම | 50,000 | පැළ 50,000<br>පැළ 25,000ක් නැගෙනහිර පළාතට යවා ඇත. |
| | | පුහුණු පංති / දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | වැඩසටහන් 50 | පුහුණු වැඩසටහන් 21ක් පවත්වා ඇත.(ප්‍රතිලාභීන් 2130)<br><br>සෙවනගල ප්‍රදේශයේ හෙක්. 262ක වගාව ආරම්භ කර ඇත. |
| | | හෙක්. 0.25ක ආදර්ශන පිහිටුවීම | ආදර්ශන 75 | ආදර්ශන 18ක් ස්ථාපනය කර ඇත. |
| | | නිර්දේශිත වර්ගවල මව් වගාවන් පිහිටුවීම | මව් වගාවන් 06 | 06ම පිහිටුවා ඇත. |
| 02 | අන්නාසි<br><br>බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව- පේරාදෙණිය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතනයන් හි පැළ සුලභ කිරීම හා මව් වගා නඩත්තුව(මාකඳුර, පස්යාල, තෙලිජ්ජවිල, පොළොන්නරුව) | 3,000 | පැළ 8,000 |
| | | නව රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ඒකක ඇරඹීම(අඹේපුස්ස, මිද්දෙනිය) | පැළ 5,000 | ආරම්භ කර ඇත. |
| | | ව්‍යාපාරික මට්ටමේ ගොවීන්ගේ පැළ සුලභ කිරීම | 300,000 | - |
| 03 | පැපොල්<br>ව්‍යාප්ති හා පුහුණු අංශය - පේරාදෙණිය | පුහුණු/ ආදර්ශන/ පැපොල් වගා නිරීක්ෂණ (නිලධාරීන් සහ ගොවීන්) | පුහුණු වැඩසටහන් 08 | පුහුණු වැඩසටහන් 09 |
| | | පැපොල් වගාව නංවාලීමේ වැඩසටහන්/ පැපොල් බීජ බෙදාහැරීම | පවුල් 90ට පැපොල් බීජ බෙදාහැරීම (ග්‍රෑම් 5 බැගින්) | ගොවි පවුල් 70ට බීජ බෙදාහැර ඇත. |
| | | පැපොල් වර්ග වැඩි දියුණු කිරීම(ප.හෝ.පර්. සං.මධ්‍යස්ථානය- හොරණ) | නව දෙමුහුන් වර්ග බිහි කිරීම | දෙමුහුන් වර්ග දෙකක් තෝරාගෙන ඇත. |
| | | පැපොල් කෘමි හා රෝග මර්දනය (ප.හෝ.පර්. සං.මධ්‍යස්ථානය - හොරණ) | කෘමි හා රෝග පාලනය | පංති 03( ප්‍රතිලාභීන්50). |
| | | රත්න වර්ගයේ බීජ නිෂ්පාදනය - ගිරාඳුරු කෝට්ටේ | රත්න බීජ නිෂ්පාදනය | කි.ග්‍රෑ.09ක් නිපදවා ඇතු. |
| | | නව වර්ග සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවට ලක් කිරීම (HORDI-ගන්නෝරුව) | නව වර්ග සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාව | දෙමුහුන් වර්ග 02ක් ස්ථාන දෙකක ක්ෂේත්‍ර පරීක්ෂාව කරන ලදී. |

| | | | | |
|---|---|---|---|---|
| 04 | අඹ<br>ආහාර පර්යේෂණ ඒකකය - ගන්නෝරුව | රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය | ටොම් ඊ. ජේ.සී බද්ධ පැළ 150<br><br>ගිරා අඹ බද්ධ පැළ 600 | ටොම් ඊ. ජේ.සී බද්ධ පැළ 150<br><br>ගිරා අඹ බද්ධ පැළ 250 |
| | | අඹ වගා පුනරුත්ථාපනය | | අක්කර 40 |
| | | අවාරයේ මල් පිදීම(කුල්ටා යෙදීමෙන් උත්තේජනය) | | ආදර්ශ 03 |
| | | උසස් තත්ත්වයේ අඹ නිෂ්පාදනය | | පුහුණු පංති 05 |
| 05 | මිදි<br>මාෂ බෝග හා තෙල් බෝග මධ්‍යස්ථානය- අඟුණුකොළපැලැස්ස | රෝපණ ද්‍රව්‍ය මිලදී ගෙන තෝරාගත් ගොවීන් අතර බෙදා හැරීම | පැළ 4,500 | ඉදිරි කන්නවල බෙදාදීම සඳහා තවාන්කරුවන් 04 දෙනෙකු පැළ නිපදවීම අරඹා ඇත. |
| | | ව්‍යාප්ති නිලධාරීන්ට හා ගොවීන් පුහුණු වැඩසටහන් පැවැත්වීම | පුහුණු කිරීම් | මිදි වගා කප්පාදුව වැඩසටහන් - 03 (ප්‍රතිලාභීන් 06) |
| | | ක්ෂේත්‍ර පරීක්ෂාව | ක්ෂේත්‍ර පරීක්ෂා 32 | හම්බන්තොට මිදි වගා 06ක් පරීක්ෂාකර වැල් කප්පාදුව හා පුහුණුව පිළිබඳ උපදෙස් ලබා දී ඇත. |
| | | නව මිදි ප්‍රභේද හඳුන්වා දීම | | නව ප්‍රභේද හඳුන්වා දීම සඳහා පර්යේෂණ වගාවක් අඟුණුකොළපැලැස්සේ පර්යේෂණ මධ්‍යස්ථානයේ |
| 06 | දෙළුම්<br>ප්‍රදේශීය කෘෂිකර්ම පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය- මාකඳුර | රෝපණ ද්‍රව්‍ය බෙදා හැරීම | පැළ 17,000 | පැළ 15,53 ක් නිපදවා 16,045ක් බෙදාහැර ඇත. |
| | | මව් ශාක නඩත්තුව | පැළ 400 | නඩත්තුව දිගටම සිදු කෙරේ. |
| | | ගොවි පුහුණු වැඩසටහන් | පංති | ගොවීන් 100 |
| 07 | මැංගුස්<br>පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය- හොරණ | පැළ නිෂ්පාදනය | ද්විග්‍රාහක - 500<br>බීජ පැළ - 1000 | ද්විග්‍රාහක පැළ 400ක් නිපදවා 144ක් අලෙවි කර ඇත.<br><br>බීජ පැළ 750 |
| | | දැනුවත්කිරීම්/පුහුණු පංති | ප්‍රතිලාභීන් 500 | පංති 06<br>ප්‍රතිලාභීන් 145 |
| 08 | රඹුටන්<br>ප්‍රගති මෙහෙයුම් හා ඇගයුම් ඒකකය - පේරාදෙණිය | රෝපණ ද්‍රව්‍ය මිල දී ගෙන තෝරාගත් ගොවීන් අතර බෙදා හැරීම | පැළ 4,000 | පැළ 3500ක් මිල දී ගෙන කුරුණෑගල සහ කෑගල්ල දිස්ත්‍රිකවල ගොවීන් අතර බෙදා දී ඇත. |
| 09 | අලිගැටපේර<br>උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය- ගන්නෝරුව | උසස් ගුණාත්මයෙන් යුත් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය | බද්ධ පැළ 3,000 | බද්ධ පැළ 1200<br>බීජ පැළ 1800 |

| | | | | |
|---|---|---|---|---|
| 10 | **කොස්**<br>පැළෑටි හඳුනාගැනීමේ මධ්‍යස්ථානය - හෝමාගම | මව් ශාක නඩත්තුව සහ නිර්දේශිත වර්ගවල පැළ නිෂ්පාදනය(FCRDC-හොරණ) | (FCRDC-හොරණ) අක්කර 05<br><br>බද්ධ පැළ 760 | නඩත්තු කරමින් පවතී. 300ක බෙදා දී ඇත. |
| | | අගය වැඩි කළ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම (FRU-DOA) | පංති10 | පංති10 - ප්‍රතිලාභීන් 300 කුරුදුවත්ත, නාවලපිටිය, නාලන්දා, කහවත්ත, කුරුණෑගල<br>, ඉබ්බාගමුව, වාරියපොළ, කුලියාපිටිය |
| | | දැනුවත් කිරීමේ වැඩසටහන් PVIC - හෝමාගම | පංති 200 | පංති 123 |
| | | යන්ත්‍ර උපකරණ මිලදීගැනීම(විදින යන්ත්‍රයක්) | යන්ත්‍ර 01 | මිලදීගෙන ඇත. |
| 11 | **පැඟිරි කුලයේ ශාක**<br><br>උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන ආයතනය- බිබිල | රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය(බොරලන්ද)<br><br>රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය(බිබිල) | පැළ 5000<br><br>බිබිලේ ස්වීට්- 20<br>ආරෝග්‍ය- 1500<br>මධු - 500<br>කොත්ඩ නාරං- 500<br>රහංගල - 500<br>ලෙමන්(බද්ධ) 1000<br>ලෙමන් (අතු) 1000<br>ජම්බෝල -500<br>අතුපැළ - 200 | |
| | | රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය(මදුරුකැටිය) | පැණි දොඩම් - 5000<br>ජමනාරං- 3000<br>රජ් ලෙමන්- 5000 | |
| | | රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය(RARDC-බණ්ඩාරවෙල)<br>රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය(FCRDC-හොරණ | බද්ධ පැළ -5000<br>ජමනාරං බද්ධ පැළ 1000 | <br>ග්‍රාහක පැළ 900 |

මූලාශ්‍රය: පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය,2012


ඇමුණුම අංක 03: 2012 - වර්ෂයේ පලතුරු බෝග ප්‍රවර්ධනය සඳහා සිදු කෙරුණු කාර්යයන්
(ජෛව විවිධත්ව පලතුරු උද්‍යාන ව්‍යාපෘතිය )

| | ක්‍රියාකාරකම් | | ප්‍රගතිය |
|---|---|---|---|
| 01 | ප්‍රධාන පලතුරු වර්ග සහ ඌන පරිභෝජන පලතුරු වර්ග හඳුනාගැනීම සහ ඒ යටතේ,<br>i) කොස්, වෙරළු, සැපතිල්ලා සහ වෙනත් නිවර්තන කලාපීය පලතුරු<br><br>ii) ඒ යටතේ පැඟිරි කුලයේ පලතුරු, අන්නාසි සහ දූරියන් වෙනත් නිවර්තන කලාපීය පලතුරු<br><br>iii) රඹුටන්, ගොරකා, උගුරැස්ස සහ වෙනත් ඌන පරිභෝජන පලතුරු)<br><br>iv) කෙසෙල්, අලිගැටපේර අඹ සහ වෙනත් ඌන පරිභෝජන පලතුරු | | හෙක්. 0.5ක පලතුරු විශේෂ 20ක් සකස් කිරීම.<br><br>හෙක්. 0.5ක පලතුරු විශේෂ 20ක් සකස් කිරීම සහ රෝපණ ද්‍රව්‍ය රැස් කිරීම. දෙහි - 22, දොඩම්- 11, ලෙමන්- 13<br><br>රඹුටන්, පේර, බද්ධ පැළ 26ක් ස්ථාපනය කිරීම සහ නඩත්තුව(අක්කර 02<br><br>හෙක්ටයාර් 0.75ක පලතුරු විශේෂ 15ක් සකස් කිරීම |
| 02 | ගොවිපළ උපකරණ මිලට ගැනීම | | අස්වනු නෙළන උපකරණ මිලට ගැනීම සඳහා ඉංජිනේරු අංශයට ඉල්ලීමක් කර ඇත.(තණකොළ කපන යන්ත්‍රය සඳහා රු. මි.0.2ක් ද රෝද ට්‍රැක්ටර් යන්ත්‍රයක් සඳහා රු. මි. 2ක්ද වෙන් වී ඇත.) |
| 03 | ගොවිපල භූමි ප්‍රදේශය සංවර්ධනයත් මේ යටතේ පැරණි රබර්වගා භූමිය සංවර්ධනය, වැටි, කානු සහ ජලය ගලායෑමේ පද්ධති සකස් කිරීම | | ජලය ගලායාමේ පද්ධති සකස් කිරීම, පස සංරක්ෂණය සඳහා ග්ලිරිසීඩියා වගා කිරීම. ස්ථාපිත කරන ලද වගාවන්(අඹ-127, පේර- 100, වෙනත් -106)පසු විපරම් කිරීම සිදු වෙමින් පවතී. |
| 04 | පලතුරු වගා පර්යේෂණ කටයුතු ශක්තිමත් කිරීම. මේ යටතේ පලතුරු බෝග පර්යේෂණ කටයුතු සඳහා යොදාගැනෙන භූමි කොටස සංවර්ධනය කිරීම | | අදාළ භූමි කොටස්වල ජලය ගලායෑමේ පද්ධති සකස් කිරීම. |
| 05 | ගොවිපළ ඇතුළත කෙටි පාරවල්, වැටි සකස් කිරීම සහ කානු කැපීම | | වල් නෙළීම පහසුවන පරිදි ඇතුළත කෙටි පාරවල් සැකසීම(1.5km) වැටි සකස් කිරීම. |


| | | | |
|---|---|---|---|
| 06 | දැනටමත් ස්ථාපිත කර ඇති පලතුරු විශේෂයන්හි මව් ශාක වගාව දියුණු කිරීම<br>ඒ යටතේ,<br>අඹ,රඹුටන් මැංගුස්ටීන් සහ අඩුවෙන් පරිභෝජනය කරන පලතුරු වර්ග(නමිනම්,දිවුල්, කාමරංකා,දං, දඹ, සියඹලා, ජම්බු, පේර, අනෝදා, ලොවි, ලාවුළු, ගඩුගුඩා) | | • බීජවලින් පැළ කරන ලද රඹුටන් ගස්වල මුදුන් කප්පාදු කිරීම, අඹ, රඹුටන්, මැංගුස්ටින්, පේර,ගඩුගුඩා වවා ඇති භූමියේ කැලය ශුද්ධ කිරීම. පොහොර යෙදීම, ජලවහන පද්ධති සකස් කිරීම. සංවර්ධනය කරන ලද අඹ, රඹුටන්, මැංගුස්ටින් යන පලතුරු වලින් ඉහළ අස්වැන්නක් ලැබීම. අඹ අස්වැන්න - 116kg,විකුණා මුදල් ලබාගෙන ඇත. මැංගුස්ටින් අස්වැන්න - 340 kg ලබාගෙන 251.5 kg විකුණා ඇත. රඹුටන් (ගස් 10න්) 1507 kg ලබාගෙන ඇත.<br><br>• ඌන පරිභෝජන පලතුරුවල රෝපණ ද්‍රව්‍ය රැස් කිරීම. (නමි නං-26, දිවුල්- 08,දඹ- 05,කරඹ- 15,ජම්බු- 22, පේර - 14, අනෝදා - 46, ලොවි- 12,ලාවලු - 16) සහ ගඩුගුඩඩා වගා භූමියට පොහොර යෙදීම.(අක්.0.5) |
| | පොල්, කවුපි, එළවළු, තැඹිලිවගා කිරීම | | වගාව නඩත්තු වෙමින් පවතී. |
| | කෙසෙල් සහ අන්නාසි | | හෙක්ටයාර් එකක කෙසෙල් වගා භූමිය තුළ අනවශ්‍ය මොටෙයියන් ඉවත් කර සකස් කිරීම හා වල් නෙළීම, පොහොර යෙදීම, කෙසෙල් පැළ 85ක් විකුණා ඇත. කෙසෙල් අස්වැන්න 97.6kg ලබාගෙන ඇත. |
| | තාක්ෂණය ව්‍යාප්ත කරන වැඩසටහන, මේ යටතේ අවම පරිභෝජන පලතුරු හඳුනාගැනීම සහ ඒ පිළිබඳව තාක්ෂණ පුහුණුවීම් පැවැත්වීම | | පුහුණු වැඩසටහන් 40ක් පවත්වා ඇත. ගොවීන් - 294<br>වෙනත් අය- 534 |
| | පලතුරු බෝග තවාන්වල පවතින රෝග හා පළිබෝධ පාලනය කිරීම | | හෙක්ටයාර් එකක ඇති රඹුටන් ගස් 153ක පුස් රෝග පාලනය කිරීම සහ කෘමි හා පළිබෝධවලින් තොර උසස් මට්ටමේ තවාන් සකස් කර ගැනීමට උපදේශන සේවා සැපයීම. |

මූලාශ්‍රය: පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය,2012


ඇමුණුම අංක 04




| | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|
| ප්‍රමාණය මෙ.ටො. | 855 | 1,751 | 2,657 | 5,048 |
| වටිනාකම රු. දහස් | 51,568 | 87,558 | 114,792 | 212,545 |





| | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|
| ප්‍රමාණය මෙ.ටො. | 197 | 800 | 454 | 783 |
| වටිනාකම රු. දහස් | 35,369 | 97,580 | 53,601 | 82,831 |





| | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|
| ප්‍රමාණය මෙ.ටො. | 1,731 | 1,822 | 1,339 | 900 |
| වටිනාකම රු. දහස් | 304,747 | 409,393 | 194,221 | 212,796 |

අලිගැටපේර අපනයනය




| | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|
| ප්‍රමාණය මෙ.ටො. | 0.06 | 0.02 | 0.01 | 0.52 |
| වටිනාකම රු. දහස් | 21.05 | 2.05 | 0.34 | 143.77 |

අඹ අපනයනය




| | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|
| ප්‍රමාණය මෙ.ටො. | 90 | 43 | 62 | 103 |
| වටිනාකම රු. දහස් | 60,980 | 27,238 | 25,085 | 27,935 |

දොඩම් අපනයනය



| | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|
| ප්‍රමාණය මෙ.ටො. | 9 | 13 | 13 | 54 |
| වටිනාකම රු. දහස් | 1,302 | 2,535 | 1,713 | 7,552 |




| | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|
| ප්‍රමාණය | 16 | 8 | 1 | 1 |
| වටිනාකම රු. දහස් | 6,213 | 3,639 | 280 | 431 |

ඇමුණුම 05

**වගු අංක 7.2.1: "අපි වවමු රට නගමු" වැඩසටහන සම්බන්ධයෙන් කෘෂිකාර්මික හා ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ අදහස් විමසීම**

| නියෝජනය කළ ආයතනය | ඉහළ ආයතන ප්‍රධානී/පළාත් හා දිස්ත්‍රික් ලේකම් % | මධ්‍යම අංශභාර අධ්‍යක්ෂ/අංශ ප්‍රධාන/ නියෝජ්‍ය අධ්‍යක්ෂ % | පහළ ප්‍රධාන සංවර්ධන නිලධාරී/කෘෂි උපදේශක % | එකතුව % |
|---|---|---|---|---|
| 1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය | 37.5% | 27.3% | 35.0% | 33.9% |
| 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 25.05 | 9.15 | .0% | 5.1% |
| 3. කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලය/ කෘෂි උපදේශක කාර්යාලය | .0% | 9.1% | 35.0% | 25.4% |
| 4. කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය | 12.5% | 18.2% | 2.5% | 6.8 |
| 5. ගොවිජන සේවා මධ්‍යස්ථානය | .0% | .0% | 7.5% | 5.1% |
| | 25.0% | 36.4% | 20.0% | 23.7% |
| එකතුව | 100.0% | 100.0% | 100.0% | 100.0% |

මූලාශ්‍රය: HARTI සමීක්ෂණ දත්ත,2012

වගු අංක 7.2.2: අදහස් දැක් වූ විවිධ මට්ටමේ නිලධාරීන් මෙම වැඩසටහන හා සම්බන්ධ වූ වර්ෂ

| දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය | 2007 % | 2008 % | 2009 % | 2010 % | 2011 % | 2012 % | වර්ෂය සඳහන් නොකළ % | එකතුව % |
|---|---|---|---|---|---|---|---|---|
| 1.කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 40.0 | 37.5 | 22.2 | 0 | 100.0 | 50 | 100.0 | 33.9 |
| 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 10.0 | 4.2 | 5.6 | 0 | 0 | 0 | 0 | 5.1 |
| 3. කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලය/ කෘෂි උපදේශක කාර්යාලය | 0 | 25.0 | 44.4 | 33.3 | 0 | 0 | 0 | 25.4 |
| 4. කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය | 30.0 | 0 | 5.6 | 0 | 0 | 0 | 0 | 6.8 |
| 5. ගොවිජන සේවා මධ්‍යස්ථානය | 0 | 4.2 | 5.6 | 33.3 | 0 | 0 | 00 | 5.1 |
| 6.පළාත්කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 20.0 | 29.2 | 16.7 | 33.3 | 0 | 50 | 0 | 23.7 |
| එකතුව | 100.0 | 100 | 100 | 100 | 100.0 | 100.0 | 100.0 | 100.0 |

මූලාශ්‍රය: HARTI සමීක්ෂණ දත්ත, 2012

වගු අංක 7.2.3: එක් එක් නිලධාරී කාණ්ඩ අනුව ඔවුන්ට වැඩසටහන පිළිබඳව ඇති අවබෝධය

| අදහස | ඉහළ ආයතන ප්‍රධානී/ සළාත් හා දිස්ත්‍රික් ලේකම් % | මධ්‍යම අංශභාර අධ්‍යක්ෂ/ අංශ ප්‍රධාන/නියෝජ්‍ය අධ්‍යක්ෂ % | පහළ සංවර්ධන නිලධාරී/ කෘෂි උපදේශක % | එකතුව % |
|---|---|---|---|---|
| ඉතා හොඳ අවබෝධයකි | 25.0% | 45.5% | 10.0% | 18.6% |
| සතුටුදායක මට්ටමක පවතී | 37.5% | 36.4% | 55.0% | 49.2% |
| සාමාන්‍ය අවබෝධයකි | 37.5% | 18.2% | 27.5% | 27.1% |
| අවබෝධයක් නැත | .0% | .0% | 2.5% | 1.7% |
| එකතුව | 100.0% | 100.0% | 100.0% | 100.0% |

මූලාශ්‍රය: HARTI සමීක්ෂණ දත්ත,2012

වගු අංක7.2.4: වැඩසටහනෙ හි අරමුණු පිළිබඳව එක් එක් නිලධාරී කාණ්ඩය දැක් වූ අදහස්

| | ඉහළ ආයතන ප්‍රධානී/පළාත් හා දිස්ත්‍රික් ලේකම් % | මධ්‍යම අංශභාර/අධ්‍යක්ෂ/අංශ ප්‍රධාන/නියෝජ්‍ය අධ්‍යක්ෂ % | පහළ සංවර්ධන නිලධාරී/කෘෂි උපදේශක % | එකතුව % |
|---|---|---|---|---|
| කාලයට උචිත ඉතා වැදගත් අරමුණුවලින් යුක්තය | 62.5% | 54.5% | 30.0% | 39.0% |
| වැදගත් අරමුණුවලින් යුක්තය | 37.5% | 36.4% | 50.0% | 45.8% |
| තරමක් වැදගත් අරමුණුවලින් යුක්තය | .0% | 9.1% | 17.5% | 13.6% |
| එතරම් වැදගත් අරමුණුවලින් යුක්ත නොවේ. | .0% | .0% | 2.5% | 1.7% |
| එකතුව | 100.0% | 100.0% | 100.0% | 100.0% |

මූලාශ්‍රය: HARTI සමීක්ෂණ දත්ත, 2012

වගු අංක 7.2.5: එක් එක් නිලධාරීන් අනුව මෙම වැඩසටහනෙහි සැලසුම් පිළිබඳව අදහස්

| | ඉහළ ආයතන ප්‍රධානී/පළාත් හා දිස්ත්‍රික් ලේකම් % | මධ්‍යම අංශභාර/අධ්‍යක්ෂ/අංශ ප්‍රධාන්/නියෝජ්‍ය අධ්‍යක්ෂ % | පහළ සංවර්ධන නිලධාරී/කෘෂි උපදේශක % | එකතුව % |
|---|---|---|---|---|
| ඉතා හොඳ සැලසුම් සහගත එකකි | .0% | 18.2% | 2.5% | 5.1% |
| හොඳ සැලසුම් සහගත එකකි | 37.5% | 45.5% | 45.0% | 44.1% |
| තරමක් හොඳට සැලසුම් සහගත එකකි | 50.0% | 36.4% | 47.5% | 45.8% |
| එතරම් හොඳට සැලසුම් කළ එකක් නොවේ | 12.5% | .0% | 5.0% | 5.1% |
| එකතුව | 100.0% | 100.0% | 100.0% | 100.0% |

මූලාශ්‍රය: HARTI සමීක්ෂණ දත්ත,2012

වගු අංක **7.2.6:** එක් එක් නිලධාරී කාණ්ඩයට අනුව මෙම වැඩසටහනෙහි ක්‍රියාත්මකභාවය පිළිබඳ අදහස්

| | ඉහළ ආයතන ප්‍රධානී/පළාත් හා දිස්ත්‍රික් ලේකම් % | මධ්‍යම අංශභාර/අධ්‍යක්ෂ/ අංශ ප්‍රධාන/නියෝජ්‍ය අධ්‍යක්ෂ % | පහළ සංවර්ධන නිලධාරී/කෘෂි උපදේශක % | එකතුව % |
|---|---|---|---|---|
| ඉතා හොඳින් ක්‍රියාත්මක විය | 0 | 0 | 0 | 0 |
| හොඳින් ක්‍රියාත්මක විය | 50.0% | 72.2% | 52.5% | 55.9% |
| තරමක් හොඳින් ක්‍රියාත්මක විය | 25.0% | 27.3% | 47.2% | 40.7% |
| එතරම් හොඳින් ක්‍රියාත්මක නොවුණි | 25.0% | .0% | .0% | 3.4% |
| එකතුව | 100.0% | 100.0% | 100.0% | 100.0% |

මූලාශ්‍රය: HARTI සමීක්ෂණ දත්ත,2012

වගු අංක **7.2.7:** වැඩසටහනෙහි සාර්ථකභාවය පිළිබඳව නිලධාරීන්ගේ අදහස් දැක්වීම

| තක්සේරුව | ඉහළ ආයතන ප්‍රධානී/පළාත් හා දිස්ත්‍රික් ලේකම් % | මධ්‍යම අංශභාර/අධ්‍යක්ෂ/ අංශ ප්‍රධාන/නියෝජ්‍ය අධ්‍යක්ෂ % | පහළ සංවර්ධන නිලධාරී/කෘෂි උපදේශක % | එකතුව % |
|---|---|---|---|---|
| ඉතා සාර්ථක වැඩසටහනකි | 12.5% | 9.1% | .0% | 3.4% |
| සාර්ථක වැඩසටහනකි | 37.5% | 63.6% | 35.9% | 41.4% |
| තරමක් සාර්ථක වැඩසටහනකි | 50.0% | 27.3% | 64.1% | 55.2% |
| එකතුව | 100.0% | 100.0% | 100.0% | 100.0% |


මූලාශ්‍රය: HARTI සමීක්ෂණ දත්ත,2012


වගු අංක**7.2.9:** වැඩසටහනේ සැලසුම් අවදියේ දී ආයතනවල අදහස් ලබාගැනීම සම්බන්ධ අදහස්

| | ඉහළ ආයතන ප්‍රධානී/පළාත් හා දිස්ත්‍රික් ලේකම් % | මධ්‍යම අංශභාර/අධ්‍යක්ෂ/ අංශ ප්‍රධාන/නියෝජ්‍ය අධ්‍යක්ෂ % | පහළ සංවර්ධන නිලධාරී/ කෘෂි උපදේශක % | එකතුව % |
|---|---|---|---|---|
| ඉතා හොඳින් සිදු කෙරිණි | .0% | 9.1% | 5.0% | 5.2% |
| හොඳින් සිදු කෙරිණි | 28.6% | 36.4% | 47.5% | 43.1% |
| සාමාන්‍ය මට්ටමකට සිදු කෙරිණි | 28.6% | 18.2% | 40.0% | 34.5% |
| සිදු කළේ නැත | 42.9% | 36.4% | 7.5% | 17.2% |
| එකතුව | 100.0% | 100.0% | 100.0% | 100.0% |


මූලාශ්‍රය: HARTI සමීක්ෂණ දත්ත,2012


ඇමුණුම් අංක 06 : දළ දේශීය නිෂ්පාදිතය සඳහා කෘෂිකාර්මික අංශයේ දායකත්වය










ඇමුණුම් අංක 08: කෘෂිකාර්මික බෝග කිහිපයක ආනයන ප්‍රමාණය සහ දේශීය නිෂ්පාදිතය






රතුළූණු ආනයන ප්‍රමාණය
ආනයන ප්‍රමාණය කි.ග්‍රෑ.
30000
25000
20000
15000
10000
5000
0
23754
26890
16207
11907
6807
2007
2008
2009
2010
2011
වර්ෂය
රතුළූණු



ලොකුළූණු ආනයන ප්‍රමාණය
ආනයන ප්‍රමාණය කි.ග්‍රෑ
200000
150000
100000
50000
0
140772
146623
143274
158086
170730
2007
2008
2009
2010
2011
වර්ෂය
ලොකුළූණු



මුං ඇට ආනයන ප්‍රමාණය
ආනයන ප්‍රමාණය කි.ග්‍රෑ.
16000
14000
12000
10000
8000
6000
4000
2000
0
12764
13728
14182
11514
10447
2007
2008
2009
2010
2011
වර්ෂය
මුං ඇට



බඩ ඉරිඟු ආනයන ප්‍රමාණය
ආනයන ප්‍රමාණය කි.ග්‍රෑ
100000
80000
60000
40000
20000
0
78757
83194
28033
10506
8244
2007
2008
2009
2010
2011
වර්ෂය
බඩ ඉරිඟු



මිරිස් ආනයන ප්‍රමාණය
ආනයන ප්‍රමාණය කි.ග්‍රෑ
50000
40000
30000
20000
10000
0
31241
34942
36218
37762
42781
2007
2008
2009
2010
2011
වර්ෂය
මිරිස්



කව්පි ආනයන ප්‍රමාණය
ආනයන ප්‍රමාණය කි. ග්‍රෑ.
1000
800
600
400
200
0
75
745
429
45
905
2007
2008
2009
2010
2011
වර්ෂය
කව්පි



දේශීය කුරුඳු නිෂ්පාදන ප්‍රමාණය
දේශීය නිෂ්පාදන මෙ.ටො.
17000
16000
15000
14000
13000
12000
13360
13430
14600
15800
15937
2007
2008
2009
2010
2011
වර්ෂය
කුරුඳු



දේශීය ගම්මිරිස් නිෂ්පාදන ප්‍රමාණය
දේශීය නිෂ්පාදනය මෙ.ටො.
30000
25000
20000
15000
10000
5000
0
19390
22870
25300
26620
25770
2007
2008
2009
2010
2011
වර්ෂය
ගම්මිරිස්


දේශීය කරඳමුංගු නිෂ්පාදන ප්‍රමාණය
දේශීය නිෂ්පාදනය මෙ.ටො.
700
600
500
400
300
200
100
0
500
400
480
570
578
2007
2008
2009
2010
2011
වර්ෂය
කරඳමුංගු



දේශීය කුරක්කන් නිෂ්පාදන ප්‍රමාණය
දේශීය නිෂ්පාදනය මෙ.ටො.
7000
6000
5000
4000
3000
2000
1000
0
5460
6510
6430
6310
5411
2007
2008
2009
2010
2011
වර්ෂය
කුරක්කන්


දේශීය මුංඇට නිෂ්පාදන ප්‍රමාණය
නිෂ්පාදන ප්‍රමාණය මෙ.ටො.
14000
12000
10000
8000
6000
4000
2000
0
8520
8880
9260
11700
10838
2007
2008
2009
2010
2011
වර්ෂය
මුංඇට


දේශීය කව්පි නිෂ්පාදන ප්‍රමාණය
නිෂ්පාදන ප්‍රමාණය මෙ.ටො.
16000
14000
12000
10000
8000
6000
4000
2000
0
10850
11950
13480
11610
10453
2007
2008
2009
2010
2011
වර්ෂය
කව්පි



දේශීය තල නිෂ්පාදන ප්‍රමාණය
දේශීය නිෂ්පාදන ප්‍රමාණය මෙ.ටො.
20000
15000
10000
5000
0
6300
6340
8530
16950
11293
2007
2008
2009
2010
2011
වර්ෂය
තල

දේශීය බඩ ඉරිඟු නිෂ්පාදන ප්‍රමාණය
දේශීය නිෂ්පාදන ප්‍රමාණය මෙ.ටො.
200000
150000
100000
50000
0
56440
112290
129770
161690
137797
2007
2008
2009
2010
2011
වර්ෂය
බඩඉරිඟු

තැ. පෙ. 1522
කොළඹ,
ශ්‍රී ලංකාව.

දු. අ. 94112696981
94112696437

ෆැක්ස් 94112692423

විද්‍යුත් තැපැල්: library@harti.lk

වෙබ් : www.harti.gov.lk

ISBN 978-955-612-176-6

Rs. 475/-

Department of Government Printing

National Digitization Project

*National Science Foundation*

Institute : National Science Foundation

1. Place of Scanning : Sanje (Private) Ltd, Hokandara

2. Date Scanned : 02/06/2017

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : Angelo Melvin Luwis

Signature : A. M. [signature]

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Information Officer

Name : Renuka Sugathadasa

Signature : K. P. Sugathadasa

Date : 02/06/2017

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*